# පොදු ගුරු මාර්ගෝපදේශය

# DRAFT

# පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම
ශ්‍රී ලංකාව
**www.nie.lk**

# විෂය නිර්දේශය සහ
# ගුරු මාර්ගෝපදේශය

# පළමුවන ශ්‍රේණිය

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk විද්‍යුත් තැපැල : info @ nie.lk

**විෂය නිර්දේශය සහ ගුරු මාර්ගෝපදේශය**

**පළමුවන ශ්‍රේණිය**

ප්‍රථම මුද්‍රණය - 2016

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN .................

මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව
ජාතික අධ්‍යාපන ආයතනය
ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk
**විද්‍යුත් තැපැල** : info @ nie.lk

*මුද්‍රණය* :

# අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මෙම ගුරු මාර්ගෝපදේශය මගින් ගුරුභවතාට තම පාසල තුළ විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වන මූලික දෑ සැපයේ. විෂය නිර්දේශය ක්‍රියාත්මක කිරීමේ දී ගුරුවරුන් තම කාර්යයන්, දරුවාගේ බුද්ධි වර්ධනය කෙරෙහි මෙන් ම, චර්යාත්මක දියුණුව කෙරෙහි ද දිගු කාලීන බලපෑමක් ඇති කරවන බව නිරන්තරයෙන් ම සිහි තබා ගත යුතු වේ.

ප්‍රජානන සාධන මානය සම්බන්ධයෙන්, අනෙක් කරුණු අතරට, ඉගෙනීම ඉහළ මට්ටමකට ගෙන යාමට පහත සඳහන් කරුණු කෙරෙහි ද ගුරුවරුන් සැලකිලිමත් විය යුතු වේ.

- ශිෂ්‍යයා තම ජීවිත අරමුණු පිළිබඳ අවදියෙන් සිටීම සහ කළ යුතු කාර්යය, හැකියාවන්ට සහ අරමුණු සාධනයට අදාළ වීම.
- ශිෂ්‍යයා ක්‍රියාකාරීව ඉගෙනුම් කාර්යාවලියෙහි නිරත වීම. (ඉගෙනීම සිසු කේන්ද්‍රීය ක්‍රියාවලියක් වීම.) කන්ෆියුසියස් ගේ කියමන සිහියට නගා ගන්න; ඇසෙන දේ අමතක වේ. දකින දේ අමතක නොවේ. කළ දේ ඉගෙන ගැනේ.
- ඉගෙනුම් වාතාවරණය, ධනාත්මක ව, අභියෝගාත්මක වී, ඉගෙනුම් මෙවලම්, උපකරණ, විද්‍යාගාර, විවිධ සම්පත් ආකාරවලට පිවිසුම පහසු වීම.
- ශිෂ්‍යයාට ක්ෂණික ධනාත්මක සහ නිර්මාණාත්මක ප්‍රතිචාරයන් ලබා දීම මගින්, ඉගෙනුම ක්‍රමානුකූල ව ඉහළ මට්ටමක අවශෝෂණයකින්, ශිෂ්‍යයාගේ දැනුම, කුසලතා සහ අරමුණු සමග අනුකලනයකට අවකාශ ඇති කිරීම.

අධ්‍යාපනයේ දී, රජයේ අපේක්ෂාව වනුයේ සියලු පාසල්වල සියලු දරුවන්ට, මූලික විෂය කරුණු අවශ්‍ය මට්ටමකට ග්‍රහණය කිරීමෙන්, විභාගයට මුහුණ දීමෙන් පසුව සාර්ථකත්වයේ සතුට විඳ ගැනීමේ හැකියාව ලබාදීමය.

දරුවාගේ චර්යාත්මක වර්ධනයට අදාළ මානය සලකා බැලූ විට අධ්‍යාපනයේ පරමාර්ථය වනුයේ ප්‍රජානන හැකියාවන් වැඩ ලෝකය සමග සම්බන්ධ කිරීමයි. එබැවින් ගුරුවරුන් තමතින් විෂය නිර්දේශ ලබා දීමේ දී වර්ධනය කළ යුතු වන්නේ, පාසලින් බැහැර ලෝකය සමග ගනුදෙනු කිරීමට ශිෂ්‍යයාට අවශ්‍ය වන, දක්ෂතා සහ කුසලතා ය. එයින් සමහර වැදගත් ගණීය හැකියාවන් පහත සඳහන් ක්ෂේත්‍රයන් හි වේ.

- කාර්යශීලී වැඩ ආචාර ධර්ම - සාධනීය ආකල්ප සහ නව නිර්මාණයට, සංරක්ෂණයට ඇති ලැදියාව
- අන්තර් පුද්ගල සම්බන්ධතා - කණ්ඩායම් වැඩ, විනය සහ කාර්යක්ෂම සන්නිවේදනය
- සදාචාරාත්මක හර - විවිධත්වයට ගරු කිරීම වැනි පුරවැසි වටිනාකම්වලින් හෙබි, සෘජු පුද්ගලයෙක්

අවසාන වශයෙන් මම සියලු විදුහල්පතිවරුන්ටත්, ගුරු භවතුන්ටත්, පාසල්වල අනෙක් කාර්ය මණ්ඩල සභිකයන්ටත්, ඉතා ඕනෑකමින් ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය දෙස කළමනාකරණයේ ඒ 4 වශයෙන් හඳුන්වන පහත සඳහන් කරුණු මගින් තම සැලකිල්ල යොමු කරන මෙන් ඉල්ලීමට කැමැත්තෙමි. එනම් ආකල්පය, විශ්ලේෂණය, ක්‍රියාව සහ වගවීමයි. ඔබ නියුක්ත වන කාර්යයෙහි (පාඩම ආදී වශයෙන්) අවසානයත්, මාර්ගයන් පිළිබඳ අදාළ සාධනීය ආකල්පයන්ගෙන් ආරම්භ කරන්න. එය සංවිධානය කර ගැනීම උදෙසා (වරු ඒකක ආදී වශයෙන්) තොරතුරු සොයා බලා ලබාගෙන ඒවා විශ්ලේෂණය කරන්න. විකල්ප සලකා බලා ක්ෂණික ක්‍රියා (ප්‍රකාශ කිරීම, බාරදීම) කාර්යක්ෂමව ගන්න. ඔබ ප්‍රතිඵල අධීක්ෂණය, ඇගැයීම සහ මිණුම සම්බන්ධයෙන් (අයිතිය) වගකීම බාර ගන්න.

මේ හා සම්බන්ධ සියලු ගුරු භවතුන්ට, ඉගැන්වීමේ දීත්, ඉගෙනීමේ දීත් සතුට අත්වේවා යයි ප්‍රාර්ථනා කිරීමට මම මෙය අවස්ථාව කර ගනිමි. අවශ්‍ය වුවහොත් මට ද පිටපතක් සහිතව ජාතික අධ්‍යාපන ආයතනයේ අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට මෙම ගුරු මාර්ගෝපදේශය පිළිබඳ ඔබේ අත්දැකීම් සහ නිරීක්ෂණ ලියා දන්වා එවීමට නොපසුබට වන්න.


**මහාචාර්ය ගුණපාල නානායක්කාර**
අධ්‍යක්ෂ ජනරාල්
ජාතික අධ්‍යාපන ආයතනය
මහරගම.

# නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩය

ඉගෙනුම පුළුල් ක්ෂේත්‍රයක විහිද යන්නකි. එය ජීවිත අතිමහත් බවට ද, ඉතා ම සරල බවට ද පත් කරයි. මනුෂ්‍යයා ඉගෙනුම් කුසලතාවෙන් උත්කෘෂ්ට ය. මානව සමාජ සංවර්ධනය කේන්ද්‍ර කොට ගත් රටක්, සමාජයක් බුද්ධිය විසින් හඳුනා ගත් අසම්මතයන් බැහැර කිරීමට ද සුභාවිතයන් තුළින් නව ලොවක් නිර්මාණය කර ගැනීමට ද මෙවලම කර ගනු ලබන්නේ ඉගෙනුම යි.

ඉගෙනුම සඳහා වටිනා යමක් ද, ඉගෙනුම් ක්‍රමවේදයන් හා පහසුකම් ද අධ්‍යාපනය වටා නිර්මාණය විය යුතු ය. විෂයමාලාව, විෂය නිර්දේශය, මාර්ගෝපදේශ, සුසාධ්‍යකරුවන් ඉගෙනුම් ක්ෂේත්‍රයට එක්වනුයේ මේ ආකාරයෙනි.

නූතන ශ්‍රී ලංකාව ගෝලීය ප්‍රවණතාවන් මෙන් ම පුරාතන උරුමයන් ද සම්මිශ්‍රණය කර ගනිමින් ස්වීය අධ්‍යාපන රටාවක් හිමි කරගෙන ඇත. කාලීන අවශ්‍යතා මත ප්‍රතිසංස්කරණයන් තුළින් වසර අටකට වරක් යාවත්කාලීන වන විෂයමාලාවේ ඉගෙනුම් සම්පතක් ලෙස මෙම ගුරු අත්පොත් නිර්මාණය වේ.

විෂයයෙහි අරමුණුවල සංගතතාව ජාතික මට්ටමින් පවත්වා ගත යුතු ය. එහෙත් ගුරු අත්පොත්හි ඉගෙනුම් ක්‍රමවේදයන්, අකුරක්වත් වෙනස් නොකොට පිළිපැදිය යුත්තක් නම් නොවේ. විෂය නිර්දේශයෙහි නිපුණතා, නිපුණතා මට්ටම්, සාධනය වීම සඳහා අන්තර්ගතය තුළින් ඉගෙනුම් පල සම්ප්‍රාප්තිය පිණිස ඉගෙනුම් ක්‍රමවේද නිර්මාණශීලී ව වෙනස් කර ගැනීමට සුසාධ්‍යකරුවන්ට පැහැදිලිව ම ඉඩක් ඇති බව සඳහන් කරමි. ශිෂ්‍ය සාධන ප්‍රතිශතය ඉහළ මට්ටමකට ගැනීම සඳහා උදව් වන, පහසුකම් සලසන ගුරු භූමිකාවට කිසියම් ප්‍රවේශයක් සඳහා නිර්මාණය වන ගුරු අත්පොත ශික්ෂකයා හට ද, දෙගුරුනට ද භාවිත කළ හැක. අදාළ පෙළ පොතට සහකරුවකු වන ගුරු අත්පොත තවත් පෙළපොතක් නොවන බව දැන ගුරුභවතුන් පෙළ පොත හා ගුර අත්පොත යන සම්පත් ද්‍රව්‍ය දෙකම භාවිත කළ යුතු ය.

ඒ ඒ විෂයයන්හි සාධනය පිළිබඳ ඇගයීම් සිදු කරන ජාතික මට්ටමේ පරීක්ෂකවරයකු වුව ද අපේක්ෂා කරන සාධනයන්, විෂයය ඉගැන්වීමට මඟ පෙන්වන සුසාධ්‍යකරුවන් විසින් පාඩම අවසානයෙහි පන්ති කාමරයේ දී දරුවන් සමඟ ප්‍රත්‍යක්ෂකරණයට පත් විය යුතු ය. එම ඒකාත්මිකවීම සඳහා වූ ප්‍රබෝධාත්මක සංස්කෘතියක් ගොඩනඟා ගැනීමට ගුරු අත්පොත පහුරක්, යාත්‍රාවක් කරගනු ඇතැයි ආයාචනා පූර්වක ව අපේක්ෂා කරමි.

**නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්**
භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජවිද්‍යා පීඨය,
ජාතික අධ්‍යාපන ආයතනය.

# හැඳින්වීම

2016 වසරේ දී පළමුවන ශ්‍රේණිය සඳහා හඳුන්වා දෙන මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය, 2007 වර්ෂයේ හඳුන්වා දුන් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය වසර අටක් පාසල්වල ක්‍රියාත්මක කිරීමේ දී ලද අත්දැකීම් සැලකිල්ලට ගෙන සංස්කරණය කරන ලද්දකි. එසේම ජාතික අධ්‍යාපන ආයතනය මගින් ක්‍රියාත්මක කරන ලද විෂයමාලා පසුපෙවුම් වැඩසටහන මගින් ලබාගත් තොරතුරු ද, විවිධ ආයතන මගින් ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ ව පවත්වන ලද පර්යේෂණවලින් ලබාගත් තොරතුරු සහ ගුරු මහත්ම මහත්මීන් හා ගුරු උපදේශක මහත්ම මහත්මීන් විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු ද මෙම සංස්කරණය සඳහා ප්‍රයෝජනයට ගන්නා ලදී.

ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය යනු ගුරු මහත්ම මහත්මීන් හට තම පන්තිවල ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතුවල සංවිධානය කර ගැනීමට මග පෙන්වනු ලබන උපදෙස් සංග්‍රහයකි. එම මග පෙන්වීම්වලට අනුව තමන්ගේ ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සකස් කර ගැනීම ගුරු මහත්ම මහත්මීන්ගේ වගකීම වෙයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිටින සිසුන් ඔවුන්ගේ පූර්ණ සංවර්ධනයේ ඉතාමත් තීරණාත්මක අවධියක පසුවන්නන් ය. සිසුන්ගේ නිර්මාණාත්මක චින්තනය, සමාජ කුසලතා සහ පෞරුෂ ලක්ෂණ ගොඩ නැගෙන්නේත්, හැඩගැසෙන්නේත් මේ අවධියේ දී ය. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති තොරතුරු මෙන් ම ඉහත සඳහන් කළ ළමා සංවර්ධනය හා සම්බන්ධ කරුණු ද සැලකිල්ලට ගත යුතු ය. සිසුන්ගේ ඉගෙනීම සම්බන්ධයෙන් ඔවුන්ගේ ආසන්න පරිසරය ඉතාම සාර්ථකව යොදාගත හැකි ය. මෙම වයස් සීමාවේ පසුවන සිසුන්ගේ ඉගෙනීම සම්පූර්ණයෙන්ම සිදු වන්නේ පරිසරයත් සමග අන්තර්ක්‍රියා කිරීමෙනි. එම නිසා සිසුන් සඳහා ඉගෙනුම්-ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී සිසුන්ගේ ආසන්න පරිසරය අර්ථාන්විත ලෙස භාවිත කළ යුතු ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇති ඉගෙනුම් ක්‍රියාකාරකම් සංවිධානය කිරීමේ දී විනෝදජනක වැඩ සහ ක්‍රීඩාවලට වැදගත් තැනක් දී තිබේ. සිසුන්ට තම ළමා කාලයේ දී ප්‍රීතිය භුක්ති විඳීමට හා සාර්ථකත්වය අත්දැකීමට අවස්ථාවන් තිබීම ඔවුන්ගේ පූර්ණ සංවර්ධනය සඳහා අතිශයින් වැදගත් වේ. එමෙන් ම ඔවුන්ගේ අනාගත ජීවිතයට අදාළ නිපුණතා සංවර්ධනය කිරීමේ පදනම ද ඇති කළ යුතුය. ඒ සඳහා පන්ති කාමරය තුළ හැකිතාක් අවස්ථා සම්පාදනය කිරීම වැදගත් ය. තමාගේ පන්තියේ ඉගෙන ගන්නා සිසුන් ඉගෙනුම් ක්‍රියාවලිය සමග කොතරම් හොඳින් සම්බන්ධ වන්නේ ද යන්න පිළිබඳව නිරන්තරයෙන් සැලකිලිමත් ව සිට අවශ්‍ය පිළියම් යොදමින් කටයුතු කිරීම ගුරු මහත්ම මහත්මීන්ගේ අවධානයට ලක්විය යුතු කරුණකි. තක්සේරු කිරීම යනුවෙන් අදහස් කරන මෙම ක්‍රියාවලියෙහි අවසාන ප්‍රතිඵලය විය යුත්තේ සෑම සිසුවෙකුගේම ඉගෙනීම වැඩිදියුණු කිරීම ය.

මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකස් කිරීම සඳහා ගුරුවරුන්ගේ, ගුරු උපදේශකවරුන්ගේ, විදුහල්පතිවරුන්ගේ, ගුරු විද්‍යාල, අධ්‍යාපන විද්‍යාපීඨ, විශ්වවිද්‍යාල කථිකාචාර්යවරුන්ගේ හා අධ්‍යාපන නිලධාරීන් විශාල පිරිසකගේ ද සහය ලබාගන්නා ලදී. ඒ සියලු දෙනාම දැක්වූ දායකත්වය වෙනුවෙන් අපගේ කෘතඥතාව පළකරමු. එසේම නිරන්තරයෙන් අපට අවශ්‍ය මගපෙන්වීම් ලබාදෙන අප ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල්, මහාචාර්ය ගුණපාල නානායක්කාර මහතා ද කෘතඥතා පූර්වක ව සිහිපත් කරමු. මෙම කෘතිය සකස් කිරීම වෙනුවෙන් ඇපකැප වී ක්‍රියා කළ අපගේ දෙපාර්තමේන්තුවේ සියලුම නිලධාරී මහත්ම මහත්මීන්ගේ හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ සේවය ද ඉතා ඉහළින් අගය කරමු.

**කේ.ඒ.ඩී.පී. සරත්චන්ද්‍ර**
අධ්‍යක්ෂ,
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන

# ජාතික අරමුණු

i. මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කර ගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික ඍජු ගුණය, ජාතික සමඟිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැඟීම සහ ශ්‍රී ලාංකීය අනන්‍යතාව තහවුරු කිරීම

ii. වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාද හඳුනා ගැනීම සහ සංරක්ෂණය කිරීම

iii. මානව අයිතිවාසිකම්වලට ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයාංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතාන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණය කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

iv. පුද්ගලයින් ගේ මානසික හා ශාරීරික සුව සම්පත සහ මානව අගයවලට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

v. සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාපණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය කිරීම

vi. පුද්ගලයා ගේ සහ ජාතියේ ජීව ගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායී කාර්ය සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීම

vii. ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩ ගැසීමට හා ඒවා පාලනය කර ගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථක ව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

viii. ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවනීය ස්ථානයක් හිමි කර ගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කර ගැනීමට දායක වනු ඇත.

## i. සන්නිවේදන නිපුණතා

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ හතරක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

**සාක්ෂරතාව** : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කතා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරැදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායී අයුරින් අදහස් හුවමාරු කර ගැනීම

**සංඛ්‍යා පිළිබඳ දැනුම** : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය

**රූපක භාවිතය** : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම

**තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය** : පරිගණක දැනුම සහ ඉගෙනීමේ දී ද, සේවා පරිශ්‍රයන් තුළදී ද, පෞද්ගලික ජීවිතයේ දී ද, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම

## ii. පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තිය, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයා ගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුසලතා
- ඍජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය

## iii. පරිසරයට අදාළ නිපුණතා

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරවලට අදාළ වේ.

**සමාජ පරිසරය** : ජාතික උරුම පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුසලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායයන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම්

**ජෛව පරිසරය** : සජීවී ලෝකය, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස්වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය, ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුසලතා

**භෞතික පරිසරය** : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍යය, සුව පහසුව, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මළපහ කිරීම් යනාදිය හා සම්බන්ධ වූ අවබෝධය, සංවේදීතාව හා කුසලතාව

ඉගෙනීම වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුසලතා මෙහි අඩංගු වේ.

iv. **වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා**

- ආර්ථික සංවර්ධනයට දායක වීම
- තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනා ගැනීම
- හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරා ගැනීම සහ වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුසලතා

v. **ආගම සහ ආචාර ධර්මවලට අදාළ නිපුණතා**

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවලට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අදාළ අගය උකහා ගැනීම හා ස්වීයකරණය

vi. **ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා**

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්


vii. **'ඉගෙනීමට ඉගෙනුම' පිළිබඳ නිපුණතා**


ශීඝ්‍රයෙන් වෙනස් වන, සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත්, ස්වාධීන ව ඉගෙන ගැනීමත්, සඳහා පුද්ගලයින් හට ශක්තිය ලබා දීම

# විෂයමාලා කමිටුව

| | |
|---|---|
| **උපදේශනය :** | මහාචාර්ය ගුණපාල නානායක්කාර<br>අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අධ්‍යාපන ආයතනය<br><br>ආචාර්ය පූජ්‍ය මාඹුල්ගොඩ සුමනරතන හිමි<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්<br>භාෂා, මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය |
| **අධීක්ෂණය :** | කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා<br>මූල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව |
| **සංස්කරණය හා සම්බන්ධීකරණය :** | එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය) |
| **විෂයමාලා කමිටුව :** | (මූල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික අධ්‍යාපන දෙපාර්තමේන්තුව)<br>කේ. ඒ. ඩී. පී. සරත්චන්ද්‍ර මයා (අධ්‍යක්ෂ)<br>එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br>එම්. ආර්. ඩබ්ලිව්. මද්දුම මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br>ආර්. එම්. කේ ද සිල්වා මිය (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br>එස්. උදයසන්දිරන් මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br>ඩබ්ලිව්. ජී. එස්. කුමාර මයා (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය)<br>එස්. එම්. එස්. දේශප්‍රිය මිය (කථිකාචාර්ය)<br>එච්. ඩබ්ලිව්. ඩබ්ලිව්. එම්. සජීවා රඹුක්වැල්ල මිය (කථිකාචාර්ය)<br>ජේ. ඒ. නිර්මලා දමයන්ති ජයසිංහ මෙනවිය (සහකාර කථිකාචාර්ය)<br>එච්. ජී. වනසේකර මිය (සහකාර කථිකාචාර්ය)<br>කේ. ආර්. එම්. සකුන්තලා රණසිංහ මිය (සහකාර කථිකාචාර්ය) |
| **සහභාගිත්වය :** | ටී. චන්ද්‍රිකා පීරිස් මිය (කථිකාචාර්ය)<br>(ඉංග්‍රීසි අධ්‍යාපන දෙපාර්තමේන්තුව) |
| **චිත්‍ර :** | |
| **පිටකවරය :** | |
| **පරිගණක වචන යෙදුම :** | බී. ඒ. එන්. බටවල මිය |
| **විවිධ සහය :** | ඩබ්ලිව්. එච්. ටියුඩර් සිල්වා මයා<br>එස්. පී. ඒ. සරත් කුමාර මයා |

## ප්‍රාථමික විෂයමාලා සැලැස්ම



## 1998 වර්ෂයේ සිට ක්‍රියාත්මක වන විෂයමාලාවේ විශේෂ ලක්ෂණ

- වසර පහකින් සමන්විත ප්‍රාථමික අධ්‍යාපන චක්‍රය විෂයමාලා සංවර්ධන හා අනෙකුත් සංවිධාන කටයුතුවල පහසුව තකා ප්‍රධාන අවධි තුනකට බෙදීම.
  1 ප්‍රධාන අවධිය - 1 සහ 2 ශ්‍රේණි
  2 ප්‍රධාන අවධිය - 3 සහ 4 ශ්‍රේණි
  3 ප්‍රධාන අවධිය - 5 ශ්‍රේණිය
- පළමුවන ශ්‍රේණියට ඇතුළුවන දරුවන් හඳුනා ගැනීමට පහසුවන ක්‍රියාකාරකම් සමූහයක් හඳුන්වා දීම.
- සාමාන්‍ය අධ්‍යාපන අවධිය අවසානයේ දී සිසුන් විසින් වර්ධනය කරගත යුතුයැයි නිර්දේශිත නිපුණතා ප්‍රකාශයට පත් කර ඇත. ඒවා ගොඩනැගීමට සුදුසු අඩිතාලමක් සැපයෙන පරිදි සැකසුනු විෂයමාලාවක් වීම. - නිපුණතා පාදක විෂයමාලාවක් වීම.
- විෂය ක්ෂේත්‍ර සංඛ්‍යාව හතරකට සීමා වීම.
  * භාෂාව * ගණිතය * ආගම * පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්
- දරුවකුගේ පූර්ණ වර්ධනයට භාෂා හා ගණිත නිපුණතාවලට අමතරව තවත් අංශ කිහිපයකට අයත් නිපුණතා වර්ධනය වීම අවශ්‍ය ය. (*උදා:* සෞන්දර්ය, නිර්මාණ, විද්‍යාව, සාරධර්ම, ශාරීරික වර්ධනය, සෞඛ්‍යය හා පෝෂණය.) මෙම නිපුණතා වෙන් වෙන් ව විෂයයන් වශයෙන් ඉදිරිපත් කිරීමට වඩා සිසුන්ට ගැලපෙන තේමා තුළින් මතුකර ඉගේමට සැලැස්වීම වඩා යෝග්‍ය ලෙස පිළිගැනේ. මෙවැනි තේමා 16කින් සමන්විත පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී පෙරට වඩා සමෝධානිත ලක්ෂණ පෙන්නුම් කිරීම
- පළමුවන ශ්‍රේණියේ සිටම දිගටම විෂය සමගාමී ක්‍රියාකාරකම්වලටත්, පස්වන ශ්‍රේණියේ දී සිසු ලැදියා හා අවශ්‍යතාවලට ගැලපෙන වෛකල්පිත විෂයන්ටත් කාලසටහන තුළ ඉඩප්‍රස්ථා සැපයීම.
- ප්‍රාථමික අවධියේ දී යොදාගන්නා ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමවේද ප්‍රධාන වශයෙන් තෙවැදෑරුම් වේ.
  * සෙල්ලම් හා විනෝදජනක වැඩ
  * ක්‍රියාකාරකම්
  * අසුන්ගත වැඩ
- පළමුවන ප්‍රධාන අවධියේ දී සෙල්ලම් සහ ක්‍රියාකාරකම්වලට වැඩි බරක් ද අසුන්ගත වැඩවලට අඩු බරක් ද ලැබේ. මේ අන්දමට ප්‍රධාන අවධි තුන තුළ ඉගෙනුම් ඉගැන්වීමේ ක්‍රමවේද සැකසෙන ක්‍රම ක්‍රමයෙන් වෙනස් වීම.
- සිසු ඉගෙනුම් ප්‍රගතිය හා දුෂ්කරතා පිළිබඳ ව තොරතුරු රැස්කිරීම පිණිස අවිධිමත් තක්සේරු කිරීම් විධිවලට ප්‍රමුඛතාව දෙන අඛණ්ඩව කරගෙන යා යුතු පාසල් පාදක තක්සේරු කිරීම සඳහා ප්‍රමුඛත්වයක් ලැබෙන ඇගයීම් ක්‍රියාවලියක් පවත්වාගෙන යාම.
- සැමට අධ්‍යාපනය තහවුරු කර ගැනීම ඉලක්ක කර ගනිමින් ඒ සඳහා ප්‍රමිතියක් වශයෙන් එක් එක් ප්‍රධාන අවධි අවසානයේ දී සිසුන් විසින් අනිවාර්යයෙන් ම නිපුණතාව ප්‍රදර්ශනය කළයුතු අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා හඳුන්වා දීමට පියවර ගැනීම.
- එක් එක් ප්‍රධාන අවධියේ දී අපේක්ෂිත අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා පිළිබඳ ප්‍රවීණතාවක් සියලුම සිසුන්ට ලබාදීම ඉලක්ක කරගෙන එම එක් ප්‍රධාන අවධිය එකම ගුරුවරයකුගේ යටතට පත් කිරීමට අනුබල දීම.
- එක් සිසුවකුගේ සාධනය තවත් සිසුවකුගේ සාධනය සමග සසඳා තීරණ ගැනීමේ ක්‍රමයෙන් මිදී නිශ්චිත අරමුණක් හෝ නිර්ණායකයක් සමග සාධනය සසඳා තීරණ ගැනීමට සමත් නිර්ණායක මූලික තක්සේරු කිරීමේ ක්‍රම යොදා ගැනීමට අනුබල දීම.
- පළමුවන ප්‍රධාන අවධියේ සිසුන්ට 6වන ශ්‍රේණියේ සිසුන් සමග එක් වී සංවිධානාත්මකව ක්‍රියාකාරකම් සහ සැලසුම්ගත සෙල්ලම්වල යෙදීමට කාර්ය සංවිධානය කිරීම.
- 2007 වර්ෂයේ සිට පළමුවන ප්‍රධාන අවධියට දෙවන ජාතික භාෂාව හඳුන්වා දීම.
- 2007 වර්ෂයේ සිට ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි ගණිත විෂය සඳහා ද භාවිත කිරීම.

# ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

වර්ෂ 2016 සිට ක්‍රියාත්මක වීමට නියමිත මෙම (සංශෝධිත) ගුරු මාර්ගෝපදේශය සිසුන්ට වඩාත් අර්ථවත් මෙන් ම ගුණාත්මක බවින් යුතු ඉගෙනුමකට මග පෙන්වන ගුරු මාර්ගෝපදේශයක් ලෙස හඳුන්වා දිය හැකි ය.

සිසුන්ගේ ගුණාත්මක ඉගෙනුමක් සඳහා මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කළයුත්තේ කෙසේ ද යන්නට මගපෙන්වීමක් මෙමගින් සිදු කෙරේ.

මවුබස, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යන ප්‍රධාන විෂයයන් මෙන් ම දෙවන ජාතික භාෂාව, ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, සිසු ප්‍රගතිය තක්සේරු කිරීම, සෙල්ලම් මිදුල භාවිතය යන කොටස් මෙහි අන්තර්ගත කර ඇත. මේ හැරුණු විට ගණිත විෂය සහ ආගම් විෂයන් සඳහා වෙන් වෙන් වශයෙන් සකස් වූ ගුරු මාර්ගෝපදේශ ද වේ. ගණිත විෂය සඳහා ගණිත වැඩ පොතක් ද, මවුබස විෂය සඳහා පෙළපොතක් සමග වැඩපොතක් ද, ආගම් විෂය සඳහා පෙළපොතක් ද, පළමුවන ශ්‍රේණියේ ඉගෙනුම ලබන සිසුන් වෙනුවෙන් සකස් කර ඇත.

දරුවන් හඳුනා ගැනීමේ වැඩසටහන තුළින් අනාවරණය කරගන්නා තොරතුරුවලට අනුව සිසුන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා කිරීම සඳහා ඵලදායී ඉගෙනුමකට යොමුවීමට මෙම ගුරු මාර්ගෝපදේශය අර්ථවත් ව පරිශීලනය කිරීම අවශ්‍ය වේ. එබඳු සාර්ථකත්වයක් කරා ළඟාවීමට නම් මෙම ගුරු මාර්ගෝපදේශයෙහි අන්තර්ගත සියලු කරුණු හොඳින් කියවා අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වන අතර ඒ ඒ විෂය කොටස් යටතේ දෛනික ඉගැන්වීමේ කටයුතු සැලසුම් කර ගැනීමට ද එය ඔබට උපකාරීවනු ඇත.

මවුබස විෂය සඳහා එක් එක් පාසල් වාරයක දී ඉගැන්වීමට භාජනය කළ යුත්තේ කුමක් ද යන්න පැහැදිලිව ඔබට ඉදිරිපත් කර ඇත. මෙම විෂයේ දී සවන්දීම, කථාකිරීම, කියවීම, ලිවීම යන ක්ෂේත්‍ර අතර සමෝධානයක් සිදුවන බැවින් එක් එක් ක්ෂේත්‍රයකට අදාළ කොටස් වෙන වෙනම ඉගැන්වීමක් නොකළ යුතුය. මවුබස විෂයේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ඒ ඒ ක්‍රියාකාරකම්වලට උචිත අයුරින් පෙළපොත හා වැඩපොත සහය කර ගැනීම අනිවාර්ය වන අතර, එසේ නොවී පෙළපොත හා වැඩපොත අඛණ්ඩව කරගෙන යාමක් සිදුනොවිය යුතුය. තවද මෙහි සාර්ථකත්වය සඳහා වඩාත් අර්ථවත් මෙන් ම වඩාත් උචිත ඉගෙනුම් උපකරණ භාවිත කිරීම ද කළ යුතු වේ.

පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් යන විෂය ද ප්‍රාථමික විෂයමාලාවේ තවත් එක් ප්‍රධාන විෂයකි. සිසුනට සමීප භෞතික, ජෛව මෙන් ම සමාජ පරිසරය කෙරෙහි අවධානය යොමු කරමින් තේමා 16ක් හඳුනාගෙන ඇති අතර ඊට අදාළව ක්‍රියාකාරකම් සමූහයක් ඉදිරිපත් කර ඇත. මෙම විෂය සඳහා ගුරුවරයාට තිබෙන එකම මූලාශ්‍රය වන්නේ මෙම ගුරු මාර්ගෝපදේශයේ අන්තර්ගත කොටස පමණි. පරිසර ගවේෂණය, විද්‍යාව, සෞන්දර්ය, නිර්මාණ, ශාරීරික අධ්‍යාපන ක්‍රියාකාරකම්, සෞඛ්‍යය හා පෝෂණය වැනි විෂය ක්ෂේත්‍ර කිහිපයකින් සමන්විත වූ මෙම විෂය සමෝධානික මෙන් ම සම්බන්ධීකරණ විෂයක් ලෙස පුළුල් විෂය පරාසයක් ආවරණය කරමින් නිර්මාණය වී ඇත. මෙම සියලු කොටස් පිළිබඳ ව ගුරුවරයා මනා අවබෝධයකින් යුතුව කටයුතු කිරීම වැදගත් වේ.

නිර්මාණශීලී ගුරුවරයෙකුට මෙහි අන්තර්ගත ක්‍රියාකාරකම්වලට පමණක් සීමා නොවී නව ක්‍රියාකාරකම් සැලසුම් කර, සිසුනට වඩාත් ඵලදායී ඉගෙනුම් අවස්ථා උදාවන අයුරින් කටයුතු කිරීමට මෙම ගුරු මාර්ගෝපදේශය තුළ අවශ්‍ය තරම් ඉඩප්‍රස්ථා ඇත.

මිලදී ගනු ලබන ඉගෙනුම් සම්පත් වෙනුවට හැකිතාක් තම අවට පරිසරයෙන් සපයා ගත හැකි ස්වභාවික සම්පත් උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීම කෙරෙයි අවධානය යොමු කිරීම ද වැදගත් වේ. තවද අන්තර්ගත ක්‍රියාකාරකම්වලට ගැලපෙන විවිධ ඉගෙනුම් ක්‍රම භාවිත කරමින් සිසුන් ක්‍රියාකාරීව දායක කර ගනිමින් වින්දනාත්මක ඉගෙනුමට යොමුකරනු ඇතැයි ද අපේක්ෂා කෙරේ.

ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි, පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයේ දී මෙන් ම ගණිත විෂයයේදී භාවිත කිරීමට ඔබට අවස්ථා සලසා ඇත. ඉංග්‍රීසි භාෂාව සිසුන්ට හුරු කිරීම සඳහා එදිනෙදා භාවිතයට ගැනෙන වචන සහ වගන්ති පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයට අදාළ තේමා යටතේ අදාළ පරිදි ගොනුකර ඇත.

දෙවන ජාතික භාෂාව (දෙමළ) භාවිතය පිළබඳ ව ද මෙම ගුරු මාර්ගෝපදේශයෙහි මගපෙන්වීමක් කර ඇත. ඊට අදාළ විෂය නිර්දේශය සහ ක්‍රියාකාරකම් සමූහයක් ද ඉදිරිපත් කර ඇති අතර එය උචිත පරිදි ගලපා ගනිමින් හා සංවිධානය කර ගනිමින් සිසුන්ට ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. ක්‍රියාකරකම් පාදක වාචික ඉංග්‍රීසි සහ දෙවන ජාතික භාෂාව යන කොටස් ඉගැන්වීමේ දී උචිත ඉගෙනුම් සම්පත් භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ. මෙසේ සෑම විෂයකින් ම අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා කරා ළඟා වූයේ ද යන්න පිළිබඳ තක්සේරු කිරීමක් සිදුකර සිසුනට අවශ්‍ය මගපෙන්වීම් සඳහා උදව් ලබාදීමට ගුරුවරයා කටයුතු කළයුතු වේ.

අවිධිමත් මෙන්ම විධිමත් ව සිදුකරන තක්සේරු කිරීමේ ක්‍රියාවලිය තුළින් හඳුනා ගැනෙන සිසු ප්‍රබලතා හා දුබලතාවලට දෛනිකව සිදුකරන ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අවශ්‍ය මගපෙන්වීම් සිදුකරනු ඇතැයි අපේක්ෂා කෙරේ. සිසු තක්සේරු කිරීමට අදාළ තක්සේරු නිර්ණායක ඇතුළත් පත්‍රිකා මෙම ගුරු මාර්ගෝපදේශයේ ඇතුළත් කර ඇත.

මෙම කාර්යයේ සාර්ථකත්වය සඳහා ඒ ඒ විෂයන්ට අදාළ ව කාලය වෙන්කර ඇති අතර එම කාලය උපරිම අයුරින් ප්‍රයෝජනයට ගැනීමට ගුරුවරයා කටයුතු කළයුතු වේ.

පළමුවන ශ්‍රේණියට ප්‍රවේශවන දරුවන්ගේ ස්වභාවය එකිනෙකාට වෙනස්වන අතර ඉගෙනුම් රටා විවිධ ය. එමනිසා ඒ පිළිබඳ සංවේදී ව ඉහත දැක් වූ කරුණු සියල්ල පිළිබඳ ව සෑම ගුරුවරයෙක්ම අවධානය යොමු කරමින් සිසුන්ට මනාව හඳුනාගනිමින් ක්‍රියා කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**එම්. ඒ. ජී. ඩබ්ලිව්. කුලරත්න**
විෂයමාලා සම්බන්ධීකාරක
මුල් ළමාවිය සංවර්ධන හා ප්‍රාථමික
අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# කාලය බෙදා ගැනීම

## පළමු වන ප්‍රධාන අවධිය (පළමුවන සහ දෙවන ශ්‍රේණි)

| විෂයය | | සතියකට වෙන් කර ඇති කාලය |
|---|---|---|
| 1. | මව්බස | පැය 5.00 |
| 2. | ගණිතය | පැය 3.30 |
| 3. | පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් | පැය 5.30 |
| 4. | ආගම | පැය 1.15 |
| 5. | දෙවන ජාතික භාෂාව | මිනිත්තු 30 |
| 6. | උදය රැස්වීම සහ ආගමික වතාවත් | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 7. | විවේක කාලය | පැය 1.15 (දිනකට මිනිත්තු 15 බැගින්) |
| 8. | ආහාර ගැනීම සඳහා | මිනිත්තු 50 (දිනකට මිනිත්තු 10 බැගින්) |
| 9. | ශරීර සුවතා ක්‍රියාකාරකම් | පැය 1.40 (දිනකට මිනිත්තු 20 බැගින්) |
| 10. | විෂය සමගාමී ක්‍රියාකාරකම | මිනිත්තු 30 (සතියේ එක් දිනෙක) |
| | **සතියකට මුළු කාලය** | **පැය 21.15** |

## පළමුවන ශ්‍රේණිය - විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය

## පටුන


1.0 මව්බස (සිංහල) - හැඳින්වීම සහ විෂය නිර්දේශය

මව්බස - ගුරු මාර්ගෝපදේශය

2.0 පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - හැඳින්වීම සහ විෂය නිර්දේශය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් - ගුරු මාර්ගෝපදේශ

1 අපයි පාසලයි

2 අපේ ගෙදර

3 වත්තට එන සත්තු

4 ජලය සමඟ සෙල්ලම්

5 අවුරුදු කාලය

6 අපට පෙනෙන අහස

7 අප කන බොන දේ

8 තොරතුරු ලැබෙන හැටි

9 වටාපිටාවේ සිදුවන වෙනස්කම්

10 අපේ යහපැවැත්ම

11 අපට ඕනෑ දේ ලැබෙන හැටි

12 ගමන් බිමන්

13 එළිය (ආලෝකය) සමඟ සෙල්ලම්

14 මිනිසුන් වැඩ කරන තැන්

15 වටාපිටාවේ වෙනස් තැන්

16 අපේ උදවු ඕනෑ අය

3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

4.0 දෙවන ජාතික භාෂාව - විෂය නිර්දේශය හා ගුරු මාර්ගෝපදේශ

5.0 සෙල්ලම් මිදුල

6.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

7.0 අත්‍යාවශ්‍ය ඉගෙනුම් නිපුණතා


**ගණිතය, ආගම් සඳහා විෂය නිර්දේශ හා ගුරු අත්පොත් වෙන වෙනම ඉදිරිපත් කෙරේ.**

**පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවා හඳුනා ගැනීම සඳහා සකස් කරන ලද ගුරු උපදෙස් සංග්‍රහයක් ද වෙනම ඉදිරිපත් කෙරේ.**

# මව්බස (සිංහල)

## 1. හැඳින්වීම

මව්බස යනු පුද්ගලයකුගේ ජීවිතයේ මූලික අඩිතාලම සපයන ප්‍රමුඛතම මාධ්‍යය යි. මව්බස නිසි ලෙස නොදන්නේ නම් එය පුද්ගල ජීවිතයක සාර්ථකත්වය අරභයා විවිධ ප්‍රශ්න ඇති කරයි. එහෙයින් සමස්ත මානව ක්‍රියාවලිය ම උදෙසා 'මව්බස' නිසි ලෙස දැන සිටීම ඉතාමත් වැදගත් වේ.

මව්බස විෂයයක් ලෙස ඉගෙනීම පාසලේ පළමුවන ශ්‍රේණියේ සිට ම ආරම්භ වෙයි. එය සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය උදෙසා ම වැදගත් වෙයි.

සියලු විෂයයන් හැදෑරීමේ පදනම වන්නේ, මව්බස පිළිබඳව සිසුවා ලබන පරිචය යි. භාෂා දැනුමින් වියුක්ත ව අන් කිසිදු විෂයයක් පිළිබඳ මනා දැනුමක් ලබා ගැනීම උගහට ය.

එමෙන් ම පුද්ගල චින්තනයෙහි ලා තාර්කික බව, නිර්මාණශීලීත්වය උදෙසා මව්බස නිසි ලෙස ඉගෙනීම වැදගත් වේ. අනාගත තරගකාරී සමාජ ජීවිතයේ නොසැලෙන සහ නිවැරදි චින්තනයක් සහිත පුද්ගලයන් බිහි කිරීම උදෙසා මව්බස නිවැරදි ව දැන සිටීම හා මව්බස විෂයයේ හරය අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වෙයි.

මේ නිසා පාසල් විෂයමාලාවේ දී මව්බස විෂයයට ඉතාමත් වැදගත් තැනක් හිමි වෙයි. සවන්දීම, කතා කිරීම, කියවීම, ලිවීම යන චතුර්විධ ක්ෂේත්‍ර අරභයා මව්බස විෂයය ව්‍යාප්ත වෙයි. මෙම චතුර්විධ ක්ෂේත්‍ර සමෝධානිත ව ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියේ දී යොදා ගැනෙයි.

මව්බස ගුරු මාර්ගෝපදේශයෙහි සැලසුම්ගත සෙල්ලම්, විනෝදජනක වැඩ, ක්‍රියාකාරකම් මගින් පළමු ශ්‍රේණියේ සිසුන්ට නිර්මාණශීලී සහ තර්කානුකූල ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කර ඇත. එමෙන් ම සාහිත්‍යය මගින් සිසුන්ගේ මනස රසඥතාවයෙන් සුපෝෂණය කරලීමත්, ඉගෙනුම් අවස්ථා ලබා දීමත් සිදු කර ඇත. එමෙන් ම,

- ප්‍රියමනාප හා රුචිකත්වයක් සහිත විෂයයක් ලෙස මව්බස විෂයය කෙරෙහි ආකල්ප ඇති කර ගැනීම
- නිවැරදි අවබෝධයකින් යුතු ව භාෂාව හැසිරවීම
- ආත්ම විශ්වාසයකින් යුතු ව අදහස් හා සිය මතය ප්‍රකාශ කිරීම
- මූලික භාෂාමය හරය අවබෝධ කර ගැනීම
- නිර්මාණශීලී චින්තනයකට මග විවර කිරීම
- තාර්කික චින්තනය තුළින් විෂය ප්‍රවීණතාවට සුදුසුකම් ලැබීම
- කාල්පනික චින්තනය තුළින් සාහිත්‍යමය වටපිටාවක් ඇති කර ගැනීම
- දෛනික සන්නිවේදන ක්‍රියාවලිය සාර්ථක කර ගැනීම සඳහා මව්බස නිවැරදි ව භාවිත කිරීම
- අනෙකුත් විෂයයන් ඉගෙනීම සඳහා මව්බස විෂයය උපයෝගී කර ගැනීම
- තවදුරටත් මව්බස විෂයයක් ලෙස ඉගෙනීම සඳහා අවශ්‍ය පදනම ලබා ගැනීම

යන අවස්ථාවලින් මව් භාෂාවක ප්‍රායෝගික වටිනාකම ද සළුත කෙරෙනු ඇත. ඒ අනුව මව්බස විෂයයේ පදනම නිවැරදි ව හා නිරවුල් ව ලබා දීම මගින් පුද්ගලයකුගේ අනාගත පෞද්ගලික, සමාජ හා වෘත්තීමය ජීවිතය සාර්ථක කර ගැනීමට අවශ්‍ය කුසලතා වර්ධනය කරලීමට හැකි වනු ඇත.

## 2. (අ) ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා අවශ්‍යතා සඳහා සවන් දීමේ, කතා කිරීමේ, කියවීමේ හා ලිවීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- කවි, ගී, කතන්දර අසා සහ කියවා රස විඳියි.
- නිවැරදි උච්චාරණය සහිත ව ශබ්ද නගා කියවයි.
- ක්‍රමවත් ව පැහැදිලි ව හා නිවැරදි ව ලියයි.
- සවන්දීම, කතා කිරීම, කියවීම හා ලිවීම සම්බන්ධ හොඳ පුරුදු ප්‍රදර්ශනය කරයි.
- පොත්පත් කියවා තේරුම් ගනියි. රස විඳියි.
- තම අත්දැකීම් වාර්තා කිරීමේ හා අදහස් නිර්මාණාත්මක ව ප්‍රකාශ කිරීමේ හැකියා ප්‍රදර්ශනය කරයි.
- සමූහයක් ඉදිරිපිට තම අදහස් සුහද ව, නිරවුල් ව හා ආචාරශීලී ව ඉදිරිපත් කරයි.

(ආ) **පළමුවන ශ්‍රේණියේ අපේක්ෂිත නිපුණතා**

- වින්දනාත්මක ව හා අවබෝධයෙන් යුතු ව සවන් දෙයි.
- අවශ්‍ය කරුණු විමසා දැන ගනියි.
- වාචික ව තම අදහස් ප්‍රකාශ කරයි.
- නිවැරදි ව උච්චාරණය කරමින් කියවයි.
- කියවා අවබෝධ කර ගනියි.
- ලිවීමේ ශිල්පීය දක්ෂතා ප්‍රදර්ශනය කරයි.
- වචන නිවැරදි ව ලියයි.
- සරල අදහස් ලියා ප්‍රකාශ කරයි.

## 3. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පළමුවන ශ්‍රේණිය සඳහා ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සැලසුම් කිරීමේ දී සැලසුම්ගත සෙල්ලම් සහ ක්‍රියාකාරකම් වැඩි වශයෙනුත්, අසුන්ගත වැඩ අඩුවෙනුත් යොදා ගැනෙන පරිදි සංවිධානය කිරීම අපේක්ෂා කෙරෙයි. තනිව කරන වැඩ, යුගල වශයෙන් කරන වැඩ, කුඩා කණ්ඩායම් වැඩ, විශාල කණ්ඩායම් වැඩ සහ පන්තිය ම කණ්ඩායමක් ලෙස ගෙන කරන වැඩ ලෙස ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීම වැදගත් වේ.

මූලික වශයෙන් ම මව්බස කියවීම සහ ලිවීමට සම්බන්ධ ක්‍රියාකාරකම් තනිව කිරීම ඉතාමත් ම වැදගත් වේ. මූලික කියවීමේ හා ලිවීමේ අවස්ථා තනි තනි ව සිසුන්ට ලබා දීමෙන් මූලික භාෂාමය දුර්වලතා මගහැරීමටත්, එක් එක් සිසුවා කෙරෙහි අවධානය යොමු කිරීමටත් හැකිවනු ඇත. එනමුත් මව්බස විෂයය සඳහා ඇති සෙසු ක්‍රියාකාරකම් යුගල හෝ කණ්ඩායම් ක්‍රියාකාරකම් ලෙස කළ හැකි ය.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සාහිත්‍යමය කොටස් සිසුන් එළිමහනට ගෙන ගොස් කිරීම වඩාත් උචිත ය. ලබා දී ඇති ක්‍රියාකාරකම් සාර්ථක ව ඉටු කිරීමෙන් සිසුන් තුළ ආත්ම විශ්වාසය ඇති වන අතර, තවදුරටත් එම ක්‍රියාකාරකමෙහි නිරත වීමට එය පෙලඹවීමක් වනු ඇත. ක්‍රියාකාරකම්වල යෙදීමෙන් ලබා ගන්නා නිපුණතා අසුන්ගත වැඩ තුළින් තවදුරටත් තහවුරු කළ හැකි ය. එමෙන් ම ඉගෙනුම් උපකරණ භාවිතය ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අනිවාර්ය වෙයි.

ක්‍රියාකාරකම් සිදු කිරීමේ දී අවශ්‍ය තැන්වල දී පෙළපොත සහ වැඩපොත යොදා ගත යුතු ය. එමෙන් ම සෑම සිසුවෙක් කෙරෙහි ම ගුරුවරයා අවධානය යොමු කළ යුතු අතර, සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කළ යුතු ය. එසේ අභ්‍යාස පොත් පරීක්ෂා කරන අතර වැරදි වෙතොත් ඒ අවස්ථාවේ දී ම සිසුවාට පැහැදිලි කර නිවැරදි කළ යුතු ය. අකුරු, වචන, වාක්‍ය කියවීම හා ලිවීම සෑම සිසුවෙකු ලවා ම සිදු කළ යුතු අතර, ඔවුන්ගේ නිවැරදි උච්චාරණය හා නිවැරදි ලිවීම පිළිබඳ සැලකිලිමත් විය යුතු ය. වැරදි සමඟ සිසුවා ඉදිරියට නොයා යුතු ය. එහෙයින් සෑම සිසුවෙකුගේ ම දුර්වලතා අවම කිරීමට එකී අවස්ථා හඳුනාගත් මොහොතේ සිට ම ක්‍රියා කළ යුතු ය.

සිසුන්ට 'ගෙදර වැඩ' ලබාදිය යුත්තේ ද ඉගෙනුම් අවස්ථා තහවුරු කරලීම හා දුර්වලතා අවම කරගැනීමට මිස අනවශ්‍ය බරක් නොවන පරිද්දෙන් ය. සෑම ක්‍රියාකාරකමට ම ගෙදර වැඩ ලබා දීම අපේක්ෂා නො කෙරෙයි.

මේ අනුව ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය සාර්ථක කර ගනු පිණිස ඉහත සඳහන් පරිදි ක්‍රියා කිරීම ඉතාමත් වැදගත් වේ.

## 4. පාසල් ප්‍රතිපත්ති සහ වැඩසටහන්

මව්බස විෂයය හා බැඳුණු වැඩසටහන් රැසක් පාසල තුළ ක්‍රියාත්මක වෙයි. මව්බස විෂයය පන්තිකාමරයට, කියවීම් පොතට සහ වැඩපොතට පමණක් සීමා නොකර බාහිර පරිසරයට ද මුදාහළ යුතු ය. මව්බස විෂයය යාන්ත්‍රික ව ඉගෙන ගන්නා ඉගෙනුම් න්‍යායවලින් පමණක් පෝෂණය වූවක් නො වේ. සමස්ත සමාජය ම මව්බස විෂයය හා බැඳුණකි.

පාසලේ උදෑසන රැස්වීම්, පන්ති රැස්වීම්, විවිධ ප්‍රසංග, ප්‍රදර්ශන, අවුරුදු උත්සවය, සිඟිති පොළ, ආගමික වැඩසටහන්, ගුරු දෙගුරු දින යනාදිය ඉන් කිහිපයකි.

එමෙන් ම පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ගායනා තරග, විවාද තරග, නාට්‍ය තරග, දැනුම මිනුම තරග, සතියේ චිත්‍රය පිළිබඳ අදහස්, බිත්ති පුවත්පත, පන්ති මට්ටමින් කතන්දර පොත් සැකසීම, පුස්තකාල පරිහරණයට අවස්ථා දීම යනාදී විවිධ අවස්ථා පාසල තුළ ක්‍රියාත්මක කළ හැකි ය. මෙම අවස්ථා තුළින් සිසුන් ඇගයීම ද අනිවාර්ය වේ.

## 5. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

මව්බස විෂය හදාරන සෑම සිසුවෙකු පිළිබඳ ව ම නිරන්තර අවධානය යොමු කිරීම ඉතා ම අවශ්‍ය වේ. මේ මගින් සිසුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් අවබෝධයක් ලැබීමත්, සිසුවාගේ දුබලතා, ගැටලු, දුෂ්කරතා පිළිබඳ ව අවබෝධයක් ලබා ගැනීමටත් හැකිවනු ඇත.

සිසුවාගේ ප්‍රගතිය සම්බන්ධයෙන් ලබන අවබෝධය තුළින් ඊට වඩා වැඩි ඉගෙනුම් අවස්ථා ලබා දීමට හැකිවනු ඇත. සිසුවාගේ ප්‍රබලතා, ගැටලු, දුෂ්කරතා පිළිබඳ ව ලබන අවබෝධය තුළින් එම දුර්වලතා, ගැටලු, දුෂ්කරතා මගහරවා ගැනීමටත් සිසුවාට සහය වීමට හැකිවනු ඇත.

මෙලෙස දරුවා පිළිබඳ තොරතුරු ලබා ගත යුත්තේ දෛනික ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී ය. මෙවන් අවිධිමත් තක්සේරු කිරීම් සිසුන්ගේ දුර්වලතා අවබෝධ කර ගැනීමට පහසු කරවනු ඇත.

සැලසුම්ගත සෙල්ලම්, ක්‍රියාකාරකම්, පෙළපොත හා වැඩපොත භාවිතයේ දී නිරීක්ෂණය, සාකච්ඡා, වාචික ප්‍රශ්න මගින් සිසුන් තනි තනිවත්, කණ්ඩායම් වශයෙනුත් ක්‍රියාකාරකම්වල නිරතවන අතර, ඒ මගින් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු රැස් කළ හැකි ය. මෙම තොරතුරු ක්‍රමවත් ව සටහන් කර ගැනීම ද ඉතාමත් වැදගත් වූවකි. මෙලෙස සටහන් තබා ගැනීම ඉතා නිවැරදි ව කළ යුතු අතර එය හුදෙක් තොරතුරු සටහන් කිරීමක් ලෙස පමණක් සිදු නොවිය යුතු ය. මෙම තොරතුරු සිසුවාගේ සමස්ත අධ්‍යාපන ක්‍රියාවලිය පිළිබඳ තීරණය ද වනු ඇත.

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| **පූර්ව භාෂා කුසලතා** | 1. ශ්‍රවණ විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | • විවිධ ශබ්ද අතුරින් භාෂාමය ශබ්ද තෝරා ගෙන සවන්දීම<br>• සාකච්ඡාවක කතා කරන පිරිස් නම් කිරීම<br>• වින්දනාත්මක ව සවන්දීම<br>• කතන්දරයකට සවන්දීම<br>• විධානවලට සවන්දීම හා ප්‍රතිචාර දැක්වීම<br>• අක්ෂර ශබ්දවලට සවන්දීම |
| | 2. දෘෂ්ටි විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි. | • සමාන රූප යා කිරීම/සම්බන්ධ කිරීම<br>• වෙනස් රූප හඳුනා ගැනීම<br>• රූප ගොනුවක වෙනස් රූපය හඳුනා ගැනීම<br>- අඩුවක් ඇති රූපය<br>- වැඩි යමක් ඇති රූපය<br>- පිහිටීමේ දිශාව අනුව වෙනස් රූපය<br>- පිහිටි ස්ථානය අනුව වෙනස් රූපය<br>- පින්තූර දෙකක් අතර අවම වශයෙන් වෙනස්කම් තුනක් හඳුනා ගැනීම<br>• අක්ෂර රූප අතර සියුම් වෙනස්කම් හඳුනා ගැනීම |
| | 3. මනෝචාලක සංවර්ධනය සඳහා කුසලතා ප්‍රදර්ශනය කරයි. | • විශාල මාංශ පේශි සංවර්ධනය සඳහා අභ්‍යාස<br>- බෝල ගැසීම<br>- රෝද පෙරලීම, ඇටමලු ක්‍රීඩා<br>• සියුම් මාංශ පේශී සංවර්ධනය සඳහා අභ්‍යාස<br>- ඉරීම, කැපීම, ඇමිණීම, ඇලවීම<br>- ගුළි කිරීම, ඇනීම, ගෙතීම, ඇසිරීම<br>- ඇඳීම, පාට කිරීම, නැමීම, රැලි කිරීම<br>• වමේ සිට දකුණට ඇස ගෙන යාමේ අභ්‍යාස<br>• ඇස් සහ අත් සමායෝජනය සඳහා අභ්‍යාස |
| | 4. පෙර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | • පින්තූර පොත් හා පින්තූර කියවීම<br>• කේවල පින්තූර නම් කිරීම<br>• එක ම අකුරෙන් ආරම්භ වන පින්තූර නම් කිරීම<br>• අකුරු රූප යා කිරීම |
| | 5. පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | • සීමාවක් තුළ පාට කිරීම<br>• ද්‍රව්‍ය වටා ඇඳීම<br>• රේඛාවක් භාවිතයෙන් පාර සෙවීම<br>• තිත් ඉරි හෝ කඩ ඉරි යා කර රූප ඇඳීම<br>• අත්වල ඇඟිලි වටා ඇඳීම<br>• අකුරුවලට අදාළ හැඩ තිත් ඉරි මත ඇඳීම<br>• අකුරුවලට අදාළ හැඩ බලා ඇඳීම<br>• අකුරුවලට අදාළ හැඩ රටා ඇඳීම<br>• අකුරක හැඩය ඉවත් කරන ලද අවකාශයේ ඇඳීම<br>• අකුරු හැඩ භාවිතයෙන් රටා නිර්මාණය කිරීම<br>• වැලි කඩදාසියේ අකුරු මත ඇඳීම (0, 1/2, 1) |

**L** සවන්දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_1$ $S_1$ | $L_1$ අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන්දෙයි. | $L_1$ • පවසන දෙයට සවන්දීම<br>• පින්තූර බලා පවසන දෙයට සවන්දීම<br>• කතන්දරවලට සවන්දීම<br>• පින්තූර කතාවලට සවන්දීම |
| | $S_1$ අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිතව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි. | $S_1$ • නිදහසේ කතා කිරීම<br>• පින්තූර බලා කතා කිරීම<br>• නිදහසේ කතන්දර කීම<br>• පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම |
| $R_1$ $W_1$ | $R_1$ කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි. | $R_1$ • කියවීමට සූදානම් වීම<br>- කියවීම සඳහා අසුන් ගැනීම සහ පොත තබා ගන්නා ආකාරය<br>• පිල්ලම් රහිත අකුරු කියවීම<br>• පිල්ලම් රහිත අකුරු එකතු කර වචන කියවීම<br>• පිල්ලම් රහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිල්ලම් සහිත අකුරු කියවීම<br>• පිල්ලම් සහිත අකුරු එකතු කර වචන කියවීම<br>• පිල්ලම් සහිත සරල වාක්‍යාංශ කියවීම<br>• පිල්ලම් සහිත සරල වැකි කියවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව කියවීම |
| | $W_1$ සම්මත නිවැරදි ක්‍රමයට ලියයි. | $W_1$ • ලිවීමට සූදානම් වීම<br>- නිවැරදි ව අසුන් ගැනීම<br>- නිවැරදි ව පැන්සල ඇල්ලීම<br>- නිවැරදි ව පොත තබා ගැනීම<br>• පිල්ලම් රහිත අකුරු ලිවීම<br>• පිල්ලම් රහිත අකුරු එකතු කර වචන ලිවීම<br>• පිල්ලම් රහිත සරල වාක්‍යාංශ ලිවීම<br>• පිල්ලම් සහිත අකුරු ලිවීම<br>• පිල්ලම් සහිත අකුරු එකතු කර වචන ලිවීම<br>• පිල්ලම් සහිත සරල වැකි ලිවීම<br>• නැවතීමේ ලකුණ යොදා ලිවීම |
| $L_2$ $S_2$ $R_2$ $W_2$ | $L_2$ සවන්දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන්දෙයි. | $L_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| | $S_2$ කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි. | $S_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| | $R_2$ කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි. | $R_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |

**L** සවන්දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | $W_2$ ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි. | $W_2$ • අකුරු දෙකේ වචන<br>• අකුරු තුනේ වචන<br>• අකුරු හතරේ වචන |
| $L_3$ $S_3$ | $L_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් සවන් දෙයි. | $L_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• අනුකරණය |
| | $S_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් කතා කරයි. | $S_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• අනුකරණය |
| $R_3$ $W_3$ | $R_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් කියවයි. | $R_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස් |
| | $W_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් ලියයි/අඳියි. | $W_3$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• ඇඟිලි රූකඩ දෙබස්<br>• චිත්‍ර (ළමා ගීත හා ළමා කතන්දර සම්බන්ධ) |
| $L_4$ $S_4$ $R_4$ $W_4$ | $L_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා සවන්දෙයි. | $L_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු |
| | $S_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කතා කරයි. | $S_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු |
| | $R_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා කියවයි. | $R_4$ • පාසල හා නිවස සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු<br>- තමා පිළිබඳ විස්තර |
| | $W_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කර ගැනීම සඳහා ලියයි. | $W_4$ • පාසල, නිවස හා සම්බන්ධ<br>- උපදෙස්<br>- තොරතුරු<br>- තමා පිළිබඳ විස්තර |
| $L_5$ $S_5$ $R_5$ $W_5$ | $L_5$ වාංමාලා සංවර්ධනය සඳහා සවන්දෙයි. | $L_5$ • කතන්දර<br>• තේරවිලි<br>• කියවන විට ලිවීම (තෝරාගත් වචන) |
| | $S_5$ වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි. | $S_5$ • කතන්දර<br>• තේරවිලි |

L සවන් දීම S කතා කිරීම R කියවීම W ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| | $R_5$ වාංමාලා සංවර්ධනය සඳහා කියවයි. | $R_5$<br>• කතන්දර<br>• තේරවිලි<br>• සංකේත<br>• කියවන විට ලිවීම (තෝරා ගෙත් වචන) |
| | $W_5$ වාංමාලා සංවර්ධනය සඳහා ලියයි. | $W_5$<br>• කතන්දරවල අන්තර්ගත වචන<br>• තේරවිලි<br>• සංකේත<br>• කියවන විට ලිවීම (තෝරා ගත් වචන) |
| $L_6$ $S_6$ | $L_6$ සන්නිවේදනය සඳහා සවන්දෙයි. | $L_6$<br>• යහළුවන්<br>• ගුරුවරුන්<br>• වෙළෙඳපොළ (සංවාද)<br>• දුරකථන (සංවාද) |
| | $S_6$ සන්නිවේදනය සඳහා කතා කරයි. | $S_6$<br>• යහළුවන්<br>• ගුරුවරුන්<br>• වෙළෙඳපොළ (සංවාද)<br>• දුරකථන (සංවාද) |
| $R_6$ $W_6$ | $R_6$ සන්නිවේදනය සඳහා කියවයි. | $R_6$<br>• ද්‍රව්‍යවල නම් (පන්ති කාමරය)<br>• මිල සටහන්<br>• ලේබල් |
| | $W_6$ සන්නිවේදනය සඳහා ලියයි. | $W_6$<br>• ද්‍රව්‍යවල නම් (පන්ති කාමරය)<br>• මිල සටහන්<br>• ලේබල් |
| $S_7$ $L_7$ $R_7$ $W_7$ | $S_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කතා කරයි. | $S_7$<br>• පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $L_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා සවන්දෙයි. | $L_7$<br>• පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $R_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි. | $R_7$<br>• පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |
| | $W_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා ලියයි. | $W_7$<br>• පින්තූර<br>• ජන ක්‍රීඩා<br>• උත්සව |

**L** සවන් දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $L_8$ $S_8$ $W_8$ $R_8$ | $L_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන්දෙයි. | $L_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $S_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි. | $S_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $W_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි. | $W_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| | $R_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි. | $R_8$ • අඳින ලද චිත්‍ර<br>• චාරිකා<br>• සහභාගි වූ අවස්ථාවක් |
| $L_9$ $S_9$ | $L_9$ අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන්දෙයි. | $L_9$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සතුන්)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා පොත් |
| | $S_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථාවෝචිත ව කතා කරයි. | $S_9$ • ළමා කවි/ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සතුන්)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා පොත් |
| $R_9$ $W_9$ | $R_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථාවෝචිත ව කියවයි. | $R_9$ • ළමා ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සතුන්)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා පොත් |
| | $W_9$ අවබෝධ කර ගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථාවෝචිත ව ලියයි. | $W_9$ • ළමා ගීත<br>• ළමා කතන්දර<br>• දෙබස්<br>• තොරතුරු (සතුන්)<br>• ළමා වෙබ් අඩවි<br>• ළමා පොත් |

**L** සවන් දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

| ක්ෂේත්‍රය | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| $S_{10}$ $L_{10}$ $R_{10}$ | $S_{10}$ | $S_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා |
| | $L_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි. | $L_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා |
| | $R_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන්දෙයි.<br><br>සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා කියවයි. | $R_{10}$ • මාතෘකාවකට අනුව විස්තර කිරීම<br>• පින්තූර කතා<br>• භාෂා අභ්‍යාස<br>- සමානාර්ථ පද<br>- විරුද්ධාර්ථ පද<br>- ගැහැනු පිරිමි හඟවන පද<br>- ඒකවචන හා බහුවචන පද |
| $W_{10}$ | $W_{10}$<br><br>සම්මත භාෂා ව්‍යවහාර හා භාෂා අභ්‍යාස සඳහා ලියයි. | $W_{10}$ • භාෂා අභ්‍යාස<br>- අකුරු හඳුනා ගැනීම<br>- අකුරු එකතු කර වචන සකස් කිරීම<br>- රූපවලට වචන යා කිරීම<br>- සමානාර්ථ පද<br>- විරුද්ධාර්ථ පද<br>- ගැහැනු පිරිමි හඟවන පද<br>- ඒකවචන හා බහුවචන පද<br>- හරි වැරදි යෙදීම<br>- හිස්තැන් පිරවීම<br>- වාක්‍යාංශ<br>- සරල වැකි<br>- ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම |

**L** සවන් දීම **S** කතා කිරීම **R** කියවීම **W** ලිවීම

## වර්ෂය තුළ මව්බස විෂයය ක්‍රියාත්මක විය යුතු ආකාරය

| වාරය | නිපුණතාව | විෂය අන්තර්ගතය | දින ගණන |
|---|---|---|---|
| පළමුවන වාරය | 1. ශ්‍රවණ විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>2. දෘෂ්ටි විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>3. මනෝචාලක සංවර්ධන සඳහා කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>4. පෙර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.<br>5. පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි. | | 30 |
| | $L_1$ $S_1$ | • පවසන දෙයට සවන්දීම<br>• පින්තූර බලා පවසන දෙයට සවන්දීම<br>• නිදහසේ කතා කිරීම<br>• පින්තූර බලා කතා කිරීම | 30 |
| | $R_1$ $W_1$ | • පිලි රහිත අකුරු කියවීම හා ලිවීම (මධ්‍ය අක්ෂර පමණි)<br>• පිලි රහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම | |
| දෙවන වාරය | $L_1$ $S_1$ | • කතන්දරවලට සවන්දීම<br>• පින්තූර කතාවලට සවන්දීම<br>• නිදහසේ කතන්දර කීම<br>• පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම | 20 |
| | $R_1$ $W_1$ | • පිලි රහිත අකුරු කියවීම හා ලිවීම (ආරෝහණ හා අවරෝහණ අක්ෂර)<br>• පිලි රහිත වචන කියවීම හා ලිවීම<br>• පිලි රහිත වාක්‍යාංශ හා වැකි ලිවීම<br>• පිලි සහිත අකුරු, වචන කියවීම හා ලිවීම (දීර්ඝ පාපිල්ලෙන් අවසන් කළ යුතුය)<br>• පිලි සහිත සරල වාක්‍යාංශ, වැකි කියවීම හා ලිවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව කියවීම හා නැවතීමේ ලකුණ යොදා වැකි ලිවීම | 40 |

| වාරය | නිපුණතාව | විෂය අන්තර්ගතය | දින |
|---|---|---|---|
| තුන්වන වාරය | $R_1$ $W_1$ | • පිලි සහිත අකුරු කියවීම හා ලිවීම (ඉතුරු පිලි හතර)<br>• පිලි සහිත අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම<br>• පිලි සහිත වචන එකතු කර වාක්‍යාංශ, වැකි කියවීම හා ලිවීම<br>• නැවතීමේ ලකුණට අනුගත ව කියවීම හා නැවතීමේ ලකුණ යොදා ලිවීම | 15 |
| | $L_2$ $S_2$ $R_2$ $W_2$<br>$L_3$ $S_3$<br>$R_3$ $W_3$<br>$L_4$ $S_4$ $R_4$ $W_4$<br>$L_5$ $S_5$ $R_5$ $W_5$<br>$L_6$ $S_6$<br>$R_6$ $W_6$<br>$S_7$ $L_7$ $R_7$ $W_7$<br>$L_8$ $S_8$ $W_8$ $R_8$<br>$L_9$ $S_9$ $R_9$ $W_9$<br>$L_{10}$ $S_{10}$ $R_{10}$<br>$W_{10}$ | | 50 |

මව්බස පාඩම් සැලසුමක් සකස් කිරීමේ දී නිපුණතාව, අන්තර්ගතය, ඉගෙනුම් පල, සම්පත්, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා ගතවන කාලය, ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාවලිය (සැකෙවින්), තක්සේරුකරණය යන කරුණු ඇතුළත් කිරීම වැදගත් වේ.

## නිපුණතාව : ශ්‍රවණ විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

ඉගෙනුම් පල : • ශබ්දවලට සවන්දීමෙන් ඒවායේ සියුම් වෙනස්කම් හඳුනා ගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:

- **විවිධ ශබ්ද අතරින් භාෂාමය ශබ්ද තෝරා ගෙන සවන්දීම**

ක්‍රියාකාරකම 01

පියවර 1 :
- මහා මාර්ගයක දී ඇසෙන ශබ්ද පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අධික ලෙස වාහනවල ශබ්ද ඇසෙන බව සාකච්ඡාව තුළින් ඉස්මතු කර ගන්න.
- වාහනවලින් ඇසෙන ශබ්ද මොනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- එම ශබ්ද අතර මිනිසුන් කතා කරන ශබ්ද ද තිබිය හැකි බවට පවසා සිසුන් දැනුවත් කරන්න.
- වාහන ශබ්ද අතර ඇසෙන භාෂාමය ශබ්දවලට සවන්දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- වාහන ශබ්ද අතර ඇසෙන භාෂාමය ශබ්ද මොනවා දැයි හඳුනා ගෙන ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 2 :
- මෙලෙස වෙළෙඳ පොළක් තුළ ඇසෙන විවිධ හඬ අතරින් භාෂාමය ශබ්ද හඳුනා ගැනීමටත්, ඒවා මොනවා දැයි ප්‍රකාශ කිරීමටත් අවස්ථාව දෙන්න.
- පාසල් පිට්ටනියක සිසුන්ගේ විවිධ හඬවල් අතරින් එකිනෙකා කතා කරන භාෂාමය ශබ්ද හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙවැනි විවිධ භාෂාමය ශබ්දවලට සවන්දීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- **සාකච්ඡාවක කතා කරන පිරිස් නම් කිරීම**

ක්‍රියාකාරකම 02

පියවර 1 :
- කෙටි සංවාදයකට සවන් දීමට යොමු කරන්න.

*උදා* :

| | | |
|---|---|---|
| **අම්මා** | : | දුව, එන්න බත් කන්න. |
| **දුව** | : | එනවා අම්මේ. |
| **තත්තා** | : | පුතා, ඔයත් එන්න බත් කන්න |
| **පුතා** | : | එනවා තාත්තෙ. |
| **අම්මා** | : | ඔව් ඔව් හැමෝම, එන්න බත් කන්න. |
| **තාත්තා** | : | අද කෑම හරි ම රසයි. |
| **දුව** | : | තාත්තේ, අයියා බත් ඉතුරු කරලා. |
| **තාත්තා** | : | පුතා සේරම බත් කන්න. |
| **අම්මා** | : | නෑ. නෑ. අයියා බත් සේරම කනවා. නේද පුතේ. |
| **තාත්තා** | : | ඔයලා දෙන්න ම හොඳ ළමයිනේ. |

- ඉහත සංවාදයේ සිටි අය කවුදැයි නම් කරන ලෙස සිසුන්ට පවසන්න.
- මෙවැනි සංවාද කිහිපයක් සැලසුම් කරගන්න.

- **වින්දනාත්මක ව සවන්දීම.**

ක්‍රියාකාරකම 03

- **ළමා ගීතවලට සවන්දීම.**
  - පහත ගීතය සිසුන්ට කිහිප වරක් සවන්දීමට අවස්ථාව ලබා දෙන්න.
  - එම ගීතයට අනුව තාල තැබීමටත් ගීතය ගායනයටත් සිසුන් යොමු කරන්න.

*උදා* : හිංචි පිංචි හාවා - යද්දි තනි වෙලා

පද රචනය : ක්ලෝඩ් ද සොයිසා
ගායනය : ශිරෝමාලා ප්‍රනාන්දු

- කතන්දරවලට සවන්දීම.

**ක්‍රියාකාරකම 04**

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- සිසුන් සමඟ වාඩි වෙන්න.
- පහත කතන්දරය සිසුන්ට පවසන්න.
- කතන්දරය ඇසුරෙන් සරල ප්‍රශ්න සිසුන්ගෙන් අසන්න.
- කතන්දරය ඇසුරෙන් ප්‍රශ්න අසමින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙවන් කතන්දර තවත් ඉදිරිපත් කර සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

*උදා :* කතන්දරය

**පුංචි සමනලයා**

දවසක් රෑ පුංචි සමනලයෙකුට ලොකු බඩගින්නක් ආවා. සමනලයා හිතුවා උදේ ම නැගිටලා මල් පැණි ටිකක් බොන්න යන්න ඕන කියලා. එයා උදේ වෙනකම් හිටියෙ හරිම නොඉවසිල්ලෙන්. යන්තම් ඉර එළිය වැටී ගෙන එන කොට ම එයා මල් තියෙන තැනක් හොයා ගෙන ගියා.

ඒත් එක ගහකවත් මලක් පෙනෙන්නවත් නෑ. සමනලයාට දැන්නම් බඩගින්න ඉවස ගන්න බැරි තරමට ම ඇවිත්. ඒත් එයා හිතට ධෛර්යය අරන් මල් තියෙන තැනක් හොයා ගෙන ඉගිලුණා. මෙහෙම යන අතරේ ලොකු රතු රෝස මලක් ඈතින් පෙනුණා. සමනලයාට හරි ම සතුටුයි.

සමනලයා තමන්ට හැකි තරම් වේගයෙන් රෝස මල ළඟට ඉගිලුණා. රෝස මලට ළං වෙන්න හදන කොට එයා දැක්කා ඒ රෝස මලෙන් පැණි බොන මී මැස්සෙක්. සමනලයා රෝස මලට ළං නොවී ඒ ළඟ තිබුණු ගසක කොළයකට ආවා. සමනලයාට හයියෙන් ඇඬුණා. සමනලයා අඬන ශබ්දය මී මැස්සාට ඇසුණා. මී මැස්සා පැණි බීම නවතා වටපිට බැලුවා. එතකොට දැක්කා අඬ අඬා ඉන්න සමනලයෙක්.

''ඇයි සමනල පැටියෝ ඔයා අඬන්නේ'' මී මැස්සා සමනලයා ළඟට ගොස් ඇසුවා.

''මට ගොඩක් බඩගිනියි. මම ගොඩක් දුර ඉඳන් ආවෙ. මට එක මලක්වත් හමු වුණේ නෑ. මම මෙච්චර දුරක් ඇවිත් දැක්කෙ මේ රෝස මල විතරයි. ඒත් ඔයා ඒකෙ පැණි බොනවනෙ. මම අඬන්නෙ, ඔයා පැණි බොන එකට නෙමෙයි. මට පැණි බොන්න වෙන මලක් හමුවුණේ නැති එකටයි.'' සමනලයා කිවුවා.

මී මැස්සාට සමනලයගේ කතාව අහල දුක හිතුණා. මී මැස්සා කිවුවා ''මම කවදාවත් මලක පැණි ඉවර වෙන්න ම බොන්නෙ නෑ. අනිත් අයටත් ඉතුරු කරලයි බොන්නෙ.'' කියලා. මී මැස්සා සමනලයාට ආදරෙන් කතා කරල රෝස මලේ පැණි බොන්න කිවුවා.

සමනලයා මී මැස්සාට ස්තුති කළා. රෝස මලෙන් පැණි බීලා බඩගින්න නැති කර ගත්තා.

සමනලයා මලෙන් පැණි බිවුවාට පස්සෙ මී මැස්සයි සමනලයයි සතුටින් කතා කළා. ඒ දෙන්නා හොඳ යාළුවෝ වුණා.

- විධානවලට සවන්දීම හා ප්‍රතිචාර දැක්වීම

**ක්‍රියාකාරකම 05**

පියවර 1 : • පහත විධානවලට සවන් දී එම ක්‍රියාකාරකම් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
*උදා :* නැගිටින්න, අත් ඔසවන්න, අත් පහළට දමන්න, වාඩි වෙන්න.

**පියවර 2 :** (එළිමහන් ක්‍රියාකාරකමකි)

- සිසුන් යුගල කරන්න.
- පහත සඳහන් විධාන ලබා දෙන්න.

  උඩ පනින්න, වාඩි වෙන්න, නැගිටින්න, අත් අල්ලා ගන්න, එක අතක් අතහරින්න, දුන් අනිත් අතත් අතහරින්න

**පියවර 3 :** (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- සිසුන් යුගල කරන්න.
- එකිනෙකාට මුහුණලා සිටීමට සලස්වන්න.
- පහත සඳහන් විධාන ලබා දෙන්න.

  යහළුවාට අතට අත දෙන්න, අත් දෙක අතහරින්න. යහළුවාගේ උරහිසට එක අතක් තබන්න. අත් පහළට දමන්න. යහළුවාගේ වටේ රවුමක් දුවන්න.
- විධානවලට නිවැරදි ව ප්‍රතිචාර ලබා දෙන්නේ දැයි නිරීක්ෂණය කරන්න.

- **අක්ෂර ශබ්දවලට සවන්දීම**

**ක්‍රියාකාරකම 06**

**පියවර 1 :** (එළිමහන් ක්‍රියාකාරකමකි.)

- ගුරුවරයා (අ) ශබ්දය කියූ විට අත්දෙක ළං කිරීමටත් (ආ) කියූ විට අත්දෙක ඈත් කිරීමටත් සිසුන්ට උපදෙස් දෙන්න.
- මෙලෙස අනෙක් කෙටි ශබ්දවලට අත් ළං කිරීමටත් දීර්ඝ ශබ්දවලට අත්දෙක ඈත් කිරීමටත් උපදෙස් දෙන්න.
- ශබ්ද මාරු කරමින් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

  *උදා :* ඇ ඈ, ඉ ඊ, උ ඌ, එ ඒ, ඔ ඕ

## නිපුණතාව : දෘෂ්ටි විභේදන කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල:**
- රූප දෙස බලා එහි සුවිශේෂතා හඳුනා ගෙන ලකුණු කරයි.
- අක්ෂර රූප දෙස බලා සියුම් වෙනස්කම් අවබෝධ කර ගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:


- සමාන රූප යා කිරීම/සම්බන්ධ කිරීම

**ක්‍රියාකාරකම 01**

- පහත සඳහන් ආදර්ශ අභ්‍යාස අනුව සිසුන්ට ලබා දීම සඳහා පිටපත් සකස් කර ගන්න.
- එක් එක් අභ්‍යාස කිරීමට පළමුව කළ යුත්තේ කුමක් දැයි සිසුන්ට සරල ව පැහැදිලි කරන්න.
- ක්‍රියාකාරකම කරන විට සෑම සිසුවෙකු කෙරෙහි ම අවධානය යොමු කරන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පරීක්ෂා කර වැරදි තැන් වෙතොත් සිසුන්ට සරල ව පැහැදිලි කොට එම අවස්ථාවේ දී ම නිවැරදි කරවන්න.
- මෙවැනි තවත් අභ්‍යාස ලබා දී සිසුන්ගේ දෘෂ්ටි විභේදන කුසලතා වර්ධනය කරන්න.

**අභ්‍යාස අංක 01 -**

උදා : සමාන රූපය තෝරා යා කරන්න.




**පියවර 1: • අඩුවක් ඇති රූපය හඳුනා ගැනීම**

**අභ්‍යාස අංක 02**

අඩුවක් ඇති රූපය යටින් ඉරක් අඳින්න.

උදා:




**පියවර 2 :• වැඩි යමක් ඇති රූපය**

**අභ්‍යාස අංක 03**

වැඩි දෙයක් ඇති රූපය පාට කරන්න.

උදා:




පියවර 3 : • පිහිටීමේ දිශාව අනුව වෙනස් රූපය

අභ්‍යාස අංක 04

පිහිටීමේ දිශාව අනුව වෙනස් රූපය සොයන්න.
ඒ වටා රවුමක් අඳින්න.

උදා :




පියවර 4 : • පිහිටීමේ ස්ථානය අනුව වෙනස් රූපය

අභ්‍යාස අංක 05

පිහිටීමේ ස්ථානය අනුව වෙනස් රූපය සොයන්න.
ඒ වටා රවුමක් අඳින්න.

උදා :




- පින්තූර දෙකක් අතර අවම වශයෙන් වෙනස්කම් තුනක් හඳුනා ගැනීම


ක්‍රියාකාරකම 02

- පළමුවන චිත්‍රය දෙස බලා දෙවන චිත්‍රයේ අඩු තැන් පාට පැන්සලකින් අඳින්න.
- මෙලෙස තවත් චිත්‍ර ලබා දී මෙවන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

අභ්‍යාසය 06 - 1 චිත්‍රය



අභ්‍යාසය 07 - 2 චිත්‍රය




- අක්ෂර රූප අතර සියුම් වෙනස්කම් හඳුනා ගැනීම

ක්‍රියාකාරකම 03

වෙනස් රූපය රවුම් කරන්න.


අභ්‍යාසය 08

උදා :




අභ්‍යාසය 09

උදා :



## නිපුණතාව : මනෝචාලක සංවර්ධනය සඳහා කුසලතා ප්‍රදර්ශනය කරයි.

ඉගෙනුම් පල:
- සිරුර, අත්, පා සහ ඇඟිලි නිදහසේ චලනය කිරීමෙන් මනෝචාලක කුසලතා ප්‍රදර්ශනය කරයි.
- ඇස් සහ අත් සමායෝජනය කරමින් අභ්‍යාසයේ යෙදෙයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:


**විශාල මාංශ පේශී සංවර්ධනය සඳහා අභ්‍යාස**

* බෝල ගැසීම (එළිමහන් ක්‍රියාකාරකමකි.)

**ක්‍රියාකාරකම 01**

පියවර 1 :
- සිසුන්ට රවුමක් සැදෙන ලෙස උපදෙස් දෙන්න.
- 1, 2 යනුවෙන් සිසුන්ට ගණන් කිරීමට සලස්වන්න.
- 1 කියූ සිසුන් රවුමේ සිටිය දී, 2 කියූ සිසුන් රවුම මැදට ගන්න.
- කටින් හුලං පිරවිය හැකි තරමක් ලොකු බෝලයක් රවුම වටා සිටින සිසුවෙකුට ලබා දෙන්න.
- රවුම වටා සිටින එක් එක් සිසුන් බෝලය ගෙන රවුම මැද සිටින සිසුන්ගේ දණහිසෙන් පහළට ගැසීමට සලස්වන්න.
- මෙහි දී රවුම වටා සිටින සිසුන් බෝලයෙන් ගැසීමත්, රවුම මැද සිටින සිසුන් බෝලය වැදීමෙන් බේරීමත් සිදු කළ යුතු බවට උපදෙස් දෙන්න.
- දණහිසෙන් පහළට බෝලය වැදුණු සිසුන් රවුමෙන් ඉවත් වී ක්‍රීඩාව නැරඹීමට උපදෙස් දෙන්න.
- මෙලෙස කණ්ඩායම් මාරු කරමින් සිසුන් ක්‍රීඩාවෙහි යොදවන්න.

පියවර 2 :
- කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.
- කණ්ඩායම් දෙකේ සිසුන් සිරස් අතර පේළි දෙකකට සිටීමට සලස්වන්න. (තරගයක ආකාරයට ක්‍රීඩාව කරන්නේ නම්, පේළි දෙකට සමාන සිසුන් සංඛ්‍යාවක් ගන්න.)
- රූප සටහනෙහි පරිදි කණ්ඩායම් දෙකේ ම ඉදිරියෙන් සිටින සිසුවාට ඉදිරියෙහි සලකුණු කළ ස්ථානයේ බෝල දෙක තබන්න.
- ගුරුවරයා සංඥාව දුන් පසු, ඉදිරියෙන් සිටින සිසුන් දෙදෙනාට බෝලයට පයින් ගැසීමට උපදෙස් දෙන්න.
- බෝලයට පයින් ගැසීමේ දී ඈතට යාම සීමා කිරීම සඳහා ඉදිරියෙන් තාප්පයක්/ බැම්මක්/ බිත්තියක් වැනි ස්ථානයක් තෝරා ගන්න.
- පහර දුන් සිසුවා විසින් බෝලය රැගෙන පෙර තිබූ ස්ථානයේ තබා, පේළියේ පිටුපසට ගොස් වාඩි වීමට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට ක්‍රීඩාව කළ පසු අඩු කාලයක් තුළ සියලු ම සිසුන් වාඩිවුණු කණ්ඩායම තරගයෙන් ජය ලබන බව පවසන්න.



* **රෝද පෙරළීම** (එළිමහන් ක්‍රියාකාරකමකි)

**ක්‍රියාකාරකම 02**

- සිසුන් යුගල කරන්න.
- සිසු යුගල අතර පරතරය මීටර 03ක් පමණ වන පරිදි සිසුන් ස්ථානගත කරන්න.
- එස්ලෝන් බටවලින් සාදා ගන්නා ලද වළලු සිසුන් දෙදෙනෙකුට එක බැගින් ලබා දෙන්න.
- එම වළල්ල එක් සිසුවෙක් අනෙක් සිසුවා දෙසට තල්ලු කර යැවීමට යොමු කරන්න.
- මේ ආකාරයට මාරුවෙන් මාරුවට දෙදෙනා එකතු වී දෙපැත්තට යැවීමට අවස්ථාව දෙන්න.
- මේ ආකාරයට සියලු ම සිසුන් ලවා ක්‍රියාකාරකම සිදු කරවන්න.
- ඉන්පසු දුර ප්‍රමාණය ඈත් කර මෙම ක්‍රියාකාරකම දිගට ම සිදු කරන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා බයිසිකල් හෝ ත්‍රීවීල් රෝද ද යොදා ගත හැකි ය.
- ඉහත සඳහන් බෝල ගැසීම ක්‍රියාකාරකමෙහි 2 වන පියවර සිදුකළ ආකාරයට බිත්තිය වෙනුවට ළදරු පුටුවක් තබා රෝද පෙරළීමේ ක්‍රීඩාවක් සැලසුම් කර ගන්න.

* **ඇට මලු ක්‍රීඩා**

**ක්‍රියාකාරකම 03**

පියවර 1 :
- අඟල් 6ක් දිග අඟල් 4ක් පළල රෙදි කැබැල්ලකින් උරයක් සාදා ඇට වර්ගයක් පුරවා මල්ලේ කට බැඳ 'ඇට මල්ලක්' සකස් කර ගෙන ඒමට සිසුන් දැනුවත් කරන්න.
- එක් එක් සිසුවා විසින් ගෙන ආ ඇට මල්ල නිදහසේ උඩ දමා ඇල්ලීමට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව වම් අතින් උඩ දමා දකුණු අතින් ඇල්ලීමටත් දකුණු අතින් උඩ දමා වම් අතින් ඇල්ලීමටත් සිසුන් යොමු කරන්න.

පියවර 2 :
- සිසුන් යුගල කරන්න.
- එක් ඇට මල්ලක් බැගින් සිසු යුගලවලට ලබා දෙන්න.
- සිසු යුගලය යම් දුර ප්‍රමාණයක් ඈත් කර ඇටමල්ල ඇල්ලීමට දෙන්න.
- මෙහි දී ක්‍රමයෙන් දුර ප්‍රමාණය වැඩි කර ක්‍රීඩාවක් ලෙසට සිදු කරන්න.

පියවර 3 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමක එක් සිසුවෙකු කණ්ඩායම මැදට ගෙන අන් අය අතට ඇටමල්ල දැමීමටත්, නැවත තමා වෙත ලබා ගැනීමටත් අවස්ථාව දෙන්න.
- මෙලෙස සෑම සිසුවෙකු ම රවුම මැදට ගෙන ඇටමල්ල අන් අය අතට දැමීමට පවසන්න.
- අනතුරුව කණ්ඩායමේ සිසුන් රවුමක් ලෙසට සිටගෙන ආරම්භක සිසුවාගෙන් ළඟ සිටින සිසුවාටත්, එම සිසුවා අනෙක් සිසුවාටත් යනාදී ලෙස ඇටමල්ල අතින් අත දැමීමට යොමු කරන්න.

## සියුම් මංශ පේශී සංවර්ධනය සඳහා අභ්‍යාස

* **ඉරීම**

**ක්‍රියාකාරකම 01**

- සෑම සිසුවෙකුට ම ඩිමයි කොළයකින් 1/4ක් බැගින් ලබා දෙන්න.
- ඩිමයි කොළය තීරුවලට ඉරන ආකාරය සිදුකර පෙන්වන්න.
- ඩිමයි කොළය ඉරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- උදවු අවශ්‍ය සිසුනට සහය වන්න.
- සුදු පැහැති බ්‍රිස්ල් බෝඩ්වලින් කපන ලද තරමක් විශාල රවුමක මිනිස් මුහුණක් ඇඳ සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- සිසුන් ඉරන ලද ඩිමයි තීරුවලින් මුහුණේ රැවුල ඇලවීමට යොමු කරන්න.
- සිසුන් නිර්මාණය කළ මුහුණ ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.




* කැපීම

**ක්‍රියාකාරකම 02**

පියවර 1 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පාට $A_4$ කොළයකින් 1/4ක පමණ ප්‍රමාණයක් සිසුන්ට ලබා දෙන්න.
- සිසුන් කැමති හැඩ කැපීමට අවස්ථාව දෙන්න.
- සිසුන් කොළය කපන අයුරු නිරීක්ෂණය කරන්න.
- කැපීමට අපහසුතා ඇති සිසුන්ට එම අවස්ථාවේ දී ම සහය වන්න.
- සිසුන් කපා අවසන් කළ හැඩ බිමයි කොළ මත අලවා ප්‍රදර්ශනය කරන්න.

පියවර 2 :
- පාට $A_4$ කොළයක් සහ සෙන්ටිමීටර් පහක් පමණ පළල බ්‍රිස්ල් බෝඩ් පටියක් සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා විසින් $A_4$ කොළයකින් රැලි කපන අයුරු සිසුන්ට කර පෙන්වන්න.
- සිසුන්ට ද $A_4$ කොළයෙන් රැලි කැපීමට අවස්ථාව දෙන්න.
- පළමු රූපයේ සඳහන් පරිදි එක් එක් සිසුවා විසින් කපන ලද රැලි පටි ලබා දී ඇති බ්‍රිස්ල් බෝඩ් පටියෙහි ඇලවීමට උපදෙස් දෙන්න.
- සිසුන් විසින් රැලි අලවන ලද බ්‍රිස්ල් බෝඩ් ගෙන දෙවන රූපයේ සඳහන් පරිදි නිර්මාණයක් සකස් කොට නූලක ආධාරයෙන් එල්ලා ප්‍රදර්ශනය කරන්න.




1 රූපය 2 රූපය

* ඇමිණීම

**ක්‍රියාකාරකම 03**

පියවර 1 :
- සිසුන්ටඉරටුවක් සහ කහමල්/අරලිය මල් ගෙන ඒමට පෙර දිනයේ උපදෙස් දෙන්න.
- සිසුන් ගෙනෙන ලද මල් කණ්ඩායම්වලට බෙදා දෙන්න.
- ඉරටුවට මල් ඇමිණීමට උපදෙස් දෙන්න.
- සිසුන් මල් අමුණන අයුරු නිරීක්ෂණය කරන්න.
- අපිළිවෙළට මල් අමුණන සිසුන්ට මල් පිළිවෙළට ඇමිණීමට සහය වන්න.
- සිසුන් විසින් ඇමිණූ මල් පොකුරක් ලෙස හෝ මල් බඳුනක් ලෙස ඉදිරිපත් කිරීමට උපදෙස් දෙන්න.

පියවර 2 :
- ගුරුවරයා විසින් අඟලක ප්‍රමාණයට කපන ලද විවිධ වර්ණයෙන් යුත් බීම බට කැබලි සිසුන්ට ලබා දෙන්න.
- විවිධ වර්ණ $A_4$ කොළවලින් කපන ලද සිදුරක් සහිත මල් ද එක් එක් සිසුන්ට ලබා දෙන්න. (රුපියල් දෙකේ කාසියක ප්‍රමාණය සෑහේ)
- කම්බි ලබා දීමේ දී සිහින් කම්බියක් ලබා දිය යුතු අතර, මල් ඇමිණූ විට බිමට නොවැටෙන පරිදි කම්බි සකස් කර දෙන්න.

- මලක් හා බීම බටයක් මාරුවෙන් මාරුවට කම්බියට අමුණන අයුරු ගුරුවරයා විසින් පැහැදිලි ව පෙන්වන්න.
- සිසුන්ට ද මල් සහ බීම බට කම්බිය පිරෙන තෙක් ඇමිණීමට අවස්ථාව දෙන්න.
- සෑම සිසුවෙක් ළඟට ම ගොස් ක්‍රියාකාරකම කරන අයුරු නිරීක්ෂණය කරන්න.
- උදවු අවශ්‍ය වන සිසුන්ට සහය වන්න.
- මල් ඇමිණූ පසු කම්බියේ දෙකෙළවර ගැට ගැසීමට සිසුන්ට සහය වන්න.
- සම්පූර්ණ කරන ලද "මල් වළලු" හිසෙහි පලඳා පහත කවිය ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.
- කවිය - මල් මල් මල් මල්
  පාට පාට මල්
  හරි ලස්සන මල්
  අපි ඇමිණූ මල්
- මල් වළල්ල



* ඇලවීම

**ක්‍රියාකාරකම 04**

පියවර 1 :
- ගුරුවරයා විසින් සුදු $A_4$ කොළයක, තරමක් විශාල ව අඳින ලද අඹ ගෙඩියක රූපය බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- කොළ පැහැ $A_4$ කොළ 1/2 බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම කොළය කුඩා කැබලිවලට ඉරීමට සිසුන් යොමු කරන්න.
- අඹ ගෙඩියේ සීමාව තුළ කොළ කැබලි ඇලවීමට උපදෙස් දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකම් කරන අයුරු නිරීක්ෂණය කරන්න.
- සම්පූර්ණ කරන ලද නිර්මාණ ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.

පියවර 2 :
- සිසුන්ට දින කිහිපයකට පෙර වට්ටක්කා ඇට වියළා තබා රැගෙන ඒමට උපදෙස් දෙන්න.
- ගුරුතුමිය විසින් කළු කඩදාසියක මලක් සහ නටුවක් ඇඳ, එක් එක් සිසුන්ට ලබා දෙන්න.
- වියළා ගත් වට්ටක්කා ඇට එම නිර්මාණය වටා පිළිවෙළකට ඇලවීමට සිසුන් ව යොමු කරන්න.
- සම්පූර්ණ කරන ලද නිර්මාණ සිසු නිර්මාණ පුවරුවේ රඳවන්න.



* ගුළි කිරීම

**ක්‍රියාකාරකම 05**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- සිසුන්ට විවිධ වර්ණයේ සව් කඩදාසිය බැගින් ලබා දෙන්න.
- සිසුන්ට ලබා දුන් සව් කඩදාසි, කැබලිවලට ඉරීමට/කැපීමට උපදෙස් දෙන්න.
- එම කැබලි ගුළි කර කණ්ඩායම මැද ඇති බඳුනට දැමීමට යොමු කරන්න.
- බ්‍රිස්ල් බෝඩ්වලින් සකස් කරගත් පලතුරුවල ආකෘති සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම ආකෘතිවල දෙපැත්තේ ගුළි කළ සව් කඩදාසි ඇලවීමට උපදෙස් දෙන්න.
- සිසුන් විසින් සාදන ලද පලතුරු නූලක ආධාරයෙන් කොළ සහිත අත්තක එල්ලන්න.
- මෙම පලතුරු අත්ත පන්ති කාමරයේ ඉහළ තැනකින් තබන්න.

* ඇනීම

**ක්‍රියාකාරකම 06**

පියවර 1 :
- පදම් කළ මැටි සහ මේසය මත තැබීමට ලෑලි කැබැල්ලක් හෝ ක්ලේ බෝඩ් එකක් ගෙන ඒමට සිසුන්ට දැනුම් දෙන්න.
- සිසුන් ගෙන ආ පදම් කළ මැටිවලින් අවශ්‍ය ප්‍රමාණයක් සිසුන්ට ලබා දෙන්න.
- එම මැටි විවිධ ප්‍රමාණවලට ගුළි කිරීමට සලස්වන්න.
- සිසුන් විසින් සාදන ලද එක් එක් මැටි ගුළියට සිහින් කෝටු කැබැල්ලකින් නටුවක් සකස් කර කොළයක් ද ඇලවීමට දෙන්න.
- සිසුන් විසින් සාදන ලද දොඩම්, වට්ටියක තබා පහත කවිය ගායනා කරමින් පන්තිය වටා යාමට අවස්ථාව දෙන්න.

කවිය :
දොඩම් දොඩම් දොඩම්
හරිම රසයි දොඩම්
එන්න ගන්න දොඩම්
හරි ලාබයි දොඩම්

පියවර 2 :
- සිසුන්ට පෙට්ටියෙන් ඉවත් කළ ගිනිකූරු සහ හොඳින් අනා ගත් මැටි ගුළියක් රැගෙන එන ලෙස දන්වන්න.
- සිසුන් ගෙන ආ මැටි, ලෑල්ලක් මත තබා තව දුරටත් ඇනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම මැටිවලින් තරමක් විශාල බෝලයක් සාදන ලෙස පවසන්න.
- එය බිත්තරයක හැඩයට හැඩ කර ගන්නට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඉන්පසු එහි ගිනිකූරු ගසා ලස්සන ''ඉත්තෑවෙක්'' සෑදීමට සිසුන් දැනුවත් කරන්න.
- ඇට වර්ගයක් භාවිත කර ඇස් දෙකට යොදන්න.
- සිසුන් විසින් සාදන ලද නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.

පියවර 3 :
- රොටියක් සෑදීමට ප්‍රමාණවත් වන පාන් පිටි ගෙන, පොල්තෙල් පමණක් මිශ්‍ර කර පාන් පිටි ගුළියක් සාදා ගෙන එන ලෙස සිසුන්ට පවසන්න.
- මෙහි දී දෙමව්පියන්ගේ සහායෙන් පාන් පිටි ගුළි කරගෙන එන ලෙස සිසුන් සහ දෙමව්පියන් දැනුවත් කරන්න.
- ලෑල්ලක් හෝ ක්ලේ බෝඩ් එකක් මත පාන් පිටි ගුළිය තබා, එය මැද සිදුරක් සෑදීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ගුරුවරයා සකස් කරගත් කහපාට පැබ්රික් සායම් ස්වල්පය බැගින් පාන් පිටි ගුළිවල සිදුරුවලට දමන්න.
- අනතුරුව පිටි සහ සායම් කලවම් කරමින් ඇනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදෙන අයුරු නිරීක්ෂණය කරන්න.
- ''පෝයදාට අහසෙහි පායන හඳ'' සාදමු යැයි සිසුන්ට පවසන්න.
- සායම් සමඟ අනන ලද පිටි ගුළියෙන් බෝලයක් ලෙස සකස් කර ගැනීමට සිසුන් යොමු කරන්න.
- ලෑල්ල මත පිටි බෝලය රොටියක් මෙන් තුනී කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- එසේ සෑදූ රොටිය මත ඇඟිල්ලෙන් මුහුණක් ඇඳීමට සිසුන් යොමු කරන්න.
- සෑම සිසුවෙක් විසින් ම සකස් කරන ලද නිර්මාණ ප්‍රදර්ශනය කරන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

* ගෙතීම

**ක්‍රියාකාරකම 07**

- වර්ණ තුනකින් 45 cm ක් පමණ දිග රෙදි පටි තුන බැගින් ගෙන්වා ගන්න.
- ගුරුවරයා ද එම ප්‍රමාණයට ම රෙදි පටි තුනක් සකස් කර ගන්න.
- ගුරුවරයා විසින් රෙදි පටි තුනේ කෙළවරවල් එකට එකතු කර, ගැටයක් ගසා පෙන්වන්න.
- සිසුන්ට රෙදි පටි ගැට ගැසීම සඳහා උදවු ලබා දෙන්න.
- එක් එක් සිසුන්ගේ උසට සරිලන උසකින් මෙම රෙදි පටි රඳවන්න.
- ගුරුවරයා විසින් තමාගේ රෙදි පටි තුන සිසුන්ට පෙනෙන ස්ථානයක රඳවන්න.
- අනතුරු ව රෙදි පටි තුනෙන් කොණ්ඩය ගොතන ආකාරයට ගොතා පෙන්වන්න.
- සිසුන්ට ද ඒ ආකාරයට ගෙතීම මග පෙන්වන්න.
- තව දුරටත්, නිවසේ දී ද එම කුසලතාව ලබා ගැනීමට අවස්ථාව ලබා දෙන්න.

* ඇසිරීම

**ක්‍රියාකාරකම 08**

- සියලු ම සිසුන්ට හිස් සබන් දවටන පෙට්ටියක් බැගින් ගෙන ඒමට පවසන්න.
- සිසුන් අඩකවයක් ආකාරයට සිටින ලෙස පවසන්න.
- සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි මේසයක් තබන්න.
- මේසය මත සබන් පෙට්ටි ඇසිරීම සඳහා ගඩොල් අච්චුවක ආකාරයේ රාමුවක් තබන්න.
- එම රාමුව තුළ සබන් පෙට්ටි ඇසිරිය යුතු බවට සිසුන් දැනුවත් කරන්න.
- එක් එක් සිසුවාට පැමිණ, තමන්ගේ සබන් පෙට්ටිය රාමුව තුළ පිළිවෙළට ඇසිරීමට අවස්ථාව දෙන්න.

* ඇඳීම

**ක්‍රියාකාරකම 09**

- සිසුන්ට සුදුපාට $A_4$ කොළය බැගින් ලබා දෙන්න.
- කොළය පුරා ලොකු සහ පොඩි රවුම් ඇඳීමට සිසුන් යොමු කරන්න.
- එම රවුම් විවිධ වර්ණවලින් පාට කිරීමට උපදෙස් දෙන්න.
- පාට කරන ලද රවුම් වටා කළු පැස්ටල් කූරෙන් ඇඳීමට යොමු කරන්න.
- සිසුන් ක්‍රියාකාරකමෙහි යෙදෙන අයුරු නිරීක්ෂණය කරන්න.
- සම්පූර්ණ කරන ලද නිර්මාණ සිසු නිර්මාණ පුවරුවේ රඳවන්න.

* පාට කිරීම

**ක්‍රියාකාරකම 10**

- ගුරුවරයා විසින් පහත ගීතය රිද්මයානුකූල ව ගායනා කරන්න.
- අනතුරුව සිසුන් සමඟ ද ගායනා කරන්න.
- ගීතය ඇසුරින් චිත්‍රයක් ඇඳ පාට කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සෑම සිසුවෙකු විසින් අඳින ලද චිත්‍ර සිසු නිර්මාණ පුවරුවේ රඳවන්න.

**සරුංගලේ**


ආකාසෙට පියාසලන
පියාසලා උඩ ඉගිලෙන
පුංචි සරුංගලේ . . . .

ගී සින්දු, ඩබ්ලියු.ඒ. අබේසිංහ, පිටු අංක 77

* නැමීම

**ක්‍රියාකාරකම 11**

- පාට $A_4$ කොළයකින් 1/2 බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ලබා දෙන පාට කොළ Zig Zag ක්‍රමයට හරස් අතට නැවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- Zig Zag යන වචනය භාවිත නොකර කොළ නවන ආකාරය ආදර්ශනයෙන් පැහැදිලි කර දෙන්න.
- පහත පෙනෙන ආකාරයේ කුරුලු රූප සිසුන් සියලු දෙනාට ප්‍රමාණවත් වන පරිදි කපා ගන්න.
- කුරුලු රූප සියල්ලේ ම රූපයේ පෙනෙන ආකාරයට සුදුසු ප්‍රමාණයට කැපුමක් යොදන්න.
- කුරුලු රූප සිසුන් අතර බෙදා දී, කැමති පරිදි පාට කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් විසින් නවා සකස් කරන ලද පාට කොළ කුරුලු රූපයේ කැපුම අතරින් රිංගවන්න.
- මෙම නිර්මාණයට නූලක් යොදා පන්තියේ සුදුසු තැනක එල්ලන්න.




* රැලි කිරීම


**ක්‍රියාකාරකම 12**


- සිසුන් කණ්ඩායම් කරන්න.
- සෙන්ටිමීටර් 15ක් පමණ දිග හා සෙන්ටිමීටර් 10ක් පමණ පළල, තෙල් කඩදාසි/ අත් පිස්නා කඩදාසි තීරුව බැගින් සිසුන්ට ලබා දෙන්න.
- එම තීරු හරස් අතට පැන්සලෙහි ඔතන්න.
- කොළය පැන්සලෙහි එතූ පසු එක් පැත්තකින් අල්ලා ගෙන, අනිත් පැත්තෙන් තල්ලු කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඉන්පසු පැන්සල ඉවතට ගෙන කොළයෙහි එක් පැත්තකට හිස, ඇස් දෙක අඳින්න.
- සකස් කරන ලද නිර්මාණය කුමක් දැයි සිසුන්ගෙන් විමසන්න.
- එක් එක් කණ්ඩායමට කළුපාට $A_4$ කොළයක් ලබා දෙන්න.
- කණ්ඩායමට ලැබුණු කොළය මත එක් එක් සිසුන් සැකසූ නිර්මාණ අලවන්න.

## ඇස සහ අත සමායෝජනය සඳහා අභ්‍යාස

**ක්‍රියාකාරකම 01**


- මෙම රූප සෑම සිසුවෙකුට ම එක පිටපත බැගින් ලබා දී අභ්‍යාස කරවන්න.
- පිරිමි ළමයාගේ සහ ගැහැනු ළමයාගේ සරුංගලය සොයා දෙන්න.
- ලේනාට අඹ අත්තටත්, කුරුල්ලාට කූඩුවටත් යන්න උදවු කරන්න.





**ක්‍රියාකාරකම 02**


- එක් අවස්ථාවක් සම්පූර්ණ විය හැකි අවස්ථා 05කින් යුත් කාඩ්පත් සකස් කර ගන්න.
- සෑම සිසුවෙකුට ම කාඩ්පත් කට්ටලය බැගින් ලබා දෙන්න.
- කාඩ්පත් දෙස බලා සම්පූර්ණ රූපය ගොඩනැගෙන පරිදි කාඩ්පත් පිළිවෙළට තැබීමට සිසුන්ට උපදෙස් දෙන්න.



**ක්‍රියාකාරකම 3**

පහත සඳහන් රූප සෑම සිසුවෙකුට ම එක පිටපත බැගින් ලබා දී අභ්‍යාස කරවන්න.

- වැහි බිංදු ගඟට වැටෙන හැටි අඳින්න.
- ගෙම්බාට විලට පැන පැන යන්නට පාර අඳින්න.





## වමේ සිට දකුණට ඇස ගෙන යාමේ අභ්‍යාස

**ක්‍රියාකාරකම 1**

**පියවර 1** : • කතන්දරයේ පින්තූර වමේ සිට දකුණට පිළිවෙළින් තබා දී කතන්දරය කීමට සිසුන් යොමු කරන්න.

**පියවර 2** : • මෙලෙස තවත් කතන්දරවලට අදාළ පින්තූර අනුපිළිවෙළින් තබා කතන්දර කීමට අවස්ථාව දෙන්න.

## නිපුණතාව : පෙර කියවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

**ඉගෙනුම් පල :**
- පින්තූර දෙස බලා එහි ඇති දේ වටහා ගෙන කියවයි.
- හැඩය පිළිබඳ අවබෝධයෙන් යුතු ව අකුරු යා කරයි.
- පින්තූර කියවා අකුරු ශබ්දවලට ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- **පින්තූර පොත් බැලීම සහ පින්තූර කියවීම**

**ක්‍රියාකාරකම 01**

පියවර 1 :
- පන්තියේ සිසුන් ගණනට ප්‍රමාණවත් වන පරිදි වර්ණවත් පින්තූර සහිත ළමා කතන්දර පොත් කට්ටලයක් සූදානම් කර ගන්න.
- කතන්දර පොත බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- පොත්වල පින්තූර හොඳින් බලන ලෙස උපදෙස් දෙන්න.
- සිසුන් පින්තූර පොත් බලන අතරතුර ගුරුවරයා එක් එක් සිසුවා ළඟට ගොස් පින්තූරවල ඇති දේ විමසන්න.

  *උදා :* * පින්තූරයේ ඉන්නේ කවුරු ද?
  * පින්තූරයේ තියෙන්නේ මොනවා ද?

පියවර 2 :
- පින්තූර පොත් ඔවුනොවුන් අතර මාරු කර ගැනීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- ඒවායේ තිබෙන දේවල් නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් සිසුවාට නැගිට තම පොතේ ඇති පින්තූරයේ තිබෙන දේ පවසන ලෙස උපදෙස් දෙන්න.

  *උදා :* හාවයි ඉබ්බයි රේස් යනවා . . .
  වඳුරා ගසින් ගසට පනිනවා . . .

- **කේවල පින්තූර නම් කිරීම**

**ක්‍රියාකාරකම 02**

පියවර 1 :
- සිසුන් ප්‍රිය කරන කුරුල්ලන්, වාහන, මල්, පලතුරු, එළවළු, සිව්පාවුන් යන වර්ගවලින් පින්තූර කාඩ්පත් 5 බැගින් සකස් කර ගන්න.
- සකස් කරගත් පින්තූර වර්ග පහෙන් එක් පින්තූරයක් බැගින් පෙන්වා ඒවා නම් කරන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

පියවර 2 :
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පියවර 1හි වර්ග අනුව සකස් කර ගත් පින්තූර පෙට්ටිවලට දමා කණ්ඩායම්වලට ලබා දෙන්න.
- පින්තූර කාඩ්පත බැගින් ගෙන කණ්ඩායමේ එක් එක් සිසුවාට එහි නම කියවීමට උපදෙස් දෙන්න. (*නිදසුන් :* ගිරවා, කපුටා, කුකුළා . . .)
- එක් සිසුවෙක් පින්තූර කියවන විට කණ්ඩායමේ අනෙක් සිසුන්ට සවන්දීමට උපදෙස් දෙන්න.

පියවර 3 :
- අනතුරුව පින්තූර කාඩ් පෙට්ටි කණ්ඩායම් අතර මාරු කරමින් පින්තූරවල නම් කියවීමට අවස්ථාව දෙන්න.
- ක්‍රියාකාරකම කරන අතරතුර ගුරුවරයා කණ්ඩායම් වෙත ගොස් නිරීක්ෂණය කරන්න.
- වෙනත් පින්තූර යොදා ගනිමින් ක්‍රියාකාරකම් සංවිධානය කර සිසුන්ගේ පෙර කියවීමේ කුසලතා සංවර්ධනය කර ගන්න.

පියවර 4 :
- පෙර දින යොදා ගත් පින්තූර කාඩ්පත් එක පෙට්ටියකට දමා ගන්න. හිස් පෙට්ටියක් ද සූදානම් කර ගන්න.
- සිසුන් රවුමක් ආකාරයට සකස් කරන්න.

- කාඩ්පත් සහිත පෙට්ටිය එක් සිසුවෙකුට ලබා දෙන්න. හිස් පෙට්ටියක් රවුමේ මැද තබන්න.
- කාඩ්පත් සහිත පෙට්ටිය අතට දුන් සිසුවාට කාඩ්පතක් ගෙන ශබ්ද නඟා කියවීමට උපදෙස් දෙන්න. අනතුරුව කාඩ්පත් පෙට්ටිය තමා ළඟ ම සිටින සිසුවාට ලබා දී තමා කියවූ කාඩ්පත රවුමේ මැද ඇති හිස් පෙට්ටියට දමන ලෙස උපදෙස් දෙන්න.
- මේ ආකාරයට පෙට්ටිය අතින් අත යවමින් සෑම සිසුවෙකුටම පින්තූර කියවීමට අවස්ථාව දෙන්න.

පියවර 5 :
- රවුමේ මැද තිබූ කාඩ්පත් සහිත පෙට්ටිය කියවීම සඳහා සිසුවෙකුට ලබා දී, හිස් වූ පෙට්ටිය රවුම මැද තබන්න.
- පියවර 01හි පරිදි එම ක්‍රියාකාරකම නැවත සිදු කරන්න.

- **එක ම අකුරෙන් ආරම්භ වන පින්තූර නම් කිරීම**

**ක්‍රියාකාරකම 05 (එළිමහන් ක්‍රියාකාරකමකි)**

- එක ම අකුරෙන් ආරම්භ වන පින්තූර කට්ටල කිහිපයක් සකස් කරගන්න.

  *උදා :* 'අ' අකුරෙන් ආරම්භ වන වචන කිහිපයකට අදාළ පින්තූර කිහිපයක් (අත, අඹ, . . .)
  'ක' අකුරෙන් ආරම්භ වන වචන කිහිපයකට අදාළ පින්තූර කිහිපයක්.
  'ග' අකුරෙන් ආරම්භ වන වචන කිහිපයකට අදාළ පින්තූර කිහිපයක් යනාදී වශයෙන්
- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට පින්තූර කට්ටලය බැගින් ලබා දෙන්න.
- කණ්ඩායමේ මැද පින්තූර තැබීමට උපදෙස් දෙන්න.
- එම පින්තූර ශබ්ද නඟා කියවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- අනතුරුව ගුරුවරයා එකින් එක පින්තූරය පෙන්වන විට පින්තූරයට අදාළ නම කියවීමට අවස්ථාව දෙන්න.
- එක ම අකුරෙන් ආරම්භ වන පින්තූර කියවූ බවට සිසුන්ට පැහැදිලි කරන්න.
- පින්තූරයේ ඇති පළමු අකුර අවධාරණය වන ලෙස පින්තූර කිහිප වරක් කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස එක ම අකුරෙන් ආරම්භ වන තවත් පින්තූර කට්ටල ද සිසුන්ට කියවීමට ලබා දෙන්න.

- **සමාන අකුරු රූප යා කිරීම**


**ක්‍රියාකාරකම 04**

- පහත සඳහන් අභ්‍යාස සෑම සිසුවෙකු ලවා ම සිදු කරන්න.
- මෙලෙස තවත් අභ්‍යාස සිසුන් ලවා කරවන්න.

සමාන අකුරු රූප යා කරන්න.

*උදා :*

| | |
|---|---|
| ග | ස |
| හ | න |
| ය | ග |
| ස | හ |
| න | ය |



# නිපුණතාව : පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

ඉගෙනුම් පල : • ආත්ම විශ්වාසයෙන් යුතු ව පෙර ලිවීමේ කුසලතා ප්‍රදර්ශනය කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය :


- **සීමාවක් තුළ පාට කිරීම**

**ක්‍රියාකාරකම 01**

පියවර 1 : • විශාල රූප පාට කිරීම.

- $A_4$ කොළයක තරමක් විශාල කොටුවක් ඇඳ සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- කොටුවේ සීමාව ඉක්මවා නොයන පරිදි එක් දිශාවකට පාට කරන අයුරු සිසුන්ට පෙන්වන්න.
- ඒ අනුව කොටුව පාට කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

උදා :




- සෑම සිසුවෙකු ම පාට කර ඇති අයුරු පරීක්ෂා කරන්න.
- මෙලෙස * සරුංගලයක් ඇඳ දී පාට කිරීම
  * වෘත්තයක් ඇඳ දී පාට කිරීම
  * මලක් ඇඳ දී පාට කිරීම යනාදී ක්‍රියාකාරකම් සෑම සිසුවෙකුට ම කිරීමට අවස්ථාව ලබා දෙන්න.

පියවර 2 : **කුඩා රූප පාට කිරීම**

- ක්‍රියාකාරකම 1 සඳහා යොදා ගත් රූප කුඩාවට ඇඳ පාට කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මෙහිදී සෑම සිසුවෙකුට ම රූපය සහිත කොළය බැගින් ලබා දෙන්න.
- සිසුන් ක්‍රියාකාරකම කරන අතරතුර නිරීක්ෂණය කරන්න.
- ක්‍රියාකාරකම අවසානයේ සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පරීක්ෂා කරන්න.


උදා :



පියවර 3 : • ඉහත ක්‍රියාකාරකම සඳහා යොදා ගත් රූප, $A_4$ කොළයක පේළි ලෙස ඇඳ සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.

- සීමාව තුළ පාට කරන්නේ දැයි සෑම සිසුවෙක් ළඟට ම ගොස් නිරීක්ෂණය කරන්න.
- සියලු ම සිසුන්ගේ ක්‍රියාකාරකම් පරීක්ෂා කරන්න.

උදා :



- ද්‍රව්‍ය වටා ඇඳීම

**ක්‍රියාකාරකම 02**

**පියවර 1 :** ● සෑම සිසුවෙකුට ම යෝගට් කෝප්පය බැගින් ලබා දෙන්න.
● යෝගට් කෝප්පය මුනින් හරවා ඒ වටා ඇඳ පාට කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

**පියවර 2 :** ● ලී කුට්ටි වටා ඇඳ ඒ මත පාට කළ වැලි ඇලවීමට උපදෙස් දෙන්න.


**පියවර 3 :** ● යෝගට් හැන්ද තබා මලක් ඇඳීමට ලබා දී එය පාට කිරීමට අවස්ථාව දෙන්න.
● මෙම සෑම ක්‍රියාකාරකමක් ම සිදුකරන ආකාරය පිළිබඳ ගුරුවරයා අවධානයෙන් සිටින්න.
● සෑම සිසුවෙකුගේ ම ක්‍රියාකාරකම් පරීක්ෂා කරන්න.

- **රේඛාවක් භාවිතයෙන් පාර සෙවීම**


**ක්‍රියාකාරකම 03**


- රේඛාවක් භාවිතයෙන් පාර සෙවීම සඳහා පහත රූපය සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.

**පූසාට නිවසටත්, සමනලයාට මලටත් යන්නට පාර අඳින්න.**



- පහත සඳහන් රූප මඟින් ද සිසුන් ලවා පාර සෙවීම කරවන්න.







- **තිත් ඉරි හෝ කඩ ඉරි යා කර රූප ඇඳීම**

**ක්‍රියාකාරකම 04**


පියවර 1 :
- සරල රූපවල කඩ ඉරි යා කර රූප ඇඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සෑම සිසුවෙකුට ම එක් රූපය බැගින් ලබා දෙන්න.

  *උදා :*
  - බැලුමක රූපය කඩ ඉරි යා කර ඇඳීමට සිසුන් යොමු කරන්න.
  - කුඩයක රූපය කඩ ඉරි යා කර ඇඳීමට සිසුන් යොමු කරන්න.





පියවර 2 :
- පහත කඩ ඉරි රූප සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- කඩ ඉරි මත ඇඳ රූපය පාට කිරීමට සිසුන් යොමු කරන්න.




- **අත්වල ඇඟිලි වටා ඇඳීම**

**ක්‍රියාකාරකම 05-**

- $A_4$ කොළය බැගින් සෑම සිසුවෙකුට ම ලබාදෙන්න.
- එක් එක් සිසුවාගේ අත $A_4$ කොළය මත තබා ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- ඉන්පසු එම රූපය පාට කිරීමට යොමු කරන්න.
- මෙලෙස ඇඟිලි වටා ඇඳීමෙන් කුරුල්ලෙක්, සමනලයෙක් නිර්මාණය වන ලෙස ඇඳීමට සිසුන්ට මග පෙන්වන්න.


උදා :



- **අකුරුවලට අදාළ හැඩ තිත් ඉරිමත ඇඳීම**

**ක්‍රියාකාරකම 06**

- අකුරුවලට අදාළ හැඩ **තිත් ඉරි මත** ඇඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් හැඩ රටාවක් එක් පිටුවක ඇඳීමට අවස්ථාව දෙන්න.



- **අකුරුවලට අදාළ හැඩ බලා ඇඳීම**


**ක්‍රියාකාරකම 07**

- අකුරුවලට අදාළ ඉහත හැඩ බලා ඇඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් හැඩයක් එක් පිටුවක ඇඳීමට අවස්ථාව දෙන්න.
- එක් එක් හැඩ එක් එක් සිසුවාට නිවැරදි ව ඇඳීමට හැකියාව ලැබෙන තෙක් අවස්ථාව ලබා දෙන්න.

- අකුරුවලට අදාළ හැඩ රටා ඇඳීම

**ක්‍රියාකාරකම 08**

- අකුරුවලට අදාළ හැඩ රටා බලා ඇඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් හැඩ රටාවක් දෙවරක් පමණ ඇඳීමට ලබා දෙන්න.






- අකුරක හැඩය ඉවත් කරන ලද අවකාශයේ ඇඳීම

**ක්‍රියාකාරකම 09**

- පහත සඳහන් පින්තූරයේ පෙනෙන ආකාරයට රිජිෆෝම් කැබැල්ලක/හාඩ්බෝඩ් කැබැල්ලක අකුරුවල හැඩය ඉවත් කර හිදැස් පත් සකස් කර ගන්න.

අවකාශය



- සියලු ම සිසුන්ට මෙම හිදැස් පත් ලබා දෙන්න.
- හිදැස් පත කොළයක් මත තබා හුණු කූරකින් හිදැස් පත තුළ ඇඳීමට අවස්ථාව ලබා දෙන්න.
- සියලු ම අකුරුවලට හිදැස් පත් සාදා සෑම සිසුවෙකු ලවා ම ඉහත ක්‍රියාකාරකම් සිදු කරන්න.

- වැලි කඩදාසියේ අකුරු මත ඇඳීම

**ක්‍රියාකාරකම 10**

- 0, 1/2, 1 ප්‍රමාණයේ වැලි කඩදාසිවලින් අකුරු කපා අලවා ගන්න. ඒ මත ඇඟිල්ල ගෙන යමින් අකුරු මත ඇඳීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**නිපුණතාව :** **$L_1$** **අවබෝධයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා සවන්දෙයි.**
**$S_1$** **අවබෝධයෙන් පැහැදිලි උච්චාරණය සහිත ව අර්ථය පැහැදිලි වන සේ කතා කරයි.**

**ඉගෙනුම් පල :** • පවසන දේ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:

- **පවසන දෙයට සවන්දීම**

**ක්‍රියාකාරකම 01-** (එළිමහන් ක්‍රියාකාරකමකි)

- සිසුන් අඩකවයක් ආකාරයට වාඩි කරවන්න.
- පවසන දෙයට අවධානයෙන් සවන්දීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- හොඳින් සවන් දී ඒ කවුදැයි නම් කරන ලෙස සිසුන්ට පවසන්න.

*උදා :* මම කියන කෙනාගේ ඇඟ කොළ පාටයි.
එයා පලතුරු කන්න හරිම කැමතියි.
ඉදුණු, පැණි රස අඹවලට ගොඩක් කැමතියි.

*පිළිතුර :* ගිරවා

- මෙලෙස ලේනා, මොනරා, සමනලයා වැනි සිසුන් කැමති සතුන් පිළිබඳ තොරතුරු පවසා පිළිතුරු ලබා ගන්න.

- **පින්තූර බලා පවසන දෙයට සවන්දීම**

**ක්‍රියාකාරකම 02 -**

- පාට පින්තූරයක් සිසුන් සියලු දෙනාට ම පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
- මේ සඳහා ක්‍රියාකාරකම 1 සඳහා යොදා නොගත් සතෙකුගේ පින්තූරයක් ගන්න.

*උදා :* මාළුවා, පූසා, බල්ලා, හාවා

- පින්තූරයේ සිටින සතා පෙන්වා එම සතා පිළිබඳ ව සිසුන්ට පවසන්න.
- පින්තූරය ඇසුරෙන් පැවසූ විස්තරවලට අදාළ ව සකසා ගත් සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.

*උදා :* • පින්තූරයේ සිටි සතා කවුද ?
• කෑමට ගන්නේ මොනවා ද ?

- **කතන්දරවලට සවන්දීම**

**ක්‍රියාකාරකම 03 - (එළිමහන් ක්‍රියාකාරකමකි)**

- බිම පැදුරක් එළා සිසුන් සමඟ වාඩිවෙන්න.
- රසවත් අයුරින් ශබ්ද නගා කතන්දරය පවසන්න.
- කතන්දරය ඇසුරෙන් සකස් කරගත් ප්‍රශ්න සිසුන්ගෙන් අසන්න.
- සෑම සිසුවෙකුගේ ම පිළිතුරු කෙරෙහි අවධානය යොමු කරන්න.

කතන්දරය

## ආඩම්බර මුවා

කැලෑවක ලස්සන මුවෙක් සිටියා. මේ මුවාට ගොඩක් ලස්සන අං තට්ටුවක් තිබුණා. ඒ අං තට්ටුව ලස්සන නිසා එයා හරිම ආඩම්බරයි. කැලෑවේ වතුර පිරුණු විලක් තිබුණා. මේ මුවා හැමදා ම ඒ විලට ගිහිං වතුරට එබිලා එයාගේ ලස්සන බැලුවා.

ඒත් මුවාගෙ කකුල් හීනියි. ඒ නිසා මුවා ඒ ගැන දුකෙන් වගේ ම තරහෙන් සිටියේ.

දවසක් මුවා කැලේ ඇවිදින්න ගියා. මෙහෙම යනකොට එකපාරට ම කොටියෙක් ගොරවන හඬක් ඇසුණා. මුවා හොඳට ම බය වුණා. පුළුවන් වේගෙන් දුවන්න පටන් ගත්තා. මෙහෙම දුවන කොට මුවාගෙ අං තට්ටුව වැලක පැටලුණා. මුවා කලබලෙන් අංතට්ටුව සොලවා දැඟලුවා. ඒත් වැලේ පැටලුණු අංතට්ටුව ගලවා ගන්න බැරි වුණා. මුවා තමන්ගෙ කකුල්වලින් වෙර යොදා එහාට මෙහාට කැරකිලා පැටලුණු අංතට්ටුව අමාරුවෙන් ගලවා ගත්තා. ලස්සනට තිබුණු අංතට්ටුව දැන් හරිම කැතයි. ලස්සන අංතට්ටුව නිසා වැල්වල පැටලී කරදරේ වැටුණු බවත් එයා සිතුවා.

මේ අතර කොටියගෙ හඬට බය වෙලා දුවල බේරුණේ තමන්ගෙ කකුල් හතරේ පිහිටෙන් නේද කියලා මුවා කල්පනා කළා. එදා මුවාට තේරුණා කකුල් හතරේ තියෙන වටිනාකම.

ලස්සන නිසා ආඩම්බර වීම හොඳ නැති බව මුවාට සිතුණා. එදා සිට මුවා තමන්ගේ ආඩම්බරකම අමතක කළා.

- **පින්තූර කතාවලට සවන්දීම**

**ක්‍රියාකාරකම 04 (එළිමහන් ක්‍රියාකාරකමකි)**

- විශාල ලෙස සකස් කරගත් පින්තූර කතාව සිසුන් සියලු දෙනාට ම පෙනෙන පරිදි ප්‍රදර්ශනය කරන්න.
- එම පින්තූර කතාව ගුරුවරයා විසින් රසවත් අයුරින් සිසුන්ට පවසන්න.
- පින්තූර කතාව ඇසුරින් සකස් කරගත් සරල ප්‍රශ්න සිසුන්ගෙන් විමසන්න.

*පින්තූර කතාව*



- **නිදහසේ කතා කිරීම**

**ක්‍රියාකාරකම 05 (එළිමහන් ක්‍රියාකාරකමකි)**

- පුටු දෙක බැගින් තැන් තැන්වල තබන්න.
- සිසුන් යුගල කරන්න.
- එක් එක් සිසු යුගලයට පුටුවල වාඩිවීමට පවසන්න.
- තමා කැමති ම සතා පිළිබඳ තම යහළුවා සමග කතා කිරීමට සිසුන් යොමු කරන්න.
- ගුරුවරයා එක් එක් සිසු යුගල අසලට ගොස් ඔවුන්ගේ කතාබහට එක්වන්න.
- මෙලෙස සිසු යුගල මාරු කරමින් සිසුන්ට කතා කිරීමට අවස්ථාව දෙන්න.

- **පින්තූර බලා කතා කිරීම**

**ක්‍රියාකාරකම 06 -**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට බෙදන්න.
- විශාල කරන ලද පාට පින්තූරයක් බැගින් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
  *උදා :* ගිරවා, ලේනා, පූසා, ඉර, හඳ, අඹ, රඹුටන්, රෝස මල, නෙළුම් මල, කාරය
- කණ්ඩායමේ සෑම සිසුවෙකු ම එම පින්තූරය බැලීමට යොමු කරන්න.
- එම පින්තූරය පිළිබඳ ව කණ්ඩායම තුළ සාකච්ඡා කිරීමට යොමු කරවන්න.
- කණ්ඩායම පින්තූරය සම්බන්ධයෙන් කතා කළ දේ ඉදිරිපත් කිරීමට අවස්ථාව දෙන්න.

- **නිදහසේ කතන්දර කීම**

**ක්‍රියාකාරකම 07**

(පෙර දිනයේ නිවසේ අයගෙන් කතන්දරයක් අසා මතක තබා ගෙන එන ලෙස සිසුන් දැනුවත් කරන්න. සිසුන්ගේ වැඩිහිටියන් ද ඒ පිළිබඳ දැනුවත් කරන්න.)


- සිසුන් යුගල කරන්න.
- පෙර දින අසා දැනගත් කතන්දරය තම යහළුවාට පැවසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන් අතරට ගොස් ඔවුන් කතන්දර කියනවාදැයි නිරීක්ෂණය කරන්න.
- උදවු අවශ්‍ය සිසුන් වේ නම් ඔවුන්ට සහයවන්න.

- **පින්තූර කතාවලින් කියවෙන දේ පිළිබඳ කතා කිරීම**

**ක්‍රියාකාරකම 08**

- සිසුන් කුඩා කණ්ඩායම්වලට වෙන් කරන්න.
- පින්තූර හතරකින් සරල කතන්දරයක් ගොඩනැගිය හැකි වන සේ කාඩ්පත් කට්ටල සකස් කර කණ්ඩායම්වලට ලබා දෙන්න.
- මෙහිදී විවිධ පින්තූර කතා කණ්ඩායම්වලට ලබා දීමට වගබලා ගන්න.
- කණ්ඩායම් ලෙස එක් ව පින්තූර කතාව ගොඩනැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගොඩනගන ලද කතා පන්තිය ඉදිරියේ ප්‍රකාශ කිරීමට යොමු කරන්න.
- සිසුන් අතරට ගොස් ඔවුන් කතන්දරය ගොඩනගා කතා කරන ආකාරය නිරීක්ෂණය කරන්න.
- මෙලෙස පින්තූර කතා මාරු කර ගනිමින් කතන්දර ගොඩනගා ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

***පින්තූර කතාව***



**නිපුණතා : $R_1$ කියවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් කියවයි.**
**$W_1$ ලිවීමේ යාන්ත්‍රණය අනුගමනය කරමින් ලියයි.**

**ඉගෙනුම් පල :**
- ශබ්ද විභේදන හඳුනාගෙන අකුරු, වචන, වාක්‍යාංශ සහ වැකි උච්චාරණය කරයි.
- අකුරු, වචනවල විවිධතා හඳුනා ගෙන නිවැරදි ව ලියයි.
- නැවතීමේ ලකුණට අනුගත ව වචන තුනේ සරල වැකි කියවයි, ලියයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:**

- **කියවීමට හා ලිවීමට සූදානම් වීම**

**ක්‍රියාකාරකම 01**



- **නිවැරදි ව අසුන් ගැනීම**
  * පුටුව මේසයට ළං කර ගන්න.
  * දෙපා හොඳින් බිම ස්පර්ශ වන ලෙස තබා ගන්න.
  * වැලමිටෙන් පහළ දෙඅත් මේසය මත තබා ගන්න.
  * ලියන කඩදාසිය හුරු අතට පහසු වන පරිදි තබා ගන්න.
  * ලියන අකුරු පහසුවෙන් පෙනෙන පරිදි හිඳ ගන්න.
- **නිවැරදි ව පැන්සල ඇල්ලීම**
  * පින්තූරයෙහි පෙනෙන පරිදි පැන්සල අල්ලා ගන්න.
  * පැන්සලෙහි උල් කරන ලද කොටසෙහි ඇඟිලි නොගැවෙන ලෙස තබා ගන්න.





- **නිවැරදි ව පොත තබා ගැනීම**
  * පුටුව මේසයට ළං කර ගන්න.
  * දෙපා බිම ස්පර්ශ වන ලෙස තබා ගන්න.
  * දෙඅත් මේසය මත තබා, හුරු අතේ දබර ඇඟිල්ල අකුරු මත ගෙන යමින් ශබ්ද නගා කියවන්න.
  * පහසුවෙන් අකුරු පෙනෙන පරිදි හිස තබා ගන්න.






- අකුරු හඳුන්වා දීම


**ක්‍රියාකාරකම 02**

සිංහල වර්ණ මාලාවෙන් අකුරු 36ක් පමණක් පළමුවන ශ්‍රේණියේ සිසුන්ට ඉගැන්වීම සඳහා තෝරාගෙන ඇත. වැඩිපුර භාවිත වන සිංහල අකුරු සැලකිල්ලට ගෙන මෙම තෝරා ගැනීම කර තිබේ. ඒ අනුව, පළමුවන ශ්‍රේණියට ඉගැන්වීමට නියමිත අක්ෂර ඉගැන්විය යුතු පිළිවෙළ පහතින් දක්වේ.


- මධ්‍ය අක්ෂර (9)




- ආරෝහණ අක්ෂර (16)





- අවරෝහණ අක්ෂර (11)




සිංහල අකුරු ලිවීම සඳහා ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව මගින් නිර්දේශ කර ඇති පස්රූල් භාවිතය 2016 සිට පළමුවන ශ්‍රේණිය සඳහා නිර්දේශ කර තිබේ. ඒ අනුව ඉහත සඳහන් අක්ෂර අතුරින් අංක 01 යටතේ දක්වා ඇත්තේ 'මධ්‍ය අක්ෂර' සමූහයකි. මධ්‍ය අක්ෂර යනු, පස්රූල්වල දෙවන හා හතරවන රූල් අතර ලියවෙන අක්ෂර ය.

*උදා :*




අංක දෙක යටතේ දක්වා ඇත්තේ 'ආරෝහණ' අක්ෂර යි. ආරෝහණ අක්ෂර යනු, පස්රූල් අතර පළමුවන හා හතරවන රූල් අතර ලියවෙන අක්ෂර හෙවත් දෙවන රූලෙන් ඉහළට ලියැවෙන අක්ෂර යි.

*උදා :*



අංක තුන යටතේ දක්වා ඇත්තේ 'අවරෝහණ අක්ෂර' යි. අවරෝහණ අක්ෂර යනු, පස්රූල් අතර දෙවන හා පස්වන රූල් අතර ලියවෙන අක්ෂර හෙවත් හතරවන රූලෙන් පහළට ලියවෙන අක්ෂර යි.

*උදා :*



මෙම අක්ෂර ඉගැන්වීම් අනුක්‍රමය සැකසීමේ දී පහත සඳහන් කරුණු සැලකිල්ලට ගන්නා ලදී.

1. පළමුවන ශ්‍රේණියේ සිසුන්ට පහසුවෙන් හා පැහැදිලි ව උච්චාරණය කළ හැකි ශබ්ද සහිත අක්ෂර පළමුවෙන් ඉගැන්වීමට සැලකිලිමත් විය.
2. අක්ෂරවල හැඩය ද අනුක්‍රමය සැකසීමේ දී සැලකිල්ලට ගන්නා ලද අතර, 'ග' අක්ෂරය ලිවීමට හුරු වූ දරුවාට ඊළඟට 'හ' අක්ෂරය ඉගැන්වීම පහසු ය. 'ය' එම හැඩයෙන් ලියන තවත් අක්ෂරයකි.

   ඒ අනුව අකුරු හැඩය ද සැලකිල්ලට ගනිමින් සමාන හැඩ සහිත අක්ෂර රූප එක ළඟට එන පරිදි අක්ෂර අනුක්‍රමය සකසා තිබේ.

   *උදා :* **න ත ක**

   **ම ඹ ඔ ඕ**

   **අ ආ ඇ ඈ**
3. එදිනෙදා වැඩිපුර භාවිත වන සිංහල වචනවල යෙදෙන අකුරු අනුක්‍රමයේ ඉහළට ගැනීමට සැලකිලිමත් විය. එහි දී සඤ්ඤක අකුරු අඩුවෙන් භාවිත වන බැවින් සෑම තීරුවක ම අගට ඒවා යොදන ලදී.


ඉහත දක්වන ලද කරුණු සියල්ල සලකා බලා මෙම අක්ෂර අනුක්‍රමය සකසා ඇති බව සැලකිය යුතු ය.

### අකුරු කියවන සහ ලියන ආකාරය - මධ්‍ය අක්ෂර

- **කියවීම හා ලිවීම** (අකුරු සහ වචන ලිවීමේ දී පස්රූල් පොත භාවිත කරන්න.)
  - 'ග' අක්ෂරය මුලට යෙදෙන වචන දෙකක් හෝ තුනක් හඬනඟා කියන්න. (*උදා:* ගල, ගස, ගම)
  - එම වචනවල මුලට යෙදෙන ශබ්දය 'ග' ශබ්දය බව හඳුන්වා දෙන්න.
  - සිසුනට ද 'ග' ශබ්දය මුලට යෙදෙන වචන කීමට අවස්ථාව දෙන්න.
  - එම ශබ්දයට අදාළ අක්ෂර රූපය පෙන්වන්න. එම අක්ෂර රූපය 'ග' බව කියන්න. (මේ සඳහා කාඩ්පතක් භාවිත කිරීම ද, හුණු පුවරුවේ ලිවීම ද සිදු කළ යුතු ය.)

- විවිධ අකුරුවලින් ආරම්භ වන පින්තූර කාඩ්පත් සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න. ඒ අතර ඇති 'ග' අකුරින් ආරම්භ වන පින්තූර තේරීමට සිසුන්ට කියන්න.
- එම අකුර නිවැරදි ව ලියන දිශාව ඊතල මගින් අංක යොදා පියවර වශයෙන් පෙන්වන්න.

උදා :



(මේ සඳහා පස්රූල් භාවිත කළ යුතු ය.)

- 'ග' අකුර ශබ්ද කරමින් මේසය මත හෝ අවකාශයේ ඇඟිල්ලෙන් ලිවීමට සිසුන් යොමු කරන්න.
- සෙන්ටිමීටර් 4/මිලි මීටර් 40 ප්‍රමාණයට සකස් කරන ලද පස් රූල භාවිත කරමින් කඩ ඉරි මත අකුරු ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

  (මෙම සෙන්ටි මීටර් 4/මිලි මීටර් 40 පස්රූලෙහි අංක 02 හා 03 රේඛා සඳහා මිලි මීටර් 05ක් ද, අංක 3 සහ 4 රේඛා සඳහා අංක 2 හා 3 රේඛාවේ ප්‍රමාණය මෙන් තුන් ගුණයක් වන මිලි මීටර් 15ක් ද, අංක 1 හා 2ත්, අංක 4 හා 5 රේඛා සඳහා අංක 2 හා 3 රේඛා සඳහා ගත් මිලි මීටර් 5 ප්‍රමාණය මෙන් දෙගුණයක් වන මිලි මීටර් 10ක් ද වන ලෙස යොදා ගන්න.)
- අංග සම්පූර්ණ අකුරු ලිවීමේ හුරුව ලැබෙන තෙක් ලිවීමේ අභ්‍යාස කරවන්න.
- පස් රූලෙහි 'ග' අක්ෂරය ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙලෙස අකුරු හඳුන්වා දීමේ පිළිවෙළට සියලු ම පිල්ලම් රහිත අකුරු 'ග' අක්ෂරය ලිවීමට අනුගමනය කළ ක්‍රියාවලිය ම භාවිත කරමින් කියවීමට හා ලිවීමට යොමු කරන්න.

- **අකුරු එකතු කර වචන කියවීම හා ලිවීම**
  - 'ග, හ, ය, ස, ප' යන අකුරු යොදා අකුරු දෙකේ හා තුනේ අර්ථවත් වචන පහක් සාදාගන්නා අයුරු හුණු පුවරුවේ ලියා පැහැදිලි කරන්න.
  - එම වචන ශබ්ද නගා කියවන්න.
  - එක් වචනයක් කියවූ පසු සිසුන්ට ද කිහිප වරක් එම වචනය උච්චාරණය කිරීමට අවස්ථාව දෙන්න.
  - මෙලෙස සියලු ම වචන ශබ්ද නගා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
  - පස්රූලක විශාල ව ලියා ගත් 'ග, හ, ය, ස, ප' යන අකුරු කොළය බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
  - එම අකුරු වටා ඇති කොටුව කපමින්, අකුරු වෙන් කර ගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
  - එම අකුරු ගළපමින් අර්ථවත් වචන සෑදීමට සිසුන්ට උපදෙස් දෙන්න.
  - සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වන අතරතුර සෑම සිසුවෙකු ම කරා ගොස්, ඔවුන් වචන සාදන ආකාරය පිළිබඳ විමසිලිමත් වන්න.
  - හුණු පුවරුවේ ලියන ලද වචන බලා, පස්රූල් පොතේ ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  - සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කිරීමේ දී, අකුරු නිවැරදි ව ලියා තිබේ දැයි විමසිලිමත් විය යුතු අතර, වැරදි ලෙස ලියා ඇති නම් නිවැරදි කර ගැනීමට උදවු දෙන්න.
  - මෙලෙස 'න, ත, ක' යන මධ්‍ය අක්ෂර ලිවීම ද හඳුන්වා දී ම සිදු කරන්න.
  - මෙහි දී 'න, ත, ක' යන අකුරු හඳුන්වා දීමෙන් අනතුරු ව එම අකුරු එකතු කර වචන ලිවීමට හා කියවීමට අවස්ථාව ලබා දෙන්න.
  - පෙර උගත් 'ග, හ, ය, ස, ප' යන අකුර සහ 'න, ත, ක' යන අකුරු එක් කර වචන සෑදීමට සිසුන් යොමු කරන්න.
  - මෙම ක්‍රමයට ම ආරෝහණ අක්ෂර හා අවරෝහණ අක්ෂර ද හඳුන්වා දීම සිදු කරන්න.
  - හඳුන්වා දෙන ලද අකුරුවලින් හැකිතාක් වචන සාදා සිසුන්ට කියවීමට අවස්ථා දෙන්න. එම වචන ලිවීමට දී වචන ලිවීම හුරු කරවන්න.

- සරල වැකි කියවීම සහ ලිවීම

**සරල වැකි ලිවීම සඳහා තනි රූල් පොත භාවිත කරන්න.**

පියවර 1 : • පහත රූපය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.



- ගස
  යට
  මල යන වචන මේ ආකාරයට හුණු පුවරුවේ ලියන්න.
- එම වචන යොදා රූපයට ගැළපෙන ආකාරයට අර්ථවත් වාක්‍යාංශයක් ගොඩ නැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන්ගේ පිළිතුරුවලට අනුව නිවැරදි වාක්‍යාංශය වචන අතර ඉඩ තබමින් හුණු පුවරුවේ ලියන්න.
- වචන අතර පරතරය පිළිබඳ සිසුන්ට පැහැදිලි ව පවසන්න.
- එම වාක්‍යාංශය ශබ්ද නගා කියවන්න.
- සිසුන්ට ද එම වාක්‍යාංශය කිහිප වරක් කියවීමට අවස්ථාව දෙන්න.
- හුණු පුවරුවේ ලියන ලද වාක්‍යාංශය **තනි රූල් පොතෙහි** නිවැරදි ව ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- **තනි රූල් පොතෙහි** ලිවීමේ දී රූල් දෙකක් හැර රූලක් ලෙස ලිවීමට සිසුන් යොමු කරන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කරන්න.
- වාක්‍යාංශය නිවැරදි ව ලියා ඇති දැයි සෑම අකුරක් හා වචනයක් කෙරෙහි ම සැලකිලිමත් වෙමින් පරීක්ෂා කරන්න.
- වැරදි ලෙස ලියා ඇත්නම් එම අවස්ථාවේ දී ම නිවැරදි කරන්න.
- රස අඹ මට, ගඟ ළඟ ගස යන වාක්‍යාංශ ද ඉහත ක්‍රියාකාරකම අනුව ගොඩ නගා බලා ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

* මෙලෙස පිලි සහිත අකුරු දෙකේ, තුනේ වචනවලින් වැකි ගොඩ නගා කියවීමේදීත් ලිවීමේදීත් ඉහත ක්‍රමය අනුගමනය කරන්න.

* මෙම අවස්ථාවේදී ම තිත, නැවතීමේ ලකුණ ලෙස භාවිත කරන අයුරු පැහැදිලි ව අවධාරණය කරන්න.

* **පිලි සහිත වචන හඳුන්වා දීම**

**පිලි ඉගැන්වීම**

පළමුවන ශ්‍රේණියට නියමිත මූලික අක්ෂර සියල්ල ඉගැන්වීමෙන් අනතුරු ව පිලි ඉගැන්වීම ආරම්භ කළ යුතු ය. අක්ෂර අනුක්‍රමය මෙන් ම පිලි අනුක්‍රමය ද පහත සඳහන් පරිදි අනුගමනය කරන්න.

**'හල්' කිරීම'**

්   ්

*උදා* : ක් ම් ල්

'හල් ලකුණ' පිල්ලක් නො වේ. එයින් සිදු කරනුයේ ව්‍යඤ්ජන අකුරකින් ස්වරය ඉවත් කිරීම යි. 'හල්' යන්නෙහි අර්ථය 'ව්‍යඤ්ජන' යන්න යි. ව්‍යඤ්ජන යනු, තනි ව උච්චාරණය කළ නො හැකි අකුරු යි.

ව්‍යඤ්ජන තනි ව උච්චාරණය කළ නොහැකි නිසා ඊට ස්වරයක් එක් කරනු ලැබේ. (*උදා :* ක, කා, කැ, කෑ, කි, කී, කු, කූ, කෙ, කේ, කො, කෝ ආදී වශයෙන්) හල් කිරීමෙන් කරනුයේ එහි ඇති ස්වරය ඉවත් කිරීම යි. එහෙයින් එය පිල්ලක් නො වේ. පිල්ලක් නම් එම පිල්ල නියෝජනය කරන ස්වරයක් තිබිය යුතු ය. හල් කිරීමේ ලකුණු ස්වරයක් නියෝජනය නොකරන බැවින් ඒවා පිල්ලම් නාමයෙන් හැඳින්වීම නොකළ යුතු ය. ඒ සඳහා 'හල් කිරීම' යන වචනය භාවිත කළ යුතු ය. හල් කිරිම සඳහා සංකේත දෙකක් තිබේ.

1. කොඩිය ්     2. රැහැන ්


ව්‍යඤ්ජන අකුරක් දකුණෙන් අවසන් වේ නම් එම අකුරු හල් කිරිම සඳහා කොඩිය (්) භාවිත වේ. ව්‍යඤ්ජන අකුරක් වමෙන් අවසන් වේ නම් එම අකුරු හල් කිරීම සඳහා රැහැන (්) භාවිත වේ. මෙම නියමයන් සිසුන්ට තේරුම් ගත හැකි සුදුසු වචන භාවිත කරමින් පැහැදිලි කර දෙන්න.

*උදා* : මල්ල     අත්ත
කම්මල     ගව්ව     ඉරට්ට
වත්ත     පල්ලම     ඉන්නල

## පිලි ඉගැන්වීමේ අනුක්‍රමය

| අනු අංකය | පිල්ලේ නම | නියෝජනය වන ස්වරය | පිලි | උදාහරණ |
|---|---|---|---|---|
| 01 | ඇලපිල්ල | ආ | ා | කා |
| 02 | කෙටි ඇදපිල්ල | ඇ | ැ | කැ |
| 03 | දික් ඇදපිල්ල | ඈ | ෑ | කෑ |
| 04 | කෙටි ඉස්පිල්ල | ඉ | ි | කි |
| 05 | දික් ඉස්පිල්ල | ඊ | ී | කී |
| 06 | කෙටි කොන් පාපිල්ල | උ | ු | ලු |
| 07 | දික් කොන් පාපිල්ල | ඌ | ූ | ලූ |
| 08 | කෙටි වක් පාපිල්ල | උ | ු | කු |
| 09 | දික් වක් පාපිල්ල | ඌ | ූ | කූ |
| 10 | කෙටි ඇද පාපිල්ල | උ | ු | රු |
| 11 | දික් ඇද පාපිල්ල | ඌ | ූ | රූ |
| 12 | කොම්බුව | එ | ෙ | කෙ |
| 13 | කොම්බුව සහිත හල් කිරීමේ ලකුණ | ඒ | ේ | කේ |
| 14 | කොම්බුව සහිත ඇලපිල්ල | ඔ | ො | කො |
| 15 | කොම්බුව, ඇලපිල්ල සහිත හල් කිරීමේ ලකුණ | ඕ | ෝ | කෝ |

පියවර 1 :
- සිසුන් අඩ කවයක් ආකාරයට වාඩි කරවන්න.
- පහත සඳහන් පින්තූරය විශාල කර අඳින්න.
- සෑම සිසුවෙකුට ම පෙනෙන පරිදි පින්තූරය ප්‍රදර්ශනය කරන්න.



- පින්තූරය බලා වචන කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- මෙහි දී ගස → ගස්, මල → මල්, අත → අත් යන වචන කිහිප වරක් ශබ්ද නඟා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ප්‍රදර්ශනය කරන ලද රූපයේ ගස්, මල්, අත් යන වචනවල, හල් ශබ්දය අවධාරණය කරන්න.
- අඩ කවයේ සිටින අවස්ථාවේ දී ම සිසු යුගලයකට කාඩ්පත් දෙක බැගින් ලබා දෙන්න.


  *උදා* : | ගස | ගස් |
- එක් එක් සිසු යුගලය බැගින් කැඳවා, තමා අතැති කාඩ්පත කියවීමට අවස්ථාව දෙන්න.
- අනතුරු ව එම කාඩ්පත්, අදාළ රූපයට යටින් ඇති රඳවනයෙහි තැබීමට යොමු කරන්න.
- සෑම සිසුවෙකුට ම තමා ළඟ ඇති කාඩ්පත කියවා රූපයට අදාළ ස්ථානයෙහි රැඳවීමට උපදෙස් දෙන්න.
- මේ අයුරින් ගස → ගස් ආදී ලෙස ලිවීමේ දී ' ් ' කොඩිය යෙදෙන බව සිසුන්ට පැහැදිලි කරන්න.
- මෙම ක්‍රියාකාරකම සඳහා යොදා ගත් වචන හුණු පුවරුවේ ලියන්න.
- එම වචන පහත පෙනෙන අයුරින් ලිවිය යුතු ය.

  ගස - ගස්

  මල - මල්

  අත - අත්
- හුණු පුවරුවේ ලියන ලද වචන, පස් රූල් පොතෙහි ලිවීමට අවස්ථාව දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කරන්න.
- අකුරකට හල් කිරීම නිවැරදි ලෙස යොදා ඇත් දැයි තහවුරු කරගන්න.
- වැරදි ලෙස ලියා ඇත්නම් නැවත ලිවීමට අවස්ථාව දෙන්න.

පියවර 2 : • පහත සඳහන් ආකාරයේ කාඩ්පත් සකස් කර ගන්න.



- සිසුන් පිට්ටනියට කැඳවා ගෙන යන්න.
- සැම සිසුවෙකුට ම එක් කාඩ්පත බැගින් ලබා දෙන්න.
- විශාල කර සකස් කරගත් ''නම'' යන කාඩ්පත පෙන්වා ශබ්ද නගා කියවන්න. එම වචනය සහිත කාඩ්පත ඇති සිසුන්ට කාඩ්පත පෙන්වීමට අවස්ථාව ලබා දෙන්න.
- එම සිසුන්ට වචනය ශබ්ද නගා කියවමින් ගුරුවරයා නම් කරන ලද ස්ථානයට යාමට උපදෙස් දෙන්න.
- මෙලෙස ''නම්'' යන වචනය ද ගුරුවරයා විසින් පෙන්වා ශබ්ද නගා කියවන්න.
- එම වචනය සහිත කාඩ්පත ඇති සිසුන්ට කාඩ්පත පෙන්වීමට අවස්ථාව දෙන්න.
- එම වචනය සිසුන් ලවා කියවන්න. ගුරුවරයා විසින් නම් කරන ලද ස්ථානයට යාමට උපදෙස් දෙන්න.
- අනතුරු ව කණ්ඩායම් දෙක ම මාරුවෙන් මාරුවට වචන දෙක ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස ඉහත සකස් කරන ලද සෙසු කාඩ්පත් ද ඉහත ක්‍රියාකාරකම සිදු කළ ආකාරයට ම සිසුන් ලවා කරවන්න.
- සිසුන් පන්ති කාමරයට කැඳවාගෙන යන්න.
- ක්‍රියාකාරකම සඳහා යොදා ගත් වචන හුණු පුවරුවේ ලියන්න.
- එම වචනවල හල් කිරීමේ ලකුණ වෙනත් වර්ණයකින් ලියන්න.
- ලියන ලද වචනවල හල් කිරීමේ ලකුණ යෙදූ අකුරු සිසුන්ට පෙන්වන්න.
- වෙනත් පැහැයකින් ලියා ඇති කොටස ''හල් කිරීම'' බව සිසුන්ට පැහැදිලි කරන්න.
- එක් අකුරකට හල් කිරීම යොදන ආකාරය ඉතා පැහැදිලි ව හුණු පුවරුවේ ලියා පෙන්වන්න.
- ලියන ලද වචන ශබ්ද නගා කියවන්න.
- හුණු පුවරුවේ ලියන ලද වචන රූල් පහේ අභ්‍යාස පොතේ ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සැම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කරන්න.
- සැම වචනයක ම හල් කිරීම යොදා ගත් ආකාරය පිළිබඳ ව සැලකිලිමත් වන්න.
- වැරදි ලෙස හල් කිරීම යොදා ඇත්නම් එම අවස්ථාවේ දී ම නිවැරදි කරන්න.
- මෙලෙස හල් කිරීම සහිත අකුරු යෙදුණු අකුරු දෙකේ, තුනේ සහ හතරේ වචන ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- දී ඇති වචන අතුරින් හල් කිරීම් ලකුණු දෙක යෙදුණු අකුරු සහිත වචන වෙන වෙන ම තෝරා ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 3 :
- පහත සඳහන් වැකි විශාල ලෙස ලියා කාඩ්පත් සකස් කරගන්න.
  - කමල් වත්තට යන්න.
  - ඉද්ද මල් කඩන්න.
  - සමන් පන්සලට එන්න.
  - පන් මල්ල ගන්න.
  - අන්දර අත්ත කපන්න.
  - අන්න මල් වත්තක්.
- එක් එක් වැකිය සිසුන්ට පෙන්වන්න.
- එක් එක් වැකිය ශබ්ද නගා කිහිප වරක් කියවන්න.
- සිසුන්ට කිහිප වරක් ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස එක් එක් වැකිය බැගින් පෙන්වා ශබ්ද නගා කියවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- පහත සඳහන් අභ්‍යාස පිටපත් කර සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ගැළපෙන වචනය යා කර, වාක්‍ය ගොඩ නැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.


| | |
|---|---|
| අන්න | කපන්න |
| සමන් පන්සලට | අරගන්න |
| අන්දර අත්ත | මල් වත්තක් |
| ඉද්ද මල් | එන්න |
| පන් මල්ල | යන්න |
| කමල් වත්තට | කඩන්න |

- නිවැරදි ලෙස ගොඩ නැගූ වැකි තනි රූල් පොතෙහි ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සිසුන් ලියූ සෑම අකුරක් වචනයක් කෙරෙහි ම අවධානය යොමු කරන්න.
- වැරදි තිබේ නම් එම අවස්ථාවේ දී ම නිවැරදි කරන්න.
- මෙලෙස හල් කිරීම යෙදුණු වචන සහිත සරල වැකි ලිවීම සඳහා ද ඉහත ආකාරයට ක්‍රියාකාරකම් සැලසුම් කරගන්න.
- අනතුරු ව හල් කිරීමේ ලකුණු යෙදුණු අකුරු සහිත වචන අඩංගු සරල වැකි ලිවීමට අවස්ථාව ලබා දෙන්න.

- **ඇලපිල්ල හඳුන්වා දීම** -

**ක්‍රියාකාරකම 01**

**පියවර 1 :**
- 'ආ' ශබ්දය යෙදෙන වචන කිහිපයක් ගුරුවරයා ශබ්ද නගා කියන්න.
  *උදා :* ගාල, තාල, නාද, පාර, මාල, යාල යන වචන
- සිසුන් ලවා ද එම වචන කියවන්න.
- එම වචනවල මුල් අකුරේ ශබ්දය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  ගා, තා, නා, පා, මා, යා ආදී වශයෙන්
- මුල් අකුරේ ශබ්දය සිසුන්ට අවධාරණය කරන්න.
- දූන් ''ආ'' ශබ්දයට අදාළ ස්වරය සිසුන්ගෙන් මතුකර ගන්න.
- දූන් ''ආ'' ශබ්දයට අදාළ ස්වරය පෙන්වන්න.



- එය කිහිප වතාවක් සිසුන් ලවා ශබ්ද කරවන්න.
- (මා, පා, ගා, තා, ලා, නා අකුරුවලට අලුතින් එක් වූ කොටස ඇලපිල්ල බවත් එහි ශබ්දය 'ආ' බවත් පැහැදිලි කරන්න. පිල්ල වෙනත් වර්ණයකින් ලියන්න.

**පියවර 2 :**
- පහත සඳහන් කවිය විශාල ලෙස ලියා ගත් කාඩ්පතක් සකස්කර ගන්න.
- ඇලපිල්ල යෙදෙන අකුරු වෙනත් පාටකින් ලියන්න.

| | |
|---|---|
| මාල මාල මාල | මාල |
| මට ම ගෙනා මාල | මාල |
| කරට දමා බලන | මාල |
| සාදයකට ඔබින | මාල |
| තාල තාල තාල | තාල |
| තාලයකට තබන | පාද |
| නාද නාද නාද | නාද |
| නාදයකට තබමු | තාල |


- සකස් කර ගත් කාඩ්පත ප්‍රදර්ශන පුවරුවේ සියලු ම සිසුන්ට පෙනෙන පරිදි රඳවන්න.
- කවිය තාලයට ගායනා කරන්න.
- සිසුන් ලවා ද ගායනා කරවන්න.
- අනතුරු ව අඩිකෝදුවක් ආධාර කර ගනිමින් ඇලපිල්ල සහිත වචන පෙන්වන්න.

  *උදා :* ''මාල'' යන වචනය කිහිප වතාවක් යෙදී ඇති ආකාරය වචනය පෙන්වමින් කියා දෙන්න.
- මේ ආකාරයට ම ''තාල'' හා ''නාද' වචන ගැන ද තහවුරු කර දෙන්න.
- එම වචන හැරුණු කොට කවියේ ඇති ''ආ'' ශබ්දය යෙදී ඇති අනෙක් වචන ගැන ද කතා කරන්න. (දාන, දාලා, පාද, සාදකයකට, නාදයකට)
- කවියේ ඇති වචන සිසුන් සමඟ සාකච්ඡා කරමින් හුණුපුවරුවේ ලියන්න.

මාල දාන
තාල දාලා
නාද පාද

- මෙම වචන පස්රුල් සහිත අභ්‍යාස පොත්වල ලිවීමට දෙන්න.
- ඇලපිල්ල අකුරට යොදන ස්ථානය හා අවසන් වන ස්ථානය පිළිබඳ ව නිවැරදි අවබෝධය ලබා දීමට කටයුතු කරන්න.

පියවර 3 : • පහත සඳහන් පින්තූර කාඩ්පත් හා වචන කාඩ්පත් සකස් කර ගන්න.




- එම පින්තූර කාඩ්පත් ප්‍රදර්ශන පුවරුවේ අලවන්න/රඳවන්න. වචන කාඩ්පත් ද ඊට යටින් රඳවන්න.
- පින්තූරයට අදාළ වචනය කියවන්න.
- 'මලය' යන වචනය නිවැරදිව ලියා ඇති වචනයක් දැයි සිසුන්ගෙන් අසන්න.
- වචනය නිවැරදි වීමට නම් කළ යුත්තේ කුමක් දැයි සිසුන්ගෙන් ම පිළිතුරු ලබා ගන්න. අඩු වී ඇති පිල්ලම ගැන විමසන්න.
- ඇලපිල්ල අඩු වී ඇති බව පවසා වෙනත් වර්ණයකින් ඇලපිල්ල යොදන්න.
- මේ ආකාරයට ම ඉතුරු පින්තූරවල වචන ද සම්පූර්ණ කරන්න.
- එම වචන සිසුන්ට අභ්‍යාස පොත්වල ලිවීමට උපදෙස් දෙන්න.

මාලය පනාව තාරාවා නළාව

පියවර 4 : • සිංහල පෙළපොතේ පාඩම් තෝරා ගෙන ඇලපිල්ල යෙදුණු වචන සෙවීමට යොමු කරන්න.
- එම වචන බලා ලිවීමට දෙන්න.


පියවර 5 : • මෙතෙක් උගත් පිලි යොදා ගනිමින් සරල වාක්‍යාංශ හා වැකි ලිවීමට අවස්ථාව දෙන්න.

*උදා :* * තාරාවා පාලම යට
* හාවා ආවා.
* අම්මා බත් උයනවා.

- **කෙටි ඇදැපිල්ල හඳුන්වා දීම -**


**ක්‍රියාකාරකම 01**

**පියවර 1 :**
- 'ඇ' ශබ්දය සහිත වචන කිහිපයක් ගුරුවරයා ශබ්ද නගා කියන්න.
  *උදා* : කැට, දැල, නැව, පැය
- ගුරුවරයා කියන ලද වචන සිසුන් ලවා ද කියවන්න.
- එම වචනවල මුලින් ඇසෙන ශබ්දය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- එම ශබ්ද 'කැ, දැ, නැ, පැ' බව කියා දෙන්න.
- මුල් ශබ්දය තුළ ඇති ස්වරය සිසුන්ගෙන් මතුකර ගන්න.
- ''ඇ'' ශබ්දයට අදාළ ස්වරය පෙන්වන්න.
- 'කැට, දැල, නැව, පැය' වචන හුණු පුවරුවේ ලියමින් අකුරට අලුතෙන් එක් වූ කොටස 'ඇ' ශබ්දය බවත් එහි නම 'කෙටි ඇදැපිල්ල' බවත් කියා දෙන්න.



**පියවර 2 :**
- පහත සඳහන් කවිය විශාල ලෙස ලියාගත් කාඩ්පතක් ද ''ඇ'' ශබ්දය ලියූ කාඩ්පතක් ද සකස්කර ගන්න.

ඇසළ අහසෙ
සඳ පායා
සමන් වැලට
පිනි වැටිලා
සිරි පොද
වැස්සක් වාගේ
හැම තැන යයි
පැතිරීලා



:
- කවිය සඳහන් කාඩ්පත සියලු ම සිසුන්ට පෙනෙන පරිදි රඳවන්න.
- කිහිපවතාවක් සිසුන් ලවා කියවන්න.
- කෙටි ඇදය සහිත වචන වර්ණ පෑනකින් වට කර පෙන්වන්න.
- ''ඇ'' ශබ්දය මතුකර ගන්න.
- අකුරු දෙකේ සරල වචන පහත ආකාරයට ලියන්න.

  *උදා* :
  ක ට ⟶ කැට
  ග න ⟶ ගැන
  ප ළ ⟶ පැළ
  ර ය ⟶ රැය
  හ ම ⟶ හැම

- අලුතෙන් එක් වූ කොටස 'කෙටි ඇදැපිල්ල' බව තහවුරු කරන්න.
- මෙම වචන රූල් පහේ අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.

**පියවර 3 :**
- කවියේ දක්වෙන පහත සඳහන් වචන මතක් කර ඒවා හුණු පුවරුවේ ලියන්න.

  * වැලට    * වැටිලා    * වැස්සක්

- එම වචන බලා ලිවීමට යොමු කරන්න.


පියවර 4 : 
- මෙතෙක් උගත් පිල්ලම් ද, කෙටි ඇදපිල්ල ද යොදා ගනිමින් වාක්‍යාංශ කිහිපයක් සකස් කර ගන්න.
- ඒවා බලා ලිවීමට දෙන්න. ඒ සඳහා තනිරූල් පොත භාවිත කරන්න.
  *උදා :* ඇතා  වැව  මැද

පියවර 5 : 
- සිංහල කියවීම පොතෙන් කෙටි ඇදපිල්ල සහිත වචන සොයන්න. ඒවා බලා ලිවීමට ද අසා ලිවීමට ද දෙන්න.

- **දික් ඇදපිල්ල හඳුන්වා දීම**
  - දික් ඇදපිල්ල යෙදුණු වචන කිහිපයක් ශබ්ද නඟා කියන්න.
    *උදා :* කෑම, ගෑම, රෑන, වෑය, සෑය
  - එම වචනවල මුල් ශබ්දය සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  - මෙලෙස දික් ඇදපිල්ල මුලට යෙදුණු අකුරු තුනේ වචන ද කියන්න.
  - එම වචන සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.
  - මෙලෙස දික් ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ සහ තුනේ වචනවල එම ශබ්දය අවධාරණය කරන්න.
  - දික් ඇදපිල්ල යෙදුණු සරල වාක්‍යාංශ සහ වැකි ලිවීමට අවස්ථාව දෙන්න.
    *උදා :* * කෑරලා මෑ වැල උඩ
  - දික් ඇදපිල්ල යෙදුණු වචන සිංහල පෙළපොතෙන් සොයා ලිවීමට ද අවස්ථාව ලබා දෙන්න.
  - දික් ඇදපිල්ල යෙදුණු අකුරු දෙකේ සරල වචන 5ක් අසා ලිවීමට දෙන්න.

- **කෙටි ඉස්පිල්ල හඳුන්වා දීම**
  - පිල්ලම් ඉගැන්වීමේ ඉහත ක්‍රමවේදය අනුගමනය කරමින් කෙටි ඉස්පිල්ල මුලට යෙදුණු වචන උදාහරණයට ගන්න.
  - එම වචන ඇසුරින් කෙටි ඉස්පිල්ල හඳුන්වා දෙන්න.

    *උදා :* කිරි  දිව  නිදි  පිට  පිනි
    බිම  මිදි  මිටි  මිල  විල
  - කි - දි - මි - පි - මි - බි - වි - ආදී වශයෙන් මුල් ශබ්දවල ඇති ස්වරය සිසුන්ගෙන් මතු කර ගන්න.
  - දැන් 'ඉ' ශබ්දයට අදාළ ස්වරය පෙන්වන්න.



  - එය කිහිපවරක් සිසුන් ලවා ශබ්ද කරවන්න. අකුරුවලට අලුතින් එක් වූ කොටසේ ශබ්දය 'ඉ' බවත් එහි නම 'කෙටි ඉස්පිල්ල' බවත් පැහැදිලි කරන්න.
  - පහත සඳහන් වචන කාඩ්පත් පන්තියට ම ප්‍රමාණවත් වන පරිදි සකස් කර ගන්න.

| | | | |
|---|---|---|---|
| මල - මිල | දන - දින | බල - බිල | පන - පින |
| රට - රිට | සත - සිත | නර - නිර | කම - කිම |
| මට - මිට | ගල - ගිල | ලය - ලිය | හර - හිර |
| වල - විල | පල - පිල | නල - නිල | හම - හිම |
| වට - විට | තර - තිර | වස - විස | මග - මිග |

- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- සිසුන් පේළි දෙකකට පෙළගස්වන්න.
- පිල්ලම් රහිත කාඩ්පත් එක් පේළියකටත්, පිල්ලම් සහිත කාඩ්පත් අනෙක් පේළියටත් බෙදා දෙන්න.
- පිල්ලම් රහිත කාඩ්පතක ඇති වචනයක් ගුරුවරයා ප්‍රකාශ කළ විට එම කාඩ්පත අත ඇති සිසුවාට ඉදිරියට එන ලෙස උපදෙස් දෙන්න.
  *උදා* : මල
- එම වචනයේ ම, මුල් අකුරට ඉස්පිල්ල යෙදී ඇති වචන කාඩ්පත ඇති සිසුවාට ඉදිරියට විත් 'මල' වචනය කාඩ්පත ඇති සිසුවා සමග අත් අල්ලා ගැනීමට කියන්න.
  *උදා* : මිල
- එම සිසුන් දෙදෙනාට වචන ප්‍රකාශ කිරීමට උපදෙස් දෙන්න.
  *උදා* : මල - මිල
- අනතුරු ව සියලු ම සිසුන්ට එක්වර එම වචන දෙක පැවසීමට අවස්ථාව දෙන්න.
- මේ ආකාරයට සියලු ම වචන සහිත කාඩ්පත් හඳුන්වා දී ඉස්පිල්ල යෙදී ඇති ආකාරය වටහා දෙන්න.
- සියලු ම වචන සිසුන් ලවා කියවන්න.
  මට - මිට  මල - මිල  රට - රිට
- සිසුන් පන්තියට කැඳවාගෙන එන්න.
- ක්‍රියාකාරකමට යොදා ගත් වචන කාඩ්පත් 5 බැගින් කණ්ඩායම්වලට ලබා දී වචන ලිවීමට යොමු කරන්න.

- **දික් ඉස්පිල්ල හඳුන්වා දීම**
  - කෙටි ඉස්පිල්ල හඳුන්වා දුන් ආකාරයට ම පිළි ඉගැන්වීමේ ක්‍රමවේදය අනුගමනය කරමින් දීර්ඝ ඉස්පිල්ල හඳුන්වා දෙන්න.
  - අකුරු දෙකේ වචන
    *උදා* : කීර, ගීත, නීල, පීර, වීර, සීත
  - අකුරු තුනේ වචන
    *උදා* : ගීතය, චීනය, සීපද, හීනය
  - සරල වැකි ලිවීමට යොමු කරන්න.
    *උදා* : * නීලා සීපද කීවා.
  - දික් ඉස්පිල්ල යෙදුණු වචන සිංහල පෙළපොතෙන් සොයා ලිවීමට ද අවස්ථාව ලබා දෙන්න.
  - දික් ඉස්පිල්ල යෙදුණු සරල වචන 5ක් අසා ලිවීමට දෙන්න.

- **කෙටි පාපිල්ල හඳුන්වා දීම**
  - කුඩ, ගුල, මුව, රුව, සුබ මෙම වචන ශබ්ද නගා කියවන්න.
  - ගුරුවරයා එම වචන කියවමින් සිසුන් ලවා ද කිහිප වරක් කියවන්න.
  - එම වචනවල මුල් අකුරෙන් ඇසෙන ශබ්දය සිසුන්ගෙන් ලබා ගැනීමට සාකච්ඡා කරන්න.
  - එම මුල් ශබ්ද නැවත වරක් ශබ්ද කරන්න. කු - ගු - මු - රු - සු
  - ඇසෙන ශබ්දය 'උ' බව තහවුරු කරගන්න.
  - ඉහත වචන හුණු පුවරුවේ ලියමින් අකුරට අලුතෙන් එක් වූ කොටසේ ශබ්දය 'උ' බවත් එහි නම ''කෙටි පාපිල්ල'' බවත් තහවුරු කරන්න.
  - කෙටි පාපිල්ල අකුරුවලට විවිධාකාරයෙන් යෙදෙන බවත් විවිධ ස්ථානවල යෙදෙන බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

* පහත සඳහන් ආකාරයට කෙටි පාපිලිවලට වෙනත් වර්ණයක් යොදා ගනිමින් වගුව ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| පුටු | ගුල | රුව |
| බුදු | තුන | සරු |
| මුදු | කුඩය | ඔරුව |
| සුදු | තුඹස | තරුව |

* කෙටි පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන අඩංගු සරල වාක්‍යාංශ සහ වැකි ලිවීමට යොමු කරන්න.

  *උදා* : * යතුර පුටුව උඩ
  * සුමුදු තරු බැලුවා.

* කෙටි පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සිංහල පෙළපොතෙන් සොයා ලිවීමට ද උපදෙස් දෙන්න.
* කෙටි පාපිල්ල යෙදුණු අකුරු සහිත සරල වචන (අකුරු දෙකේ) 5ක් අසා ලිවීමට දෙන්න.

* **දික් පාපිල්ල හඳුන්වා දීම**

**පියවර 1** : • කෙටි පාපිල්ල හඳුන්වා දීමට ගත් ක්‍රමවේදය ම යොදා ගනිමින් දික් පාපිල්ල හඳුන්වා දෙන්න.


පූ යන්නෙන් පූසා
බූ යන්නෙන් බූලා
ලූ යන්නෙන් ලූලා
හූ යන්නෙන් හූනා

පුරු පුරු පූසා
බුහ් බුහ් බූලා
චික් චික් හූනා
දිය බුං ලූලා

* ඉහත කවිය සිසුන්ට පැහැදිලි ව පෙනෙන සේ ප්‍රදර්ශනය කරන්න.
* 'පූසා - බූලා - හූනා - ලූලා' මේවායේ පින්තූර කාඩ්පත් හා වචන ලියූ කාඩ්පත් වෙන වෙන ම සකස් කරගන්න.
* පළමුව ගුරුවරයා කවිය ගායනා කරන්න.
* ගුරුවරයා සිසුන් සමඟ ද කවිය ගායනා කරන්න.
* කවියේ ඇති (පූ/ බූ / ලූ / හූ) මෙම අකුරු පෙන්වමින් ''ඌ'' ශබ්දය මතුකර ගන්න.

  *උදා* : ''පූ'' යන්නෙන් ''පූසා''

* පේළියෙන් පේළිය නැවත ගායනයේ යෙදෙන්න.
* පින්තූර කාඩ්පත ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.




- එයට යටින් වචන කාඩ්පත රඳවන්න.
- මේ ආකාරයට සියලු ම රූප හා වචන ගැළපෙන සේ ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- එම වචන අභ්‍යාස පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න. අදාළ රූපය ද ඇඳ ගැනීමට යොමු කරන්න.
- අකුරු දෙකේ වචන ලිවීම
  *උදා* : කුර, නුල, මූණ, රූල, සූර
- අකුරු තුනේ වචන ලිවීම
  *උදා* : කුඩය, පූජාව, මූඩිය, සූඩයා
- සරල වාක්‍යාංශ හා වැකි ලිවීමට යොමු කරන්න.
  *උදා* : * බූලා කුඩාරම යට
  * පූසා හූනා ඇල්ලුවා.
- කෙටි පාපිල්ල යෙදුණු අකුරු සහිත වචන සිංහල පෙළ පොතෙන් සොයා ලිවීමට අවස්ථාව දෙන්න.

- **කොම්බුව හඳුන්වා දීම**

පියවර 1 :
- පහත කවිය විශාල ලෙස ලියා සකස් කර ගන්න.

දෙහි ගෙඩි දෙහි ගෙඩි
බෙලි ගෙඩි බෙලි ගෙඩි
දෙහි ගෙඩි බෙලි ගෙඩි
හදලා හෙට බොමු //



- දෙහි ගෙඩියක හා බෙලි ගෙඩියක රූප දෙකක් පාට කර සකස් කර ගන්න.
- | දෙහි | | බෙලි | ලෙස ලියූ වචන පත්‍රිකා පන්තියේ සිසුන් ගණනට අනුව සකස් කර ගන්න. ''ෙ'' වෙනත් වර්ණයකින් යොදන්න.

පියවර 2 :
- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- කවිය ගායනා කරන්න.
- සිසුන් සමග තාල තබමින් ගායනා කරන්න.
- දෙහි ගෙඩි හා බෙලි ගෙඩි රූප දෙක ස්ථාන දෙකක රඳවන්න.
- දෙහි හා බෙලි වචන කාඩ්පත් අහඹු ලෙස සිසුන්ට ලබා දෙන්න.
- 'දෙහි ගෙඩි දෙහි ගෙඩි' කියන විට දෙහි වචනය සහිත කාඩ්පත ඇති සිසුන් දෙහි ගෙඩියේ රූපය ඇති ස්ථානයට යාමට පවසන්න.
- 'බෙලි ගෙඩි බෙලි ගෙඩි' කියන විට බෙලි වචනය සහිත කාඩ්පත ඇති සිසුන් බෙලි ගෙඩියේ රූපය ඇති ස්ථානයට යාමට පවසන්න.
- එම ස්ථාන දෙකේ සිටිමින් ගීතය ගායනා කිරීමට අවස්ථාව දෙන්න.
- 'දෙහි' වචනයේ හා 'බෙලි' වචනයේ 'එ' ශබ්දය ගැන කතා කරන්න.

පියවර 3 :
- සිසුන් පන්තියට කැඳවාගෙන එන්න.
- කවිය ලියූ කාඩ්පත ප්‍රදර්ශනය පුවරුවේ රඳවන්න.
- වචන පෙන්වමින් නැවත කියවන්න.
- 'එ' ශබ්දය යෙදුණු වචන මතුකර ගන්න.
- ඒවා හුණු පුවරුවේ ලියන්න.
  *උදා* : දෙහි, බෙලි, ගෙඩි, හෙට
- 'එ' ශබ්දය සඳහා කොම්බුව භාවිත කරන බව පැහැදිලි කරන්න.
- එම වචන ලිවීමට දෙන්න.

පියවර 4 : ● සිංහල කියවීම පොතෙන් අකුරු තුනේ 'එ' ශබ්දය සහිත වචන 5ක් සොයා ලියන්නට උපදෙස් දෙන්න.

පියවර 5 : ● 'එ' ශබ්දය යෙදෙන සරල වැකි ලිවීමට දෙන්න.
*උදා :* * බෙලි රසයි. * දෙහි ඇඹුලයි. * බෙලි සාදා දෙහි දමමු.

පියවර 6 : ● ''ෙ'' යෙදෙන තවත් වචන ලබා දෙමින් ලිවීමේ අභ්‍යාස ලබා දෙන්න.

- **කොම්බුව සහ හල් ලකුණ හඳුන්වා දීම**

- 'කේක්, ලේනා, බේසම, සේසත' යන වචන හුණු පුවරුවේ ලියන්න.
- එම වචන ශබ්දනගා කියවන්න.
- සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.
- එම වචනවල 'ඒ' ශබ්දය මතු කරන්න.
- 'ඒ' ශබ්දය සඳහා කොම්බුව සහ හල් ලකුණ භාවිත වන අයුරු ඉහත වචන ඇසුරින් පැහැදිලි කරන්න.
- අනතුරුව පහත වචන කියවීමට සහ ලිවීමට දෙන්න.

**අකුරු දෙකේ වචන -** කේක් පේර ලේනා සේර මේස වේයා
**අකුරු තුනේ වචන -** ඩේලියා බේසම රේන්ද සේසත

- සරල වාක්‍යාංශ සහ වැකි කියවීමට හා ලිවීමට යොමු කරන්න.
*උදා :* බේසම මේසය උඩ, ලේනා පේර කෑවා. , සේන කේක් ගේනවා.
- 'ඒ' ශබ්දය යෙදුණු වචන සිංහල කියවීම් පොතෙන් සොයා ලිවීමට ද අවස්ථාව ලබා දෙන්න.
- 'ඒ'' ශබ්දය යෙදුණු වචන 5ක් අසා ලිවීමට දෙන්න. (අකුරු දෙකේ හා තුනේ වචන)
- 'ෙ ් ' යෙදෙන තවත් වචන ලබා දෙමින් ලිවීමේ අභ්‍යාස කරවන්න.

- **කොම්බුව සහ ඇලපිල්ල හඳුන්වා දීම**

පියවර 1 : ● පන්තිය ඇතුළත සිසුන් අඩ කවයකට සකසා ගන්න.
- පහත සඳහන් තේරවිලි කියා ඒ පිළිබඳ සිසුන්ට සිතීමට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න.

* සුදුපාටට පෙනෙන්නේ
වෙල අයිනේ සිටින්නේ - කොකා

* ගේ දොර පිස දමන්නේ
ගේ මුල්ලේ සිටින්නේ - කොස්ස

* උදැල්ල අරගෙන
කුඹුරට යනවා - ගොවියා

* අරිනවා - වහනවා
රෑට යතුරු දමනවා - දොර

* ඉර පායන විට පිල් විදහා නටනවා - මොනරා

* පිටි දාලා වඩනවා
පුච්චා රස බලනවා - රොටී

- කොකා, මොනරා, දොර, කොස්සා, රොටි, ගොවියා යන වචන හා රූප කාඩ්පත් වෙන වෙන ම සකසා ගන්න.

- ගුරුවරයා නම් කරන ලද සිසුවා ඉදිරියට පැමිණ පැවසූ තේරවිල්ලට අදාළ රූප කාඩ්පත ගැනීමට උපදෙස් දෙන්න.
- රූප කාඩ්පත ලෑල්ලේ රඳවන්න. අදාළ වචන කාඩ්පත ද රඳවන්න. සිසුන් ලවා කියවන්න.


*උදා* :



කොකා

- 'ඔ' ශබ්දයට කොම්බුව සහ ඇලපිල්ල භාවිත වන අයුරු තේරවිලිවල පිළිතුරු ඇසුරින් පැහැදිලි කරන්න.
- තේරවිලිවල පිළිතුරුවලට අදාළ වචන අභ්‍යාස පොතේ ලිවීමට යොමු කරන්න.
- පහත සඳහන් ආකාරයේ පැවරුම් පතක් සියලු ම සිසුන්ට ලබා දෙන්න.

*උදා* :

 මේසය උඩ

........................... මේසය උඩ

 කුඹුර කොටනවා

......................... කුඹුර කොටනවා

මාමා  කැඩුවා.

මාමා ....................කැඩුවා.


- පින්තූරයට අදාළ වචනය හිස්තැනෙහි ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සම්පූර්ණ කරන ලද වැකි කියවීමට අවස්ථාව දෙන්න.
- පැවරුම්පතේ සම්පූර්ණ කරන ලද වැකි තනිරූල් පොතේ ලිවීමට දෙන්න.

- **කොම්බුව, ඇලපිල්ල සහ හල් කිරීමේ ලකුණ හඳුන්වා දීම**
  - මෙම කවිය හුණු පුවරුවේ ලියන්න.
  - 'ඕ' ශබ්දය යෙදෙන අකුරු ලිවීමට වෙනත් වර්ණයක් භාවිත කරන්න.

බෝල බෝල
පිනි වැටිලා
රෝද රෝද
හතු හැදිලා
තෝර තෝර
ගනිමු කඩා
සෝද සෝද
ගනිමු කපා

- කවිය ගායනා කරන්න.
- සිසුන් සමඟින් ද ගායනා කරන්න.

- වර්ණ කර ලියූ අකුරු පිළිබඳ ව අවධාරණය කරන්න.
- 'ඕ' ශබ්දය යෙදෙන වචන සිසුන්ගෙන් මතු කර ගන්න.
- එම වචන හුණු පුවරුවේ ලියන්න.
- හුණු පුවරුවේ ලියන ලද වචන රූල් පහේ අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.
- 'ඕ' ශබ්දය ඇති වචන සිංහල කියවීම් පොතෙන් සොයා ලිවීමට දෙන්න.
- 'ඕ' ශබ්දය යෙදෙන සරල වාක්‍යාංශ සහ වැකි ලිවීමට දෙන්න.
- පහත සඳහන් පරිදි පැවරුම් පතක් සකස් කර ගන්න.

(1) මල්ලී  ගත්තා.

*උදා :* මල්ලී බෝලය ගත්තා.

(2) අර මට

------ ------- -------

(3) අම්මා  ඉව්වා

------- ------- -------

- හිස්තැන්වලට වචන යොදා අභ්‍යාස සම්පූර්ණ කිරීමට උපදෙස් දෙන්න.
- සම්පූර්ණ කරන ලද වාක්‍යාංශ සහ වැකි කියවීමට අවස්ථාව දෙන්න.
- සකස් කරන ලද වාක්‍යාංශය හා වැකිය තනිරූල් පොතේ ලිවීමට දෙන්න.

**නිපුණතා :** **$L_2$ සවන් දීමේ කුසලතා සංවර්ධනය සඳහා සවන්දෙයි.**

**$S_2$ කථන කුසලතා සංවර්ධනය සඳහා කතා කරයි.**

**$R_2$ කියවීමේ කුසලතා සංවර්ධනය සඳහා කියවයි.**

**$W_2$ ලිවීමේ කුසලතා සංවර්ධනය සඳහා ලියයි.**

ඉගෙනුම් පල :
- වචනවල ශබ්ද විභේදනය හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- අකුරු ගළපා අර්ථවත් වචන සාදයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:

### පිලි රහිත අකුරු දෙකේ වචන

**ක්‍රියාකාරකම 01**

පියවර 1 : (එළිමහන් ක්‍රියාකාරකමකි)

- අඩ කවයක් ආකාරයට සිසුන් වාඩි කරවන්න.
- සිසුන්ට සවන්දීමට උපදෙස් දී පහත සඳහන් වචන හරස් අතට (→) ශබ්ද නඟා පවසන්න.


| | | | |
|---|---|---|---|
| කය | කද | කස | කට |

| | | | |
|---|---|---|---|
| හය | හද | හස | හට |

- වචනවලින් මුලට ඇසෙන ශබ්දය පිළිබඳ විමසන්න. වචන කට්ටල සියල්ල එසේ කියවන්න.
- ඉහත වචන කට්ටල පහළට ↓ කියන්න. *උදා* : කය, හය
- වචනවල අගට ඇසෙන ශබ්දය පිළිබඳ විමසන්න.
- එම වචනවල ඇති වෙනස පහදා දෙන්න.

පියවර 2 :
- මෙම වචන කට්ටල අත්පුඩි ගසමින් සිසුන් ලවා කියවන්න.
- පියවර 1හි දී ගුරුවරයා කියූ ආකාරයට ම හරහට හා පහළට කිහිපවරක් වචන කට්ටල ශබ්ද නඟා කියන්න.
- වචනවල ශබ්ද අතර ඇති සියුම් වෙනස්කම් පිළිබඳ සිසුන් සමඟ කතා කරන්න.

පියවර 3 :
- ඉහත යොදා ගත් මෙම වචන කාඩ්පත් සහ එම වචනවල මුලට ඇති අකුරු ද රූපයේ පෙනෙන ආකාරයට සූදානම් කරන්න.




- අකුරු පේළියකට තබන්න.
- වචන කාඩ්පත් සිසුන්ට ලබා දෙන්න.
- ඒවා කියවා ගැනීමට සිසුන්ට සහාය වන්න.
- නළාව නාද කළ විට තමා අතැති කාඩ්පතේ ඇති වචනය පටන් ගන්නා අකුර ඉදිරියේ පේළි සැදෙන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- එසේ පේළි සැදුණු පසු වචන කාඩ්පත් කියවීමට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට සෑම වචන පේළියක් ම කියවීමට යොමු කරන්න.

පියවර 4 : 
- සිසුන් පන්තියට කැඳවා ගෙන එන්න.
- සිසුන් අතැති කාඩ්පත් ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- එක ම අකුරින් පටන් ගන්නා වචන කාඩ්පත් එක පේළියකට රැඳවීමට උපදෙස් දෙන්න.
- එම වචන පේළි වශයෙන් ලිවීමට සිසුන් යොමු කරන්න.
- ඒවා නැවත කියවීමට යොමු කර වචනවල වෙනස්කම් ගැන නැවත කතා කරන්න.

## පිලි රහිත අකුරු තුනේ වචන

**ක්‍රියාකාරකම 02**

පියවර 1 : 
- පහත සඳහන් අකුරු තුනේ වචන තෝරා ගන්න.

  නහය - යහන    සරම - සමර    කසය - සකය    බසය - සබය


  පහන - හපන    කඩය - යකඩ    නවය - වනය

- සිසුන් කණ්ඩායම් කරන්න.
- සිසුන් සවන්දීමට යොමු කරන්න.
- තෝරා ගත් වචන කියවන්න.
  *උදා* : නහය - යහන ///
- එලෙස ම වචන කට්ටල සියල්ලට ම සවන් දීමට සලස්වන්න.

පියවර 2 : 
- වචන දෙකක් වුවත් එම වචනවල සමාන බව පිළිබඳ කතා කරන්න.

පියවර 3 : 
- පහත වචනවල අකුරු යෝගට් පියන්වල ලියා ආධාරකයක් සවි කර රූපයේ පෙනෙන පරිදි සකස් කර ගන්න.

  නහය,   සරම,   කසය,   බසය,   පහන,   කඩය,   නවය




- සිසුන් තිදෙනා බැගින් පන්තිය ඉදිරියට කැඳවන්න.
- සකස් කර ගත් අකුරු තුන ලබා දෙන්න.
- එම අකුරු කියවීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් තිදෙනාට ''නහය'' වචනය සැදෙන ආකාරයට පිළිවෙළට පන්තිය ඉදිරියේ සිට ගැනීමට උපදෙස් දෙන්න.
- එම වචනය සිසුන් ලවා කියවන්න.
  *උදා* : නහය
- එම අකුරු 3 අතැති සිසුන්ට මාරු වී වෙනත් වචනයක් සැදෙන ආකාරයට සිට ගැනීමට යොමු කරන්න. *උදා* : යහන
- සිසුන් ලවා වචනය කියවන්න.
- එකම අකුරු 3 යොදා විවිධ වචන සැදිය හැකි බව තහවුරු කරන්න.
  'නහය - යහන' වචන හුණු පුවරුවේ ලියන්න.
- අකුරු තුන එක ම වුව ද වචන දෙක වෙනස් බව කියා දෙන්න.
- මේ ආකාරයට සියලු ම වචන සඳහා ක්‍රියාකාරකම කරවන්න.
- පැවරුම්පතක් සකස් කර දී කියවා යා කිරීමට යොමු කරන්න.

යා කරන්න.

| | |
|---|---|
| නහය | සකය |
| සරම | යහන |
| කසය | සමර |
| බසය | හපන |
| පහන | සබය |
| කඩය | වනය |
| නවය | යකඩ |

**පියවර 4 :** • හුණු පුවරුවේ ලියූ වචන බලා තනිරූල් පොත්වල ලිවීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- පිල්ලම් රහිත අකුරු හතරේ වචන සඳහා ද මෙවැනි ක්‍රියාකාරකම් සැලසුම් කර වචන අතර වෙනස්කම් හඳුනා ගැනීමට යොමු කරන්න.

## පිල්ලම් සහිත අකුරු දෙකේ වචන

**ක්‍රියාකාරකම** 01

**පියවර 1 :** (එළිමහන් ක්‍රියාකාරකමකි)

- සිසුන් අඩකවයක ආකාරයට පෙළගස්වන්න.
- පහත ගීතයට සවන් දීමට උපදෙස් දී ගුරුතුමිය ගීතය කිහිප වරක් ගායනා කරන්න.
- කවිය ගායනා කරමින් සිසුන් ලවා ද ගායනා කරවන්න.
- රඟ දක්වමින් ගායනා කරන්න.
- සිසුන් පන්තිය වෙත කැඳවාගෙන එන්න.

ගීතයඃ රෝසි රෝසි
එන්න එන්න
රෝස පොකුර
අර බලන්න

මල් පොහොට්ටු
ගොඩයි ගොඩයි
පොසොන් පෝය
හරිම ළඟයි

රෝස මලින්
දෝත පුරා
වඳිමු වඳිමු
දෝත නගා

- සවන් දුන් ගීතයෙන් ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.

*උදා* : * එන්න කියන්නේ කාට ද?
* බලන්න කියන්නේ මොකක් ද?
* ගොඩක් තියෙන්නේ මොනවා ද?
* වඳින්නේ කොහොම ද?

පියවර 2 : • ගීතයේ ඇතුළත් ''ඔ'' හා ''ඕ'' ශබ්දය යෙදෙන වචන ශබ්ද නඟා පවසන්න. ''ඔ'' හා ''ඕ'' ශබ්ද දෙකේ වෙනස අවබෝධ වන පරිදි කිහිප වරක් කියවන්න.

*උදා* : * පොකුර, පොහොට්ටු, ගොඩයි, පොසොන්
* රෝසි, රෝස, පෝය, දෝත

• එක් එක් වචනය හුණු පුවරුවේ ලියන්න.

• සිසුන් ලවා ද වචන ශබ්ද නඟා කිහිප විටක් කියවන්න.

පියවර 3 : • සිසුන් කණ්ඩායම් කරන්න.

• පහත සඳහන් කාඩ්පත සියලු ම සිසුන්ට පෙනෙන පරිදි විශාල ලෙස ලියා සකස් කර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

| | | |
|---|---|---|
| මොර | - | මෝර |
| තොර | - | තෝර |
| රොද | - | රෝද |
| දොස | - | දෝස |
| බොර | - | බෝර |

• කාඩ්පතේ සඳහන් වචන පේළි සිසුන් ලවා පහළට කියවන්න.

*උදා* : මොර, තොර, රොද, දොස, බොර
මෝර, තෝර, රෝද, දෝස, බෝර

• ඉන් පසු ව වචන මොර - මෝර
තොර - තෝර . . . යනාදී වශයෙන් සිසුන් ලවා කියවන්න.

• මෙම වචන කාඩ්පත්වල ද ලියා සියලු ම සිසුන්ට ප්‍රමාණවත් පරිදි සකස් කර ගන්න.

*උදා* : මොර මෝර
තොර තෝර

• සකස් කරගත් කාඩ්පත් 5 බැගින් කණ්ඩායම්වලට ලබා දෙන්න.

• එක් සිසුවෙකුට එක් කාඩ්පතක් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන්න.

• ''ඔ'' ශබ්දය සහිත අකුර කියූ විට එම ශබ්දය සහිත වචන කාඩ්පත් අතැති සිසුන්ට නැගිටීමට උපදෙස් දෙන්න.

*උදා* : ''මො' අකුර කියූ විට [මොර] කාඩ්පත

• එම සිසුන් පන්තිය ඉදිරියට කැඳවන්න. කාඩ්පත සිසුන්ට පෙන්වා ශබ්ද නඟා වචනය කියවීමට උපදෙස් දෙන්න.

*උදා* : මොර

• මේ ආකාරයට ම ''ඕ'' ශබ්දය කියන්න. උදා: 'මෝ''

• එම ශබ්දයට අදාළ වචනය සහිත කාඩ්පත අතැති සිසුන්ට නැගිට ඉදිරියට පැමිණීමට උපදෙස් දෙන්න.

*උදා* : [මෝර] වචනය සහිත කාඩ්පත

• මොර - මෝර වචන කාඩ්පත් අතැති සිසුන් දෙදෙනා බැගින් අත් අල්ලා ගෙන වචන දෙක කියවීමට යොමු කරන්න.

• ඒ ආකාරයට ම සියලු ම වචන කියවන්න.

• වචන කාඩ්පත් සිසුන් අතර හුවමාරු කර ක්‍රියාකාරකම නැවත කරන්න.

පියවර 4 : • පහත සඳහන් පරිදි හිස්තැන් පිරවීමේ පැවරුම්පතක් සකස් කර ගන්න.
• පැවරුම් පත සියලු ම සිසුන්ට ලබා දෙන්න.
• හිස්තැනට සුදුසු අකුර ලිවීමට යොමු කරන්න.

**හිස්තැන් පුරවන්න.**

| | |
|---|---|
| [මො] ර | [ ] ර |
| [ ] ර | [තෝ] ර |
| [රො] ද | [ ] ද |
| [ ] ස | [දෝ] ස |
| [බො] ර | [ ] ර |

## පිලි සහිත අකුරු තුනේ වචන

**ක්‍රියාකාරකම** 02

පියවර 1 : • පහත ගීතය ගුරුවරයා කිහිප වරක් ගායනා කරන්න.

සීත උදේ බටිති මලිති
මිහිරි සින්දු කියනවා
කීචි-බීචි චීං හඬින්
වීණා නද ඇසෙනවා

රන්දි දෝණි කුරුලු හඬට
මිහිරි ගීත ගයනවා
නිසල් පුතා උදැසනින්
ගිගිරි තාල තියනවා

• ගීතය ඇසුරෙන් සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.
*උදා* : * මිහිරි සින්දු කියන්නේ කවුරු ද?
* කොයි වේලාවට ද?
* රන්දිට ඇසුණේ කුමන හඬක් ද?
* තාල තියන්නේ කවුරු ද?

පියවර 2 : • සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
• පන්තිය දෙපැත්තට පෙළගස්වන්න.
• ගීතය සිසුන් ලවා ගායනා කරවන්න.
• රංගනයේ යෙදෙමින් ගායනා කරන්න.
• කෙටි හා දික් ඉස්පිල්ල සහිත වචන ගීතය ඇසුරෙන් හඳුන්වා දෙන්න.
• මෙහි දී එම ශබ්ද දෙක අතර වෙනස පහදා දෙන්න.
• ගීතයේ සඳහන් කෙටි ඉස්පිල්ල යෙදූ වචන මොනවා දැයි සිසුන්ගෙන් අසන්න.
*උදා* : බටිති, මලිති, මිහිරි . . .
• දික් ඉස්පිල්ල යෙදුණු වචන මොනවා දැයි අසන්න.
කීචි, බීචි, චීං, වීණාවක්
• 'අපි හැමෝම එම වචන කියමු' යැයි යෝජනා කර එක් පැත්තක සිටින සිසුන්ට කෙටි ඉස්පිල්ල යෙදූ වචනත්, අනෙක් පැත්තේ සිසුන්ට දික් ඉස්පිල්ල යෙදූ වචනත් ගුරුවරයා සමග කියවීමට අවස්ථාව දෙන්න.

*උදා* : ''ඉ'' ''ඊ''

| ''ඉ'' | ''ඊ'' |
|---|---|
| බටිති | සීත |
| මලිති | කීචි |
| මිහිරි | බීචි |
| රන්දි | චීං |
| සින්දු | වීණාව |
| අපිව | |
| හඬින් | |

පියවර 3 : • සිසුන් කණ්ඩායම් කරන්න.

| | | |
|---|---|---|
| | කි | රි |
| බ | | ති |
| පි | හි | |

ටි

| | | |
|---|---|---|
| | හි | ණි |
| ම | | ති |
| ස | ල් | |

ලි

| | | |
|---|---|---|
| | හි | රි |
| චි | | නි |
| පි | රි | |

මි

| | | |
|---|---|---|
| | ය | ත |
| ටි | | රි |
| දි | න | |

කි

| | | |
|---|---|---|
| | ය | න |
| පි | | ත |
| ගි | ගි | |

රි

- ඉහත සඳහන් කාඩ්පත් කට්ටලයක් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- කාඩ්පත යට ඇති අකුරු තුනක් වෙනත් වර්ණයකින් ලියා සකස් කර පෙට්ටියකට දමා කණ්ඩායමකට අකුරු කට්ටලයක් ද ලබා දෙන්න.
- එක් සිසුවෙකුට එක් කාඩ්පතක් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන්න.
- අකුරු පෙට්ටියෙන් අකුරු තබමින් වචනය කියවීමට කියන්න.

*උදා* :

| | | |
|---|---|---|
| ටි | කි | රි |
| බ | ටි | ති |
| පි | හි | ටි |

- මෙම කාඩ්පත ගත් සිසුවා (ටි) අකුරු තුන තෝරා කාඩ්පතේ හිස්තැන්වලට තබා කියවිය යුතු බවට උපදෙස් දෙන්න.
- මේ ආකාරයට එක් එක් සිසුවා තම කාඩ්පත සම්පූර්ණ කළ පසුව එම අකුරු ඇලවීමට උපදෙස් දෙන්න.
- කණ්ඩායමේ සිසුන් අතර කාඩ්පත් මාරු කරමින් කියවීමට යොමු කරන්න.

පියවර 4 : • එක් එක් සිසුවාගේ කාඩ්පත තමාගේ අභ්‍යාස පොතේ ඇලවීමට කියන්න.

- එහි සඳහන් වචන ලිවීමට සලස්වන්න.
- තමාගේ කාඩ්පතේ වචන ලියූ පසු යහළුවෙකුගේ කාඩ්පතක වචන ද ලියන්නට අවස්ථාව දෙන්න.

## පිලි සහිත අකුරු හතරේ වචන

**ක්‍රියාකාරකම**

පියවර 1 : • කතන්දරයකට සවන් දීමට සුදුසු පරිදි සිසුන්ට හිඳගැනීමට සලස්වන්න.

- පහත කතන්දරය ගුරුතුමිය රසවත් ව කියන්න.

> රුක්මල් රැකියාව විදියට (ලෙස) කළේ බුලත් විකිණීම. ඔහු බුලත් ගේන්න ගියේ ගමට ටිකක් දුරින් තිබුණු දූපතකට. දූපතේ බූරුවෝ හිටියා. බූරුවන්ගේ කූඩාරම සාදා තිබුණේ රුස්ස ගහක් යට. දවසක් රෑ මහා කුණාටුවක් ආවා. කූඩාරම කැඩුණා. රුක්මන් දූපතට යනකොට බූරුවන්ට තුවාල වෙලා. බුලත් කොරටුවත් කඩා වැටිලා. රුක්මල්ට හරිම දුකයි.

- නැවත කතන්දරය පවසා ප්‍රශ්න කිහිපයක් සාකච්ඡා කරන්න.

  *උදා* : * බුලත් විකුණුවේ කවුරු ද? රුක්මල්
  * කුඩාරම සාදා තිබුණේ කොහේ ද? රූස්ස ගහ යට
  * රුක්මල් විකුණුවේ මොනවා ද? බුලත්
  * දූපතේ සිටියේ කවුරුන් ද? බූරුවෝ
  * දවසක් රෑ ආවේ කුමක් ද? කුණාටුවක්
  * කුණාටුවට කැඩුණේ මොකක් ද? කුඩාරම
  * දූපත තිබුණේ ගමට ළඟින් ද දුරින් ද? දුරින්
  * බුලත් ගේන්න ගියේ කොහාට ද? දූපතට

පියවර 2 :
- කතාවේ වචන යුගල වශයෙන් ගුරුවරයා කියමින් සිසුන් ලවා ද කියන්න.

  රුක්මල් - රූස්ස

  බුලත් - බූරුවෝ

  කුණාටුව - කූඩාරම

  දුරින් - දූපතට

- වචනවල ''උ'' ශබ්දය ''ඌ'' ශබ්ද අතර වෙනස පැහැදිලි ව හඳුන්වා දෙන්න.
- ගුරුවරයා ''උ'' ශබ්දයේ වචනය කියූ විට සිසුන්ට ''ඌ'' ශබ්දයේ වචනය කීමට යොමු කරන්න. *උදා* : රුක්මල් - රූස්ස
- ගුරුවරයා ''ඌ' ශබ්දයේ වචනය කියූ විට සිසුන්ට ''උ'' ශබ්දයේ වචනය කීමට උපදෙස් දෙන්න. *උදා*: රූස්ස - රුක්මල්
- ඉන්පසුව 'රුක්මල්, බුලත්, කුණාටුව, දුරින්' යන වචන එක වරකට ද 'රූස්ස, බූරුවෝ, කූඩාරම, දූපතට' වචන එක වරකට ද ශබ්ද නගා සිසුන් ලවා කියවන්න.

පියවර 3 :
- පියවර 1 සඳහා යොදා ගත් කතන්දරයේ අකුරු තරමක් විශාල ලෙස ලියා සකස් කර කතාවේ පිටපතක් බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ගුරුවරයා කතාව කියමින් සිසුන් ලවා ද කියවන්න.
- සිසුන්ට තනිව ම කතාව කියවීමට අවස්ථා ලබා දෙන්න. අවශ්‍ය අවස්ථාවල දී උදවු ලබා දෙන්න.
- ගුරුවරයා කියවන වචන කොටු කිරීමට උපදෙස් දෙන්න.

  රුක්මල්, රූස්ස
- රුක්මල් වචනය කහ පාටින් ද රූස්ස වචනය නිල් පාටින් ද පාට කිරීමට කියන්න.
- මේ ආකාරයට ඉතිරි වචන ද කොටු කරමින් පාට කරවන්න.
- කහ පාටින් පාට කළ වචන කියවන්න.
- නිල් පාටින් පාට කළ වචන කියවන්න.
- පැවරුම් පතේ ඇති පාපිලි යෙදුණු වෙනත් වචන ගැන ද අවධානය යොමු කරන්න.

පියවර 4 :
- පැවරුම් පත්වල කොටු කරන ලද අකුරු හතරේ වචන ගුරුවරයා හුණු පුවරුවේ ලියන්න. *උදා* : රුක්මල්, කුණාටුව, කූඩාරම, බූරුවෝ, දූපතට
- මෙම වචන රූල් පහේ අභ්‍යාස පොත්වල ලිවීමට උපදෙස් දෙන්න.

## නිපුණතා : $L_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් සවන්දෙයි.
## $S_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් කතා කරයි.

**ඉගෙනුම් පල** :
- කවි/ගීතවලට රසවින්දනයෙන් යුතු ව සවන් දී, තාල තබයි.
- කතන්දර, දෙබස්, අනුකරණවලට කැමැත්තෙන් යුතු ව සවන් දී ඉදිරිපත් කරයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- **ළමා ගීත**

**ක්‍රියාකාරකම 1**

- පහත සඳහන් ගීතය සිසුන්ට කිහිපවරක් සවන්දීමට අවස්ථාව දෙන්න.
- ගීතයේ අන්තර්ගතය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- ගීතයට අනුව රංගනයේ යෙදීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගුරුවරයා ද සිසුන් සමග රංගනයට එක්වන්න.

**පුළුන් කොට්ට**

*උදා* : පුළුන් කොට්ට අත් දෙක තබලා
හොරෙන් හොරෙන් වටපිට බලලා
ගමන් බිමන් යාමට හපනා - බළල් හාමිනේ . . .

**පද රචනය** : මෙල්රෝයි ධර්මරත්න
**ගායනය** : ශිරෝමි ප්‍රනාන්දු
ළමා ගීත එකතුව, ජෝර්ජ් රොබ්සන් ද සිල්වා, පිටු. 59

- **ළමා කතන්දර**

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- ගුරුවරයා ද සිසුන් සමග වාඩිවෙන්න.
- සිසුන් සියලු දෙනාට ම ඇසෙන පරිදි කතන්දරයක් රසවත් ව පවසන්න.
- කතන්දරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.
- කතාව ආශ්‍රයෙන් සකසා ගත් ප්‍රශ්න සිසුන්ගෙන් අසන්න.

*උදා* : කතන්දරය

**අපි හරි යාළුයි**

එක කැලෑවක අලි පැටියෙකුයි හා පැටියෙකුයි බොහොම යාළුකමින් සිටියා. මේ දෙන්නා සෙල්ලම් කළේ හරිම සමගියෙන්. එක්කෙනෙකුට අනිත් කෙනා නැතුව ඉන්න බෑ. හැමදාම හවසට සෙල්ලම් කරන්න මේ දෙන්නා ගමේ පිට්ටනියට එනවා. බැරිවෙලා හරි සෙල්ලම් කරන වේලාවට එක්කෙනෙකුට එන්න ප්‍රමාද වුණොත් අනිත් කෙනා ඉන්නෙ හරිම නොඉවසිල්ලෙන්.

හැමදාම හා පැටියා උදෙන් ම ඉස්කෝලෙ යනවා. අලි පැටියා තමයි හා පැටියව ඉස්කෝලෙට ගෙනියන්නෙ. හා පැටියා අලි පැටියගෙ පිට උඩ නැගගෙන ඉස්කෝලෙ යන්නෙ පුදුම සතුටකින්.

හා පැටියාව ඉස්කෝලෙ ගේට්ටුව ළඟ දි බැහැල යනකොට අලි පැටියට හරිම දුකයි. ඒ දුකට අලි පැටියා පැත්තකට වෙලා අඬන වෙලාවලුත් තියෙනවා. දවසක් හා පැටියා අලි පැටියගේ ඇස්වල තිබුණු කඳුළු දැක්කා.

'ඇයි මගේ යාළුවේ. ඔයාට මම නැතුව පාළුයි ද ? ඒකද මේ අඬන්නේ ?' කියල හා පැටියා ඇහුවා.

'මට ගොඩක් දුකයි හා පැටියො. මමත් ආසයි ඔයා වගේ ඉස්කෝලෙ යන්න.' අලි පැටියා කිවුවා.

'හරි. මමත් ආසයි ඔයා මගේ පන්තියේ ම ඉන්නව නම්. මම අපේ ගුරුතුමීගෙන් අහන්නම්' යැයි හා පැටියා පැවසුවා. එදා හා පැටියා ඉස්කෝලෙ ගිහිං මේ විස්තරේ ගුරුතුමීට කිවුවා.

'ඊළඟ දවසේ ඉඳන් ඔයාගේ යාළුවටත් ඉස්කෝලෙට එන්න කියන්න.' ගුරුතුමී පැවසුවා. හා පැටියා එදා ඉස්කෝලෙ ඇරෙනකම් ඉවසිල්ලක් නැතුව හිටියේ මේ පණිවුඩේ අලි පැටියාට කියන්න.

ඉස්කෝලෙ ඇරුණු ගමන් ම ගෙදර ගිහිං සෙල්ලම් කරන වේලාව එනතුරු නොසිට හා පැටියා පිට්ටනියට ගියා. එදා වෙලාව යන්නෑ කියලයි හා පැටියට දැණුනේ. මෙන්න අලි පැටියා එනවා.

හා පැටියා අලි පැටියට පණිවිඩය කිවුවා. අලි පැටියට හරිම සතුටුයි.

ඒ සතුටටත් එක්ක දෙන්න ම බොහෝ වෙලා යනකම් සෙල්ලම් කළා. පසුවදා ඉඳන් අලි පැටියයි හා පැටියයි දෙන්න ම ඉස්කෝලෙ ගියෙත් එකට. ආවෙත් එකට මයි.

- **ඇඟිලි රූකඩ දෙබස්**

**ක්‍රියාකාරකම** 3 -

- සිසුන්ගේ මහපට ඇඟිලිවලට පැලඳිය හැකි ආකාරයට සකස් කරගත් මුහුණක් සිසුන් සංඛ්‍යාවට අනුව සකසා ගන්න.
- සිසුන් අඩකවයකට වාඩි කරවන්න.
- පළමුව මහපට ඇඟිලි දෙකට මුහුණු දමා කිහිපවරක් දෙබස් පවසන්න.
- සෑම සිසුවෙකුට ම එක් මහපට ඇඟිල්ලකට මුහුණ පැලඳ ගැනීමට පවසන්න.
- ගුරුවරයා දෙබසෙහි එන 'ළමයා'ගේ කොටස කියන්න.
- 'කුඹලාගේ' කොටස සිසුන්ට පැවසීමට දෙන්න.
- මෙලෙස දෙබසෙහි චරිත මාරුකර දෙබස ඉදිරිපත් කරන්න.
- පිළිතුරු දෙන විට මුහුණු පැලඳි ඇඟිල්ල චලනය කොට පිළිතුරු දීමට සිසුන්ට පවසන්න.

*උදා* :
ළමයා : රන් කුඹලෝ //
කුඹලා : ඇයි ළමයෝ //
ළමයා : මොකට ද ඔය මැටි ගුළියක්
කුඹලා : ගේ හදන්න ගෙනාව මං
ළමයා : කොහේ ද ඔය ගේ හදන්නෙ
කුඹලා : උළුවස්සෙයි ගේ හදන්නෙ
ළමයා : මගේ පුටුව යට හදන්න
කුඹලා : අම්ම ඒක කඩයි නේද ?
ළමයා : නැහැ කඩන්න දෙන්නෑ මං
කුඹලා : ඔයා ගොඩක් හොඳ ළමයෙක්
ළමයා/කුඹලා : අපි දැන් හොඳ යාළුවෝ . . .//

- **අනුකරණ**

**ක්‍රියාකාරකම** 4

- සිසුන් රවුමක ආකාරය වාඩි කරවන්න.
- උදෑසන අවදි වී කරන දේවල් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- ඒ අනුව පහත ගීතයට සවන්දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ගීතයේ එක් එක් අවස්ථා අනුකරණය කරන අයුරු සිසුන්ට පෙන්වන්න.
- එම එක් එක් අවස්ථා ගයමින් අනුකරණය කිරීමට සිසුන්ට මග පෙන්වන්න.
- ගුරුවරයා ද සිසුන් සමඟ එක් ව ගීතය ගයමින් අනුකරණයේ යෙදෙන්න.

- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායමට විවිධ අවස්ථා ලබා දී ගීතයට අනුව අනුකරණයේ යෙදීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස කණ්ඩායම් මාරු කරමින් ඉහත ක්‍රියාකාරකමෙහි යොදවන්න.

*උදා :* අපි මෙහෙමයි
දත් මදින්නෙ . . . ///
අපි මෙහෙමයි දත් මදින්නෙ පුංචි බුරුසුවෙන්
අපි මෙහෙමයි
මුව දොවන්නෙ . . .///
අපි මෙහෙමයි මුව දොවන්නෙ - පුංචි අත් දෙකෙන්
අපි මෙහෙමයි
කෑම කන්නෙ . . .///
අපි මෙහෙමයි කෑම කන්නෙ - පුංචි පිඟානෙන්
අපි මෙහෙමයි
වතුර බොන්නෙ . . .///
අපි මෙහෙමයි වතුර බොන්නෙ - පුංචි කෝප්පෙන්
අපි මෙහෙමයි
වැඩ කරන්නෙ . . . ///
අපි මෙහෙමයි වැඩ කරන්නෙ - පුංචි උදැල්ලෙන්
අපි මෙහෙමයි
ගමන් යන්නෙ . . . ///
අපි මෙහෙමයි ගමන් යන්නෙ - පුංචි පා දෙකෙන්

## නිපුණතා : $R_3$ කැමැත්තෙන් හා රසවිඳිමින් කියවයි.
## $W_3$ කමැත්තෙන් හා රසවිඳිමින් ලියයි/අඳියි.

**ඉගෙනුම් පල :**
- කවි/ගීත, කතන්දර, දෙබස් අවබෝධ කරගෙන එහි අන්තර්ගත වචන නිවැරදි ව ලියයි.
- කවි/ගීත, කතන්දර හා දෙබස් අවබෝධ කර, තමා කැමති ආකාරයට චිත්‍ර ලෙස ඉදිරිපත් කරයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- ළමා කවි/ගීත

**ක්‍රියාකාරකම 1**

- 'පුළුන් කොට්ට'යන ළමා ගීතයෙන් කොටසක් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ගුරුවරයා විසින් එක් එක් වචනය ශබ්ද නගා කියවන්න.
- ගුරුවරයා සමඟ සිසුන්ට ද ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- එම ගීත කොටසින් තමා කැමති වචන පහක් බලා ලිවීමට යොමු කරන්න.
- එක් එක් සිසුන්ගේ අභ්‍යාස පොත් පරීක්ෂා කරන අතර වචන උච්චාරණයට ද අවස්ථාව ලබා දෙන්න.

- ළමා කතන්දර

**ක්‍රියාකාරකම 2 -**

- 'අපි හරි යාළුයි' කතන්දරයේ එන සරල ඡේදයක පිටපත බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ඡේදය කියවන්න.
- ගුරුවරයා සිසුන් සමඟ ඡේදය කියවන්න.
- ඡේදයෙන් තෝරාගත් වචන කිහිපයක් පවසා එම වචන රවුම් කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම ඡේදයේ රවුම් කිරීමට දුන් වචන හුණු පුවරුවේ ලියන්න.
- එම වචන ශබ්ද නගා කියවන්න.
- ගුරුවරයා සමඟ එක්ව සිසුන්ට ද වචන ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- සිසුන් විසින් රවුම් කරන ලද වචන හා හුණු පුවරුවේ ඇති වචන සැසඳීමට අවස්ථාව දෙන්න.
- ඡේදයේ රවුම් කර ඇති වචන බලා ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- ඇඟිලි රූකඩ දෙබස්

**ක්‍රියාකාරකම 3 -**

- 'රන් කුඹලා සහ ළමයා' දෙබස පිටපත් කොට සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- දෙබස වර්ණ දෙකකින් හුණු පුවරුවේ ලියන්න.
- ගුරුවරයා එක් එක් වචනය ශබ්ද නගා කියවන්න.
- ගුරුවරයා සමඟ සිසුන්ට ද වචන කියවීමට අවස්ථාව දෙන්න.
- දෙන ලද දෙබසෙහි සිසුන්ට තමා කැමති වචන පහක් රවුම් කරන ලෙස උපදෙස් දෙන්න.
- රවුම් කරන ලද වචන පහ රූල් පහේ අභ්‍යාස පොතේ ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

- චිත්‍ර

**ක්‍රියාකාරකම 4**

- පෙර උගත් ගීතයෙන්/කතන්දරයෙන්/ඇඟිලි රූකඩ දෙබසින් තමා සිත්ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- සියලු ම සිසුන්ගේ චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- මෙය චිත්‍ර ප්‍රදර්ශනයක් ලෙසින් පවත්වන්න.
- අනතුරුව සිසුන් චිත්‍ර ඉදිරිපිට අඩකවයකට වාඩි කරවන්න.
- එම චිත්‍ර අතුරින් තමා අඳින ලද චිත්‍රය පෙන්වා එහි ඇති දේ පිළිබඳ පැවසීමට සෑම සිසුවෙකුට ම අවස්ථාව දෙන්න.

**නිපුණතා :** **$L_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කිරීම සඳහා සවන්දෙයි.**
**$S_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කිරීම සඳහා කතා කරයි.**
**$R_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කිරීම සඳහා කියවයි.**
**$W_4$ එදිනෙදා අවශ්‍යතා ඉටු කිරීම සඳහා ලියයි.**


**ඉගෙනුම් පල :**
- ලබා දෙන උපදෙස් වටහාගෙන අදාළ පරිදි ප්‍රතිචාර දක්වයි.
- සරල තොරතුරකට සවන් දී ප්‍රතිචාර දක්වයි.
- තමා පිළිබඳ වැදගත් කරුණු අවබෝධයෙන් යුතුව ප්‍රකාශ කරයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- *උපදෙස්*

**ක්‍රියාකාරකම 1**

- සිසුන් අඩ කවයක් ආකාරයට වාඩි කරවන්න.
- ගුරුවරයා සිසුන් ඉදිරියේ සිටිමින් පහත උපදෙස් ලබා දෙන්න.
- පහත එක් එක් පියවර ගුරුතුමිය විසින් ද සිදුකර පෙන්වන්න.
- රවුම් හැඩයේ කොළයක් අතට ගන්න.
- රවුමෙහි දෙපැත්තකින් කුඩා කොටස් දෙකක් ඉදිරියට නමන්න.
- රවුම ඇතුළෙහි ඇස් දෙකක් අඳින්න.
- ඇස් දෙකට පහළින් නහයක් අඳින්න.
- රවුමේ පිටුපසින් ගම් ගා $A_4$ කොළයක ඇලවීමට දෙන්න.
- 'කුරුල්ලාට කැමති නමක් යෝජනා කිරීමට දී යෝජනා කළ නම ඇලවූ රූපයට යටින් ලිවීමට උපදෙස් දෙන්න.
- යෝජිත නම් සියල්ල හුණු පුවරුවේ ලියන්න.
- සිසුන් සමඟ එම නම් කියවන්න.
- ඉන් නම් පහක් බලා ලිවීමට දෙන්න.
- මෙවැනි උපදෙස් සහිත ක්‍රියාකාරකම් තවදුරටත් සිසුන් ලවා සිදු කරන්න.



- තොරතුරු

**ක්‍රියාකාරකම 2**

- පන්තියේ සිසුන් රවුමට සිටීමට සලස්වන්න.
- තෝරාගත් එක් සිසුවෙකුට තොරතුරක් පවසා තැපැල්කරුවකු බයිසිකලයක යන පරිදි ගොස් එම තොරතුර තවත් සිසුවෙකුට පැවසීමට යොමු කරන්න.
  *උදා :* ඉර පායලා මල් පිපිලා. අඹ කන්න ලේන්නු ඇවිල්ලා.
- තොරතුර ලබා ගත් සිසුවා තමාට ලැබුණු තොරතුර ශබ්ද නගා පැවසීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස සෑම සිසුවෙකුට ම සරල තොරතුරක් බැගින් තවත් සිසුවකුට පැවසීමට දෙන්න.
- තෝරාගත් සරල තොරතුරක් හුණු පුවරුවේ ලියන්න.
- ලියන ලද තොරතුර ශබ්ද නගා කිහිපවරක් කියවා පෙන්වන්න.
- සිසුන්ට ද කිහිපවරක් ශබ්ද නගා තොරතුර කියවීමට යොමු කරන්න.
- එම තොරතුර අභ්‍යාස පොතෙහි ලියා ගැනීමට අවස්ථාව දෙන්න.

- **තමා පිළිබඳ තොරතුරු**

**ක්‍රියාකාරකම 3**

- සිසුන් යුගල කරන්න.
- එක් එක් සිසුවාට තමාගේ නම, වයස හා ගම පැවසීමට යොමු කරන්න.
- අහඹු ලෙස සිසුන්ගෙන් තමා යහළුවාට පැවසූ දේ පිළිබඳ විමසන්න.
- එක් සිසුවෙක් අනෙක් සිසුවාට පවසන ලද තොරතුර ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එක් එක් සිසුන්ට තමාගේ ඡායාරූපය මව්බස අභ්‍යාස පොතේ අදාළ පිටුවේ වම්පස ඉහළ කෙළවරේ ඇලවීමට/තමාගේ රූපය ඇඳීමට උපදෙස් දෙන්න.

  ගුරුවරයා හුණු පුවරුවේ නම :

  වයසඃ

  ගම : යන ලෙසින් ලියා පෙන්වන්න.

- සිසුන්ට ද හුණු පුවරුවේ ලියා ඇති දේ කිහිපවරක් කියවීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව තමාගේ නම, වයස හා ගම ලිවීමට අවස්ථාව දෙන්න.

**නිපුණතා :** **$L_5$ වාංමාලා සංවර්ධනය සඳහා සවන්දෙයි.**
**$S_5$ වාංමාලා සංවර්ධනය සඳහා කතා කරයි.**
**$R_5$ වාංමාලා සංවර්ධනය සඳහා කියවයි.**
**$W_5$ වාංමාලා සංවර්ධනය සඳහා ලියයි.**

ඉගෙනුම් පල :
- කතන්දර, තේරවිලි ආදියට සවන් දී ඒවා නැවත භාවිත කරයි.
- තේරවිලිවලට සවන් දී කැමැත්තෙන් යුතු ව විසඳයි.
- සංකේත හඳුනා ගෙන අවබෝධයෙන් යුතු ව අදාළ පරිදි භාවිත කරයි.
- තෝරාගත් වචනවලට සාවධානයෙන් යුතු ව සවන් දී නිවැරදි ව ලියයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- කතන්දර

ක්‍රියාකාරකම 1

පියවර 1 : (එළිමහන් ක්‍රියාකාරකමකි)
- කතන්දරයට සවන්දීමට සුදුසු පරිදි ගුරුවරයා ද සිසුන් සමඟ වාඩිවෙන්න.
- තෝරාගත් කතන්දරය රසවත් ව පවසන්න.
- කතාව ආශ්‍රයෙන් සරල ප්‍රශ්න අසා පිළිතුරු ලබාගන්න.

<u>කතන්දරය</u>

**රැ සාදය**

වේයෝ හරි ම කඩිසරයි. වැඩක් නැතුව ඉන්න වෙලාවක් හොයා ගන්න අමාරුයි. හැමවෙලාවෙ ම පුංචි පුංචි පස් ගුළි අරන් ගෙයක් හදනවා. මේ ගෙදර හදන්නෙ එක්කෙනෙකුට ඉන්න ම නෙමෙයි. හැම දෙනාට ම ඉන්න යි. හැමදෙනා ම එකතුවෙලා විවේකයක් නොගෙන ම ගේ හදන්නේ වැසි කාලය අත ළඟ ම එන බව දැනගෙනයි.

ඉක්මනින් ගේ හදලා අවසන් කළ යුතු නිසා වේයන්ගේ නායකයා රැස්වීමක් කැඳෙවුවා. ගේ හදන වැඩේ බෙදාගෙන කරන්න තීරණය කළා. පස් ගේන්න, බිත්ති බඳින්න, බිත්තිවල ජනෙල් දොරවල් දාන්න වැඩ බෙදා ගත්තා. වේ හාමිනේලා දොර රෙදි ජනෙල් රෙදි දමා ගේ ඇතුළ සරසන්න බාර ගත්තා.

කොහොම හරි වැස්සට කලින් ගේ හදලා අවසන් කළා. ගෙදර ලොකු සාදයක් පවත්වන්න වේ නායකයා තීරණය කළා. දිනයක් නියම කරලා කූඹියන්ටයි, තණකොළ පෙත්තන්ටයි, කණාමැදිරියන්ටයි ආරාධනා කළා. සාදය පැවැත්වුණේ රාත්‍රී කාලයේ. කූඹි සහ තණකොළ පෙත්තෝ කෑම වර්ග ගොඩක් අරගෙන සාදයට ආවා. කණාමැදිරියන් සාදයට පැමිණ නොමිලේ ම ආලෝකය ලබා දුන්නා. එදා රැ වේයන්ගෙ ගේ ඇතුළ දිව්‍ය ලෝකයක් වගේ. හැමෝම ගොඩක් සතුටු වුණා.

පියවර 2 :
- කතන්දරයේ කොටසක් විශාල ව ලියාගත් කොළයක් පිටපත් කර සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එහි සඳහන් වචන පහක් හුණු පුවරුවේ ලියන්න.
- හුණු පුවරුවේ සඳහන් වචන කතන්දරයෙන් තෝරා එම වචන වටා රවුමක් ඇඳීමට සිසුන්ට උපදෙස් දෙන්න.

- ක්‍රියාකාරකම කරන අතරතුර ගුරුවරයා සිසුන් ව නිරීක්ෂණය කරන්න.
- රවුම් කරන ලද වචන අභ්‍යාස පොතේ ලියා ගැනීමට උපදෙස් දෙන්න.

පියවර 3 :
- කතන්දරය විශාල ව ලියාගත් කොළය නැවත සිසුන් අතට ගැනීමට පවසන්න.
- ගුරුවරයා පවසන වචන එම කොළයෙන් තෝරා වචනයට යටින් ඉරක් ඇඳීමට උපදෙස් දෙන්න.
- එම වචන හුණු පුවරුවේ ලියන්න.
- හුණු පුවරුවේ ලියූ වචන ඉරි ඇඳි වචන සමඟ සැසඳීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- හුණු පුවරුවේ ලියූ වචන එකින් එක ගුරුවරයා කියවූ පසු සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.
- එම වචන බලා ලිවීමට දෙන්න.

- **තේරවිලි**

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- තේරවිලි 05ක් තෝරාගන්න.

*උදා* : 1. සුදු පාටයි - උසම උසයි
හිස දල්වයි - අඳුර නසයි (පිළිතුර - ඉටිපන්දම)

2. උස ම උසයි - බෙල්ල දිගයි
ගස්වල දළු - හිටගෙන කයි (පිළිතුර - ජිරාෆ්)

3. රෑ අහසේ දිලිසෙන්නේ
ලොවට එළිය මම දෙන්නේ (පිළිතුර - හඳ)

4. දාරත් නැති - මුලුත් නොමැති
යන්නේ මම පෙරළි පෙරළි (පිළිතුර - බෝලය)

5. මගේ ඇගේ කුරු ගොඩයි - පාට පාට මල් විසිරෙයි
අව්වට වැස්සට දෙකටම - මාව උඩින් අරන් දුවයි (පිළිතුර - කුඩය)

- ඉහත තේරවිලි 05 සඳහා පිළිතුරු පින්තූරවලින් සකසා ගන්න.
- පිළිතුරට අදාළ නොමැති පින්තූර 03ක් ද සකසා ගන්න.
- පින්තූර සහිත පෙට්ටිය බැගින් කණ්ඩායම් ගණනට සකසන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් කණ්ඩායම්වලට පින්තූර සහිත පෙට්ටිය බැගින් ලබා දෙන්න.
- කණ්ඩායම් සියල්ලන්ට ම ඇසෙන පරිදි එක් එක් තේරවිල්ලක් ශබ්ද නඟා පවසන්න.
- එම තේරවිල්ලට අදාළ පිළිතුර පින්තූර පෙට්ටියෙන් තේරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- පිළිතුර සහිත පින්තූරය පිළිබඳ කණ්ඩායම තුළ සාකච්ඡාවකට යොමු කරන්න.
- අහඹු ලෙස කණ්ඩායමකින් පිළිතුර ලබාගන්න.
- කණ්ඩායම විසින් ලබා දුන් පිළිතුර නිවැරදි දැයි අනෙක් කණ්ඩායම්වලින් විමසන්න.
- අනතුරුව සෙසු කණ්ඩායම්වලට ද පිළිතුර හඬ නගා ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.


පියවර 2 :
- පියවර 1 සඳහා යොදාගත් තේරවිලි හුණු පුවරුවේ ලියන්න.
- එක් එක් තේරවිල්ල ගුරුවරයා ශබ්ද නඟා කියවූ පසු ගුරුවරයා සමඟ සිසුන්ට කියවීමට අවස්ථාව දෙන්න.

- එක් එක් තේරවිල්ල බැගින් ලියන ලද කාඩ්පත් කණ්ඩායමට එක බැගින් ලබා දෙන්න.
- එක් තේරවිල්ලක් ශබ්ද නගා කියන්න.
- එම තේරවිල්ල සහිත කාඩ්පත ලැබුණු කණ්ඩායමට නැගිටින්නට පවසන්න.
- එම සිසුන්ට තමාට ලැබුණු තේරවිල්ල ගුරුවරයා සමඟ ශබ්ද නගා කියවීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස තේරවිලි පහ සඳහා ම ඉහත ආකාරයට සිදු කර සිසුන්ට තේරවිල්ල කියවීමට දෙන්න.
- තම කණ්ඩායමට ලැබුණු තේරවිල්ල බලා ලිවීමට අවස්ථාව දෙන්න.

- **සංකේත**


**ක්‍රියාකාරකම 3**

**පියවර 1 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පහත සඳහන් සංකේත දෙක කාඩ්බෝඩ්වල අළවා සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.



- මෙම සංකේත ඇති ස්ථාන දැක තිබෙනවා දැයි සිසුන්ගෙන් විමසන්න.
- එක් එක් සංකේතවලට අදාළ පිළිතුර ලැබේ දැයි විමසිලිමත් වන්න.
- සංකේත පිළිබඳ සිසුන්ට පැහැදිලි කරන්න.
- සංකේත අභ්‍යාස පොතේ ඇඳගැනීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එම සංකේත ඇඳ ඊට යටින් ගැහැනු, පිරිමි ලෙස ලිවීමට යොමු කරන්න.

**පියවර 2 :**
- එක් එක් කණ්ඩායමට පහත සඳහන් සංකේත පෙට්ටිවලට දමා ලබා දෙන්න.



- මෙම සංකේත බැලීමට අවස්ථාව දෙන්න.
- යා යුතු දිශාව පෙන්වීම සඳහා මෙම සංකේත භාවිත කරන බව පැහැදිලි කරන්න.
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න.
- අනතුරුව ඉහත සංකේත තුන වෙන වෙන ම කාඩ්බෝඩ් කැබැල්ලක ඇඳ ලීයකට සම්බන්ධ කර පිට්ටනියේ තබන්න.
- ඒ අනුව සිසුන්ට කණ්ඩායම් වශයෙන් ගමන් කිරීමට මග පෙන්වන්න.
- මෙවැනි සංකේත තිබීමේ වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

**පියවර 3 :**
- සංකේතවල පින්තූර අභ්‍යාස පොතේ අලවා ගැනීමට සලස්වා හඳුන්වා දීමේ දී භාවිත කළ වචන පහ අසා ලිවීමක් ලෙසට දෙන්න.

**නිපුණතා:** **$L_6$ සන්නිවේදනය සඳහා සවන්දෙයි.**

**$S_6$ සන්නිවේදනය සඳහා කතා කරයි.**

ඉගෙනුම් පල: • අන් අය හා විනීතව, කාරුණිකව හා මිත්‍රශීලීව කතා කරයි.
- අන් අයගේ අදහස්වලට සවන් දී අගය කරයි.
- එය පුරුද්දක් ලෙස සිදු කරයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපායඃ

• යහළුවන්

**ක්‍රියාකාරකම** 1

පියවර 1 : • සිසුන් යුගල කරන්න.
- ගුරුවරයා පහත තොරතුරු සිසුන්ට පවසන්න.
  * කැමති ම කෑම
  * කැමති ම සතා
- එක් එක් සිසු යුගලයට ඉහත තොරතුරු පිළිබඳ ව සුහද ව කතා කිරීමට උපදෙස් දෙන්න.
- සිසුන් තොරතුරු හුවමාරු කරගන්නා ආකාරය පිළිබඳ ව අවධානයෙන් සිටින්න.
- සාකච්ඡාවෙන් අනතුරුව තම යහළුවා පිළිබඳ දැනගත් තොරතුරු පැවසීමට අවස්ථාව දෙන්න.
- යුගල වශයෙන් තොරතුරු පැවසීමෙන් පසු සිසු යුගල මාරුකර තොරතුරු ලබා ගැනීමට යොමු කරන්න.
- ලබාගත් තොරතුරු පැවසීමට අවස්ථාව දෙන්න.

• ගුරුවරු

**ක්‍රියාකාරකම** 2 (එළිමහන් ක්‍රියාකාරකමකි)
- සිසුන් කවාකාර ව වාඩිකරවන්න.
- සුහදශීලී ව සිසුන් අමතන්න.
- මෙහි දී පළමුව පොදුවේ සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.

  *උදා* : * පුතාල/දූල හැමෝ ම සතුටින් ද ඉන්නෙ ?

  * පුතාල/දූල උදෙන් ම නැගිටල මොනව ද කරන්නෙ ?
- සිසුන් සියලු ම දෙනාගේ ම පිළිතුරුවලට සවන් දෙන්න.
- අනතුරුව එක් එක් සිසුන්ගේ නම් පවසමින් සාකච්ඡාව දිගින් දිගට ගෙන යන්න.
- මෙහි දී සිසුන්ගේ රුචි අරුචිකම් දෛනිකව සිදුකරන වැඩ යනාදිය පිළිබඳව සාකච්ඡා කරන්න.
- සිසුන්ට ද ගුරුවරයාගෙන් ප්‍රශ්න ඇසීමට අවසථාව දෙන්න.

• **වෙළෙඳපොළ**

**ක්‍රියාකාරකම** 3

පියවර 1 : • සිසුන් වෙළෙඳ පොළක් නැරඹීමට කැඳවා ගෙන යන්න.
- මෙහි දී, * වෙළෙඳාම් කරන අයුරු

  * බඩු මිල දී ගන්නා අයුරු යනාදිය පිළිබඳ අවබෝධය ලබා දෙන්න.

පියවර 2 : • ආදර්ශ වෙළෙඳ පොළක් සඳහා ගෙන ආයුතු දේ හා සිසුන් එහි දී ඇඳිය යුතු ඇඳුම් පිළිබඳව දෙමාපියන් ද දැනුවත් කරන්න.
- ආදර්ශ වෙළෙඳ පොළක් සංවිධානය කරන්න.
- පෙර නැරඹූ වෙළෙඳ පොළෙහි අත්දැකීම මෙහි දී යොදා ගැනීම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- මෙහි දී සිසුන් විනීත ව හැසිරෙන්නේ ද යන්නත්, වචන භාවිතයේ ප්‍රායෝගිකත්වය හා ගුණාත්මක භාවය පිළිබඳවත් අවධානයෙන් සිට ඊට මග පෙන්වන්න.
- දෙමාපියන්ට හා 2 ශ්‍රේණියේ සිසුන්ට බඩු මිල දී ගැනීමට අවස්ථාව දෙන්න.

- දුරකථනය

**ක්‍රියාකාරකම 4**

- යෝගට් කෝප්ප දෙකක් හා නූලක් භාවිතයෙන් සෙල්ලම් දුරකතනයක් සකසන අයුරු සිසුන්ට පෙන්වන්න.
- සෙල්ලම් දුරකතනයක් සෑදීමට සිසුන්ට ද අවස්ථාව දෙන්න.
- ඒ සඳහා සිසුන්ට සහාය වන්න.
- සිසුන් එළිමහනට කැඳවා ගෙන යන්න.
- පළමුව ගුරුවරයා ආදර්ශ දුරකතනයකින් කතා කරන අයුරු පෙන්වන්න.
- සිසුන් යුගල කරන්න.
- සෑම සිසුවෙකු සමඟ ම ගුරුවරයා ද එක් ව කතා කරන්න.
- අනතුරුව සිසුන්ට තම යහළුවන් හා කතා කිරීමට අවස්ථාව දෙන්න.

## නිපුණතා : $R_6$ සන්නිවේදනය සඳහා කියවයි.
## $W_6$ සන්නිවේදනය සඳහා ලියයි.

**ඉගෙනුම් පල:** • ද්‍රව්‍යවල නම්, මිල සටහන්, ලේබල් කියවා අවබෝධ කොටගෙන එහි ඇති දේ සටහන් කර ගනියි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

• ද්‍රව්‍යවල නම්

**ක්‍රියාකාරකම 1**

පියවර 1 :
- පන්ති කාමරයේ ඇති ද්‍රව්‍ය පිළිබඳ සාකච්ඡාවක් පවත්වන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පන්ති කාමරයේ ඇති ද්‍රව්‍යවල පින්තූර කාඩ්පත් හා ඊට අදාළ නම් ලියූ කාඩ්පත් ඇතුළත් පෙට්ටි සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- ද්‍රව්‍ය රූපවලට අදාළ නම් එක ළඟින් තැබීමට උපදෙස් දෙන්න.
- සිසුන් රූප හා ඊට අදාළ නම් තෝරන අයුරු නිරීක්ෂණය කරන්න.
- ද්‍රව්‍යවල නම් හුණු පුවරුවේ ලියන්න.
- එක් එක් ද්‍රව්‍ය නාමය ශබ්ද නගා කිහිපවරක් කියවන්න.
- අනතුරුව සිසුන්ට ද කිහිපවරක් කියවීමට අවස්ථාව දෙන්න.
- ගුරුවරයා ද්‍රව්‍ය රූපය පෙන්වන විට ඊට අදාළ නම සහිත කාඩ්පත පෙන්වා කියවීමට දෙන්න.
- අනතුරුව එක් කණ්ඩායමකින් ද්‍රව්‍ය රූපයක් පෙන්වන විට ඔවුන් නම් කරන කණ්ඩායමෙන් ඊට අදාළ නම සහිත කාඩ්පත පෙන්වා කියවීමට උපදෙස් දෙන්න.
- අහඹු ලෙස නම් කරන ලද කණ්ඩායමෙන් හුණු පුවරුවේ ලියා ඇති ද්‍රව්‍ය නාමවලින් පෙන්වන ලද ද්‍රව්‍ය නාමය කියවීමට දෙන්න.
- ද්‍රව්‍ය නාම බලා අභ්‍යාස පොත්වල ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

• මිල සටහන්

**ක්‍රියාකාරකම 2**

පියවර 1 :
- විශාල ව ලියා සකස් කරගත් මිල දර්ශනයක් සිසුන්ට පෙනෙන පරිදි ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- එම මිල දර්ශනයේ ම පිටපත බැගින් සිසුන්ට ලබා දෙන්න.
- මිල දර්ශනය ශබ්ද නගා කිහිපවරක් කියවන්න.
- ගුරුවරයා සමඟ සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව මිල දර්ශනයේ ඇතුළත් වචනයක් ගුරුවරයා ශබ්ද නගා කියවන්න.
- ගුරුවරයා පැවසූ වචනය සිසුන් ළඟ ඇති මිල දර්ශනයෙන් සොයා රවුම් කිරීමට උපදෙස් දෙන්න.
- මෙලෙස වචන කිහිපයක් ප්‍රකාශ කරන්න.
- සියලු ම සිසුන් කරා ගොස් ඔවුන් නිවැරදි වචනය රවුම් කර ඇත් දැයි පරීක්ෂා කරන්න.
- එම වචන බලා ලිවීමට දෙන්න.

• ලේබල්

**ක්‍රියාකාරකම 3 :**

**පියවර 1 :**

- සිසුන් කණ්ඩායම් කරන්න.
- ධාන්‍ය වර්ග දැමීමට සුදුසු ප්ලාස්ටික් කෝප්ප (plastic cups) සහ ආහාර ද්‍රව්‍යවල නම් ලියූ ලේබල් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න. *උදා* : කඩල, කව්පි, පරිප්පු, මෙනේරි, තල කණ්ඩායම්වලට ලබා දී ඇති ප්ලාස්ටික් කෝප්පවල (plastic cups) දෙන ලද ලේබල් ඇලවීමට උපදෙස් දෙන්න.
- මෙහි දී එක් සිසුවකු විසින් එක් ලේබලයක් හෝ ඇලවීමට යොමු කරන්න.
- ලේබල්වල නම් ගුරුවරයා විසින් හුණු පුවරුවේ ලියන්න.
- එම නම් කිහිපවරක් ශබ්දනඟා පවසන්න.
- අනතුරුව සිසුන්ට ද එම නම් කියවීමට අවස්ථාව දෙන්න.
- හුණු පුවරුවේ ලියා ඇති නම් එක් එක් කණ්ඩායම්වලට ලබා දුන් ලේබල්වල තිබේ දැයි පරීක්ෂා කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**පියවර 2 :**

- සෑම කණ්ඩායමකට ම ප්ලාස්ටික් කෝප්ප (plastic cups) සහ නම් නොලියූ හිස් ලේබල් ලබාදෙන්න.
- කණ්ඩායමේ සෑම සිසුවෙකුට ම තමන් විසින් ඇලවූ ලේබලය දෙස බලා හිස් ලේබලයෙහි නම ලියා ලබාදුන් ප්ලාස්ටික් කෝප්පවල (plastic cups) ඇලවීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා ලේබලයක ඇති නමක් පැවසූ විට සෑම කණ්ඩායමක ම එම ලේබලය ඇති සිසුන්ට නම් කරන ස්ථානයට යාමට උපදෙස් දෙන්න.
- මෙලෙස සියලු ම ලේබල්වල ඇති නම් කියවා, එක් එක් ස්ථානවලට සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් කණ්ඩායමකින් එක් ලේබලයක් සහිත සිසුවෙක් ද, තවත් කණ්ඩායමකින් තවත් ලේබලයක් සහිත සිසුවෙක් ද යනාදී ලෙසට විවිධ වර්ගවලට අයත් ලේබල් සහිත සිසුන් කණ්ඩායමකට එක්වන ලෙසට සකස් කරන්න.
- මෙලෙස පන්තිය තුළ කණ්ඩායම් කිහිපයක් සකස් කරන්න.
- කණ්ඩායම් ලෙස එක් ව ලේබල්වල ඇති නම් ලිවීමට උපදෙස් දෙන්න.

**නිපුණතා :** **$S_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කතා කරයි.**

**$L_7$ භාෂාව හැසිරවීමේ කුසලතා සඳහා සවන් දෙයි.**

**$R_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා කියවයි.**

**$W_7$ භාෂාව හැසිරවීමේ කුසලතා වර්ධනය සඳහා ලියයි.**


ඉගෙනුම් පල:
- පින්තූරවල ඇති දේ පිළිබඳ අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.
- ජන ක්‍රීඩා, උත්සව පිළිබඳ අවබෝධ කරගෙන අන් අය හා සාකච්ඡා කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය:**

- පින්තූර

ක්‍රියාකාරකම 01

පියවර 1 :
- පහත රූපය විශාල ලෙස සකස් කර සිසුන්ට පෙනෙන පරිදි පන්තියේ ප්‍රදර්ශනය කරන්න.



- පින්තූරය දෙස බලා ඒ පිළිබඳව කතා කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.

පියවර 2 :
- රූපය ඇසුරින් සකස් කරගත් වැකි හුණු පුවරුවේ ලියන්න.
- එම වැකි සිසුන් සමඟ කියවන්න.

*උදා :*
* විලේ නෙළුම් මල් පිපිලා.
* සමනලුන් මල්වලට ඉගිලෙනවා.
* කුරුල්ලන් අහසේ ඉගිලෙනවා.
* කන්ද උඩින් ඉර පායනවා.
* විලේ මාළු පීනනවා.
* කොකා බලාගෙන ඉන්නවා.

පියවර 3 :
- සියලු ම සිසුන්ට පහත පත්‍රිකාව ලබා දී වචනයට ගැළපෙන ඉතිරි කොටස යා කිරීමට උපදෙස් දෙන්න.
- ගුරුවරයා නම් කරන සිසුවෙකු විසින් ගළපන ලද වැකි පන්තියේ සිසුන්ට ඇසෙන සේ කියවීමට යොමු කරන්න.

යා කරන්න.

| | |
|---|---|
| කොකා | පිපිලා. |
| නෙළුම් මල් | බලාගෙන ඉන්නවා. |
| මාළු | මල්වල පැණි බොනවා. |
| සමනලුන් | පීනනවා. |
| ඉර | අහසේ ඉගිලෙනවා. |
| කුරුල්ලන් | පායලා. |

පියවර 4 : ● පහත ඡේදය හුණුපුවරුවේ ලියන්න.

● හිස්තැන් පුරවමින් ඡේදය අභ්‍යාස පොතේ ලිවීමට දෙන්න.

කන්ද උඩින් ________ පායලා. මාළු පීනන දිහා ________ බලාගෙන ඉන්නවා. විලේ ________ පිපිලා. ________ මල් පැණි බොනවා. කුරුල්ලන් ________ ඉගිලෙනවා.

• ජන ක්‍රීඩා

**ක්‍රියාකාරකම 02 (එළිමහන් ක්‍රියාකාරකමකි)**

පියවර 1 : ● සිසුන් කණ්ඩායම් කරන්න.

● එක කණ්ඩායමක සිසුන් පැදුරක් මත රවුමක ආකාරයට වාඩි කරවන්න.

● අනෙක් සිසුන්ට ක්‍රීඩාව කරන ආකාරය බලා සිටීමට උපදෙස් දෙන්න.

● කණ්ඩායමේ සිසුන්ගේ අත්ල යටට සිටින ලෙස පැදුරු මත අත් තබා ගැනීමට සලස්වන්න.

● ගුරුවරයා කණ්ඩායමේ සිසුන්ගේ එක් එක් අතට තම ඇඟිල්ලක් තබමින්, 'අතුරු මිතුරු' ගීතය ගායනා කරන්න.

''අතුරු මිතුරු දඹදිව තුරු
රාජ කපුරු හෙට්ටියෝ

එස්. විජේසූරිය, ජන ක්‍රීඩා ශතකය, (35-36 පිටු)

● මෙලෙස ගීතය ගයමින් අවසානයේ දී 'ගොඩගනියෝ - හෙට්ටියෝ' යන්නෙහි - 'යෝ' කියවෙන විට ගුරුවරයා ඇඟිල්ල තැබූ අත හිමි සිසුවාට තම අත ඉවත් කර ගැනීමට උපදෙස් දෙන්න.

● ගීතය ගායනා කරමින්, කණ්ඩායමේ සෙසු සිසුන්ගේ ද අත් දෙක ම ඉවත් වී අවසානයට ඉතිරි වන සිසුවා ජය ලබන බව ක්‍රීඩාව තුළින් තහවුරු කරන්න.

● මෙලෙස සෑම කණ්ඩායමක ම සිසුන්ට පැදුරු මත වාඩි වී අතුරු මිතුරු ක්‍රීඩාව කිරීමට අවස්ථාව ලබා දෙන්න.

● කණ්ඩායමට නායකයෙකු බැගින් පත් කර, ක්‍රීඩාව කිරීමට උපදෙස් දෙන්න.

● සෑම කණ්ඩායමක ම සිසුන් ක්‍රීඩාව කරන අතරතුර ගුරුවරයා සියලු කණ්ඩායම් සමඟ ක්‍රීඩාව කරන්න.

පියවර 2 : ● පන්තියේ සිසුන්ට ප්‍රමාණවත් පරිදි පහත වචන ලියූ කාඩ්පත් කට්ටල සකස් කර ගන්න.

මිතුරු, හාල්, මනමාලි, ඉහළ, ටිකිරි

● ඉහත වචන පහ හුණු පුවරුවේ ලියා අවස්ථා තුනක් පමණ ශබ්ද නඟා කියවීමට සලස්වන්න.

● සිසුන් කණ්ඩායම් කරන්න.

● කාඩ්පත් කට්ටල සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.

● ගුරුවරයා පවසන වචනය සහිත කාඩ්පත් අතැති සිසුන්ට නැගිට වචනය සහිත කාඩ්පත දෙස බලා කියවීමට අවස්ථාව දෙන්න. *උදා :* මිතුරු

● මෙලෙස ගුරුවරයා අනෙකුත් වචන ද, කියවූ පසු අදාළ කාඩ්පත් අතැති සිසුන්ට වචන කියවීමට උපදෙස් දෙන්න.

● පසුව කණ්ඩායම් තුළ සිසුන්ගේ කාඩ්පත් මාරු කර කාඩ්පත් කියවීමට අවස්ථාව ලබා දෙන්න.

● ගුරුවරයා වචන පවසන වේගය වැඩි කරමින් සිසුන්ට ද වේගයෙන් වචන කියවීමට සලස්වන්න.

පියවර 3 : ● ඉහත උගත් වචන ඇසුරින් පැවරුම් පතක් සකස් කර ගන්න.

- සෑම සිසුවෙකුට ම පැවරුම් පත බැගින් ලබා දෙන්න.

*උදා :* සුදුසු අකුර තෝරා හිස්තැනෙහි ලියන්න.

ටි ___ රි (ති/කි)

මන ___ ලි (මා/ටා)

___ ල් (පා/හා)

ඉහ ___ (ළ/ල)

මි ___ රු (කු/තු)

- සිසුන් ලියන ලද පැවරුම් පත් පරීක්ෂා කරන්න.

- **උත්සව**

**ක්‍රියාකාරකම 03**

**නිපුණතා අංක 07**

**පියවර 1 :** ● පහත පින්තූරය සිසුන්ට පැහැදිලි ව පෙනෙන ලෙස විශාල කර සකස් කර ගන්න.



- පින්තූරය සිසුන්ට හොඳින් පෙනෙන ස්ථානයක රඳවන්න.
- පින්තූරය දෙස හොඳින් බලා, එහි පෙනෙන දේවල් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- සිසුන් පවසන පිළිතුරු අනුව සිංහල අවුරුදු කාලය පිළිබඳ අත්දැකීම් පින්තූරය ඇසුරින් සාකච්ඡා කරන්න.

  *උදා :* * ආච්චි මොකද කරන්නේ?
  * ගසේ අත්ත උඩ ඉන්නේ කවු ද?
  * ගස්වල තිබෙන ගෙඩි මොනවා ද?
  * රබන් ගහන්නේ කවු ද?

පියවර 2 :
- සිසුන් ප්‍රමාණයට කොළපාට හා රතුපාට කොඩි දෙක බැගින් සකස් කර ගන්න.
- පින්තූරයේ ඇති දේවල් ඇසුරෙන් 'හරි වැකි' සහ 'වැරදි වැකි' සිසුන්ට ඇසෙන ලෙස පවසන්න.

  *උදා :* මල්ලි ඕංචිලි පදිනවා. (×) නැන්දලා රබන් ගහනවා. (√)
  ආච්චි කැවුම් බදිනවා. (√) අඹ ගසේ කොහා සිටිනවා. (×)
- ගුරුවරයා පවසන වැකිවලට හොඳින් සවන් දී පැවසූ වැකිය 'හරි නම්' කොළ පාට කොඩියක් ඔසොවන ලෙස සිසුන්ට පවසන්න.
- ගුරුවරයා පැවසූ වැකිය 'වැරදි නම්' රතු පාට කොඩියක් ඔසවන ලෙසට ද සිසුන්ට පවසන්න.
- මේ ආකාරයට ප්‍රශ්න අසා සිසුන්ගෙන් නිවැරදි පිළිතුරු ලබා ගන්න.
- ප්‍රශ්නවලට අවබෝධයෙන් පිළිතුරු ලබා දෙන්නේ ද යන්න සිසුන් ඔසවන කොඩියට අනුව පරීක්ෂා කරන්න.

පියවර 3 :
- සිසුන් සෙල්ලම් මිදුලට රැගෙන යන්න.
- එහි ඇති ඕංචිල්ලා පැදීමට සිසුන් යොමු කරන්න.

  'ඕංචිලි වාරම්' කවි කියමින් සිසුන්ට ඕංචිලි පැදීමට අවස්ථාව ලබා දෙන්න.
- ගුරුවරයා ඕංචිලි වාරම් ගායනා කරන්න.

  *උදා :* ඕංචිලි චිලි චිල්ල මලේ - වැල්ල දිගට නෙල්ලි කැලේ
  කඩන්න බැරි කටු අකුලේ - කඩා දෙන්න මගේ මලේ

  උඩයන රවුමට පපුවයි දන්නේ - පහළට එනවිට නිවලයි එන්නේ
  පොල්ලක් පැන්නත් බය නොසිතන්නේ - පත්තිනි දෙවිඳුනි අප රැක දෙන්නේ
- සැම සිසුවෙකුට ම ඕංචිලි වාරම් කියමින් ඕංචිල්ලා පැදීමට අවස්ථාව සලසා දෙන්න.

පියවර 4 : (එළිමහන් ක්‍රියාකාරකමකි.)
- රබන් පද වැයීම සඳහා ළමා මේස ද පුටු ද රැගෙන යන්න. හැකිනම් රබන් යොදාගන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- ගුරුවරයා එක් කණ්ඩායමක වාඩි වෙන්න.
- සිසුන්ට බලා සිටීමට පවසන්න.
- ගුරුවරයා,

  'උඩින් උඩින් වර පෙත්තප්පු
  බිමින් බිමින් වර පෙත්තප්පු
  උඩින් උඩින් වර - බිමින් බිමින් වර
  කැවුම් කන්න වර පෙත්තප්පු' රබන් පදය ගායනා කරන්න.
- පසු ව, ගුරුවරයා රබන් පදය ගයමින් එහි තාලයට අනුව මේසයට ගසන්න.
- මෙය වාර තුනක් පමණ කරන්න.

පියවර 5 : 
- සිසුන් කණ්ඩායම්වල වාඩි කරවන්න.
- උඩින් උඩින් වර පෙත්තප්පු - යැයි ගුරුවරයා තාලයට ගායනා කරන්න.
- සිසුන්ට එම රබන් පදය තාලයට ගැසීමට පවසන්න.
- මේ ආකාරයට රබන් පද නිමවන තෙක් එම රබන් පදය ගායනා කොට සිසුන්ට තාලයට ගැසීමට අවස්ථාව දෙන්න.

පියවර 6 : 
- කණ්ඩායම්වල සෑම දෙනා ම රබන් පදය බැගින් ගායනා කරන විට, එක් කණ්ඩායමකට රබන් පදය ගැසීමට අවස්ථාව දෙන්න.
- මේ ආකාරයට පන්තියේ සියලු දෙනාට ම රබන් පද ගායනයටත්, රබන් පද වාදනයටත් අවස්ථාව දෙන්න.

පියවර 7 : 
- සිසුන් කණ්ඩායම් කරන්න.
- රූපය ඇසුරින් වගන්ති පහක් සාදා බ්‍රිස්ල් බෝඩ් එකක එම වැකි පැහැදිලි ව ලියන්න.

  *උදා :* * එරබදු මල් පිපිලා.
  * කොහා කෑගසනවා.
  * ළමයි ඔංචිලි පදිනවා.
  * ආච්චි කැවුම් බදිනවා.
  * නැන්දලා රබන් ගහනවා.
- ලියන ලද වැකි ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- මෙම වැකි එකින් එක ශබ්ද නගා කියවන්න.
- මෙලෙස අවස්ථා තුනක් පමණ වැකි කියවීමට සලස්වන්න.
- වැකි ලියූ බ්‍රිස්ල් බෝඩ් එක පුවරුවෙන් ඉවත් කරන්න.
- කණ්ඩායමකට වැකි දෙකක් සෑදිය හැකි පරිදි වචන කට්ටලය බැගින් ලබා දෙන්න.

| | | |
|---|---|---|
| බදිනවා | ආච්චි | කැවුම් |
| මල් | එරබදු | පිපිලා |
| ගහනවා | නැන්දලා | රබන් |
| කෑගසනවා | කොහා | |
| ඔංචිලි | පදිනවා | ළමයි |

- කට්ටලයේ ඇති වචන ගළපමින් වැකි සෑදීමට කණ්ඩායම්වලට උපදෙස් දෙන්න.
- කාඩ්පත් ගළපා සෑදූ වැකි තම කණ්ඩායමේ මේසය මත පිළිවෙළට තැබීමට සිසුන් යොමු කරන්න.
- ගුරුවරයා කණ්ඩායම් ක්‍රියාකාරකම පරීක්ෂා කරන්න.
- කණ්ඩායමක් ලෙස එක් ව සෑදූ වැකිවලින් එකක් බලා ලිවීමට අවස්ථාව දෙන්න.

**නිපුණතා :** **$L_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා සවන්දෙයි.**

**$S_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කතා කරයි.**

**$W_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා ලියයි.**

**$R_8$ ඉගෙනුම් සංවර්ධනය සඳහා කියවයි.**

ඉගෙනුම් පල :
- එදිනෙදා ජීවිතයේ ලද අත්දැකීම් චිත්‍ර මගින් ඉදිරිපත් කර විස්තර කරයි.
- චිත්‍ර දෙස බලා රසවිඳ ඒ පිළිබඳ සිය අදහස් ඉදිරිපත් කරයි.
- දුටු/සහභාගි වූ අවස්ථා/සිද්ධීන් චිත්‍රවලට නගා එම අත්දැකීම් අන් අය සමඟ හුවමාරු කර ගනියි.
- අඳින ලද චිත්‍ර/සහභාගි වූ අවස්ථා/ දුටු සිද්ධි හා චාරිකා සම්බන්ධ ව කියවයි. ලියයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

- අඳින ලද චිත්‍ර

ක්‍රියාකාරකම 1

පියවර 1 :
- සිසුන් සියලු දෙනාට ම පෙනෙන ලෙස චිත්‍රයක් ප්‍රදර්ශනය කරන්න.
- එම චිත්‍රය දෙස බලා සිටීමට සිසුන්ට ප්‍රමාණවත් කාලයක් ලබා දෙන්න.
- චිත්‍රය පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- චිත්‍රයේ අන්තර්ගතය පිළිබඳ සිසුන්ගෙන් ප්‍රශ්න අසන්න.
- සිසුන්ට නිදහසේ සිය කැමැත්තෙන් පිළිතුරු දීමට පොලඹවන්න.
- චිත්‍රය දෙස බලා වැකි තුනක් ලිවීමට උපදෙස් දෙන්න.
- ලියන ලද වැකි කියවීමට දෙන්න.

*උදා :* චිත්‍රය



පියවර 2 : • සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් එක් සිසුවාට $A_4$ කඩදාසිය බැගින් ලබා දෙන්න.
- $A_4$ කඩදාසිය සෘජුකෝණාස්‍රාකාර ව තබා ගන්නා ලෙසට උපදෙස් දෙන්න.
- අනතුරුව සිසුන්ට කැමති චිත්‍රයක් නිදහසේ ඇඳීමට අවස්ථාව දෙන්න.
- සිසුන් චිත්‍ර අඳින විට කිසිදු බාධාවක් නොකරන්න.
- අඳින ලද චිත්‍ර පිළිබඳ කණ්ඩායම් අතර සාකච්ඡා කිරීමට මඟ පෙන්වන්න.
- සිසුන් විසින් අඳින ලද චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- මෙය චිත්‍ර ප්‍රදර්ශනයක් ආකාරයට සැලසුම් කරන්න.
- සිසුන් සියලු ම දෙනාට චිත්‍ර නැරඹීමට අවස්ථාව ලබා දෙන්න.
- අනතුරුව චිත්‍ර දෙසට මුහුණ ලා අඩකවයක් ආකාරයට සිසුන් වාඩිකරවන්න.
- චිත්‍ර පිළිබඳ ව සෑම සිසුවකුගෙන් ම ප්‍රශ්න අසන්න.

  *උදා* : * පුතා/දුව ඔයාගේ චිත්‍රය ගැන කියන්න.
  * මේ චිත්‍රවලින් කැමති ම චිත්‍රය පෙන්වන්න.
  * ඒ චිත්‍රයට කැමති ඇයි ?

- මෙහිදී සිසුන්ට තමා කැමති ම චිත්‍රය පෙන්වා, එය අගය කරන්නට සලස්වන්න.
- සිසුන්ට නිදහසේ පිළිතුරු දීමට හැකිවන පරිදි ප්‍රශ්න අසන්න.
- එක් එක් සිසුන්ට තමන් විසින් අඳින ලද චිත්‍රය දෙස බලා වැකි දෙකක් ලිවීමට අවස්ථාව දෙන්න.
- ලියන ලද වැකි කියවීමට දෙන්න.

- **චාරිකා**

**ක්‍රියාකාරකම 2**

පියවර 1 : • ගුරුවරයා තමා ගිය විනෝද චාරිකාවක් හෝ නැරඹූ සුවිශේෂ ස්ථානයක් පිළිබඳ සිත්ගන්නා සුලු ආකාරයෙන් සිසුන්ට පවසන්න.

  *උදා* : සතුන් වත්ත, ළමා උද්‍යාන, මුහුදු වෙරළ, ආගමික ස්ථාන, එළවළු කොරටුව

- වීඩියෝ පට හෝ පින්තූර ආධාරයෙන් සිත්ගන්නා සුලු ආකාරයට පැහැදිලි කරන්න.
- සිසුන්ට ගුරුවරයාගෙන් ප්‍රශ්න ඇසීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස සිසුන් හා ගුරුවරයා අතර සාකච්ඡාවක් ඇති කරන්න.
- සාකච්ඡාවෙන් මතු වූ සරල වැකි තුනක් හුණු පුවරුවේ ලියන්න.
- එම වැකි බලා ලිවීමට දෙන්න.
- එම වැකි සිසුන්ට තනි ව ම කියවීමට හැකිදැයි පරීක්ෂා කිරීම සඳහා අහඹු ලෙස සිසුන්ට වැකි කියවීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව ගුරුවරයා එම වැකි ශබ්ද නගා කිහිපවරක් කියවන්න.
- ගුරුවරයා සමඟ සිසුන්ට ද කිහිපවරක් එම වැකි ශබ්ද නගා කියවීමට දෙන්න.

පියවර 2 : • සතුන් වත්තක වීඩියෝ පටයක් සපයා ගන්න.
- සිසුන්ට වීඩියෝව නැරඹීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව තමන් දුටු දේ සම්බන්ධයෙන් සිසුන්ගෙන් විමසන්න.
- සතුන් වත්ත වීඩියෝ පටයේ සිටි සතුන් තුන් දෙනෙකුගේ, පක්ෂීන් තුන්දෙනෙකු සහ ඊට අමතරව වීඩියෝ පටයේ නොසිටි සතුන් තුන් දෙනෙකුගේ නම් ලියූ කාඩ්පත් කණ්ඩායම් ප්‍රමාණයට අනුව සකසා ගන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.

- සෑම කණ්ඩායමකට ම නම් ලියූ කාඩ්පත් සහිත පෙට්ටිය බැගින් ලබා දෙන්න.
- වීඩියෝ පටයේ සිටි සතුන් සහ පක්ෂීන් පෙට්ටියෙහි ඇති නම්වලින් තේරීමට උපදෙස් දෙන්න.
- අනතුරුව එක් එක් කණ්ඩායම් පන්තිය ඉදිරියට කැඳවා, තෝරාගත් කාඩ්පත් සියල්ලන් අතරේ බෙදා ගෙන කියවීමට යොමු කරන්න.
- පින්තූරවල ඇති සතුන්ගේ හා පක්ෂීන්ගේ නම් ලිවීමට අවස්ථාව දෙන්න.
- ලියන ලද නම් කියවීමට දෙන්න.

- **සහභාගි වූ අවස්ථා/සිද්ධි**

**ක්‍රියාකාරකම 3**

**පියවර 1 :**
- සිසුන් අඩකවයක් ආකාරයට වාඩි කරවන්න.
- ගුරුවරයා සහභාගි වූ අවස්ථාවක්/සිද්ධියක් පිළිබඳ සිත්ගන්නා සුලු අයුරින් රසවත් ව සිසුන්ට පවසන්න.
- මෙහිදී රූප, චිත්‍ර, සංයුක්ත තැටි කතාව රසවත් ව ප්‍රකාශ කිරීමට සහාය කරගන්න.
- ගුරුවරයා පැවසූ විස්තරයෙහි සිද්ධිවල අනුක්‍රමය සිසුන්ගෙන් විමසන්න.
- අදාළ විස්තරයෙහි ඇතුළත් වචන 5ක් එක් එක් වචනයක හිස්තැනක් සහිත ව හුණු පුවරුවේ ලියන්න.
- සෑම වචනයක ම අඩු අකුරක් සමඟ තවත් අකුරක් වචනය ඉදිරියෙන් ලියන්න.
- හිස්තැනට සුදුසු අකුර යොදා වචන සම්පූර්ණ කොට ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සම්පූර්ණ කරන ලද වචන කියවීමට දෙන්න.

**පියවර 2 :** (එළිමහන් ක්‍රියාකාරකමකි.)
- සිසුන් අඩකවයකට වාඩි කරවන්න.
- දෙමාපියන්/වැඩිහිටියන් සමඟ සහභාගි වූ අවස්ථාවක් හෝ තමාට වූ සිද්ධියක් සිහිපත් කර ගැනීමට ප්‍රමාණවත් කාලයක් දෙන්න.
- එක් එක් සිසුවාට ඒ පිළිබඳ ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- එක් එක් සිසුවාගේ ප්‍රකාශයන්ට අනුව සරල ප්‍රශ්න අසන්න.
- මෙහිදී නිදහසේ පිළිතුරු දීමට සිසුන් පොලඹවන්න.
- සිසුන්ගේ පිළිතුරු ඇසුරෙන් මතු වූ සරල වැකියක් හුණු පුවරුවේ ලියන්න.
- හුණු පුවරුවේ ලියන ලද වැකිය අභ්‍යාස පොතේ ලිවීමට අවස්ථාව ලබා දෙන්න.
- අහඹු ලෙස තෝරාගත් සිසුන්ට ලියන ලද වැකිය කියවීමට අවස්ථාව දෙන්න.
- හුණු පුවරුවේ ලියන ලද වැකිය කිහිපවරක් ශබ්දනගා කියවන්න.
- සිසුන් යුගල කරන්න.
- සිසු යුගලයට තම පොත් මාරුකර අනෙක් සිසුවා ලියා ඇති වැකිය නිවැරදි දැයි පරීක්ෂා කිරීමට දෙන්න.
- එක් එක් සිසු යුගලය අසලට ගොස් නිරීක්ෂණය කරන්න.

**නිපුණතා :** **$L_9$** **අවබෝධය සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව සවන්දෙයි.**

**$S_9$** **අවබෝධ කරගත් දේ භාවිතයෙන් නිර්මාණශීලී ව සහ අවස්ථාවෝචිත ව කතා කරයි.**

**$R_9$** **අවබෝධය සඳහාත් නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් සාවධාන ව කියවයි.**

**$W_9$** **අවබෝධයෙන් ලිවීම සඳහාත්, නිර්මාණාත්මක කුසලතා ප්‍රකාශ කිරීම සඳහාත් ලියයි.**

**ඉගෙනුම් පල** :
- ළමා කවි/ගී, කතන්දරවලට සවන් දී රසවින්දනයෙන් යුතු ව ඉදිරිපත් කරයි.
- ළමා අන්තර්ජාල නිරීක්ෂණය කර නිර්මාණාත්මක ව ඉදිරිපත් කරයි.
- කතන්දර, දෙබස්, තොරතුරුවලට සවන් දී මතකයෙන් යුතු ව භාවිත කරයි.
- ළමා කතන්දර පොත් බලා ඒවා සම්බන්ධ වැදගත් කරුණු ඉදිරිපත් කරයි.
- ළමා කතන්දර පොත් බැලීම පුරුද්දක් ලෙස පවත්වා ගනියි.
- ළමා කතන්දර පොත් කියවා එහි ඇති දෙයක් පිළිබඳ වැකියක් ගොඩනගයි.

## ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- ළමා කවි/ගීත

**ක්‍රියාකාරකම 1 :**

- සිසුන් රවුමට වාඩි කරවන්න.
- ළමා ගීතයකට සවන්දීමට සලස්වන්න.
- මෙලෙස ගීතය තුන් වතාවක් පමණ සවන්දීමට දෙන්න.
- ගීතයේ රිද්මයට සිසුන්ට නර්තනයක යෙදීමට අවස්ථාව දෙන්න.
- ගීතය ඇසුරෙන් සකස් කරගත් සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.
- මෙහිදී සෑම සිසුවෙකුගේ ම පිළිතුරුවලට අවධානය යොමු කරන්න.
- ගීතයේ අන්තර්ගත සතුන්ගේ නම් ලිවීමට අවස්ථාව දෙන්න.

### ගීතය

*උදා :* හා පැටියන් වගේ - මුව පැටියන් වගේ
සමනලයින් වගේ
රැඟුම් රඟන අගේ
පුංචි හපන්නූ බලන්න - පුංචි හපන්නූ . . .

(පද රචනය - ධර්මසිරි ගමගේ. ගායනය -නන්දා මාලනී
ළමා ගීත එකතුව, ජෝර්ජ් රොබ්සන් ද සිල්වා, පිටු 141)

- ළමා කතන්දර

**ක්‍රියාකාරකම 2 :** (එළිමහන් ක්‍රියාකාරකමකි)

- ළමා කතන්දරයකට සවන්දීමට සලස්වන්න.
- මෙලෙස කතන්දරය තුන් වතාවක් පමණ සවන්දීමට දෙන්න.
- සිසුන් යුගල කරන්න.
- කතන්දරය ඇසුරින් සකස් කරගත් ප්‍රශ්න පහකට අදාළ පිළිතුරු කාඩ්පත් සිසු යුගල සංඛ්‍යාවට අනුව සකස් කරගන්න.

- සිසුන්ට නැවත කතන්දරය ඇසීමට සලස්වන්න.
- කතන්දරය ඇසුරින් සකස් කරගත් ප්‍රශ්න එකින් එක සිසුන්ගෙන් අසන්න.
- එක් එක් ප්‍රශ්නවලට අදාළ පිළිතුර කාඩ්පත් අතුරින් තේරීමට සෑම සිසු යුගලයකට ම උපදෙස් දෙන්න.
- අහඹු ලෙස සිසු යුගලයකට නිවැරදි පිළිතුර සහිත කාඩ්පත කියවීමට අවස්ථාව දෙන්න.
- වැරදි පිළිතුර සහිත කාඩ්පත් තෝරා ඇති සිසුන් සිටී නම් එම අවස්ථාවේ දී ම නිවැරදි කරන්න.
- කාඩ්පත්වල ඇති පිළිතුරු බලා ලිවීමට සිසුන් යොමු කරන්න.

*කතන්දරය* -

## බූරුවා සහ අශ්වයා

එක්තරා ගමක බඩු විකුණා ජීවත් වූ වෙළෙන්දෙක් සිටියා. මොහු වෙළෙඳාමට ගියේ බූරුවෙකුගේ හා අශ්වයකුගේ පිටේ බඩු පටවා ගෙන යි.

දිනක් මොහු කඳුකර පළාතකට වෙළෙඳාමේ ගියා. බූරුවාට උසුලාගත නොහැකි තරම් ම බඩු පිටේ පටවා තිබුණා. නමුත් අශ්වයාගේ පිටේ ඒ තරමට බඩු තිබුණේ නෑ.

බූරුවා තමාගේ පිටේ තිබුණු බඩුත් සමග කඳු නැග බොහොම වෙහෙස වී සිටියා. තවදුරටත් කන්ද නැග ගැනීමට ශක්තියක් නොමැති බව බූරුවාට දැණුනා.

'යාළුවේ, මගේ පිට උඩ බඩු ගොඩක් තියෙනවා. මට හුගක් බර වැඩියි. පුළුවන් නම් මේකෙන් බඩු ටිකක් අරගන්නව ද?' යැයි බූරුවා අශ්වයාගෙන් ඇහුවා.

'මේ මොන කතාවක් ද? මමත් මේ ටික අරන් යන්නේ බොහොම අමාරුවෙන්. තවත් නම් මට ගෙනියන්න බෑ' අශ්වයා පැවසුවා.

බූරුවා කෙසේ හෝ බඩු ගෙන යාමට සිතාගත්තා. එනමුත් වැඩිදුරක් කන්ද නැගීමට අපහසු වුණා. මුළු ඇඟෙන් ම දහදිය ගළා ගියා. ඇස් නොපෙනී ගියා.

බූරුවාට ක්ලාන්තය සෑදී බිම වැටුණා. වෙළෙන්දා බූරුවාගේ පිට උඩ තිබූ බඩු සියල්ල අශ්වයාගේ පිට උඩින් තිබ්බා. ක්ලාන්තය සෑදුණු බූරුවා ද අශ්වයාගේ ම පිට උඩ තිබ්බා.

බූරුවාගෙන් බඩු ටිකක් ගෙන පිට උඩ තබා ගත්තා නම් මෙලෙස නොවන බවත්, සහයෝගයෙන් වැඩ කිරීමේ අගයත් අශ්වයා වටහා ගත්තා.

- **දෙබස්**

**ක්‍රියාකාරකම 3 :**

- සිසුන් රවුමට වාඩි කරවන්න.
- පහත සඳහන් 'දෙබස' තුන් වතාවක් සවන්දීමට සලස්වන්න.
- දෙබසෙහි අන්තර්ගතය පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- දෙබස ඇසුරෙන් සකස් කරගත් සරල ප්‍රශ්න විමසන්න.
- එම ප්‍රශ්නයට අදාළ පිළිතුර කණ්ඩායම් සාකච්ඡාවෙන් මතුකර ගැනීමට සිසුන්ට මග පෙන්වන්න.
- අහඹු ලෙස කණ්ඩායමකින් නිවැරදි පිළිතුර විමසන්න.
- එම කණ්ඩායම ලබාදුන් පිළිතුර නිවැරදි දැයි අනෙක් කණ්ඩායම්වලින් අසන්න.
- අනතුරුව නිවැරදි පිළිතුර අනෙකුත් කණ්ඩායම්වලට ද පැවසීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස සෑම ප්‍රශ්නයක් ම අසා නිවැරදි පිළිතුර ලබා ගන්න.
- එම කවිවලින් පේළි හතරක් හුණු පුවරුවේ ලියන්න.
- ගුරුවරයා කවිය ශබ්ද නගා කියවන්න.
- ගුරුවරයා සමඟ සිසුන්ට ද කියවීමට අවස්ථාව දෙන්න.

- එම කවි පේළි හතර බලා ලිවීමට අවස්ථාව දෙන්න.

| 'යාළුකමයි එකමුතුවයි' | |
|---|---|
| **කොක්කු දෙදෙනා :** | විලේ වතුර සිඳීලා<br>මොකද කරන්නේ<br>වෙන විලකට ඉගිලිලා<br>යන්න හදන්නේ |
| **ඉබ්බා** | :නොයන් අනේ මාව දමා<br>ඉන්නට බැනේ<br>යනවා නම් මාත් රැගෙන<br>යන්නට යන්නේ |
| **කොක්කු දෙදෙනා :** | කෝටුව තද කර අල්ලා<br>අපි ඉගිලෙන්නේ<br>කතා කරනු එපා කිසිත්<br>බිමට වැටෙන්නේ |
| **ඉබ්බා** : | කිසිත් කතා නොකරමි මං<br>යනවිට අහසින්<br>යාළුකමයි එකමුතුවයි<br>ඊටත් ඉහළින් |

- **තොරතුරු (සතුන්)**

**ක්‍රියාකාරකම** 4

:

- සිසුන්ගෙන් තමන් වඩාත් ම කැමති සතුන් පිළිබඳ ව විමසන්න.
- තෝරාගත් සතෙකුගේ විශාල කරන ලද පින්තූරයක් ප්‍රදර්ශනය කරන්න./දෘශ්‍ය පටයක් ආධාරයෙන් පෙන්වන්න.
- එම සතා පිළිබඳ ව සිසුන් දන්නා දේ විමසන්න.
- සතා පිළිබඳ තොරතුරුවලට සවන්දීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒ ඇසුරෙන් සරල ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.
- තොරතුරුවල ඇතුළත් වැකි දෙකක් හුණු පුවරුවේ ලියන්න.
- ගුරුවරයා එම වැකි ශබ්ද නඟා කියවන්න.
- අනතුරුව එක් එක් වැකිය ශබ්ද නඟා කියවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- හුණු පුවරුවේ ඇති වැකි මකා දමන්න.
- සතා පිළිබඳ ව සිතා වැකියක් ලිවීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- එක් එක් සිසුන් ලියන ලද වැකි පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න.

*උදා :* **ගිරවා**

ගිරවු වර්ග බොහෝ සිටිනවා. පලතුරු, මල් පොහොට්ටු, ඇට වර්ග ගිරවුන්ගේ ආහාර යි. ඔවුන් ජීවත් වන්නේ ගස් බෙනවල යි. ඔවුන්ගේ හොට ඉතා ශක්තිමත් ය. ගිරවිය වරකට බිත්තර දෙකක් පමණ දමනවා. ඔවුන් ඉගිලෙන විට පියාපත් වේගයෙන් සැලෙනවා. එයින් යම් හඬක් ද නිකුත් වෙනවා.

**ලේනා**

ලෝකයේ බොහෝ රටවල ලේන්නු වාසය කරනවා. ඔවුන් කූඩු සාදන්නේ ගස් බෙනවල යි. පලතුරු කෑමට ලේනුන් වඩා කැමැත්තක් දක්වනවා. ඔවුන්ගේ ඉදිරි පාද දෙක තරමක් කොට යි. පසුපස පාද දෙක තරමක් දිග යි. මේ නිසා ඔවුන්ට වේගයෙන් පැන දුවන්නට හැකියි. ලේනාගේ වලිගය තරමක් විශාල යි. ඉදිරි පාද දෙකේ ඇඟිලි හතර බැගින් වේ. පසුපස පාද දෙකේ ඇඟිලි පහ බැගින් වේ. ඇඟිලිවල නිය උල් ය. මේ නිසා ලේන්නුන්ට පහසුවෙන් ගස්වල නැගිය හැකියි.

• **ළමා අන්තර් ජාලය**

**ක්‍රියාකාරකම 5**

- සිසුන් පරිගණක කාමරයට කැඳවාගෙන යන්න./පන්ති කාමරය තුළ දෘශ්‍යාධාර භාවිත කරන්න.
- ළමා වෙබ් අඩවි හරහා ළමා ගීත හා කතන්දර රසවිඳීමට සලස්වන්න.
- එම ගීත හා කතන්දර පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- අන්තර්ජාලය හරහා රසවිඳින ලද ගීත ගායනයටත්, කතන්දර පැවසීමටත් අවස්ථාව ලබා දෙන්න.
- රසවිඳින ලද ගීත හා කතන්දරවල සිසුන් සිත් ගත් අවස්ථා චිත්‍රයට නැගීමට දෙන්න.
- සිසුන්ගේ චිත්‍ර ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- එක් එක් සිසුන්ට තම චිත්‍රය පිළිබඳ අදහස් පැවසීමට අවස්ථාව දෙන්න.
- චිත්‍ර අතරින් තමා කැමති ම චිත්‍රය පෙන්වා ඒ පිළිබඳ අදහස් පැවසීමට මග පෙන්වන්න.
- සිසුන්ට තම චිත්‍රයේ ඇතුළත් දේ පිළිබඳ ව වැකි දෙකක් ලිවීමට අවස්ථාව දෙන්න.

• **ළමා පොත්පත්**

**ක්‍රියාකාරකම 6**

පියවර 1 :

- පන්ති කාමරයේ learning centre/පාසල් පුස්තකාලයෙහි ඇති ළමා කතන්දර පොත් තෝරා ගන්න.
- ළමා කතන්දර පොත් තෝරා ගැනීමේ දී පින්තූර වැඩියෙන් ඇති පොත් තෝරා ගන්න.
- සිසුන් යුගල කරන්න.
- එක් එක් සිසු යුගලයට ළමා කතන්දර පොත බැගින් ලබා දෙන්න.
- ඒවා නිදහසේ බැලීමට අවස්ථාව දෙන්න.
- එක් එක් සිසු යුගලය ළඟට ගොස් ඔවුන් බලන කතන්දර පොත පිළිබඳ කතාබහ කරන්න.
- පහත කරුණු පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * මේ පොතේ ඇති කැමති ම පින්තූරය කුමක් ද ?
  * එම පින්තූරයට කැමති ඇයි ?
  * ඒ පින්තූරයේ ඇත්තේ මොනවා ද ?
- සෑම සිසු යුගලයක් ම නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව, ළමා කතන්දර පොත්වල ඇති දේ පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡාවේ යෙදෙන්න.
- එක් එක් සිසු යුගලයන්හි එක් සිසුවකු කැමති පින්තූරයක් පිළිබඳ ව අනෙක් සිසුවා සමඟ සාකච්ඡා කිරීමට අවස්ථාව දෙන්න.
- එක් එක් සිසුන් කැමති පින්තූරය ඇසුරින් චිත්‍රයක් ඇඳීමට දෙන්න.
- සිසුන් විසින් අඳින චිත්‍ර, ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- සිසු යුගලයන්හි එක් සිසුවකු විසින් අඳින ලද චිත්‍රය දෙස බලා අදහස් පැවසීමට අනෙක් සිසුවාට අවස්ථාව දෙන්න.
- එක් එක් සිසුන් විසින් අඳින ලද චිත්‍රය දෙස බලා වැකියක් ලිවීමට දෙන්න.

පියවර 2 : (එළිමහන් ක්‍රියාකාරකමකි)

- පන්ති කාමරයේ /learning centre/පාසල් පුස්තකාලයෙන් ළමා කතන්දර පොත් තෝරාගන්න.
- සිසුන් අඩකවයකට වාඩි කරවන්න.
- ගුරුවරයා ළමා කතන්දර පොත ශබ්ද නගා රසවත් ව පවසන්න.
- පවසන ලද කතන්දරය පිළිබඳ සිසුන්ගෙන් ප්‍රශ්න අසා පිළිතුරු ලබා ගන්න.
- මෙවැනි කතන්දර පොතක් නිවසේ දී කියවා ගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- කියවන ලද කතන්දරය පන්තියේ දී පැවසීමට අවස්ථාව දෙන්න.
- මෙලෙස කතන්දර පොත් කියවීමට සිසුන් යොමු කරන්න.
- තමා කියවූ කතන්දරයට අදාළ ව වැකියක් ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.

**නිපුණතා :** **$L_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා කතා කරයි.**
**$S_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා සවන්දෙයි.**
**$R_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා කියවයි.**

ඉගෙනුම් පල :
- අවබෝධයෙන් යුතු ව අදහස් ඉදිරිපත් කරයි.
- පින්තූර කතාවකින් පැවසෙන දේ තර්කානුකූල ව ගොඩ නගයි.
- සම්මත භාෂා ව්‍යවහාර අවබෝධ කරගෙන මතකයෙන් ප්‍රකාශ කරයි.

**ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :**

- මාතෘකාවකට අනුව විස්තර කිරීම

**ක්‍රියාකාරකම 01**

පියවර 1 :
- ගුරුවරයා පහත සඳහන් තොරතුරු ඇතුළත් කර තමා ගැන හැඳින්වීමක් කරන්න. (නම, ගම, විවේකය ගත කරන අන්දම, කැමතිම සතා, කැමති කෑම)
- සිසුන් කණ්ඩායම් කරන්න.
- පහත ඇති පත්‍රිකාව හා සාදාගත් වචන පත්‍රිකා කණ්ඩායමකට එක බැගින් ලබා දෙන්න.


<u>මගේ ගුරුතුමිය</u>

මගේ ගුරුතුමියගේ නම ................................................. යි.
ඇගේ ගම .................................................
ඇය විවේකයට කරන්නේ .................................................
ඇය කැමති ම සතා .................................................
ඇය කන්න කැමති ම .................................................

| | | |
|---|---|---|
| පොත් කියවීම යි. | කුමාරි | මහරගම යි. |
| පලතුරු යි. | හාවා යි. | |

- කණ්ඩායමේ සිසුන්ට පත්‍රිකාවේ ඇති වැකිවල හිස්තැනට අදාළ වචන පත්‍රිකා ඇලවීමට යොමු කරන්න.
- සියලු ම සිසුන් ක්‍රියාකාරකමෙහි නිරත වේ දැයි ගුරුවරයා සොයා බලන්න.
- ගුරුවරයා ද මෙවැනි ම පත්‍රිකාවක් සකස් කරගෙන ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- සිසු ක්‍රියාකාරකම අවසාන වූ පසු සිසුන් සමග කතා කරමින් ප්‍රදර්ශන පුවරුවේ තොරතුරු සම්පූර්ණ කරන්න.
- සිසුන් සම්පූර්ණ කරන ලද තොරතුරු හා ප්‍රදර්ශන පුවරුවේ ඇති පත්‍රිකාවේ තොරතුරු සැසඳීමට යොමු කරන්න.
- මෙලෙස සිසුන්ට ද තමා ගැන හැඳින්වීමක් කළ හැකි බව පහදා දෙන්න.

පියවර 2 :
- පහත සටහන විශාල ලෙස සකස් කරන්න.




නිපුන් සහ නිපුනි හරිම යාළු යි. නිපුනිගේ ගම ගාල්ල යි. නිපුන්ගේ ගම හිනිදුම යි. නිපුනි ගෙදර දී අම්මාට උදවු කරයි. නිපුන් ගෙදර දී පැල සිටුවයි. දෙදෙනා ම අන්නාසි කෑමට හරි ම කැමතියි.

- එය සිසුනට පෙනෙන පරිදි ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- ගුරුවරයා සිසුනට ඇසෙන පරිදි ශබ්ද නගා ඡේදය කියවන්න.
- ඉන්පසු සිසුන් සමග කිහිප වාරයක් කියවන්න.
- යහළුවන් දෙදෙනා පිළිබඳ තොරතුරු සිසුන් සමග සාකච්ඡා කරන්න.
- යහළුවන් දෙදෙනාගෙන් තමා කැමති ම යහළුවාගේ තොරතුරු ලිවීමට උපදෙස් දෙන්න.

පියවර 3 :
- හාවා, පූසා, ගිරවා, අලියා යන සතුන්ගේ විශාල කරන ලද වර්ණ පින්තූර සකස් කර ගන්න.
- එක් එක් රූපය පෙන්වමින් සිසුන් සමග එම සතා පිළිබඳ සාකච්ඡා කරන්න.


  *උදා :* * හාවා පැන පැන යනවා. * ගිරවා කොළ පාට යි.
  * හාවා පුළුන් ගොඩක් වාගෙයි. * ගිරවාගේ බෙල්ලේ මාලයක් තියෙනවා.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- $A_3$ කොළයක සත්ත්ව රූප දෙකක් අලවා සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- එම සත්ත්ව රූප දෙකට අදාළ ව වැකි දෙක බැගින් ලියූ පත්‍රිකා සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- සතාගේ රුවට අදාළ ව ලියූ වැකි සතාට පහළින් ඇලවීමට සිසුන් යොමු කරන්න.
- කණ්ඩායමේ සියලු දෙනා ම එක් ව වැකි කියවීමට අවස්ථාව දෙන්න.
- ගුරුවරයා සෑම කණ්ඩායමක් ළඟට ම ගොස් සිසුන් කියවන අයුරු නිරීක්ෂණය කරන්න.
- උදවු අවශ්‍ය සිසුන්ට එම අවස්ථාවේ දී ම සහාය වන්න.
- සම්පූර්ණ කරන ලද ක්‍රියාකාරකම් ප්‍රදර්ශන පුවරුවට ගන්න.
- කණ්ඩායමක සෑම සිසුවෙකුට ම එක් වැකියක් බැගින් කියවීමට අවස්ථාව දෙන්න.
- අනෙකුත් කණ්ඩායම්වලට සවන් දීමට යොමු කරන්න.
- එක් කණ්ඩායමක් වැකි කියවා අවසන් වූ පසු ඔවුන් කියන ලද වැකිවලට අදාළ ප්‍රශ්න අසන්න.
- සිසුන්ගෙන් අහඹු ලෙස පිළිතුරු ලබා ගන්න.
- මෙලෙස සෑම කණ්ඩායමකට ම අවස්ථාව දී, ඉහත පරිදි ක්‍රියාකාරකමෙහි යොදවන්න.

- **පින්තූර කතා**

**ක්‍රියාකාරකම 02**

පියවර 1 :
- පහත සඳහන් පින්තූර කතාවේ එක් කොටසක් $A_4$ ප්‍රමාණයට සකස් කර පාට කර කාඩ්පත් 4ක් ලෙස සකස් කර ගන්න.

*උදා :* **අපේ පාලම**



**පියවර 2 :**
- පින්තූර කාඩ්පත් ප්‍රදර්ශන පුවරුවේ අපිළිවෙළට රඳවන්න.
- සිසුන්ට නිරීක්ෂණය සඳහා මද වේලාවක් ලබා දෙන්න.
- එක් එක් පින්තූරයේ ඇති දේවල් පිළිබඳ කතා බහ කරන්න.
- කතාව ගොඩනගමින් පින්තූර කාඩ්පත් පිළිවෙළට රඳවන්න.
- ගුරුවරයා කතන්දරය රසවත් ව සිසුන්ට කියා දෙන්න.
- හැකි පරිදි සිසුන්ට ද කතාව පැවසීමට අවස්ථාව ලබා දෙන්න.
  *උදා :* වැල් කතාවක් ලෙස සිසුන් සම්බන්ධ කර ගනිමින්

**පියවර 3 :**
- සියලු ම සිසුන් ගුරුවරයාට සවන් දීමට යොමු කරන්න.
- කතන්දරයේ සඳහන් දේ හා සඳහන් නොවන දේ ගුරුවරයා පවසන බවත්, 'හරි'දෙයක් පැවසූ විට අත් එසවීමටත් 'වැරදි' දෙයක් පැවසූ විට අත් නොඔසොවන ලෙසටත් උපදෙන් දෙන්න.
  * ජිරාෆ්ගේ පිට දිගේ එන විට ඉත්තෑවා ගඟට වැටුණා.
  * යහළුවෝ ජිරාෆ්ට මල් මාලාවක් දැම්මා.
- මේ ආකාරයට වැකි සකස් කර සවන් දී ප්‍රතිචාර ලබා ගන්න.

**පියවර 4 :**
- කතන්දරය ඇසුරෙන් වැකි ලබා දී සිදු වූ අනුපිළිවෙළට අංක යෙදීම සඳහා පැවරුම්පතක් ලබා දෙන්න.

| | |
|---|---|
| *උදා :* * ජිරාෆ් යහළුවන්ට උදවු කිරීමට සිතුවා. | ◯ |
| * වැස්සට පාලම කැඩුණා. | ◯ |
| * ජිරාෆ් එගොඩට බෙල්ල දිගු කළා. | ◯ |
| * මල් මාලයක් දමා ස්තුති කළා. | ◯ |
| * යහළුවෝ මෙගොඩට ආවා. | ◯ |

- පැවරුම්පත ලබා දී සිසුන් සමඟ වැකි කිහිප වරක් කියවන්න.
- මේ අවස්ථාවේ ද කතන්දරය සිදු වූ අනුපිළිවෙළ ගැන කතා කරන්න.
- සිසුන්ට තනි තනි ව ම පැවරුම කියවමින් කතන්දරය සිදු වූ අනුපිළිවෙළ අනුව 1, 2, 3, 4 හා 5 වශයෙන් අංක යොදන ලෙස උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගෙන් ම පැවරුම්පත් පරීක්ෂා කරන්න.
- කතන්දරය ගැළපෙන පරිදි අනුපිළිවෙළට අංක යොදන්න.

භාෂා අභ්‍යාස

**(මේ සඳහා ගුරු මාර්ගෝපදේශයේ ලබා දී ඇති වචන පමණක් ඉගැන්වීම අනිවාර්ය වේ. ඉන් පරිබාහිර වෙනත් වචන ප්‍රමාණය ද ඉක්මවා ඉගැන්වීම කිසිසේත් නොකළ යුතු ය.)**

- සමානාර්ථ පද

ක්‍රියාකාරකම 3

පියවර 1 : • පහත පින්තූරය සිසුන්ට ප්‍රදර්ශනය කරන්න.

ගෙවත්ත



- | අහස | අම්මා | තාත්තා | ඉර | ගස | වචන ලියූ කාඩ්පත් සකස් කර ගන්න.
- මෙම වචන සිසුන්ට පෙන්වා කියවමින් පින්තූරයේ අදාළ ස්ථානවල රඳවන්න. අලවන්න. ඒවා කියවන්න.
- එම වචනවලට සමාන පදයක් එනම්; එම වචනයට භාවිත කළ හැකි වෙනත් වචනයක් ලබා ගත හැකි වන පරිදි සාකච්ඡා කරන්න.

  *උදා* : * රුක් රෝපණ දිනය මතකයට නංවා 'එදින පැළ කළේ මොනවා ද?' යන්න මතු කර ගන්න. 'ගස්' යනුවෙන් පිළිතුරු දෙනු ඇති. 'රුක් රෝපණය' කියන්නේ ගස් සිටුවීම බව පැහැදිලි කර ගස = රුක , ගසට කියන තවත් නමක් බව වටහා දෙන්න.

  * ඒ ආකාරයෙන්, අම්මාට වඳින ගාථාව 'මවට' වඳින ගාථාව ලෙසත්, තාත්තාට වඳින ගාථාව 'පියාට' වඳින ගාථාව ලෙසත්, ගුවන් යානය 'අහස් යානය' ලෙසත් ඉරට කියන තවත් නමක් 'හිරු' යනාදී වශයෙන් සමාන ව භාවිත කළ හැකි පද පිළිබඳ ව සිසුන් සමග සාකච්ඡා කරන්න.


  * මෙලෙස ගොඩ නගා ගත් සමාන පද ශබ්ද නගා කියවන්න.

  අහස - ආකාසය /// අම්මා - මව /// තාත්තා - පියා /// ගස - රුක /// ඉර - හිරු ///

පියවර 2 : • පින්තූරයේ තිබෙන පහත සඳහන් රූප ඒ ආකාරයෙන් ම වෙන් වෙන් ව කාඩ්පත් 2 බැගින් සකස් කර ගන්න.


අම්මා, අහස, ඉර, තාත්තා, ගස

*උදා :*



- වචන ලියූ කාඩ්පත් ද සකස් කර ගන්න. *උදා :* ගස රුක
- පින්තූරය භාවිත කරමින් ගස පෙන්වන්න.
- ප්‍රදර්ශන පුවරුවේ සකස් කර ගත් රූප කාඩ්පත් දෙක රඳවන්න.
- එක් පින්තූරයක් යට ගස වචනය ද, අනෙක් පින්තූරය යට රුක වචනයට අලවන්න.

*උදා :*



ගස රුක

- පින්තූරයේ ගසත් මේ ගසත් රුකත් එක ම බව පැහැදිලි කර දෙන්න.
- මේ ආකාරයට ඉතුරු පින්තූර 4 ද (අම්මා, තාත්තා, ඉර, අහස) හඳුන්වා දෙන්න.

පියවර 3 : • පහත සඳහන් ආකාරයේ පැවරුම් පතක් සකස් කරන්න.
- සෑම සිසුවෙකුට ම එක් පැවරුම් පත බැගින් ලබා දෙන්න.
- සමාන පද යුගල යා කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම පැවරුම් පරීක්ෂා කරන්න.

යා කරන්න.

| | |
|---|---|
| ගස | ආකාසය |
| අහස | රුක |
| අම්මා | හිරු |
| තාත්තා | මව |
| ඉර | පියා |

- විරුද්ධාර්ථ පද

**ක්‍රියාකාරකම 4**

පියවර 1 : • මුල් පින්තූරය භාවිතයට ගන්න.
- පහත සඳහන් තොරතුරු මතු කර ගනිමින් කතා කරන්න.

*උදා :* ගස උඩ ගිරවා — උස රඹුටන් ගස — අම්මා මහතයි.
ගස යට පූසා — මිටි අඹ ගස — තාත්තා කෙට්ටුයි.
ලොකු හාවා — නංගී කැමතියි අඹවලට
පොඩි හාවා — මල්ලී අකමැතියි අඹවලට

- පින්තූරයේ සඳහන් දේවල් පෙන්වමින් 'විරුද්ධ බව' පෙන්වා දීමට සාකච්ඡාව මෙහෙයවන්න.
- පන්තියේ පෙනෙන්නට ඇති වෙනත් උදාහරණ ද ගනිමින් වචනවල වෙනස පහදා දෙන්න.

  *උදා :* පුටුව <u>උඩ</u> පොත      කමල් <u>උස</u> යි.

  පුටුව <u>යට</u> මකනය      නිමල් <u>මිටි</u> යි.

පියවර 2 :
- පහත සඳහන් වචන එකට ගොනු කර පවසන්න. හොඳින් අසා සිටින ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.

  උඩ - යට
  ලොකු - පොඩි
  මහත යි - කෙට්ටු යි.
  උස - මිටි
  කැමති - අකමැති

- එම වචන සිසුන් ලවා ද කියවන්න.
- එම වචන ම කියවෙන ආකාරයේ ප්‍රශ්න කිහිපයක් සිසුන්ගෙන් අසන්න.

  *උදා :* ගිරවා ඉන්නේ කොහේ ද?
  පූසා ඉන්නේ කොහේ ද?

- **ගැහැනු පිරිමි හඟවන පද**

**ක්‍රියාකාරකම 5**

පියවර 1 :
- පින්තූරය නැවත සිසුන්ට පෙනෙන පරිදි පන්තියේ අලවන්න/රඳවන්න.
- ගැහැනු පද හා පිරිමි පද හඳුන්වා දීමට හැකි වන පරිදි පින්තූරයේ ඇති දේ පිළිබඳ සාකච්ඡා කරන්න. ඒ සඳහා ස්ත්‍රී, පුරුෂ ලිංග යන පද භාවිත නොකරන්න.

  *උදා :* අම්මා - තාත්තා
  කුරුල්ලා - කිරිල්ලී

- 'බිත්තර දාන්නේ කිරිල්ලී' බවත් 'කුරුල්ලා කෑම සොයා යන' බවත් පවසන්න.
  ගෙදර සිටින පිරිමි අය සීයා, අයියා, මල්ලී ගැන මතක් කර ඊට අදාළ ගැහැනු පද කියන්න.
  ආච්චි, අක්කා, නංගී යනාදී වශයෙන්
- මෙලෙස පින්තූරයේ ඇති වෙනත් සත්තු ගැන ද කතා කරමින් ගිරවා - ගිරවී, පූසා - පූසී යනාදී ලෙස ද පවසන්න.

පියවර 2 :
- තෝරාගත් ගැහැනු, පිරිමි පද කිහිප වරක් පවසන්න.

  *උදා :* අම්මා - තාත්තා
  ආච්චී - සීයා
  ගිරවී - ගිරවා
  පූසී - පූසා
  කිරිල්ලී - කුරුල්ලා

- ගුරුවරයා පවසන වචනවලට අදාළ ව පිරිමි පදය සිසුන්ගෙන් විමසන්න.
- ඒ ආකාරයට ම ගැහැනු පදය විමසන්න.
- එක් එක් සිසුවා කෙරෙහි අවධානය යොමු කරමින් පිළිතුරු ලබා ගන්න.

පියවර 3 :
- පහත සඳහන් පරිදි ලියන ලද චාට්පතක් සකස් කර ගන්න.

|  |  |
|---|---|
| අම්මා | තාත්තා |
| ආච්චී | සීයා |
| නංගී | මල්ලී |
| අක්කා | අයියා |

- මුළු පන්තියට ම පෙනෙන පරිදි මෙම චාට්පත හුණු පුවරුවේ රඳවන්න.
- සියලු ම සිසුන් සහභාගි කරමින් වචන කියවන්න.
- පින්තූරයේ සිටින සතුන් සම්බන්ධ කර ගනිමින් ගැහැනු පද හා පිරිමි පද ගුරුවරයා සිසුන් සමග සාකච්ඡා කරමින් හුණු පුවරුවේ ලියන්න.

  *උදා :* කුරුල්ලා - කිරිල්ලී
  ගිරවා - ගිරවී
  පූසා - පූසී
- එම වචන ද කිහිපවරක් කියවීමට යොමු කරන්න.
- පහත සඳහන් පැවරුම්පත සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.

<u>යා කරන්න.</u>

| |
|---|
| ගිරවා |
| ගිරවී |
| අම්මා |
| තාත්තා |
| නංගී     කිරිල්ලී |
| මල්ලී |
| කුරුල්ලා |

- පැවරුම් පත සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම පැවරුම් පත් පරීක්ෂා කරන්න.

- **ඒකවචන - බහුවචන පද**

**ක්‍රියාකාරකම 6**

**පියවර 1:** • පහත සඳහන් වචන කාඩ්පත් සකස් කර ගන්න.
ගස-ගස්, මල-මල්, අත-අත්, ගල-ගල්, අම්මා-අම්මලා, තාත්තා-තාත්තලා

**පියවර 2 :** • පහත රූපය විශාල ලෙස සකස් කර ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.

**මුහුදු වෙරළ**



- එහි පෙනෙන දේවල් සිසුන් සමග සාකච්ඡා කරන්න.
- පින්තූරයේ එක ගසක් පෙන්වා මේ කුමක්දැයි අහන්න. ''ගස'' යනුවෙන් පිළිතුරු ලැබේවි.

  [ගස] කාඩ්පත පෙන්වන්න. ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.

- එහි තිබෙන ගස් වටා රවුමක් අඳිමින් ඒ මොනවාදැයි අහන්න. ''ගස්'' යනුවෙන් කියනු ඇත. [ගස්] කාඩ්පත පෙන්වන්න. [ගස] කාඩ්පත ඉදිරියෙන් [ගස්] කාඩ්පත රඳවන්න.
- ඒ වචන අත්පුඩි ගසමින් කියන්න.



ගස - ගස් ////


**පියවර 03** : • මේ ආකාරයට සකස් කරගත් කාඩ්පත් ඇසුරෙන් 'එකක්, ගොඩක්' යන වචන භාවිත කරමින් ඒකවචන හා බහුවචන හඳුන්වා දෙන්න.

**පියවර 04** : • පින්තූරයේ ඇති වෙනත් වචන පිළිබඳව ද විමසන්න.

*උදා* : කුරුල්ලා - කුරුල්ලෝ    ළමයා - ළමයි
සරුංගලය - සරුංගල්    ඔරුව - ඔරු

**පියවර 05** : • පහත සඳහන් පරිදි පැවරුම්පතක් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න.
- සකස් කර ගත් කාඩ්පත් ද ලබා දෙන්න.
- කණ්ඩායමේ සිසුන් එක් වී පැවරුම්පතේ හිස්තැන්වලට අදාළ ව ලබා දුන් පත්‍රිකා තැබීමට උපදෙස් දෙන්න.
- ඒවා නිවැරදි ව සකස් කර ඇත්නම් ඇලවීමට උපදෙස් දෙන්න.

| එකක් | ගොඩක් |
|---|---|
|  | |
| | ගස් |
| |  |
| මල | |
|  | |
| | අත් |
| |  |
| | ගල් |



## නිපුණතාව : $W_{10}$ සම්මත භාෂා ව්‍යවහාර සඳහා ලියයි.

ඉගෙනුම් පල: • භාෂා අභ්‍යාස කියවා අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි.

### ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රමෝපාය :

- මාතෘකාවකට අනුව විස්තර කිරීම - තමා පිළිබඳ තොරතුරු

ක්‍රියාකාරකම 01

- පහත සඳහන් පත්‍රිකාව සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.

| |
|---|
| මගේ නම ...................................................................................... |
| මගේ ගම ...................................................................................... |
| මම විවේකයට කරන්නේ ........................................................ |
| මම කැමති ම සතා .................................................................... |
| මම කන්න කැමති ........................................................................ |

- තමා පිළිබඳ තොරතුරු ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පරීක්ෂා කරන්න.

- යහළුවා

ක්‍රියාකාරකම 2

- සිසුන් යුගල කරන්න.
- අනතුරු ව මගේ යහළුවා චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න.
- "මගේ යහළුවා" පිළිබඳ වැකි දෙකක් ලිවීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කරන්න.

- සතුන්

ක්‍රියාකාරකම 3 :

- පහත සඳහන් පත්‍රිකාව බැගින් සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම පත්‍රිකාවෙන් තමා කැමති ම සතාගේ තොරතුරු සොයා වචන ගළපා වැකි ලිවීමට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම අභ්‍යාස පොත් පරීක්ෂා කරන්න.

පත්‍රිකාව I

| | | |
|---|---|---|
| දුවනවා | හාවා | වේගයෙන් |
| පූසා | බොනවා | කිරි |
| පෙරහැරේ | අලියා | යනවා |
| ගිරවාගේ | වකුටුයි | හොට |
| සතෙක් | සුරතල් | පූසා |
| සතෙක් | අලියා | ලොකු |
| දිගයි | කන් | හාවාගේ |
| අදිනවා | අලියා | කොට |
| කනවා | පලතුරු | ගිරවා |
| උඳුපියළිය | කනවා | හාවා |
| කැමතියි | දඩයමට | පූසා |
| කොළ | ගිරවා | පාටයි |

- **අකුරු හඳුනා ගැනීම**

**ක්‍රියාකාරකම 01**


**පියවර 1 :**
- ඒකවචන සහ බහු වචන පද හඳුන්වා දීම සඳහා භාවිත කළ 'මුහුදු වෙරළෙහි' පින්තූරය විශාල ලෙස සකස් කර ගන්න.
- සරුංගලය, ළමයා, කුරුල්ලා, ඉර, ඔරුව යන වචනවල අකුරු වෙන් වෙන් ව කාඩ්පත්වල ලියා සකස් කර ගන්න.

  *උදා :* ස රු ං ග ල ය

  ඉ ර

**පියවර 2 :**
- සකස් කරගත් පින්තූරය සිසුන් සියලු දෙනාට ම පෙනෙන පරිදි ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- 'ඉ' කාඩ්පත පෙන්වා 'ඉ' අකුරෙන් පටන් ගන්නා රූපයක් පින්තූරයෙන් නම් කරන ලෙස ගුරුවරයා පවසන්න. *උදා :* ඉර
- 'ස' කාඩ්පත පෙන්වා එම අකුරෙන් පටන් ගන්නා රූපයක් පින්තූරයෙන් නම් කරන ලෙස කියන්න. *උදා :* සරුංගලය
- මේ ආකාරයට සකස් කරගත් කාඩ්පත්වල මුල් අකුර පෙන්වා පින්තූරවල නම් ලබා ගන්න.

**පියවර 3 :**
- පහත සඳහන් ආකාරයේ පැවරුම්පතක් සකස් කර සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- සිසුන්ගේ පැවරුම් පරීක්ෂා කරන්න.




- **අකුරු එකතු කර වචන සකස් කිරීම**

**ක්‍රියාකාරකම 2**

**පියවර 1 :**
- පහත සඳහන් අකුරු ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න. (සිසු උස හා ඇස් මට්ටමට සරිලන අයුරින් ප්‍රදර්ශන පුවරුව එල්ලන්න.)

රු ඔ ව    ස රු ං ල ග ය    ඉ ර    රු ලා ල් කු

- අකුරු පෙළට තබා වචන සැකසීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ළමයා, ඔරුව, කුරුල්ලා හා සරුංගලය යන වචනවල එක් එක් වචනයේ ඇති අකුරු ගණන අනුව සිසුන් ඉදිරියට කැඳවා වචන සකස් කරවන්න. එම වචන කියවන්න.


**පියවර 2 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- මෙම අකුරු කට්ටල සිසු කණ්ඩායම්වලට ලබා දෙන්න.
- අකුරු කට්ටල භාවිතයෙන් වචන ගොඩ නඟන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.


**පියවර 3 :**
- පහත සඳහන් පැවරුම සකස් කර සිසුන්ට ලබා දෙන්න.
- පින්තූරයට ගැළපෙන වචනයට අදාළ අකුරු පමණක් පාට කිරීමට යොමු කරන්න.

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
|  | උ | ඉ | ව | ර | ඔ | ස | ද |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
|  | ම | ඔ | ර | රු | ග | ව | ප |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
|  | ළ | අ | ම | ව | යා | ර | ත |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
|  | කු | පු | රු | ට | ල් | ව | ලා |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
|  | ස | ප | රු | ං | ග | ල | ය |

**රූපවලට වචන යා කිරීම**

**ක්‍රියාකාරකම 03**

- පහත සඳහන් ආකාරයේ පැවරුම්පතක් සෑම සිසුවකුට ම ලබා දෙන්න.
- පින්තූරයට අදාළ වචනය යා කරන ලෙස උපදෙස් දෙන්න.

රූපවලට වචන යා කරන්න.


| | |
|---|---|
|  | වලාකුළු |
|  | මුහුද |
|  | මල් ගස |
|  | පොල් ගස |
|  | සරුංගලය |
|  | ඔරුව |


• සමානාර්ථ පද

**ක්‍රියාකාරකම 04**

**පියවර 1 :**
- සිසුන් කණ්ඩායම් කරන්න.
- කණ්ඩායමකට එක බැගින් $A_3$ කඩදාසි සූදානම් කර ගන්න.
- ගස, ඉර, අම්මා, තාත්තා, අහස යන පින්තූර 5×5 cm ප්‍රමාණයේ පත්‍රිකාවල ඇඳ කණ්ඩායමකට රූප කට්ටලය බැගින් සූදානම් කර ගන්න.
- සිසුන්ට වචන ලිවීමට ප්‍රමාණවත් වන පරිදි එක් පින්තූරයකට දෙක බැගින් කඩදාසි තීරු ද ලබා දෙන්න.
- සෑම කණ්ඩායමක ම එක් සිසුවෙකුට එක බැගින් පින්තූරයක් ලබා දෙන්න.
- තමාට ලැබුණු රූපයට කිව හැකි වෙනත් පද දෙකක් දෙන ලද කඩදාසි තීරු දෙකෙහි ලිවීමට උපදෙස් දෙන්න.
- තමාගේ මේසය මත රූපය ද, ලියූ වචන සහිත පත්‍රිකා ද පේළියට තැබීමටත්, යහළුවන්ගේ පත්‍රිකා කියවා බැලීමටත් සිසුන් යොමු කරන්න.

**පියවර 2 :**
- $A_3$ ප්‍රමාණයේ කඩදාසියක් සෑම කණ්ඩායමකට ම ලබා දෙන්න. පියවර 1හි සකස් කරගත් රූප පත්‍රිකා හා වචන පත්‍රිකා කඩදාසිය මත පේළියට තබන ලෙස සෑම කණ්ඩායමකට ම උපදෙස් දෙන්න.
- නිවැරදි ව තබා ඇති කණ්ඩායම්වල රූප හා වචන පත්‍රිකා $A_3$ කොළයේ ඇලවීමට යොමු කරන්න.


ගස - රුක


ඉර - හිරු


අම්මා - මව


තාත්තා - පියා


අහස - ආකාසය

- සිසුන් ඇලවූ පත්‍රිකාවල වචන හුණු පුවරුවේ ලියන්න.
- එම වචන සිසුන් ලවා ද කියවන්න.
- කියවන ලද වචන ලිවීමට දෙන්න.

• විරුද්ධාර්ථ පද

**ක්‍රියාකාරකම 05**

- සමානාර්ථ පද හඳුන්වා දීම සඳහා යොදා ගත් 'ගෙවත්තේ' පින්තූරය නැවත ලබා දී විරුද්ධ පද පිළිබඳ මතකය අවදි කරවන්න.
- පහත සඳහන් පරිදි හිස්තැන් පිරවීමේ අභ්‍යාසයක් සකස් කර ගන්න.
- සියලු ම සිසුන්ට පැවරුම්පත බැගින් ලබා දෙන්න.

**හිස්තැනට සුදුසු වචනය ලියන්න.**

ගස ______________ ගිරවා. (යට / උඩ)
ගස ______________ පූසා.

__________ හාවා උඳුපියලිය කනවා. (ලොකු / පොඩි)
__________ හාවා පැන පැන යනවා.

නංගි අඹවලට ______________ (කැමතියි / අකමැතියි)
මල්ලි අඹවලට ______________

රඹුටන් ගස __________ යි. (මිටි / උස)
පොල් ගස __________ යි.

- ගැහැනු පිරිමි හඟවන පද

**ක්‍රියාකාරකම 06**

**පියවර 1 :** • පහත සඳහන් කාඩ්පත් පන්තියේ සිසුන්ට ප්‍රමාණවත් වන පරිදි සකස් කර ගන්න.

| Ⓐ | Ⓑ |
|---|---|
| අම්මා | තාත්තා |
| නංගී | මල්ලී |
| ගිරවා | ගිරවී |
| පූසා | පූසී |
| කුරුල්ලා | කිරිල්ලී |

- කාඩ්පත් යුගලය බැගින් සකස් කර ගන්න.

  *උදා* : **අම්මා** කාඩ්පත් 3ක් හා **තාත්තා** කාඩ්පත් 3ක්
- සිසුන් එළිමහනට කැඳවාගෙන යන්න. රවුමක් ආකාරයට පෙළගස්වන්න.
- කියවීමට ගත් වචන ගුරුවරයා ද කියමින් සිසුන් ලවා ද කියවන්න. *උදා* : අම්මා, තාත්තා.
- සකස් කර ගත් කාඩ්පත් සිසුන්ට ලබා දෙන්න.
- ගුරුවරයා සංඥාවක් දුන් විට

  අම්මා - තාත්තා

  නංගී - මල්ලී

  ගිරවා - ගිරවී

  පූසා - පූසී

  කුරුල්ලා - කිරිල්ලී

  ආදී වශයෙන් කාඩ්පත් අතැති සිසුන් එක් තැනකට පැමිණීමට උපදෙස් දෙන්න.
- මෙලෙස සෑම වචන යුගලයක් ම නම් කර, සිසුන් ස්ථානගත කරන්න.
- අනතුරුව, සිසුන් පහත ආකාරයට පෙළගස්වන්න.

| අම්මා | තාත්තා | නංගී | මල්ලී | ගිරවා | ගිරවී | පූසා | පූසි | කුරුල්ලා | කිරිල්ලී |
|---|---|---|---|---|---|---|---|---|---|
| x | x | x | x | x | x | x | x | x | x |
| x | x | x | x | x | x | x | x | x | x |
| x | x | x | x | x | x | x | x | x | x |

- සිසුන්ට එම වචන ශබ්ද නගා පේළියෙන් පේළිය කියවීමට යොමු කරන්න.
- සිසුන් පන්තියට කැඳවාගෙන එන්න.
- කාඩ්පත් කට්ටල කණ්ඩායමේ මේසය මත ගළපා තබන ලෙස උපදෙස් දෙන්න.
- එම වචන යුගල වශයෙන් හුණු පුවරුවේ ලියන්න.
- වචන අභ්‍යාස පොත්වල ලිවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- **ඒකවචන හා බහුවචන පද**

**ක්‍රියාකාරකම 07**

- පහත සඳහන් පැවරුම්පත සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- ඒකවචන හා බහුවචන අදාළ තැනට යොදා පැවරුම සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම පැවරුම් පත් පරීක්ෂා කරන්න.

| ඒකවචන | බහුවචන |
|---|---|
| ගස | ................................. |
| ................................. | මල් |
| ................................. | ගල් |
| අම්මා | ................................. |
| ................................. | තාත්තලා |

- **හරි වැරදි යෙදීම**

**ක්‍රියාකාරකම 08**

පියවර 1 :
- 'අපේ පාලම' පින්තූර කතාවේ රූප රාමු අනුපිළිවෙළට ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- සිසුන් සවන් දීමට යොමු කර, කතාවේ සිදු වූ දේවල් හා සිදු නොවූ දේවල් පවසන්න.
  *උදා :* * වැස්සට වැට කැඩුණා. * ජිරාෆ් ගඟට පැන්නා.
  * ලේනා මල් මාලය දූම්මා. * හාවා ඌරාගේ පිටට නැංගා.
- එක් එක් කරුණ පවසන විට එය කතාවේ සිදු වූවා ද නැද්ද යන්න සිසුන්ගෙන් විමසන්න.

පියවර 2 :
- පහත සඳහන් ආකාරයේ පැවරුම්පතක් සකස් කර දී එම වාක්‍ය හරි නම් හරි (√) ලකුණ ද වැරදි නම් වැරදි (×) ලකුණ ද යොදන්න.
  හරි නම් හරි (√) ලකුණ ද වැරදි නම් වැරදි (×) ලකුණ ද යොදන්න.

| | |
|---|---|
| (1) වැස්සට වැට කැඩුණා. | ( ) |
| (2) හාවා මල් මාලය දූම්මා. | ( ) |
| (3) ජිරාෆ් ගේ බෙල්ල කොට යි. | ( ) |
| (4) ලේනා මල් මාලය දූම්මා. | ( ) |
| (5) ඉත්තෑවා වතුරට වැටුණා. | ( ) |

- සරල වාක්‍යාංශ හා වැකි

**ක්‍රියාකාරකම 09**

**ක්‍රියාකාරකම**

**පියවර 1 :**
- ''අපේ පාලම'' පින්තූර කතාව ඇසුරෙන්, පහත සඳහන් වාක්‍යාංශ හා වචන පත්‍රිකා සකස් කර ගන්න.

| අහසින් වැහි බිංදු |
|---|
| ජිරාෆ්ගේ බෙල්ල |
| ගඟේ වතුර |
| යහළුවෝ ගං ඉවුරේ බලා |
| හාවා මල් මාලය |
| ලේනා අත්පුඩි |

| වැටෙනවා. | වැඩි යි. | දිග යි. | ගසනවා. | දමනවා. | සිටිනවා. |
|---|---|---|---|---|---|

**පියවර 2 :**
- සකස් කර ගත් වාක්‍යාංශ ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.
- වචන පත්‍රිකා පහතින් රඳවන්න.
- එම වාක්‍යාංශ ගුරුවරයා කියවා සිසුන් ලවා ද කියවන්න.
- වචන පත්‍රිකා ද ඒ ආකාරයට ම කියවන්න.

**පියවර 3 :**
- වාක්‍යාංශවලට ගැළපෙන වචන පත්‍රිකාව නම් කිරීම සඳහා සිසුන් යොමු කරන්න.

  *උදා* : ''අහසින් වැහි බිංදු'' ගුරුවරයා කියන්න.

  ඊට අදාළ වචන පහතින් තෝරා කියවීමට සිසුන්ට උපදෙස් දෙන්න.

  'වැටෙනවා' වචනය ගෙන වාක්‍යාංශය ඉදිරියෙන් රඳවා වාක්‍යය ම කියවීමට යොමු කරන්න.

  *උදා* : අහසින් වැහි බිංදු වැටෙනවා.
- මේ ආකාරයට සියලු ම වැකි සම්පූර්ණ කරන්න.
- ඒවා කියවන්න.

**පියවර 4 :**
- පහත සඳහන් පරිදි පැවරුම් පතක් සකස් කර සෑම සිසුවෙකුට ම ලබා දෙන්න.
- එම පැවරුම සම්පූර්ණ කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සෑම සිසුවෙකුගේ ම පැවරුම් පත් පරීක්ෂා කරන්න.

හිස්තැන් පුරවන්න.

(1) ජිරාෆ්ගේ බෙල්ල ________.

(2) ගඟේ වතුර ________.

(3) හාවා මල් මාලය ________.

(4) ලේනා අත්පුඩි ________.

(5) අහසින් වැහි බිංදු ________.

(වැටෙනවා, දිගයි, වැඩියි, ගසනවා, දමනවා)

- **හිස්තැන් පිරවීම**

**ක්‍රියාකාරකම 10**

**පියවර 1 :** ● පහත සඳහන් ලෙස පැවරුම් පතක් විශාල ලෙස සකස් කොට ප්‍රදර්ශන පුවරුවේ සවි කරන්න.

*උදා :* (1) සමනලයා මලට <u>ඉගිලෙනවා.</u>

(2) අම්මා මිදුල __________ .

(3) තාත්තා වතුර __________ .

(4) ගිරවා රඹුටන් __________ .

(5) හාවා පැන පැන __________ .

- පැවරුමට අදාළ ක්‍රියාපදය සහිත වචන කාඩ්පත් සකස් කර ගන්න.
- එක් එක් වාක්‍යයට ගැළපෙන ක්‍රියාපදය සිසුන් සමඟ සාකච්ඡා කරමින් හිස්තැනට අදාළ ස්ථානයේ රැඳවීමට සලස්වන්න.
- එම වැකි **තනිරූල් පොතේ** ලිවීමට උපදෙස් දෙන්න.

- **ප්‍රශ්නවලට පිළිතුරු ලිවීම**

**ක්‍රියාකාරකම 11**

**පියවර 1 :** ● **'අපේ පාලම'** පින්තූර කතාව ප්‍රදර්ශන පුවරුවේ රඳවන්න.

- පින්තූර නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- ප්‍රශ්න අසන බව පවසා පිළිතුරු දන්නා සිසුන්ට අත් ඔසොවන ලෙස උපදෙස් දෙන්න.
- ප්‍රශ්න ඉදිරිපත් කරමින් පිළිතුරු ලබා ගන්න.

*උදා :* * පාලම කැඩුණේ ඇයි ?

* යහළුවන්ට උදවු කළේ ඇයි ?

* ජීරාෆ්ට උදවු කිරීමට හැකි වුණේ ඇයි ?

* උදවු කිරීම යහළුවෝ අගය කළේ කොහොම ද ?

**පියවර 2 :** ● **'අපේ පාලම'** කතාව ඇසුරින් පැවරුම්පතක් සකස් කර සිසුන්ට ලබා දී පිළිතුරු ලිවීමට උපදෙස් දෙන්න.

*උදා :* (1) පාලම කැඩුණේ ඇයි ? ..................................................................

(2) යහළුවන්ට උදවු කළේ කවු ද ? ....................................................................

(3) මල් මාලය දැමුවේ කවු ද ? ..............................................................

‘අකුරු ලිවීම සඳහා අභ්‍යාස පොත’ ආදර්ශ පිටුව

# භාවිත සිංහල හෝඩිය

අ ආ ඇ ඈ ඉ ඊ

උ ඌ ඍ ඎ ඏ ඐ

එ ඒ ඓ ඔ ඕ ඖ

අං අඃ

ක ඛ ග ඝ ඞ ඟ

ච ඡ ජ ඣ ඤ ඥ

ට ඨ ඩ ඪ ණ ඬ


ත ථ ද ධ න ඳ







ප ඵ බ භ ම ඹ





ය ර ල ව

ශ ෂ ස හ ළ

ඦ ෆ ඵ




1
2
3
4
5

1
2
3
4
5

1
2
3
4
5

1
2
3
4
5

1
2
3
4
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

1
1.1
2
3
3.1
3.2
4
4.1
5

# 2.0 පළමුවන ශ්‍රේණිය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හැඳින්වීම සහ විෂය නිර්දේශය

## 1. හැඳින්වීම

*"පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" නමින් හැඳින්වෙන මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය මිනිසා සහ මිනිස් ප්‍රජාව කෙරෙහි විවිධ අයුරින් බලපෑම් කළා වූ හෝ කරන්නා වූ හෝ භෞතික, සමාජයීය සහ ජෛව පද්ධතීන් පිළිබඳ ව හා ඒවා පදනම් කර ගෙන සිදු විය යුතු ඉගෙනුම් ක්‍රියාවලියකට යොමු කරන්නකි.*

ළදරු වියේ සිට ම ස්වභාවයෙන් ම මිනිසා සිය වටාපිටාව කෙරෙහි කුතුහලයකින් පසු වන අතර අනුක්‍රමයෙන් එම වටාපිටාව සමඟ සාර්ථක ව අන්තර් ක්‍රියා කිරීමට අවශ්‍ය නිපුණතා ළඟා කර ගැනීමට උත්සාහ දරයි. මෙම ක්‍රියාවලියේ දී සිය සංවේදී ඉන්ද්‍රියයන් ප්‍රයෝජනයට ගන්නා අතර ම ඒවායේ සංවේදී බවත්, වර්ගීකරණය හා තර්කනය වැනි බුද්ධිමය හැකියාවනුත් වර්ධනය කර ගනියි. එසේ ම ඒ ඔස්සේ සිය වාග්මාලාව සහ සන්නිවේදන කුසලතා ද වර්ධනය කර ගනියි. තමා ජීවත් වන වටාපිටාව පිළිබඳ ව තොරතුරු සොයා බැලීම, රැස් කිරීම හා නැවත ප්‍රකාශ කිරීම දරුවාගේ ජීවිත ක්‍රියාවලියේ ම අංගයකි. මෙය නිරායාසයෙන් ම ඕනෑම ජීවියකු තුළ සිදු වන්නකි. දරුවාගේ එම නැඹුරුව වර්ධනය කිරීම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ගොඩ නැඟීමේ පදනම විය.

එදිනෙදා ජීවිතයේ දී හමුවන අභියෝගවලට සාර්ථක ව මුහුණ දිය හැකි හා රටේ සංවර්ධන ක්‍රියාවලියට දායක විය හැකි සමබර පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තුළ සාක්ෂරතාව, ගණිත දැනුම සහ ආගම පිළිබඳ නිපුණතාවලට අමතර ව තවත් ක්ෂේත්‍ර කිහිපයකට අයත් නිපුණතා වර්ධනය විය යුතු ය. මීට පෙර ක්‍රියාත්මක වූ ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලාවන් හි සෞන්දර්ය අධ්‍යාපනය, නිර්මාණ ක්‍රියාකාරකම්, ශාරීරික අධ්‍යාපනය හා ආරම්භක විද්‍යාව වැනි විෂයයන් යටතේ එම නිපුණතා ශාක්ෂාත් කර ගැනීමේ අවශ්‍යතාව සලසා තිබුණි. එහෙත් නව විෂයමලාවේ "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" නම් වූ පුළුල් විෂයයක් යටතේ එම විවිධ ක්ෂේත්‍රවලට අයත් නිපුණතා අවස්ථානුකූලව මතු කර ගැනීමට ඉඩ සලසා ඇත.

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය පළමුවන ප්‍රධාන අවධියේ දී තේමා 16ක් මත විෂය නිර්දේශය ගොඩ නඟා ඇත. සෞන්දර්ය, නිර්මාණ හා ශාරීරික අධ්‍යාපන ක්ෂේත්‍රවලට අදාළ නිපුණතා මතු කර ගැනීම මෙන් ම ආගම, මව්බස හා ගණිතය යන ප්‍රධාන විෂයයන් පෝෂණය සඳහා ද "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්" යොදා ගත හැකි ය. පළමුවන ශ්‍රේණියේ දරුවන්ගේ කතා බහට ගැළපෙන සරල ඉංග්‍රීසි වදන් මෙම ක්‍රියාකාරකම් මගින් මතු කර ගත හැකි ය. මෙම විෂයයට අදාළ ක්‍රියාකාරකම් කිරීමේ දී ගුරුවරයාට තවත් සහායකයන් සිටීම ඒවා සංවිධානයට පහසුවනු ඇත. එම පාසලේ ම 6 වැනි ශ්‍රේණියේ සිසුන්ගේ සහාය මේ සඳහා ලබා ගත හැකි වනු ඇත.

විෂය නිර්දේශයේ ඇතුළත් සියලු කොටස් ඒ ආකාරයෙන් ම ශ්‍රී ලංකාවේ සෑම පාසලක ම කළ යුතු යැයි අදහස් නොකෙරේ. මෙම අවධියේ දී දරුවන්ගේ පරිසරය සීමිත ය. එම සීමාව තුළ ඇති දේ, සිදු වන දේ සියල්ල සෑම පාසලකට ම පොදු නොවේ. එහෙයින් දරුවන් සඳහා ක්‍රියාකාරකම් තෝරා ගැනීමේ දී සිය පාරිසරික සම්පත්වලට සරිලන සේ ඒවා තෝරා ගැනීමේ නිදහස හා වගකීම ගුරුවරයා සතු ය.

මේ අනුව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි ඉදිරිපත් කර ඇති එක් එක් තේමාවෙන් අපේක්ෂිත නිපුණතා කරා ළඟා වීමට, යෝජිත ක්‍රියාකාරකම් වෙනුවට වෙනත් ක්‍රියාකාරකම් ඔබට නිර්මාණය කර ගත හැකි අතර, එසේ කිරීමේ දී අපේක්ෂිත නිපුණතා ඉටු වන අයුරින් ක්‍රියාකාරකම් සොයා ගැනීමට වග බලා ගත යුතු ය.

## 2. ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

පළමුවන ශ්‍රේණියේ සිට පස්වන ශ්‍රේණිය තෙක් මෙම ඉගෙනුම් ක්ෂේත්‍රය පරිශීලනය කිරීමෙන් සිසුන් තුළ පහත දැක්වෙන නිපුණතා සංවර්ධනය සඳහා අවස්ථා සම්පාදනය කිරීමට අපේක්ෂා කෙරේ.

- සිය වටාපිටාවේ චමත්කාරය හඳුනාගෙන ඒ තුළින් වින්දනයක් ලබයි.
- ක්‍රීඩාව, විවේකය, විනෝදය සිය ජීවිතයට අවශ්‍ය අංග ලෙස සලකා උචිත අයුරින් ඒවා සිය දින චර්යාවට මුහු කර ක්‍රියා කරයි.
- සෞන්දර්යාත්මක දේ අගය කරමින් ඒවා සිය ප්‍රකාශන කාර්යයන්හි දී භාවිත කරයි.
- නිරෝගීමත් දිවි පැවැත්මකට අවශ්‍ය මූලික හුරුකම් ප්‍රදර්ශනය කරයි.
- මිනිස් නිර්මාණ අගය කරයි.
- සිය වටාපිටාවේ සිටින ජීවීන් හා ඔවුන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- මිනිස් සමාජය, මිනිස් හැසිරීම හා මිනිසා කෙරෙහි ඒවායේ බලපෑම පිළිබඳ ව අවබෝධයෙන් යුතු ව කටයුතු කරයි.
- පෘථිවිය, එහි සම්පත් හා අවකාශය මිනිසා කෙරෙහි බලපාන අයුරු ගවේෂණය කරයි.
- පාරිසරික සංරක්ෂණ ක්‍රියාවලියේ සිය වගකීම අවබෝධ කර ගෙන ඒ අනුව කටයුතු කරයි.
- සිය වටාපිටාවේ ශක්තිය සහ බලය යෙදීම ප්‍රජාවේ ඉදිරි ගමනට බලපාන අයුරු විමර්ශනාත්මක ව අගය කරයි.
- අනාගත වැඩ ලෝකයට අවශ්‍ය හුරුව ලබා ගැනීම සඳහා තම පරිසරයේ ඇති ද්‍රව්‍ය හා උපකරණ අවශ්‍ය පරිදි හසුරුවයි.

## 3. පළමුවන ප්‍රධාන අවධියේ පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයට අදාළ ඉගෙනුම් නිපුණතා

- පාසල් පරිසරයට අනුගතව කටයුතු කරයි.
- නිවසේ දී සතුටින් හා ඵලදායී ලෙස පුද්ගලයන් අතර අන්තර් සම්බන්ධතාවල නියැලෙයි.
- තොරතුරු රැස් කිරීම සඳහා නිරීක්ෂණ කරයි.
- අත්දැකීම් තුළින් සරල ක්‍රියාකාරකම්වල නියැලෙයි.
- සිරිත් විරිත්වලට අනුකූල ව ක්‍රියාකරයි.
- පාසල හා සම්බන්ධ අතීත තොරතුරු විමසා බලයි.
- සෞඛ්‍යවත් දිවිපෙවෙතක් සඳහා යහපත් පුරුදු අනුගමනය කරයි.
- සුහද කතා බහ ඔස්සේ නිවැරදි ව තොරතුරු හුවමාරු කර ගනියි.
- අවට පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.
- තමා හා තම අවට පරිසරය පිරිසිදු ව ක්‍රමවත් ව පවත්වා ගැනීමට දායක වෙයි.
- අන් අයට ප්‍රියජනක අන්දමින් තම ගති පැවතුම් පවත්වා ගනියි.
- මූලික ඉරියව් නිවැරදි ව පවත්වා ගනියි.
- එදිනෙදා කටයුතුවලදී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් ව කටයුතු කරයි.
- අවකාශය උචිත ලෙස භාවිත කරමින් ක්‍රීඩා හා ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- අරමුණු ගත කාර්යයන් සඳහා සාමූහික ව වගකීමෙන් වැඩ කරයි.
- පරිසර විවිධත්වය කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි.

- අවශ්‍ය අවස්ථාවලදී අන් අයට උදව් කිරීමට ඉදිරිපත් වෙයි.
- රූප සංකේත හා ලිඛිත පුවරු මඟින් දැක්වෙන තොරතුරු ලබා ගනියි.
- තම අත්දැකීම් චිත්‍ර හා ඇඟීම් මඟින් ප්‍රකාශ කරයි.
- පරිසරයේ ශබ්ද, නාද, චලන සහ චරිත නිරූපණය කරයි.
- අභිනය දක්වමින් රංගනයේ හා ගායනයේ නිරත වෙයි.
- විවිධ කටයුතුවලදී සමායෝජනයෙන් යුතු ව චලන දක්වයි.
- විවිධ ද්‍රව්‍ය භාවිතයෙන් විවිධ දේ නිර්මාණය කරයි.
- ලබාගත් අත්දැකීම් හා රැස් කරන ලද තොරතුරු තනි ව හෝ සාමූහික ව හෝ පිරිසකට ඉදිරිපත් කරයි.
- නිවසේ දී හා පාසලේ දී සිය යුතුකම් හා වගකීම් පිළිබඳ ව සංවේදී ව කටයුතු කරයි.

## 4. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා යොමුවක්

- මෙම නිර්දේශයේ දී දරුවාගේ වටාපිටාව තේමා 16 ඔස්සේ විකාශය කර ඇත.
- සියලු දෑ තෘප්තිදායක අත්දැකීම් වශයෙන් ලබා ගැනීමට දරුවනට ඉඩ සැපයිය යුතු වා මෙන් ම ඒ සඳහා ප්‍රමාණවත් සැලැස්මක් හා සූදානමක් අවශ්‍ය වනු ඇත.
- මෙහි ඇති අදහස්වලට අනුකූල ව ඉගෙනුම් හා හඳුන්වා දීමේ ක්‍රම යොදා පාඩම් සැලසුම් කර ගත යුතු ය.
- තොරතුරු වාර්තා කිරීම, තොරතුරු සොයා ගැනීම තරම්ම වැදගත් ය. මුල් අවධියේ දී වාචික ව කටු සටහන් මඟින් සිය අත්දැකීම් ප්‍රකාශ කිරීමට දරුවන් පොළඹවන්න. ක්‍රමයෙන් වචන ද වාක්‍ය ද තරමක් සවිස්තරාත්මක රූප සටහන් ද යොදා ගැනීමට දරුවන් යොමු කරවන්න.
- වැඩ සියල්ල හා උත්සාහය අගය කළ යුතු ය.
- සිසුන් කන්ඩායම් වශයෙන් වැඩෙහි යොදවන්න. එහෙත් මුල් අවස්ථාවලදී කණ්ඩායමක කෙනෙකු වැඩ කළ යුතු ආකාරය පිළිබඳ ව දරුවනට මඟ පෙන්වීම් හා නිවැරදි කිරීම් අවශ්‍ය වනු ඇත.
- යම් තේමාවකට සම්බන්ධ ව ඉගෙනුම් ඉගැන්වීම් කර ගෙන යන අවස්ථාවේ දී අනුක්‍රමයෙන් එක් රැස් වන තොරතුරු හා ද්‍රව්‍ය ක්‍රමයෙන් ගොඩ නැගෙන ප්‍රදර්ශනයක් බවට පෙරලන්න.
- තේමා ඉදිරිපත් කර ඇත්තේ නිශ්චිත පිළිවෙළකට නොවේ. ඕනෑ ම වේලාවකට උචිත තේමාවන් ඕනෑම තැනකින් තෝරා ගැනීමට නිදහසක් ඇත. කාලයට උචිත අයුරින් තේමා තෝරා ගැනීමෙන් සම්පත් පරිහරණය වඩා පහසු වනු ඇත.

## 5. ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉගැන්වීමට වඩා, ඉගෙනුමට මුල් තැනක් දෙන ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියකි. කණ්ඩායම් හා තනි තනි ව ද වරෙක මුළු පන්තිය ම ද ඉගෙනුම් කාර්යවල යෙදවිය හැකි ය.

ගුරුවරයා මේ සඳහා කල් ඇති ව සැලසුම් කර ගත යුතු ය. එක ම මොහොතක විවිධ කණ්ඩායම් එකිනෙකට වෙනස් වැඩවලට යෑමට හැකි ය. ඒ මඟින් පුළුල් ක්ෂේත්‍රයක් ආවරණය කර ගැනීමට හැකි ය.

සිසුන් සඳහා සැලසුම් කරන වැඩ අතර නිරීක්ෂණ, ක්ෂේත්‍ර චාරිකා, අත්හදා බැලීම්, කෙටි ව්‍යාපෘති, රැස් කිරීම්, භූමිකා රංගන වැනි විවිධ ඉගෙනුම් ක්‍රමෝපාය ද පුද්ගලයන්ගෙන්, පොත්පත් වැනි මුද්‍රිත මාධ්‍යවලින් ද විද්‍යුත් මාධ්‍යවලින් ද තොරතුරු රැස් කිරීම් අඩංගු විය හැකි ය.

## 6. පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පළමුවන ශ්‍රේණිය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් යටතේ පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන් සංවිධානය විය යුත්තේ දවස පුරා මේසය අසල පුටුවක වාඩි වී සිටීම වෙනුවට විවිධ ඉරියව්වෙන් හා සතුටින් නොයෙකුත් ක්‍රියාකාරකම්වල නිරත වන දරුවන් දැකිය හැකි වන පරිදි ය.

- පාසල් කාලය තුළ දී පළමුවන ශ්‍රේණිය සිසුන් ප්‍රධාන වශයෙන් සෙල්ලම් ස්වරූපයක් ගත් ක්‍රියාකාරකම්වල නිරත වීමට අවශ්‍ය පරිසරය සකස් කිරීම.
- එළිමහනේ ඉගෙනුම් අවස්ථා සඳහා පහසුකම් සැපයීම.
- පාසලේ ක්‍රීඩා සෞන්දර්යාත්මක කටයුතු විශේෂ දින සැමරුම් අවස්ථා හා වෙනත් විෂයය සමගාමී කටයුතුවලදී පළමුවන ශ්‍රේණිය දරුවන් ද සහභාගි කර ගැනීම.
- පාසලේ ඉහළ පන්තිවල (6/5 වන ශ්‍රේණි) සිසුන්ගේ උදව් ද අවශ්‍ය අවස්ථාවලදී ලබාදීම.

## 7. සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

සිසුන් සඳහා ඉගෙනුම් ඉගැන්වීම් කටයුතු සංවිධානය කිරීමේ දී ඔවුන් ඉගෙනීම සම්බන්ධයෙන් දක්වන හැකියාවන් හා නොහැකියාවන් පිළිබඳ සුවිශේෂ වැටහීමක් ගුරුවරුනට තිබිය යුතු ය. මේ සඳහා පන්ති කාමරය තුළ නිරන්තරයෙන් කරනු ලබන තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් අදහස් කෙරේ. සිසුන් තක්සේරු කිරීමේ පරමාර්ථ රාශියක් තිබේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල කරනු ලබන තක්සේරු කිරීම් ප්‍රධාන අරමුණු දෙකක් මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ඉන් පළමුවැන්න වන්නේ අනාවරණයයි. තමාගේ පන්ති කාමරයේ සිටින සෑම සිසුවකුට ම ගැළපෙන ආකාරයේ අධ්‍යාපනයක් ලබාදීමට නම් ගුරුවරුන්හට ඒ සෑම සිසුවකු පිළිබඳ ව ම වැටහීමක් තිබිය යුතු ය. දෙවැනි අරමුණ සිසුන් පිළිබඳ අනාවරණය කරගත් තොරතුරු පදනම් කරගෙන එක් එක් සිසුන් සඳහා උපදේශාත්මක පසු පෙවුමක් ලබා දීම ය. එම නිසා ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක තක්සේරු කිරීම් සිසුන් සඳහා ශ්‍රේණි ලබා දීම, සිසුන් එකිනෙකා සසඳමින් අගය කිරීම, සිසුන් ඔවුන්ගේ හැකියාවන් අනුව වර්ග කිරීම වැනි කරුණුවලින් ඔබ්බට ගිය දෙයක් වශයෙන් සැලකිය හැකි ය.

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වන තක්සේරු කිරීම නිර්ණායක මූලික, ගුරුවරයා මුල් කරගත්, අවිධිමත් සම්භවන තක්සේරු කිරීමක් ලෙස ද හඳුන්වා දිය හැකි ය. විෂයමාලාවේ අපේක්ෂිත නිපුණතා අනුව ගොඩනගා ගත් ඇගයීම් නිර්ණායක ඇතුළත් කර ඇත. පන්ති භාර ගුරු මහත්ම මහත්මීන් මේ නිර්ණායක කරා සිසුන් කෙතෙක් දුරට ළඟා වී තිබේ දැයි, තක්සේරු කිරීම යටතේ අනාවරණය කරගත යුතු ව ඇත.

කණ්ඩායම් වැඩවල නිරතවීමේ දි ප්‍රශ්න ඇසීම, අවිධිමත් ලෙස සිසුන් නිරීක්ෂණය කිරීම, ඔවුන් සමඟ සාකච්ඡා කිරීම, කාර්ය සාධන ගොනු පවත්වා ගෙන යාම, ගෙදර වැඩ ඇගයීම වැනි අවිධිමත් ක්‍රම ද බෙහෙවින් ප්‍රයෝජනවත් වේ. ඒවා අවශ්‍ය පරිදි භාවිත කිරීම, විශේෂයෙන් ප්‍රාථමික ශ්‍රේණිවල දී පන්ති භාර ගුරුවරයාගේ වගකීමයි. තක්සේරු කිරීම වාර අවසානයේ හෝ ඒකකයක් අවසානයේ හෝ නොව ඉගැන්වීම් කටයුතු කරන අතරතුර ම ක්‍රියාත්මක විය යුතු දෙයකි. තක්සේරු කිරීම වඩාත් හොඳ අධ්‍යාපනයක් සිසුන්ට ලබා දීම පිණිස එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගැඹුරින් හඳුනා ගැනීමේ ක්‍රියාවලියක් වශයෙන් වටහාගෙන කටයුතු කිරීම යෝග්‍යය.

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 1. අපයි පාසලයි | • පාසලේ තිබෙන සුවිශේෂ හා වැදගත් ස්ථාන හඳුනාගෙන එම සුවිශේෂ හා වැදගත් ස්ථානවල විවිධත්වයන්ට අනුකූල ව කටයුතු කරයි.<br>• පාසලේ කටයුතුවලට දායක වෙමින් පාසල් සංස්කෘතිය යහපත් ව පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br>• පාසලේ සිටින විවිධ පුද්ගල භූමිකා හඳුනා ගනිමින් ඔවුන් කෙරෙහි සංවේදීව කටයුතු කරයි.<br>• පන්ති කාමරය අලංකාරව පවත්වාගෙන යාම සඳහා විවිධ මාධ්‍ය භාවිත කරමින් නිර්මාණවල යෙදෙයි.<br>• උපකරණ භාවිත කරමින් චාලක ක්‍රියාකාරකම්වල නියැලෙයි.<br>• පාසලේ අගය ඉස්මතු කර දැක්වීම සඳහා වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරයි. | • පාසලේ ඇති සුවිශේෂී මෙන් ම වැදගත් ස්ථාන පිළිබඳ තොරතුරු<br>• පාසලේ භූමියේ වෙනස්කම් හඳුනාගැනීම හා ආරක්ෂාකාරීව හැසිරීම.<br>• පන්ති කාමරයේ අලංකාරය, පිරිසිදුකම හා ක්‍රමවත් බව පවත්වා ගෙන යාමට කළ යුතු කාර්යයන්<br>• පාසලේ හා පන්ති කාමරයේ සිදුවන චාරිත්‍ර වාරිත්‍ර හඳුනා ගැනීම හා පිළිපැදීම.<br>• පාසල් කොඩියට හා පාසල් ගීතයට ගරු කළයුතු බව<br>• පාසලේ ක්‍රියාත්මක වන නීතිරීති හා එම නීතිරීතිවලට අවනත බව<br>• පාසල තුළ සිටින විවිධ පුද්ගලයන් හා ඔවුන්ගේ භූමිකා හඳුනා ගැනීම<br>• පන්ති කාමරයේ අලංකරණය පවත්වා ගැනීමට සුදුසු නිර්මාණ<br>• සෙල්ලම් මිදුල භාවිත කරමින් චාලක ක්‍රියාකාරකම්වල නිරත වීම<br>• පාසලේ අගය මතු කර දැක්වෙන ගීතවලට නිදහස් චලන ක්‍රියාකාරකම් |
| 2. අපේ ගෙදර | • නිවසේ හා නිවසට සම්බන්ධ පුද්ගලයින් හා සතුන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.<br>• තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නිවස යහපත් ලෙස පවත්වා ගෙන යෑමට දායක වෙයි.<br>• එදිනෙදා නිවසේ ප්‍රයෝජනයට ගත හැකි දෑ නිපදවා ගැනීමට දායක වෙයි.<br>• නිවසේ අලංකරණය සහ පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා යොදා ගත හැකි නිර්මාණ සිදු කරමින් වින්දනයක් ලබයි.<br>• නිවෙස් පරිසරය ඇසුරු කර ගත් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙමින් වින්දනයක් ලබයි.<br>• නිවෙස් පරිසරය ආශ්‍රිතව ලබන අත්දැකීම් වින්දනාත්මකව ප්‍රකාශ කරයි. | • නිවසේ සිටින සාමාජිකයින් අතර අන්‍යෝන්‍ය බැඳීම් වර්ධනය වන ආකාරයෙන් සිදුකරන කටයුතු<br>• නිවසට පැමිණෙන අමුත්තන්, නෑදෑයින් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතුව කටයුතු කළ යුතු බව<br>• නිවසේ හා නිවස ආශ්‍රිත සතුන් පිළිබඳ සංවේදී බව<br>• නිවසේ එදිනෙදා සිදුකරන කටයුතුවල දී තමාට ලබාදිය හැකි දායකත්වය<br>• නිවෙස් පරිසරයේ පිරිසිදු බව පවත්වා ගැනීම සඳහා සිදුකරන කටයුතු<br>• නිවසේ දී නිෂ්පාදනය කර ගන්නා දේ කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු බව<br>• නිවසේ අලංකරණය සඳහා යොදාගත හැකි නිර්මාණ<br>• නිවෙස් පරිසරය ඇසුරු කරගත් චාලක ක්‍රියාකාරකම්<br>• නිවෙස් හා නිවෙස් පරිසරය සම්බන්ධ කවි, ගී ගායනා හා රංගන |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 3. වත්තට එන සත්තු | • අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.<br>• සතුන් ද පරිසරයේ ම කොටසක් සේ සලකා සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.<br>• අප අවට පරිසරයේ වෙසෙන සතුන්ගේ චර්යා පිළිබඳ අනුකරණයෙන් යුතුව නිර්මාණාත්මක චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.<br>• සතුන්ගේ විවිධ ලක්ෂණ හා හැසිරීම් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.<br>• විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ව වාසස්ථානවල ආකෘති නිර්මාණ කරයි. | • පාසල් වත්තට එන සතුන් හඳුනා ගැනීම<br>• සතුන්ගේ විවිධ ලක්ෂණ<br>• සතුන්ගේ වාසස්ථාන පිළිබඳ තොරතුරු<br>• සතුන් පිළිබඳව සංවේදී බවින් යුතුව කටයුතු කිරීම<br>• අප අවට සතුන් අනුකරණය කරමින් සිදු කළහැකි නිදහස් චාලක ක්‍රියාකාරකම්<br>• සතුන්ගේ විවිධ නාද, චලන හා ඉරියව් පිළිබඳ අනුකරණාත්මක රංගන<br>• සතුන් පිළිබඳ කියවෙන ගීත<br>• සතුන්ගේ චිත්‍ර හා ආකෘති නිර්මාණය |
| 4. ජලය සමඟ සෙල්ලම් | • ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ලෙස භාවිත කරයි.<br>• ජලයේ ස්වභාවය හා ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• ජලය විවිධ අයුරින් භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදෙයි.<br>• ජලය උපයෝගී කර ගනිමින් නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැළෙයි.<br>• ජලය තේමා කොට ගත් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි. | • එදිනෙදා කටයුතු සඳහා ජලය ප්‍රයෝජනවත් වන අයුරු<br>• ජලය අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කළ යුතු බව<br>• ජලයේ හැඩය හා ස්වරූපය වෙනස්වන විවිධ අවස්ථා<br>• විවිධ ද්‍රව්‍ය ජලය සමඟ දක්වන අන්තර් ක්‍රියා<br>• විවිධ ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන අයුරු<br>• විවිධ නිර්මාණ සඳහා වර්ණවත් දියර භාවිත කරමින් මැවිය හැකි රටා<br>• ජලය උපයෝගී කරගනිමින් සිදුකළ හැකි නිර්මාණාත්මක ක්‍රීඩා<br>• ජලය යොදා ගනිමින් විවිධ නාද නිපදවිය හැකි ආකාර |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 5. අවුරුදු කාලය | • අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම් ගවේෂණය කර වාර්තා කරයි.<br>• අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම අගය කරමින් කටයුතු කරයි.<br>• අවුරුදු කාලයේ සිදුකරන කටයුතුවලින් සිදුවිය හැකි අනතුරු පිළිබඳ ව විමසිලිමත් වෙමින් ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• අවුරුදු සිරිය මතුවන විවිධ නිර්මාණවල යෙදෙමින් වින්දනය ලබයි.<br>• විවිධ ජන කොටස්වල අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවලට ගරු කරයි.<br>• අවුරුදු උත්සව සමය හා සම්බන්ධ ක්‍රීඩාවල නිරත වෙමින් වින්දනයක් ලබයි.<br>• අවුරුදු කාලයට සුවිශේෂ වූ වින්දනාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි. | • අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම්<br>• අවුරුදු සිරිත් විරිත් හඳුනා ගැනීම හා පිළිපැදීම<br>• අවුරුදු කාලය හා සම්බන්ධ චිත්‍ර/පෝස්ටර් නිර්මාණය<br>• අවුරුදු කාලය හා සබැඳි ජන ක්‍රීඩා<br>• අවුරුදු කාලයට සුවිශේෂ වූ සරල ජනකවි, ගීත, රංගන |
| 6. අපට පෙනෙන අහස | • අහස හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>• හිරු එළියෙන්, සුළඟින් සිදුවන බලපෑම පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• විවිධ මාධ්‍ය භාවිත කරමින් අහසේ සුන්දරත්වය හා පාරිසරික වෙනස්කම් විදහා දැක්වෙන නිර්මාණ කරයි.<br>• අවකාශය භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.<br>• අහසේ සුන්දරත්වය ප්‍රකාශනාත්මක චලන ඇසුරෙන් ඉදිරිපත් කර වින්දනයක් ලබයි. | • ආකාශ වස්තු පිළිබඳ තොරතුරු<br>• සුළඟ උපයෝගී කරගෙන ද්‍රව්‍ය අහසේ පා කළ හැකි බව<br>• හිරු එළියේ බලපෑම නිසා සිදුවන පාරිසරික වෙනස්කම්<br>• සෙවණ ලබා ගැනීමට යොදාගත හැකි සරල නිර්මාණ<br>• තිරස් අවකාශ භාවිත කරමින් දිවීම ආශ්‍රිත සුළු ක්‍රීඩා<br>• අහසේ දක්නට ලැබෙන විවිධ දේ පිළිබඳ කවි, ගීත ගායනය හා රංගනය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 7. අප කන බොන දේ | • ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනාගනිමින් පරිභෝජනය කරයි.<br>• නිරෝගී පැවැත්ම සඳහා නිවැරදි සෞඛ්‍යය පුරුදු පවත්වා ගනියි.<br>• ආහාර අපිරිසිදුවන අයුරු හඳුනාගෙන ඒවායින් ආහාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.<br>• විවිධ මාධ්‍ය යොදා ගනිමින් ආහාර හා සම්බන්ධ නිර්මාණවල යෙදෙයි.<br>• ශක්ති වර්ධනයට උපකාරී වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• ආහාර ගැනීමේ දී පවත්වා ගත යුතු නිවැරදි පිළිවෙත් ප්‍රදර්ශනයවන නිර්මාණාත්මක රංගනවල යෙදෙයි. | • ආහාරවලින් අපේ ශරීරයට ලැබෙන ප්‍රයෝජන<br>• ආහාර වේලක අඩංගු විය යුතු දේ<br>• නියමිත වේලාවට හා නියමිත ප්‍රමාණයෙන් ආහාර පාන ගැනීමේ වැදගත්කම<br>• නිරෝගී පැවැත්ම සඳහා වන සෞඛ්‍ය පුරුදු<br>• ස්වාභාවික ආහාරපාන ගැනීමේ වැදගත්කම<br>• ආහාර අපිරිසිදුවන ක්‍රම<br>• ආහාර අපිරිසිදු වීම වලක්වා ගන්නා අයුරු<br>• ආහාර පාන ප්‍රියජනක ලෙස පිළිගැන්වීම සඳහා යොදාගත හැකි නිර්මාණ<br>• ශක්ති වර්ධනය සඳහා උපකාරීවන වින්දනාත්මක ක්‍රීඩා<br>• ආහාර හා සබැඳි සෞඛ්‍ය පුරුදු ප්‍රදර්ශනය වන නිර්මාණාත්මක රංගන |
| 8. තොරතුරු ලැබෙන හැටි | • සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍ය හඳුනා ගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.<br>• සන්නිවේදනය හා බැඳුණු තාක්ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.<br>• තොරතුරු සන්නිවේදනය හා සම්බන්ධ විවිධ නිර්මාණ කරයි.<br>• විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• විවිධ සන්නිවේදන විධි යොදා ගනිමින් ප්‍රකාශනාත්මක චලන සහිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි. | • අපට තොරතුරු ලැබෙන විවිධ මාධ්‍ය හා උපකරණ<br>• සන්නිවේදනය සඳහා යොදාගන්නා විවිධ තාක්ෂණික මෙවලම් භාවිතය<br>• සන්නිවේදනය සඳහා යොදා ගන්නා උපකරණවල ආකෘති නිර්මාණය<br>• විවිධ සංඥාවලට අනුව සිදුකරනු ලබන චාලක ක්‍රියාකාරකම්<br>• සන්නිවේදනයේ දී හඬ හා ඉරියව් හසුරුවන විවිධ ආකාර |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 9. වටපිටාවේ සිදුවන වෙනස්කම් | • පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.<br>• ස්වාභාවික පරිසරයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.<br>• වටපිටාවේ සිදුවන විවිධ වෙනස්කම්වල දී භාවිත කළ හැකි නිර්මාණ කරයි.<br>• සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• අවකාශය භාවිත කරමින් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි. | • අව්ව, වැස්ස හා සුළඟ ආශ්‍රිතව පරිසරයේ සිදුවන වෙනස්කම්<br>• පරිසරයේ වෙනස්කම්වලට සතුන් දක්වන ප්‍රතිචාර<br>• ස්වාභාවික පරිසරයේ ඇතිවිය හැකි හදිසි තත්ත්වයන්<br>• වටපිටාවේ වෙනස්කම් දැක්වෙන චිත්‍ර<br>• වටපිටාවේ සිදුවන වෙනස්කම්වල දී භාවිත කළ හැකි නිර්මාණ<br>• වටපිටාවේ සිදුවන වෙනස්කම් ඇසුරින් සිදුකළ හැකි නිදහස් චලන ක්‍රියාකාරකම්<br>• සෞන්දර්යාත්මක හැකියා වර්ධනයට අදාළ ශ්වසන ක්‍රියාකාරකම් |
| 10. අපේ යහ පැවැත්ම | • යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වාගෙන යාමට කටයුතු කරයි.<br>• වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.<br>• නීතිරීති පිළිගනිමින් නීතිගරුකව හැසිරෙයි.<br>• යහපුරුදු පවත්වා ගැනීම සඳහා ඉවහල් වන නිර්මාණ කරයි.<br>• ශාරීරික සහ මානසික යෝග්‍යතාව පවත්වා ගැනීමට ඉවහල්වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.<br>• වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරමින් යහපත් චර්යා පිළිබිඹු කරයි. | • අන්‍යයන්ට ගරු කළ යුතු බව<br>• අන් අයට හිරිහැරයක් නොවන සේ කටයුතු කිරීම<br>• අන් අයගේ ගුණාංග අගය කිරීම<br>• එදිනෙදා කටයුතුවල දී නායකත්වය ගෙන කටයුතු කිරීම<br>• එදිනෙදා කටයුතුවල දී නීතිගරුකව හැසිරිය යුතු බව<br>• යහපුරුදු දැක්වෙන පණිවිඩ සහිත චිත්‍ර/ පෝස්ටර් නිර්මාණය<br>• යුගල වශයෙන් සහභාගි වී සාර්ථකත්වය ලබාගත හැකි ක්‍රියාකාරකම්<br>• යහපුරුදු පිළිබඳ කියවෙන කවි, ගීත ගායනය හා රංගනය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
| --- | --- | --- |
| 11. අපට ඕනෑ දේ ලැබෙන හැටි | • අවශ්‍ය අවස්ථාවල දී අපට උදව් ලබාදෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් කටයුතු කරයි.<br>• වෙළඳපොළක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.<br>• තමාට ලැබුණු දේ අන්‍යයන් සමඟ බෙදා හදා ගැනීමේ යහපුරුදු පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.<br>• අපට අවශ්‍ය සමහර දෑ අපටම නිෂ්පාදනය කරගත හැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.<br>• එදිනෙදා ද්‍රව්‍ය ඇසුරෙන් විවිධ නිර්මාණවල යෙදෙයි.<br>• ශාරීරික යෝග්‍යතා වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• අපට ඕනෑ දේ ලැබෙන ස්ථානවලින් සිදු කරන කාර්යයන් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි. | • අපගේ අවශ්‍යතා ලබා දීමට නිවසේ දී හා පාසලේ දී විවිධ අයගෙන් ලැබෙන උදවු හා ඔවුන්ගෙන් සිදුවන සේවය<br>• වෙළඳපොළ පිළිබඳ සජීවී අත්දැකීම්<br>• තමාට ලැබෙන දේ බෙදා හදා ගැනීමේ වැදගත්කම හා එම පුරුදු පවත්වා ගැනීම<br>• තමා සතු දේ අරපිරිමැස්මෙන් යුතුව භාවිතය<br>• එදිනෙදා ආහාර සඳහා ලබා ගන්නා භෝග වර්ග හැකි අයුරින් ගෙවත්තේම වගා කර ගැනීමට දායක වීම<br>• විවිධ ද්‍රව්‍ය ආශ්‍රයෙන් වර්ණ නිපදවා ගනිමින් සිදුකළ හැකි මෝස්තර<br>• විවිධ ද්‍රව්‍ය ඇසුරින් නම්‍යතා වර්ධනයට උපකාරීවන චාලක ක්‍රියාකාරකම්<br>• අපට ඕනෑ දේ ලැබෙන ස්ථානවලින් ඉටු කරන කාර්යයන් හා සම්බන්ධ කවි, ගීත, රංගන |
| 12. ගමන් බිමන් | • ගමන්බිමන්වල දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි.<br>• පොදු ගමනාගමන සේවා පිළිබඳ දැනුවත් වෙමින් ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කරයි.<br>• ගමන් බිමන් යාමේ දී විය හැකි බාධක හා අනතුරු පිළිබඳ විමසිලිමත් ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.<br>• ගමන් බිමන්වල දී අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.<br>• ගමනාගමන ක්‍රම විවිධ මාධ්‍ය මගින් නිර්මාණය කරයි.<br>• ගමන් කිරීම හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• විවිධ ගමන් විලාස ඇසුරෙන් නිර්මාණාත්මක රංගන ඉදිරිපත් කරයි. | • ඇවිදීමේ දී, සිටගැනීමේ දී හා වාඩිවීමේ දී අනුගමනය කළ යුතු නිවැරදි ඉරියව්<br>• දිය, ගොඩ, අහසේ ගමන් කිරීමට යොදාගන්නා වාහන<br>• පයින් ගමන් කිරීමේ දී ඇතිවිය හැකි බාධක, අනතුරු හා ඒවායින් ආරක්ෂා වීම<br>• ගමන්බිමන්වල දී අන්‍යයන්ට උදවු කිරීම හා අන්‍යයන්ගෙන් තමාට ලැබෙන උදවු අගය කිරීම<br>• ගමනාගමනය සඳහා යොදාගන්නා ක්‍රම විදහා දැක්වෙන චිත්‍ර හා ආකෘති<br>• ඇවිදීමේ දී සමබරතාව රැකගැනීමේ මූලික හුරුකම්<br>• විවිධ ගමන් විලාසවල රිද්ම අනුකරණය |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 13. එළිය (ආලෝකය) සමඟ සෙල්ලම් | • ආලෝක ප්‍රභවයන්, ආලෝකය හා ඇස අතර ඇති සබඳතාව අධ්‍යයනය කරයි.<br>• ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් දෛනික කටයුතුවල යෙදෙයි.<br>• ස්වාභාවිකව එළිය වෙනස්වීම් අනුව පරිසරයේ ඇති වන වෙනස්කම් සහ එළිය වෙනස් කළ හැකි අයුරු විමර්ශනය කර වාර්තා කරයි.<br>• අලංකරණය සඳහා ආලෝකය උපයෝගි කර ගනිමින් විවිධ නිර්මාණ කරයි.<br>• ස්වාභාවික ආලෝකයෙන් වන බලපෑම් පිළිබඳ විමසිලිමත් ව ඵලදායී අයුරින් ක්‍රීඩාවල යෙදෙයි.<br>• එළිය සමඟ සිදු කළ හැකි අභිනය මුල් කරගත් වින්දනාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරයි. | • යමක් දැකීමට ආලෝකය හා ඇසේ පෙනීමේ හැකියාව එක සේ වැදගත් වන බව<br>• ඇසේ ආරක්ෂාව පිළිබඳ ව විමසිලිමත් විය යුතු අයුරු<br>• එළිය විහිදීම අඩු කිරීම, වැඩි කිරීම සහ එහි දිශාව වෙනස් කිරීම කළ හැකි අයුරු<br>• විවිධ නිර්මාණවල අලංකරණය සඳහා ආලෝකය යොදා ගැනීම<br>• සෙවණැලි පැගීම ආශ්‍රිත ක්‍රීඩා<br>• සෙවණැලි භාවිත කරමින් සිදුකළ හැකි ආංගික චලන |
| 14. මිනිසුන් වැඩ කරන් තැන් | • ආසන්න පරිසරයේ පුද්ගලයන් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන සහ එම ස්ථානවල දී තම ආරක්ෂාව සලසා ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි.<br>• විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැළඳුම් හා උපකරණ හඳුනාගෙන වාර්තා කරයි.<br>• මිනිසුන් වැඩ කරන ස්ථාන ආශ්‍රිත චලන අනුකරණය හා සමබරතාවය පවත්වා ගත යුතු චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• වැඩ කරන ස්ථාන, එම ස්ථානවල දී භාවිත කරනු ලබන භාණ්ඩ හා උපකරණ සම්බන්ධ නිර්මාණ කරයි.<br>• මිනිසුන් වැඩ කරන තැන් හා සම්බන්ධ තොරතුරු වින්දනාත්මක ව ප්‍රකාශ කරයි. | • ආසන්න පරිසරයේ පුද්ගලයින් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන<br>• එකිනෙකට වෙනස් කාර්යයන් සඳහා භාවිත කරන උපකරණ, මෙවලම්, ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු<br>• සමබරතාව පවත්වා ගැනීම හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්<br>• වැඩකරන ස්ථානවල විවිධ අවස්ථා විදහා දැක්වෙන පෝස්ටර් හා චිත්‍ර<br>• විවිධ කාර්යයන් කරන අතරතුර ගායනා කරනු ලබන කවි, ගී<br>• විවිධ තැන්වල වැඩ කරන මිනිසුන්ගේ චලන අනුකරණය කිරීම හා සම්බන්ධ ක්‍රියාකාරකම් |

| තේමාව | නිපුණතාව | විෂය අන්තර්ගතය |
|---|---|---|
| 15. වටපිටාවේ වෙනස් තැන් | • පරිසරයේ විවිධත්වයට අනුව පැළ වැඩෙන ආකාරය හා ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කර වාර්තා කරයි.<br>• පරිසරයේ විවිධ ස්ථානවල මිනිසා විසින් සිදුකරන වෙනස්කම් හඳුනාගනිමින් එම ස්ථාන යහපත් ස්ථාන බවට පත්කර ගැනීමට කටයුතු කරයි.<br>• පරිසරයේ විවිධත්වයන්ට ගැළපෙන නිර්මාණ කරමින් පරිසරයේ සුන්දරත්වය රැකගනියි.<br>• පාසල් පරිසරයේ වෙනස් වූ තැන් අනුව මූලික ශාරීරික යෝග්‍යතා වර්ධනය වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• වටපිටාවේ වෙනස් තැන්වල ඇති විවිධත්වය පිළිබිඹු කරන රිද්මයානුකූල චලන වින්දනාත්මකව ඉදිරිපත් කරයි. | • අවට පරිසරයේ විවිධත්වය පිළිබඳ තොරතුරු<br>• ආසන්න පරිසරයේ විවිධත්වයෙන් යුතු ස්ථාන කිහිපයක පැළ වැඩෙන ආකාරය හා ජීවායේ ජීවත් වන සතුන් පිළිබඳ තොරතුරු<br>• අවට පරිසරයේ සුන්දරත්වය රැකගත යුතු බව<br>• මිනිසාගේ මැදිහත් වීමෙන් වටපිටාව සුන්දර ස්ථානයක් බවට පත් කර ගත හැකි අයුරු<br>• පරිසරයෙන් සපයාගන්නා විවිධ ද්‍රව්‍ය ආශ්‍රයෙන් සිදුකළ හැකි නිර්මාණ<br>• බාධක සහිත පරිසරයක ඇවිදීමේ හා දිවීමේ ක්‍රියාකාරකම්<br>• පරිසරයේ ඇසෙන හ දකින ශබ්ද, නාද හා චලන |
| 16. අපේ උදව් ඕනෑ අය | • සමාජයේ උදවු අවශ්‍ය අය හඳුනා ගෙන උදවු කිරීමට කටයුතු කරයි.<br>• සාර්ථකත්වය සඳහා සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.<br>• අන් අයට උපකාරී වන ආකාරයේ නිර්මාණ කරයි.<br>• අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය සඳහා චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.<br>• සමාජයේ විවිධ අය පිළිබඳ සංවේදීතාව මතු කර දක්වන භූමිකා රංගනවල නිරත වෙයි. | • පාසලේ දී හා නිවසේ දී අන් අයට කළ හැකි උදවු<br>• විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් කෙරෙහි සංවේදී විය යුතු බව<br>• අන් අයගේ උදවු ලබා ගැනීමේ දී ආචාරශීලී විය යුතු බව<br>• අන් අයට උපකාරී වන නිර්මාණ<br>• සහයෝගයෙන් සිදුකරන සාමූහික ක්‍රීඩා<br>• අපගේ උදවු අවශ්‍ය විවිධ පුද්ගල චරිත පිළිබඳ නිර්මාණාත්මක රංගන |

## 1. තේමාව : අපයි පාසලයි

**නිපුණතා** :

- පාසලේ තිබෙන සුවිශේෂ හා වැදගත් ස්ථාන හඳුනාගෙන එම සුවිශේෂ හා වැදගත් ස්ථානවල විවිධත්වයන්ට අනුකූල ව කටයුතු කරයි.
- පාසලේ කටයුතුවලට දායක වෙමින් පාසල් සංස්කෘතිය යහපත් ව පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.
- පාසලේ සිටින විවිධ පුද්ගල භූමිකා හඳුනා ගනිමින් ඔවුන් කෙරෙහි සංවේදීව කටයුතු කරයි.
- පන්ති කාමරය අලංකාරව පවත්වාගෙන යාම සඳහා විවිධ මාධ්‍ය භාවිත කරමින් නිර්මාණවල යෙදෙයි.
- උපකරණ භාවිත කරමින් චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- පාසලේ අගය ඉස්මතු කර දැක්වීම සඳහා වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරයි.

**ඉගෙනුම් පල** :

- පාසලේ තිබෙන සුවිශේෂ මෙන් ම වැදගත් ස්ථාන නිරීක්ෂණය කර වාර්තා කරයි.
- පාසල් භූමියේ වෙනස්කම් පිළිබඳ සැලකිලිමත්ව ආරක්ෂාකාරීව හැසිරෙයි.
- පන්ති කාමරය අලංකාරව, පිරිසිදුව හා ක්‍රමවත්ව පවත්වාගෙන යාමට දායක වෙයි.
- පන්තියේ පිළිගත් චාරිත්‍ර වාරිත්‍රවලට අනුගතව කටයුතු කරයි.
- පාසලේ ක්‍රියාත්මක වන නීතිරීතිවලට අනුව කටයුතු කරයි.
- පාසල් ගීතයට ගරු කරමින් එය නිවැරදිව ගායනා කරයි.
- පාසල් කොඩියට ගරුත්වයෙන් යුතුව ක්‍රියා කරයි.
- පාසල තුළ සිටින විවිධ පුද්ගලයින් හා ඔවුන්ගේ භූමිකා විස්තර කරයි.
- පන්ති කාමරයේ අලංකාරය සඳහා සුදුසු නිර්මාණ කරයි.
- සෙල්ලම් මිදුල භාවිත කරමින්, චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- පාසල පිළිබඳ, පාසලේ විවිධ භූමිකා පිළිබඳ කියවෙන කවි, ගීත ගායනා කරමින් රංගන ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- දරුවා හඳුනා ගැනීමේ වැඩසටහනට සහභාගී වීමෙන් පසු පාසල පිළිබඳ සිසුන්ට හැඟුණු දේ, පාසලේ දී දුටු දේ, පාසලේ දී කරන ලද සෙල්ලම් . . . වැනි දේ පිළිබඳ සිසුන් සමඟ සුහද කතාබහක යෙදෙන්න.
- පාසල පිළිබඳ සිසු අත්දැකීම් තවදුරටත් වර්ධනය සඳහාත් , පාසලේ තිබෙන සිසුන්ට සමීප වැදගත් මෙන් ම සුවිශේෂ ස්ථාන හඳුනා ගැනීම සඳහාත් සිසුන් සමඟ පාසලේ නිරීක්ෂණ චාරිකාවල නියැළෙන්න.
- එහිදී පහත සඳහන් ස්ථාන නිරීක්ෂණය කරන්න.

*උදා* : * විදුහල්පති කාර්යාලය/ප්‍රාථමික අංශ ප්‍රධාන කාර්යාලය

| | |
|---|---|
| * ගුරු විවේකාගාරය | * ආපන ශාලාව |
| * ජල පහසුකම් සපයන ස්ථානය | * සෙල්ලම්පිටිය/සෙල්ලම් මිදුල, |
| * වැසිකිළි/කැසිකිළි ස්ථාන | * ගෘහ විද්‍යාගාරය |
| * වෙනත් වැදගත්/සුවිශේෂ ස්ථාන | * ආගමික කටයුතු සිදුකරන ස්ථානය |

ඉහත සඳහන් එක් එක් ස්ථානවල

- වැදගත්කම
- එම ස්ථානවල දී කටයුතු කළ යුතු අයුරු
- එම ස්ථාන ආරක්ෂා කරගැනීම හා රැකගැනීමට අපට කළ හැකි දේ
- පාසල භූමියේ අනාරක්ෂිත ස්ථාන ඇතොත් එම ස්ථානවල දී හැසිරිය යුතු ආකාර . . .

වැනි කරුණු සිසුන් සමඟ කතා කරන්න.

- පසුව මෙම නිරීක්ෂණ තුළින් ලද අත්දැකීම් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡාවක යෙදෙන්න.
- තමන් නිරීක්ෂණය කළ එක් ස්ථානයක් තෝරාගෙන එය චිත්‍රයට නැගීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසු නිර්මාණ පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. ඒවා අගය කරන්න.

**ක්‍රියාකාරකම** 2 :

- පාසල් භූමියේ වෙනස්කම් නිරීක්ෂණය සඳහා සිසුන් සමඟ චාරිකාවක යෙදෙන්න.
- එම නිරීක්ෂණ චාරිකාවේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
  - * පාසලේ එක් එක් ස්ථානවලට යා හැකි මාර්ග
  - * එම මාර්ගවල ඇති අනාරක්ෂිත ස්ථාන හා එසේ අනාරක්ෂිත වීමට හේතු (සතුන්ගෙන් විය හැකි අනතුරු, භූමියේ පිහිටි ස්වභාවය, මෙවැනි ස්ථාන නිසා විය හැකි අනතුරු)
  - * පාසල් භූමියේ පිහිටීමේ වෙනස්කම් (කාණු, දිය පිරි වලවල්, බෑවුම් සහිත ස්ථාන, අඳුරු ස්ථාන, . . . . වැනි)
  - * සිසුන්ට සෙල්ලම් කළ හැකි ස්ථාන
- මෙවැනි එක් එක් ස්ථානවල ස්වභාවය අනුව කටයුතු කළ යුතු ආකාරය සිසුන් සමඟ කතාබහ කරන්න.
- පාසල් භූමියේ තමා සිත්ගත් ස්ථානයක් චිත්‍රයට නැගීමට සිසුන් යොමු කරන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. අගය කරන්න.

**ක්‍රියාකාරකම** 3 :

- පන්ති කාමරයේ හා පාසලේ පවතින නීතිරීති, චාරිත්‍ර වාරිත්‍ර පිළිබඳ සිසුන් දැනුවත් කරන්න. ඒ පිළිබඳ ඔවුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා* :
  - උදෑසන රැස්වීමේ දී කටයුතු කළ යුතු අයුරු
  - ආගමික වතාවත් සිදු කිරීමේ දී කටයුතු කළ යුතු අයුරු
  - සීනුව නාද කිරීමට අනුව කටයුතු කළ යුතු අයුරු
  - ගුරුවරුන් ඉදිරියේ හැසිරිය යුතු අයුරු
  - ආහාර ගැනීමේ දී පිළිපැදිය යුතු චාරිත්‍ර වාරිත්‍ර
  - පන්තියේ/පන්ති කාමරය අවට පිරිසිදු බව පවත්වා ගත යුතු අයුරු
- ඉහත කටයුතුවල වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- මෙම සිරිත්විරිත් හා නීතිරීති අඛණ්ඩව පවත්වාගෙන යාමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම** 4 :

- පන්ති කාමරය අක්‍රමවත් හා අපිරිසිදුව තිබිය දී ඇති විය හැකි අයහපත් තත්ත්වයන් පිළිබඳ ව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා* :
  - රෝග බෝ වීමේ අවදානම
  - ප්‍රියජනක ඉගෙනුම් පරිසරයක් ඇති නොවීම
  - පන්ති කාමරය කෙරෙහි අයහපත් ආකල්ප ගොඩනැගීම

- අනතුරු ව තම පන්ති කාමරය ක්‍රමවත් ව, පිරිසිදු ව හා අලංකාරව පවත්වා ගැනීමට කළ හැකි දෑ පිළිබඳ සාකච්ඡා කරමින් ඒ සඳහා සිදු කළ හැකි වෙනස්කම් පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා* : • ගුරු මේසයට රෙදි දැමීමට
  - මල් බඳුන්, කොඩිවැල්, බිත්ති සැරසිලි, ආදර්ශන වැනි දේ නිර්මාණය කිරීම
  - අනවශ්‍ය දේ බැහැර කිරීමට (කසළ) කළ යුතු දේ
- ඉහත කරුණුවලින් අවධාරණය කරනු ලබන දෑ පුරුද්දක් වශයෙන් පවත්වා ගැනීමට සිසුන් යොමු කරන්න.
- පන්ති අලංකරණය හා පිරිසිදු බව පවත්වා ගැනීම සඳහා විවිධ මාධ්‍ය යොදා ගනිමින් සිදු කළ හැකි නිර්මාණාත්මක ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.

  *උදා* : පහසුවෙන් සරලව කළ හැකි බිත්ති සැරසිල්ලක්
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- පාසල් කොඩිය පන්තියට ගෙන්වා ගන්න.
- එය හොඳින් නිරීක්ෂණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න *උදා* : හැඩය, වර්ණය, සලකුණු ආදිය
- සෑම පාසලකටම අනන්‍ය වූ පාසල් කොඩියක් ඇති බවත්, එයට ගරු කළ යුතු බවත් සිසුන්ට පෙන්වා දෙන්න.
- පාසල් කොඩිය ඔසවන අවස්ථා හා එවැනි අවස්ථාවල දී කටයුතු කළ යුතු ආකාරය සිසුන්ට අවධාරණය කරන්න.
- පාසල් ගීතය සිසුන්ට ඇසීමට සලස්වන්න. (මෙහිදී කැසට් පටයක් භාවිත කිරීම සුදුසු ය.)
- පාසල් ගීතයට ගරු කළ යුතු ආකාරය හා එය නිවැරදි ව ගායනා කරන ආකාරය සිසුන්ට පැහැදිලි කරන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවා ගෙන යන්න. එම ස්ථානයේ පාසල් කොඩිය ඔසවා පාසල් ගීතය නිවැරදි ඉරියව්වෙන් සිට ගායනා කරමින් එයට ගෞරව කරන ආකාරය ප්‍රදර්ශනය කරන්න.
- මේ ආකාරයට පාසල් ගීතය ගායනා කිරීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- පාසලේ සිටින විවිධ කාර්යයන්/වගකීම් ඉටුකරන අය කවුරුන් දැයි හඳුනා ගන්න.

  *උදා* : * විදුහල්පති
  * නියෝජ්‍ය විදුහල්පති
  * අංශ භාර ගුරුවරුන්
  * ගුරුවරුන්
  * ශිෂ්‍ය නායකයන්
  * කාර්යාල ආධාරක/සහායකයින් . . . වැනි
- ඔබ පාසලට අදාළ ව ඉහත පුද්ගලයින් කිහිප දෙනෙකු ඉටු කරන කාර්යයන් හඳුනා ගැනීම සඳහා පන්තියේ සිසුන් සමඟ ඔවුන් සජීවී ව මුණගැසීමට කටයුතු කරන්න.
- එහිදී ඔවුන් එදිනෙදා කරන කටයුතු හා ඔවුන්ගේ වගකීම් හා ඒවායින් පාසලට වන සේවය පිළිබඳ සාකච්ඡා කරන්න.
- මේ සියලු අය පාසල වෙනුවෙන් විවිධ සේවා සපයන අය බවත්, ඔවුන්ගෙන් වන සේවය අගය කරමින් ගරුත්වයකින් යුතුව කටයුතු කළ යුතු බවත් සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- සෙල්ලම් මිදුල භාවිත කරමින් සිසුන්ගේ ස්නායු පේශි සමායෝජනය වන චාලක ක්‍රියාකාරකම්වල නිරත වීමට අවස්ථාව සලසන්න.
- මේ සඳහා සිසුන් සෙල්ලම් මිදුලට රැගෙන යන්න.
- එහි ඇති ඔංචිල්ලාව, නැගුම් රාමුව, සීසෝව, සමබර දණ්ඩ, . . . වැනි උපකරණ හා ඒවායේ ක්‍රියාකාරීත්වය පැහැදිලි කර දෙන්න.
- සෙල්ලම් මිදුල භාවිත කිරීමේ දී ඇති විය හැකි අනතුරු පිළිබඳ සාකච්ඡා කර ඒවායින් ආරක්ෂා වන අයුරු පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- කණ්ඩායම් කිහිපයකට සිසුන් වෙන්කර, සෙල්ලම් මිදුලේ ඇති සෑම උපකරණයකම ක්‍රියාකාරකම් කිරීම සඳහා අදාළ ස්ථානවලට යොමු කරන්න.
- කණ්ඩායම් මාරු කරමින් සෑම උපකරණයකම අත්දැකීම් ලබාදීම සඳහා සිසුන්ට අවස්ථාව දෙන්න.

**ක්‍රියාකාරකම 8 :**

- පාසල පිළිබඳ සහ පාසලේ විවිධ භූමිකා පිළිබඳ කියවෙන කවි, ගී රැස්කරගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- සිසුන් රැස්කරගෙන එන ගීත/කවි අතුරින් තෝරාගත් සුදුසු කවි/ගී කිහිපයකට උචිත චලන උපයෝගී කර ගනිමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අවශ්‍යතාව අනුව සංගීත භාණ්ඩ/ආදේශ භාණ්ඩ භාවිත කරන්න.

**ක්‍රියාකාරකම 9**

- පාසල් භූමියේ ඉඩකඩ සහිත ස්ථානයකට සිසුන් රැගෙන යන්න.
- සීමාවක් තුළ සිසුන්ට නිදහසේ සිටීමට සලස්වන්න.
- පහත සඳහන් නිදහස් ක්‍රියාකාරකමේ සිසුන් යොදවන්න.
- ඒ සඳහා තරමක විශාල රබර් බෝල කිහිපයක් ක්‍රීඩාව සඳහා යොදාගන්න.
- අතින්, පයින් සිසුන් අතර බෝලය යවමින් නිදහසේ ක්‍රීඩා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයට ප්‍රමාණවත් කාලයක් ක්‍රියාකාරකමෙහි නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## 2. තේමාව : අපේ ගෙදර

**නිපුණතා** :
- නිවසේ හා නිවසට සම්බන්ධ පුද්ගලයින් හා සතුන් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතු ව කටයුතු කරයි.
- තම යුතුකම් හා වගකීම් ඉටු කරමින් නිවස යහපත් ලෙස පවත්වා ගෙන යෑමට දායක වෙයි.
- එදිනෙදා නිවසේ ප්‍රයෝජනයට ගත හැකි දෑ නිපදවා ගැනීමට දායක වෙයි.
- නිවසේ අලංකරණය සහ පවිත්‍රතාව පවත්වා ගැනීම සඳහා යොදා ගත හැකි නිර්මාණ සිදු කරමින් වින්දනයක් ලබයි.
- නිවෙස් පරිසරය ඇසුරු කර ගත් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙමින් වින්දනයක් ලබයි.
- නිවෙස් පරිසරය ආශ්‍රිතව ලබන අත්දැකීම් වින්දනාත්මකව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් පල** :
- නිවසේ සිටින සාමාජිකයන් සමඟ සුහදව කටයුතු කරමින් අන්‍යෝන්‍ය බැඳීම් වර්ධනය කර ගනියි.
- නිවසට පැමිණෙන අය කෙරෙහි යහපත් ආකල්පයකින් යුතුව කටයුතු කරයි.
- නිවසේ හා නිවස ආශ්‍රිතව ඇති කරන සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- නිවසේ දියුණුවට හැකි පමණින් උදවු කරයි.
- නිවෙස් පරිසරය පිරිසිදුව හා ක්‍රමවත් ව පවත්වාගෙන යාමට දායක වෙයි.
- නිවසේ අලංකරණය සඳහා යොදාගත හැකි සරල නිර්මාණ කරයි.
- නිවසේ පරිසරය හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- නිවසේ හා නිවෙස් පරිසරය සම්බන්ධ කවි සහ ගී රංගන සහිතව ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- දරුවා හඳුනා ගැනීමේ වැඩසටහන සඳහා උපයෝගී කරගත් සෙල්ලම් ගෙවල් මෙම තේමාවේ ක්‍රියාකාරකම් සඳහා යොදා ගන්න.
- පන්තියේ සිසුන් 'අපේ ගෙදර' සාමාජිකයන් ලෙස සැරසී, එම සාමාජිකයන්ගේ කටයුතු අනුකරණය කරමින් සෙල්ලම් ගෙවල්වල නිදහසේ සෙල්ලම් කිරීමට අවස්ථාව දෙන්න.
- අනතුරුව සිසුන් සමඟ තම තමන්ගේ නිවසේ තොරතුරු පිළිබඳ ව නිදහසේ කතා කිරීමට ඉඩ දෙන්න.

  *උදා :* * සිටින සාමාජිකයින්
  
  * ඔවුන් නිවසේ දී සිදුකරන කටයුතු, . . . වැනි
- මෙම කතාබහේ දී නිවස ප්‍රීතිදායක බවට පත්වීමට වැදගත් වන කරුණු පිළිබඳ ව කතාබහ කරන්න.

  *උදා :* * දෙමාපියන් හා අනෙකුත් වැඩිහිටියන් සමඟ ආදරයෙන් කථාබහ කිරීම, ගෞරව කිරීම, ඔවුන්ට සැලකීම
- ඒ අනුව අප නිවස ද ප්‍රීතිදායක නිවසක් බවට පත්වීම සඳහා මේ අයුරින් කටයුතු කළයුතු බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- පවුලේ සාමාජිකයින් පිළිබඳ සංවේදී බව මතු කරන කවි, ගීත ආදිය ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* * අම්මා මගේ හරි හොඳයි
  බත් උයලා - හොඳි උයලා කන්න බොන්න දෙයි
  තාත්තා මගේ හරි හොඳයි
  වත්ත පිටියෙ වැඩ කරයි

- තෝරාගන්නා කවි, ගීතවල අන්තර්ගත යහපත් ආකල්ප සහ ගුණාංග මතුකර දක්වමින් සිසුන් සමඟ කතාබහ කරන්න.
- පවුලේ සමාජිකයන් චිත්‍රයට නැඟීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- නිවසේ මුළුතැන්ගෙයි ප්‍රයෝජනයට ගන්නා භාණ්ඩ උපයෝගී කර ගනිමින් ජන නැටුම් ඉදිරිපත් කිරීමට ද සිසුන් යොමු කරන්න.

  *උදා :* කුළු නැටුම්
  කළගෙඩි නැටුම්

- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක්කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- ක්‍රීඩාපිටිය හෝ ඉඩකඩ සහිත ස්ථානයකට සිසුන් කැඳවාගෙන ගොස් රවුමක් ආකාරයට සිටගැනීමට සලස්වන්න.
- පසුව එක් එක් සිසුවා රවුම මැදට ගෙන්වා නිවසේ දී වැඩිහිටියන් විසින් සිදුකරනු ලබන තමා කැමති එක් කාර්යයක් නිරූපණය කිරීමට අවස්ථාව ලබා දෙන්න.

  *උදා :* * මිදුල අතුගෑම
  * පොල්ගෑම . . . වැනි

- එම සිසුවා විසින් ඉදිරිපත් කරන නිරූපණය කුමක් දැයි අනුමාන කර ප්‍රකාශ කරන ලෙස රවුමේ සිටින අනෙක් සිසුන්ට පවසන්න.
- පසුව රවුමේ සිටින අනෙක් සිසුන්ට තම නිවසේ දී එකී කාර්යයේ ඔවුන් යෙදී ඇත්නම් එම කාර්යය සිදුකරන අයුරු රවුමේ තමා සිටින ස්ථානයේ සිටම නිරූපණයට අවස්ථාව ලබා දෙන්න.
- මේ අයුරින් රවුමේ මැදට සෑම සිසුවෙකුම කැඳවා එවැනි නිරූපණ ඉදිරිපත් කිරීම සඳහා යොමු කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- නිවසේ කටයුතුවලට උදවු කරන සිසුන් ගැන විමසන්න. එවැනි අත්දැකීම් ඇති සිසුන්ට ඒ පිළිබඳ ව කතා කිරීමට අවස්ථාව දෙන්න.
- නිවසේ වැඩවලට සිසුන්ට හවුල් විය හැකි කටයුතු මොනවාදැයි විමසන්න.
  - * නිවසේ දී පාවිච්චි කරන බඩුබාහිරාදිය නිසි තැන තැබීම
  - * නිවැරදිව කසළ බැහැර කිරීම
  - * මල් පැළවලට/මල් පාත්තිවලට වතුර දැමීම
  - * තම පිඟාන හා කෝප්පය සෝදා පිරිසිදු කර නිසි තැන තැබීම
  - * තමන් පාවිච්චි කරන ඇඳුම්පැළඳුම්, පොත්පත් ආදිය නිසි තැන පිළිවෙළට තැබීම
  - * නිවස අතුගා පිරිසිදුව තැබීම . . . වැනි
- නිවසේ වැඩවල යෙදීමට දෙමාපියන්/වැඩිහිටියන් බොහෝ මහන්සිවන නිසා ඔවුන් වෙනුවෙන් අප ද එම වැඩවලට හැකි පමණින් උදවු කළ යුතු ය යන හැඟීම ඇතිවන ආකාරයෙන් සාකච්ඡාවක් මෙහෙයවන්න.

**ක්‍රියාකාරකම 5 :**

- නිවසට පැමිණෙන නෑදෑ හිතවතුන් පිළිබඳ ව පහත සඳහන් කරුණු ඔස්සේ කතාබහ කරන්න.
  - * ගෙදරට පැමිණෙන නෑදෑයින් හිතවතුන් කවුරුන් ද යන්න
  - * ඔවුන්ව ආමන්ත්‍රණය කරන අයුරු
  - * ඔවුන් අප නිවෙස්වලට පැමිණ උදවු උපකාර කළ අවස්ථා . . . වැනි කරුණු මතුකර දක්වමින් කතාබහ කරන්න.
- මෙම නෑදෑයින්/අමුත්තන්/හිතවතුන් හොඳින් පිළිගෙන කථාබහ කරමින් හැකි පමණින් සත්කාර කළ යුතු බව පෙන්වා දෙන්න.
- එසේම නිවසට පැමිණෙන සමහර අයගෙන් ඇතිවිය හැකි අනාරක්ෂිත අවස්ථා හා එවැනි අවස්ථාවල දී කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න.
- නිවසට පැමිණෙන හිතවතුන්, නෑදෑයින් කෙරෙහි යහපත් ආකල්පයකින් යුතුව කටයුතු කළ යුතු ආකාර පිළිබඳ භූමිකා රංගනවල යෙදීමට ද සිසුන් යොමු කරන්න.
- සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- තම නිවසේ හා නිවස ආශ්‍රිත ව සිටින සතුන්ගේ රූප රැස්කර ගෙන එන ලෙස සිසුන්ට පවසන්න.
- එම රූප ඇසුරෙන් සතුන් පිළිබඳ පහත සඳහන් කරුණු මතු කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක නිරත වන්න.

  *උදා :* * නිවසේ ඇති කරන සතුන් හා නිවස ආශ්‍රිතව ගැවසෙන සතුන්
  * එම සතුන් හඳුන්වන සුරතල් නම්
  * සතුන් තුළ ඇති යහපත් ගුණාංග
- මෙම සතුන් ඉතා දීර්ඝ කාලයක සිට මිනිසාගේ සමීප මිතුරන් ලෙස සිටින බවත්, එම සතුන්ට සැලකීම මිනිසුන්ගේ යුතුකමක් බවත් මෙහි දී තවදුරටත් පැහැදිලි කරන්න.
- සතුන්ට උදවු උපකාර කළ අවස්ථා ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සතුන්ට ආදරය, කරුණාව දැක්වූ අවස්ථා ඇතුළත් කතන්දර සිසුන්ට ඉදිරිපත් කරන්න. එම කතන්දර ඔස්සේ සතුන් කෙරෙහි සංවේදී වීමේ වැදගත්කම හා එය අපගේ යුතුකමක් හා වගකීමක් බවත්, සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 7**

- නිවසක හැඩය සහිත රූප සටහනක් අඳින ලද පත්‍රිකාවක් සිසුන්ට සපයන්න.
- වර්ණවත් කඩදාසි කැබලි යොදා ගනිමින් කොලාජ් නිර්මාණයක යෙදීමට සිසුන්ට මග පෙන්වන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. අගය කරන්න.

**ක්‍රියාකාරකම 8 :**

- නිවස ආශ්‍රිතව සිදු කළ හැකි ක්‍රීඩා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. එම ක්‍රීඩාවල සිසුන් කණ්ඩායම් වශයෙන් යොදවන්න.

  *උදා :* * අඹ ඇට පැනීම
  * බෝල ගැසීම
  * ඔට්ටු සෙල්ලම් , . . . වැනි

## 3. තේමාව : වත්තට එන සත්තු

**නිපුණතා** :
- අවට පරිසරයේ වෙසෙන සතුන් අතර පවත්නා විවිධත්වය අධ්‍යයනය කර වාර්තා කරයි.
- සතුන් ද පරිසරයේ ම කොටසක් සේ සලකා සතුන් පිළිබඳ සංවේදී ව කටයුතු කරයි.
- අප අවට පරිසරයේ වෙසෙන සතුන්ගේ චර්යා පිළිබඳ අනුකරණයෙන් යුතුව නිර්මාණාත්මක චාලක ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- සතුන්ගේ විවිධ ලක්ෂණ හා හැසිරීම් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් සත්ව වාසස්ථානවල ආකෘති නිර්මාණ කරයි.

**ඉගෙනුම් පල** :
- තම පරිසරයේ දැකිය හැකි සතුන් පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
- සතුන්ගේ විවිධ ලක්ෂණ නිරීක්ෂණය කර ඉදිරිපත් කරයි.
- සතුන්ගේ වාසස්ථාන නිරීක්ෂණය කර වාර්තා කරයි.
- සතුන් කෙරෙහි සංවේදී බවෙන් යුතු හැසිරීම් ප්‍රදර්ශනය කරයි.
- අනුකරණාත්මක චාලක ක්‍රියාකාරකම් යොදා ගනිමින් සතුන්ගේ විවිධ ගමන් විලාස ඉදිරිපත් කරයි.
- සතුන්ගේ චර්යා අනුකරණය කරමින් රංගන ඉදිරිපත් කරයි.
- සතුන් පිළිබඳ කවි/ගීත ගායනා කරයි.
- විවිධ මාධ්‍ය යොදා ගනිමින් චිත්‍ර හා සත්ව ආකෘති නිර්මාණය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පාසල් වත්තේ හෝ සුදුසු ස්ථානයක සතුන් නිරීක්ෂණය සඳහා සිසුන් සමඟ චාරිකාවක නිරත වන්න.
- ආරක්ෂාකාරීව, සතුන් නිරීක්ෂණය සඳහා සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.
- නිරීක්ෂණයේ දී පහත සඳහන් කරුණු පිළිබඳව සිසු අවධානය යොමු කරන්න.

  *උදා :* * සතුන් හඳුන්වන නම්
  * සතුන්ගේ පාට
  * ගමන් කරන ආකාර
  * නිකුත් කරන හඬ
  * ආහාර ගන්නා ආකාරය
  * සතුන් ගැවසෙන ස්ථාන
- නිරීක්ෂණයේ දී සතුන් කිහිප දෙනෙකුගේ සුවිශේෂ ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරන්න.

  *උදා :* * පියාපත් තිබෙනවා ද? පාද තිබෙනවා ද ? පාද කීයක් තිබේ ද ?
  * හඬ නගන ආකාර සමාන ද/වෙනස් ද ?
  * හොටයේ/මුඛයේ හැඩය කුමන ආකාර ද ?
  * සැම කුරුල්ලෙක්ම එක විදියට පියාසර කරනවා ද ?
  * වලිගයේ ස්වභාවය කෙබඳු ද ?
  * සතුන් ගැවසෙන්නේ තනිව ද? රංචු වශයෙන් ද ?
- නිරීක්ෂණ චාරිකාවේ දී තමන් දුටු දේ විවිධ ආකාරවලින් පන්තියට ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. (අනුකරණය මගින්/වාචිකව හෝ වෙනත් සුදුසු ක්‍රමයකට)

- තමන් කැමති සතෙකුගේ චිත්‍රයක් ඇඳ පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.
- සතුන් පිළිබඳ කියැවෙන සරල කවි, ගීත සිසුන් සමඟ ගායනා කරන්න. ගායනයට අනුව අංග චලන දැක්වීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සත්ව වාසස්ථාන පිළිබඳ සිසුන් සමඟ කතාබහක නිරත වන්න.
- සාකච්ඡාවේ දී විවිධ සතුන්ගේ වාසස්ථාන දැක්වෙන පින්තූර, වීඩියෝ දර්ශන හා සිසුන් නිවසේ, ගෙවත්තේ, වටපිටාවේ දැක ඇති වාසස්ථාන පිළිබඳ අත්දැකීම් ද සාකච්ඡාවේදී ප්‍රයෝජනයට ගන්න.

  *උදා :* වඩු කුරුල්ලා, රන් කුඹලා, මී මැස්සා, ලේනා, වේයා, කපුටා, කුඹින්, දිමියන් ආදී සතුන්ගේ වාසස්ථාන
- මෙහිදී සිසු අත්දැකීම් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- හැකි නම් වැඩිහිටියන්ගේ උදවු ඇතිව අතහැර දමනු ලැබූ කුරුලු කූඩුවක්, මී වදයක් හෝ ලේන් කූඩුවක් සිසු ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත් වෙමින් පරීක්ෂා කිරීමට අවස්ථාව දෙන්න.
- එහිදී පහත කරුණු අවධානයට යොමු කරන්න.
  * ඒවා සෑදීමට යොදාගෙන ඇති ද්‍රව්‍ය මොනවා ද ?
  * ඒවායේ හැඩය, ප්‍රමාණය
- නිරීක්ෂණය කරන ලද තොරතුරු ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න.
- සිසු කණ්ඩායම් සංඛ්‍යාවට අනුව අත්කාච, පීරිසි/තැටි හා සීනි සපයා ගන්න.
- තැටිවලට සීනි ස්වල්පය බැගින් දමා කුහුඹුවන් පැමිණේ යයි අනුමාන කළ හැකි ස්ථානවල එම තැටි තබන්න.
- සීනි සහිත තැටිවලට කුහුඹුවන් පැමිණෙන විට පහත කරුණු ඔස්සේ එම සතුන් නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න. පළමුව පියවි ඇසින් ද, දෙවනුව අත්කාච භාවිත කරමින් ද සතුන් නිරීක්ෂණයට සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
  * කුහුඹුවන් පැමිණෙන ආකාරය
  * සීනි සහිත තැටි තුළ ඔවුන් හැසිරෙන ආකාරය
  * සීනි කැට රැගෙන යන ආකාරය
  * කුහුඹුවන් දෙදෙනෙක් මුණගැහුණු විට හැසිරෙන ආකාරය
- මෙම නිරීක්ෂණය තුළින් පියවි ඇසින් බැලීමට වඩා අත්කාචයෙන් බැලීමේ දී වැඩි තොරතුරු ප්‍රමාණයක් ලබාගත හැකි බව සිසුන්ට අත්විඳීමට සලස්වන්න.
- නිරීක්ෂණය කරන ලද තොරතුරු අනුකරණයෙන් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සතුන්ගේ විවිධ චර්යා පිළිබඳ කියැවෙන කවි/ගීත සිසුන් සමඟ ගායනා කරන්න.

  *උදා :* පායනා කාලේ දී - රෑ දවල් මහන්සි වී

  කන්න දේ රැස් කරයි - කුඹියෝ

**ක්‍රියාකාරකම 4 :**

- සතුන්ට උපකාර කිරීම සඳහා අපට ලැබෙන අවස්ථා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * ආහාර හෝ ජලය නොමැතිව සිටින අවස්ථා
  * අනතුරකට ලක් වී ඇති අවස්ථා
  * සතෙකු සිරවී නිදහස් විය නොහැකි ව සිටින අවස්ථා
  * තුවාල හෝ ශාරීරික අපහසුතාවලින් පෙළෙන අවස්ථා
- මෙවැනි අවස්ථාවල දී සතුන්ට උපකාර කිරීම සඳහා ඉදිරිපත් වන්නේ නම් තම ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වීම හා වැඩිහිටියන්ගේ උදවු ලබා ගැනීම අවශ්‍ය බව සිසුන්ට අවධාරණය කරන්න.
- සතුන්ට උපකාර කිරීම හා ඔවුන් රැකබලා ගැනීම අප විසින් කළ යුතු දෙයක් බව ද සිසුන්ට පහදන්න.
- ඉහත අයුරින් සතුන්ට උදවු කළ අවස්ථා පිළිබඳ සිසු අත්දැකීම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- සතුන් ද අප පරිසරයේම ජීවත් වන කොටසක් බැවින් ඔවුන්ට හිරිහැර කිරීම නොකළ යුතු බව පෙන්වා දෙන්න.


**ක්‍රියාකාරකම 5 :**

- සතුන්ට ආදරය, කරුණාව දක්වන අවස්ථා ඇතුළත් ජනකතා/ජාතක කතා සොයා ගෙනවිත් එය කැමති ආකාරයකින් ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- සිසුන් සොයාගෙන එන කතා ඇසුරෙන් තෝරාගත් කතාවක කණ්ඩායම් වශයෙන් එක් වී එහි විවිධ අවස්ථා නිරූපණය වන අයුරින් ඉදිරිපත් කිරීම් සිදු කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.
- සතුන් පිළිබඳ සංවේදිතාව මතුවන ආකාරයේ කවි/ගීත සිසුන් සමඟ ගායනා කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- සත්ව චලන අනුකරණය කිරීම සඳහා පහත සඳහන් ක්‍රීඩාවට සිසුන් යොමු කරන්න.
- ඒ සඳහා එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවා ගෙන යන්න.
- පහත රූප සටහනේ දැක්වෙන ආකාරයට රේඛා ඇඳ සීමා ලකුණු කරගන්න.

*උදා :*




- එක් එක් රේඛාව ඉදිරියේ සතුන්ගේ නම් සඳහන් නාම පුවරු තබන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කර රූප සටහනේ දැක්වෙන ආකාරයට ස්ථානගත කරන්න.
- රේඛා අතර සිසුන් ගමන් කළ යුත්තේ නාම පුවරුවේ සඳහන් සතා අනුකරණය කරමිනි.
- පළමු සංඥාව ලබා දුන්විට ගමන් ආරම්භ කර ඊළඟ රේඛාව මතට පැමිණිය යුතු වේ.


  *උදා :* හාවුන් පනිමින් අලියන්ගේ රේඛාව මතට පැමිණීම

  ගිරවුන් ඉගිලෙමින් වටයෙන් ගොස් හාවුන්ගේ රේඛාව මතට පැමිණීම

- දෙවන සංඥාව ලබා දුන් විට රේඛාවට අදාළ නාම පුවරුවේ ඇති සතාව අනුකරණය කරමින් ඊළඟ රේඛාවට පැමිණිය යුතු වේ.
- මේ ආකාරයට සෑම සිසුවෙකුටම ඉහත අවස්ථා අනුකරණයට අවස්ථාව ලැබෙන පරිදි වට කිහිපයක් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 7**

- ඉරටු හෝ වෙනත් ආධාරකවල සත්ව පින්තූර අලවා රූකඩ සකස් කරගන්න.




- සත්ව රූකඩ යොදා ගනිමින් දෙබස් කියමින් වින්දනාත්මක රංගන ඉදිරිපත් කිරීමට සිසුන් කණ්ඩායම් ලෙස යොමු කරන්න.
- අහසේ පියාසර කරන සතුන් කිහිප දෙනෙකුගේ ආකෘති තැනීමට යොමු කරවන්න. මේ සඳහා ශාක පත්‍ර, කඩදාසි ආදිය යොදා ගන්න.
- එම ආකෘති තරමක් දිග ආධාරකවල රඳවා ගෙන ගමන් කිරීමට සලස්වන්න. සිසුන් නොපෙනී රිටිවල ගැසූ ආකෘති පමණක් පෙනෙන පරිදි කොට බිත්තියකට හෝ වෙනත් එවැනි යමකට ආවරණය වී ගමන් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහි දී සතුන් නිකුත් කරන ශබ්ද අනුකරණයට ද අවස්ථාව සලස්වන්න.

**ක්‍රියාකාරකම 8**

- සිසුන්ට සපයාගත හැකි ද්‍රව්‍ය කිහිපයක් යෝජනා කර ඒවා යොදා ගනිමින් කැමති සතෙකු නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.
- සිසු නිර්මාණ අගයන්න.
- ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න.

# 4. තේමාව : ජලය සමඟ සෙල්ලම්

**නිපුණතා** :
- ජලය වටිනා සම්පතක් ලෙස සලකා ඵලදායී ලෙස භාවිත කරයි.
- ජලයේ ස්වභාවය හා ද්‍රව්‍ය ජලය සමඟ හැසිරෙන ආකාරය පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- ජලය විවිධ අයුරින් භාවිත කරමින් නිර්මාණකරණයේ යෙදෙයි.
- ජලය උපයෝගී කර ගනිමින් නිර්මාණාත්මක ක්‍රීඩාවල නියැළෙයි.
- ජලය තේමා කොට ගත් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**ඉගෙනුම් පල** :
- එදිනෙදා කටයුතුවල දී ජලයෙන් ලබා ගන්නා ප්‍රයෝජන ප්‍රකාශ කරයි.
- ජලය නොමැති වීම නිසා ඇතිවිය හැකි දුෂ්කරතා පැහැදිලි කරයි.
- ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කරයි.
- යොදාගන්නා භාජනය අනුව ජලයේ හැඩය වෙනස් කළ හැකි දැයි සොයා බලයි.
- ජලය විවිධ ස්වරූපයන්ට වෙනස්වන ආකාරය පරීක්‍ෂා කර වර්තා කරයි.
- විවිධ ද්‍රව්‍ය ජලයට දැමූ විට ජලයේ වර්ණය වෙනස්වන ආකාරය පරීක්‍ෂා කරයි.
- විවිධ ද්‍රව්‍ය ජලයට දැමූ විට පාවෙන, ගිලෙන දෑ වෙන්කොට දක්වයි.
- වර්ණ දියර යොදා ගනිමින් විවිධ නිර්මාණ කරයි.
- ජලය යොදා ගනිමින් නිර්මාණාත්මක ක්‍රීඩාවල යෙදෙයි.
- ජලය උපයෝගී කරගෙන විවිධ නාද නිපදවන ආකාර අත්හදා බලයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**


- ජලයෙන් ලැබෙන ප්‍රයෝජන පෙන්නුම් කරන පින්තූර කිහිපයක් සකස් කරගන්න.
- එම පින්තූර ඇසුරෙන් අප එදිනෙදා සිදු කරන බොහෝ කාර්යයන් සඳහා ජලය ප්‍රයෝජනවත් වන ආකාරය පිළිබඳ සාකච්ඡා කරන්න.
- ජලයෙන් මිනිසා ලබන ප්‍රයෝජන ඇතුළත් වන සේ චිත්‍ර නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න. තමා අඳින ලද චිත්‍රය ගැන තම කණ්ඩායමට විස්තර කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- ජලය නොමැති වීමෙන් හා ජලය හිඟ වීමෙන් ඇතිවන තත්ත්ව නිරූපණය කෙරෙන පින්තූරවලට සිසුන්ගේ අවධානය යොමු කරන්න.
- ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිත නොකිරීම නිසා ඇති වූ පීඩාවන් පිළිබඳ කතන්දර සිසුන්ට ඉදිරිපත් කරන්න.
- එවැනි කුඩා කතන්දර රඟ දැක්වීමට සිසුන් යොමු කරන්න.
- ඒ අනුව ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කළ යුත්තේ කුමන හේතු නිසා දැයි සිසුන්ගෙන් විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න. *උදා* : ජලය සීමිත සම්පතක් වීම, ජලය නොමැතිව ජීවත් වීමට නොහැකි වීම, . . . වැනි
- මේ නිසා ජලය අරපිරිමැස්මෙන් යුතුව භාවිත කිරීම සඳහා නිවසේ දී හා පාසලේ දී අපට කළ හැකි දේ පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

ක්‍රියාකාරකම 3 :

- ජලය සම්බන්ධ කර ගනිමින් කළ හැකි සෙල්ලමක් සැලසුම් කර ක්‍රියාත්මක කරන්න.
- පහත දැක්වෙන ක්‍රියාකාරකම සිදු කිරීම සඳහා සුදුසු ස්ථානයක් තෝරාගන්න.
- ක්‍රියාකරකම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය රැස්කර ගන්න.
  * සමාන ප්‍රමාණයේ බෝතල්
  * සමාන ප්‍රමාණ පුනීල
  * තරමක විශාල වතුර බේසමක්
  * සමාන ප්‍රමාණයේ කෝප්ප



- රූප සටහනෙහි දැක්වෙන පරිදි සිසු කණ්ඩායම් මැදින් ජල බේසමක් තබන්න.
- ඉහත දැක්වෙන පරිදි පන්තියේ සිසුන් කණ්ඩායම් කර බේසම වටා පෙළගස්වන්න. සෑම පේළියක කෙළවරම පුනීලයක් සහ බෝතලය බැගින් තබන්න.
- සෑම පේළියකම බේසමට ආසන්න කෙළවරෙහි සිටින පළමු සිසුවාට කුඩා කෝප්පය බැගින් ලබා දෙන්න.
- බේසමෙහි ඇති ජලයෙන් කුඩා කෝප්පයට ජලය පුරවා ගෙන බෝතලය පිරවීම සඳහා අතින් අත යැවීමට කියන්න. පේළිය අවසානයේ සිටින සිසුවා බෝතලයට ජලය වත්කර, ආපසු කෝප්පය පෙර සේ පළමු සිසුවාට එවිය යුතුය. අතින් අත මාරු කිරීමේ දී සහ බෝතලය පිරවීමේ දී ජලය අපතේ නොයැවීමට උපදෙස් දෙන්න. මේ ආකාරයට පළමුවෙන් බෝතලය පුරවා ගත් කණ්ඩායමට ජය හිමි වේ.
- මෙවැනි ක්‍රීඩා පාසලේ ඇති සම්පත්, ඉඩකඩ හා සිසු ප්‍රමාණය අනුව අවශ්‍ය පරිදි සිදු කිරීමට ඔබට නිදහස ඇත.

ක්‍රියාකාරකම 4 :

- විවිධ හැඩවලින් යුක්ත වූ වීදුරු භාජන දෙකකට ජලය සමාන ප්‍රමාණයක් බැගින් දමන්න. මෙම භාජන දෙක නිරීක්ෂණය කිරීමට සලස්වා සිසුන්ගේ නිරීක්ෂණ ප්‍රකාශ කිරීම සඳහා පහත දැක්වෙන ආකාරයෙන් ප්‍රශ්න අසන්න.
  * භාජන දෙකේ ජලය පිරී ඇති උස ගැන කිව හැක්කේ මොනවා ද ?
  * භාජන දෙකේ ජල ප්‍රමාණ සමාන ද ? අසමාන ද ?

- හැඩයෙන් හා ප්‍රමාණයෙන් සමාන වෙනත් භාජන දෙකකට, පෙර භාජන දෙකේ ජලය මාරු කරමින් නිරීක්ෂණයට යොමු කරන්න.
- නිරීක්ෂණ අවස්ථා පිළිබඳ ව සිතා බැලීමට අවස්ථා ලබා දෙන්න. එසේ සිතා බැලීමෙන් පසු සිසු අදහස් ප්‍රකාශ කිරීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- ජලය විවිධ ස්වරූපයන්ට වෙනස්වන ආකාරය අත්හදා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න. එම සෑම කණ්ඩායමකටම විනිවිද පෙනෙන වීදුරු දෙක බැගින් ලබා දෙන්න.
- එම භාජන දෙකින් එකකට පිරිසිදු ජලයත්, අනෙක් භාජනයට අයිස් කැට කිහිපයකුත් දමන්න. භාජන දෙක පිටතින් අල්ලා බැලීමටත්, අයිස් කැටවලට සිදුවන දේ නිරීක්ෂණයටත් සිසුන් යොමු කරන්න. එසේම ජලයේ හා අයිස් කැටවල වෙනස අත්විඳීමට ද අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් අත්විඳින ලද දෑ ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- අයිස් තිබූ භාජනවල අයිස් දියවන තුරු තබා ඒවා දියවන අයුරු විටින් විට නිරීක්ෂණය කිරීමට යොමු කරන්න. එම නිරීක්ෂණවලින් පසු සිසු අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

**ක්‍රියාකාරකම 6 :**

- කට ලොකු තරමක් විශාල ප්‍රමාණයේ විනිවිද පෙනෙන භාජනයක් සපයා ගන්න. එය සිසුන්ගේ ඇස් මට්ටමෙන් තබන්න. වටපිටාවෙන් සපයාගත හැකි විවිධ ද්‍රව්‍ය කිහිපයක් ගෙන (*උදා* : ලී කැට, ගල්කැට, ප්ලාස්ටික්, . . . වැනි දෑ) එම එක් එක් ද්‍රව්‍ය ජලයේ පාවේ ද, ගිලේ ද යන්න අනුමාන කර ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.
- පසුව එම ද්‍රව්‍ය ජලයට දමා සිදුවන දේ නිරීක්ෂණය කිරීමට සිසුන්ව යොමු කරන්න. සිසු අනුමානවලට අනුව එම ද්‍රව්‍ය ගිලීම හෝ පාවීම සිදු වී ද?, සිදු නොවී ද යන්න සිසුන්ගෙන් විමසන්න. සිසුන් සමඟ සාකච්ඡා කරමින් ජලයේ ගිලෙන ද්‍රව්‍ය හා පාවෙන ද්‍රව්‍ය වෙන් කරන්න.
- ඒ අනුව සමහර ද්‍රව්‍යයන් ජලයට දැමූ විට පාවෙන බවත්, තවත් සමහර ද්‍රව්‍යය ගිලෙන බවත් හඳුනාගැනීමට අවස්ථාව ලබාදෙන්න.

**ක්‍රියාකාරකම 7 :**

- සමහර ද්‍රව්‍ය ජලයට දැමූ විට ජලයේ වර්ණය වෙනස්වන ආකාරය නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.
- මේ සඳහා විනිවිද පෙනෙන තරමක විශාල ප්‍රමාණයේ බෝතල්/වතුර වීදුරු කිහිපයක් හා ජලයේ වර්ණය වෙනස්වීම පරීක්ෂා කිරීමට සුදුසු ද්‍රව්‍ය කීපයක් සපයා ගන්න. *උදා* : නිල්, කහ, සායම් වැනි
- එක් එක් ද්‍රව්‍ය සමාන ප්‍රමාණවලින් එම බෝතල්වලට/වතුර වීදුරුවලට වෙන් වෙන් ව දමා ජලය සමඟ සසඳා බැලීමට සිසුන් යොමු කරන්න. එම ද්‍රව්‍ය මිශ්‍රකරන විට ජලයේ වර්ණය වෙනස්වන අයුරු නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න. සිසුන්ගේ නිරීක්ෂණ ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසන්න.
- මෙම ක්‍රියාකාරකම සාමාන්‍ය ජලය, ශීත ජලය, උණු ජලය යොද ගනිමින් ද සිදු කරන්න. නිරීක්ෂණ වාර්තා කිරීමට සිසුන්ට අවසථාව ලබා දෙන්න.
- ද්‍රව්‍ය ප්‍රමාණ සහ ජල ප්‍රමාණ අඩු, වැඩි කරමින් සිදුවන දේ නිරීක්ෂණයට ද අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 8 :**

- ස්වාභාවික හෝ කෘතිම ද්‍රව්‍ය ආශ්‍රයෙන් වර්ණ දියර සකස් කරගත හැකි ද්‍රව්‍ය කිහිපයක් ගන්න.
  *උදා :* දිය සායම්, රත්මල්, බීට්, . . . වැනි ද්‍රව්‍ය ආශ්‍රයෙන්
- එම වර්ණ අත්ලේ සහ ඇඟිලිවල ගල්වා ඒවා ආශ්‍රයෙන් විවිධ රටා, සත්ව රූප, මල් ආදිය නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- විවිධ හැඩ ඇති ශාක පත්‍ර, ගෙඩි, කරල් ආදිය යොදා ගනිමින් ද සීල් මුද්‍රණ මෝස්තර නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- වර්ණ දියර බිඳු කඩදාසි කොළයක් මතට දමා පිඹිමින් රටා මැවීමට ද සිසුන්ට අවස්ථාව සලසා දෙන්න.
- සිසු නිර්මාණ අගයන්න. සියලු නිර්මාණ එක්කර පන්තියේ ප්‍රදර්ශනයක් පවත්වන්න.

**ක්‍රියාකාරකම 9 :**

- ජලය උපයෝගී කර ගනිමින් සිදුකළ හැකි විවිධ නාද රටා නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- මේ සඳහා විවිධ මට්ටම්වලින් ජලය පිරවූ බෝතල් තුළට කටින් පිඹ නිකුත් වන නාදවල වෙනස්කම් සිසුන්ට ඇසීමට සලස්වන්න.
- කෝප්ප, වීදුරු, බෝතල් වැනි භාජනවලට ද විවිධ මට්ටමට ජලය පුරවා ඒවාට තට්ටු කර, එකිනෙකට වෙනස් නාද ඇතිවන අයුරු හඳුනා ගැනීමට අවස්ථා සපයන්න.
- සෑම සිසුවෙකුටම සුදුසු ආකාරයේ ජලය සහිත බඳුන් ලබා දෙන්න. සිසුන් කණ්ඩායම් කරන්න. සිසුන්ගේ අත ඇති භාජනවලට ජලය පුරවා තට්ටු කරමින් වාදනයක් ඉදිරිපත් කිරීමට මග පෙන්වන්න. කණ්ඩායම් අනුව එකම රිද්මයකට තට්ටු කරමින් එක් ව කණ්ඩායම් වාදනයක් ඉදිරිපත් කිරීමට ද අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 10 :**

- සෑම සිසුවෙකුටම විවිධ ශාක පත්‍ර කීපයක් රැගෙන එන ලෙස පවසන්න.
  *උදා :* නෙළුම්, හබරල, . . . වැනි ශාක පත්‍ර ඇතුළුව
- එම කොළ එකිනෙක මතට ජල බිඳු කීපයක් දමා, ජලය අපතේ යාමට නොදී පත්‍රය සොලවමින් සිදුවන දේ නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව සලසන්න.
- මේ ආකාරයට දිය බිඳු නොවැටී හැකි තරම් වේලාවක් චලනය කරමින් එම දිය බිඳු රඳවා ගැනීමට සිසුන් යොමු කරන්න.
- මෙම ක්‍රියාකාරකම විනෝදාත්මක ව සිදුකිරීමට සිසුන්ට කණ්ඩායම් වශයෙන් අවස්ථාව සලසන්න.

**ක්‍රියාකාරකම 11 :**

- සබන් දියර සහිත භාජනයක් හා සබන් පෙන පිම්බීමට සුදුසු ආකාරයේ බටයක් සෑම සිසුවෙකුටම වෙන් වෙන් වශයෙන් ලබා දෙන්න.
- සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවාගෙන ගොස් නිදහසේ සබන් පෙන පිම්බීමට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී සබන් දියර තම මුඛය තුළට නොගත යුතු බව ද අවධාරණය කරන්න.
- සබන් පෙන පිම්බීමේ දී හැකි තරම් විශාල බෝල ඇති වන අයුරින් ඒවා පිම්බීමට උත්සහ ගන්නා ලෙස සිසුන්ට පවසන්න.
- ඉහළ අහසට සබන් පෙන පුම්බා පා කර හැරීමට ද සිසුන් යොමු කරන්න.
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන්කර, ඒ එක් එක් කණ්ඩායම්වලට සබන් මිශ්‍රිත ජලය සහිත බේසම බැගින් ලබා දෙන්න.
- අනතුරුව සෑම සිසුවෙකුටම බටයක් බැගින් ලබා දී තම කණ්ඩායමට අයත් බේසමේ සබන් පෙන හැකි තරම් මතු කිරීමට යොමු කරන්න. සිසු කාර්යය අගය කරන්න.

# 5. තේමාව : අවුරුදු කාලය

**නිපුණතා** :
- අවුරුදු කාලවල දී වටපිටාවේ සිදුවන වෙනස්කම් ගවේෂණය කර වාර්තා කරයි.
- අවුරුදු චාරිත්‍ර වාරිත්‍රවල වැදගත්කම අගය කරමින් කටයුතු කරයි.
- අවුරුදු සිරිය මතුවන විවිධ නිර්මාණවල යෙදෙමින් වින්දනය ලබයි.
- අවුරුදු උත්සව සමය හා සම්බන්ධ ක්‍රීඩාවල නිරත වෙමින් වින්දනයක් ලබයි.
- අවුරුදු කාලයට සුවිශේෂ වූ වින්දනාත්මක ක්‍රියාකාරකම්වල නියැළෙයි.

**ඉගෙනුම් පල** :
- අවුරුදු කාලයේ දී වටපිටාවේ සිදුවන විවිධ වෙනස්කම් විස්තර කරයි.
- අවුරුදු සමය තුළ සිදු කරන සිරිත් විරිත් හඳුනා ගනිමින් ඒවා අනුගමනය කරයි.
- අවුරුදු කාලය හා සබැඳි ගෘහස්ථ හා එළිමහන් ජන ක්‍රීඩාවල යෙදෙයි.
- අවුරුදු උළෙලේ සුන්දරත්වය විවිධ අවස්ථා චිත්‍ර මගින් නිරූපණය කරයි.
- අවුරුදු කාලය හා සබැඳි ජනකවි හා ගීත ගායනා කරමින් ඊට අදාළව රංගන ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- සිංහල දෙමළ අවුරුද්ද සම්බන්ධව පහත දැක්වෙන කරුණු මුල්කර ගනිමින් සිසුන් සමග කථා කරන්න.
  - * එය ජාතික උත්සවයක් බව
  - * එය යෙදී ඇති වකවානුව
  - * එහි ඇති වැදගත්කම
  - * අවුරුද්ද සැමරීම අතීතයේ සිට වාර්ෂිකව පැවැත එන බව

**ක්‍රියාකාරකම 2**

- අවුරුදු කාලයේ දී අවට පරිසරයේ සිදුවන වෙනස්කම් පිළිබඳව සිසු අත්දැකීම් සමගින් කතා කරන්න.

  *උදා:* * අවට පරිසරයේ ගස්වැල්වල මල් පිපී, ගෙඩි හැදී පල බර වන බව
  * අවුරුදු කාලයේ දී පමණක් මල් පිපෙන, ගෙඩි හැදෙන ගස් ඇති බව *උදා* :එරබදු මල්
  * පක්ෂීන් එම එල ආහාරයට ගනිමින් සතුටින් හැසිරෙන බව
  * කොහාගේ නාදය, රබන් හඬ, රතිඤ්ඤා හඬ අවටින් ඇසෙන බව
- අවුරුදු කාලයේ දී අවට පරිසරයේ සුන්දරත්වය චිත්‍රයට නැගීමට අවස්ථාව ලබා දෙන්න. එම චිත්‍ර පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- අලුත් අවුරුද්ද සඳහා නිවස සූදානම් කරන අයුරු පිළිබඳව ද සිසු අත්දැකීම් ඇසුරෙන් සාකච්ඡාවක් කරන්න.

  *උදා* : * මකුළු දැල් ආදිය කඩා නිවස හා අවට පරිසරය පිරිසිදු කිරීම
  * නිවසේ ගොම මැටි ගා පිරිසිදු කිරීම
  * හුණු, තීන්ත ආදිය ගා නිවෙස් අලුත්වැඩියා කිරීම
  * ආහාර ද්‍රව්‍ය රැස්කර සූදානම් වීම
  * කැවිලි පෙවිලි සකස් කිරීම
  * මුළුතැන්ගෙට අදාළව අවශ්‍ය භාණ්ඩ හා උපකරණ සූදානම් කර ගැනීම. (නැවුම් වළං, මුට්ටි)

**ක්‍රියාකාරකම 3 :**

- අවශ්‍ය අවස්ථාවල දී දෙමාපිය සහය ලබා ගනිමින් ආදර්ශ අවුරුදු උත්සවයක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරගන්න.
- අවුරුදු උත්සවය පැවැත්වෙන ස්ථානය අවට පිරිසිදු කිරීම හා සැරසීම සිසුන්ගේ ද සහය සහිතව සිදු කරන්න.
- අවුරුදු කාලයට සුවිශේෂ වූ කැවුම්/අතිරස/කිරිබත්/කෙසෙල් ආදි සිංහල දෙමළ අවුරුද්දට සුවිශේෂ ආහාර ද්‍රව්‍යවලින් යුක්ත කෑම මේසයක් ද පිළියෙල කිරීමට සලස්වන්න. මේ සඳහා අවශ්‍ය දෑ කල්තබා සූදානම් කර ගැනීම අවශ්‍ය ය.
- නියමිත දිනයේ දී සහභාගී වන සියලු සිසුන් උචිත ඇඳුම්වලින් සැරසී අවුරුදු උත්සවයට සහභාගී කරවන්න.
- අවුරුදු උත්සවයේදී සමරණ ප්‍රධාන චාරිත්‍ර ඇතුළත් සැලැස්මක් (ආදර්ශ නැකැත් පත්‍රයක්) සාදා ගන්න.
- අවුරුදු උත්සවය පැවැත්වෙන දින ජාතික කොඩිය හා පාසල් කොඩිය ද එසවීමට අවශ්‍ය කටයුතු සූදානම් කර ගන්න.
- අපේ ජාතික කොඩිය ශ්‍රී ලංකාවේ සියලු ජන වාර්ගිකයන්ට අයත් හා අප රටට ම අනන්‍ය වූවක් බව ත්, මෙවැනි ජාතික උත්සව අවස්ථාවල දී ජාතික කොඩිය එසවීම සිදු කරන බව ත් සිසුන්ට පැහැදිලි කරන්න. පාසල් කොඩිය ද පාසලේ විශේෂ අවස්ථාවල දී ඔසවන බව කියන්න. මෙම කොඩි ඔසවන විට අප ඊට ගරු කළ යුතු අයුරු, හා හැසිරිය යුතු අයුරු පැහැදිලි කරන්න.
- මෙම උළෙල සඳහා විදුහල්පතිතුමා හෝ වෙනත් අයෙකු ප්‍රධාන අමුත්තා ලෙස කැඳවා ගන්න. අනතුරුව ප්‍රධාන අමුත්තා ලවා ජාතික කොඩිය එසවීමට සලස්වන්න. ජාතික ගීය ගායනා කරන අවස්ථාවේ දී සියලු සිසුන් සීරුවෙන් සිට ගෞරව දැක්වීමට ද යොමු කරන්න.
- මෙම අවුරුදු උත්සවයේ දී පහත සඳහන් චාරිත්‍ර වාරිත්‍ර සියල්ල හෝ කිහිපයක් හෝ ආදර්ශනය කිරීමට සලස්වන්න.
  * නොනගතය වේලාවේ දී ආගමික කටයුතුවල යෙදීම
  * නැකතට ලිප ගිනි මෙලවීම
  * කිරිබතක් පිළියෙල කිරීම
  * නැකතට ගනුදෙනු කිරීම හා ආහාර අනුභවය, වැඩ ඇල්ලීම
  * වැඩිහිටියන්ට බුලත් දී වැඳීම, සංග්‍රහ කිරීම
  * හිස තෙල් ගෑම (මෙම කටයුතුවල දී රබන් ගසමින් උත්සවයක සිරිය ගැනීම සුදුසු ය)

**ක්‍රියාකාරකම 4**

- අවුරුදු ක්‍රීඩා උළෙල ආරම්භ කරන්න. මේ සඳහා ජන ක්‍රීඩා තෝරා ගැනීම සුදුසු ය. විශේෂයෙන් ප්‍රදේශයට ආවේණික, සිසුන්ගේ වයසට ගැළපෙන ජන ක්‍රීඩා තෝරා ගැනීම කරන්න.
  *උදා :* පංච දැමීම, එළුවන් කෑම/ පනා හැංගීම/ලේන්සු හැංගීම/රබන් ගැසීම
- රබන් ගැසීම සඳහා ප්‍රදේශයේ සිටින රබාන ගැසීමට හැකියාව ඇති කිහිප දෙනෙකුට ද ආරාධනා කරන්න. සිසුන් සමඟ එකතුව රබන් පද කියමින් රබන් ගැසීමට අවස්ථාව සලසන්න.
- මෙම ක්‍රීඩා තෝරා ගැනීමේ දී සිසු ස්වභාවය, අවශ්‍යතා සහ ලැදියා අනුව තනිව ජයග්‍රහණය කරනවාට වඩා කණ්ඩායමක් වශයෙන් ජයග්‍රහණය ලැබෙන පරිදි ක්‍රීඩා තෝරා ගැනීමට ද, ඒ සඳහා අවශ්‍ය නම් ක්‍රීඩා නිර්මාණ කිරීමට ද කටයුතු කරන්න. මෙහි දී සිසු ආරක්ෂාව පිළිබඳව ද සැලකිලිමත් වන්න. එසේම කණ්ඩායමක් ලෙස කටයුතු කිරීමේ වැදගත්කම අගය කරන්න.


**ක්‍රියාකාරකම 5**

- අවුරුදු අසිරිය පිළිබඳ කියවෙන කවි/ගී වැඩිහිටියන්ගේ උදවු ද සහිතව සොයාගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- සිසුන් ගෙන එන කවි, ගී එකතු කර කුඩා පොත් සාදන්න.

- ඒවායෙහි දැක්වෙන කවි, ගී සිසුන් සමඟ තාලයට ගායනා කරන්න.
- ඔංචිලි වාරම් කියමින් ඔංචිලි පැදීම වැනි ක්‍රියාකාරකම්වල යෙදීමට ද සිසුන්ට අවස්ථාව සලසන්න.
- අවුරුදු හා සම්බන්ධ යම් යම් අවස්ථා පිළිබඳ ව භූමිකා රංගනයේ යෙදීමට සිසුන් යොමු කරන්න.
- මැටි වැනි ද්‍රව්‍යයක් යොදා ගනිමින් කැවුම්/කිරිබත් ආදි ආහාර ද්‍රව්‍යවල ආකෘති, නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒවා පන්තියේ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

## චක්ගුඩු ක්‍රීඩාව

- පන්තියේ සිසුන් සමානව කණ්ඩායම් දෙකකට වෙන් කරන්න.




- චක්ගුඩු ක්‍රීඩාවේ යෙදීම සඳහා රූප සටහනේ දැක්වෙන පරිදි පිටියේ මැද රේඛාවෙන් දෙපස A හා B කණ්ඩායම් දෙකෙහි සිසුන් කැමති ලෙස ස්ථානගත කරන්න.
- ක්‍රීඩාව ආරම්භයේ දී තරගයේ යෙදිය යුතු අයුරු, දැවී යන අයුරු හා ජයග්‍රහණය කරන අයුරු සිසුන්ට පැහැදිලි කරන්න.
- ක්‍රීඩාව පවත්වාගෙන යාමේ පහසුව සඳහා තුන්වැන්නෙක් නළාවක් සහිතව සිටීම සුදුසු ය.
- තුන්වැන්නා නළාවෙන් සංඥාවක් දුන් පසු එක් කණ්ඩායමකින් සිසුවෙක් 'ගුඩු ගුඩු' කියමින් තම ප්‍රතිවිරුද්ධ පිලට යයි. මෙම 'ගුඩු ගුඩු' යැයි කීම ඔහු දැවී යනතුරු හෝ නැවත තම පිලට එනතුරු සිදුකළ යුතු ය. මෙම ප්‍රතිවිරුද්ධ පිලට යන සිසුවාගේ උත්සහය විය යුත්තේ ප්‍රතිවිරුද්ධ පිලේ අයෙකුට හෝ කිහිප දෙනෙකුට අතින් හෝ පාදයෙන් හෝ පහර දී ආපසු ආරක්ෂිතව නැවත තම පිලට පැමිණීම ය.
- මෙම අවස්ථාවේ දී ප්‍රතිවිරුද්ධ පිල සිදුකළ යුතු වන්නේ තම පිලට පැමිණි සිසුවාගේ පහර දීමෙන් බේරී ඔහුව/ඇයව කෙසේ හෝ අල්ලා ගැනීම ය. මෙසේ පැමිණෙන සිසුවා අල්ලා ගැනීමේ දී ඔහු/ඇය කෙසේ හෝ බේරී පළාගියහොත් පහර දීමට පැමිණි අයව ස්පර්ශ කළ සියලු දෙනා තරගයෙන් ඉවත් වේ.
- අනතුරුව පළමු පරිදි ම තුන්වැන්නාගේ සංඥාවට අනුව අනෙක් පිලේ සිසුවෙකු ප්‍රතිවිරුද්ධ පිලට ගොස් පෙර පරිදි ම ක්‍රියාකරයි. මේ අයුරින් එක් කණ්ඩායමක සියල්ල තරගයෙන් ඉවත් වන තුරු ක්‍රීඩාව පවත්වා ගත යුතු ය. සියලු දෙනා පළමුව දැවීගිය කණ්ඩායම තරගයෙන් පරාජයට පත් වේ. අනෙක් කණ්ඩායම ජයග්‍රාහකයෝ වන්නේය.

# 6. තේමාව : අපට පෙනෙන අහස

**නිපුණතා** :
- අහසේ හා අවට පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.
- හිරු එළිය, සුළං වැනි ස්වභාවික දේවලින් සිදුවන බලපෑම අධ්‍යයනය කර වාර්තා කරයි.
- විවිධ මාධ්‍ය භාවිත කරමින් අහස හා පාරිසරික වෙනස්කම් විදහා දැක්වෙන නිර්මාණ කරයි.
- අවකාශ භාවිත කරමින් ක්‍රීඩාවල නිරත වෙයි.
- අහසේ සුන්දරත්වය ප්‍රකාශනාත්මක මාධ්‍ය ඇසුරෙන් ඉදිරිපත් කර වින්දනයක් ලබයි.

**ඉගෙනුම් පල** :
- දිවා හා රාත්‍රී අහසේ දක්නට ලැබෙන දේ නිරීක්ෂණය කර වාර්තා කරයි.
- දිවා හා රාත්‍රී අහසෙහි අපූර්වත්වය ප්‍රකාශ කරයි.
- සුළං උපයෝගී කර ගනිමින් ද්‍රව්‍ය අහසේ පා කර හැරිය හැකි බව අත්හදා බලයි.
- හිරු එළියේ බලපෑම නිසා පැළෑටිවල සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර ප්‍රකාශ කරයි.
- සෙවණ ලබා ගැනීමට යොදාගත හැකි සරල නිර්මාණ කරයි.
- තිරස් අවකාශ භාවිත කරමින් දිවීම ආශ්‍රිත සුළු ක්‍රීඩාවල යෙදෙයි.
- අහස හා සම්බන්ධ කවි, ගී ගායනවලට අනුකූලව රංගනවල යෙදෙයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- දිවා හා රාත්‍රී අහසේ දක්නට ලැබෙන ස්වාභාවික වස්තු පිළිබඳ ව සිසුන් සමඟ කතා කරන්න.
  *උදා* : හිරු, සඳු, තරු, වලාකුළු, දේදුන්න
- දිවා අහස නිරීක්ෂණ චාරිකාවක් සඳහා අවශ්‍ය ද්‍රව්‍ය රැස්කර ගන්න.
  *උදා* : * කාඩ්බෝඩ් කැබැල්ලකින් සකස් කර ගත් සිලින්ඩරයක් (වලාකුළු නිරීක්ෂණය සඳහා)
- සිසුන් කණ්ඩායම් කර, ඔවුන්ට අවශ්‍ය උපකරණ ලබා දී අහස නිරීක්ෂණයට යොමු කරන්න.
  *උදා* : * හිරු නිරීක්ෂණය - හිරු දෙස පියවි ඇසින් නොබලන්න. ඒ සඳහා ජල බේසමක් භාවිත කරන්න.
  * වලාකුළු නිරීක්ෂණය - කාඩ්බෝඩ් සිලන්ඩර් ආදිය සමඟ
  * දේදුන්න නිරීක්ෂණය - දේදුන්නක් පායා ඇති විට පියවි ඇසින් නිරීක්ෂණය

- නිරීක්ෂණයෙන් අනතුරුව පහත සඳහන් කරුණු පිළිබඳ ව අවධානය යොමු කරමින් සිසුන් සමඟ කතාබහ කරන්න.
  *උදා* : * හිරුගේ ස්වභාවය, හිරුගේ හැඩය, හිරු දවස තුළ සිටින ස්ථානය වෙනස් වනවා ද? සූර්යයා නොපෙනෙන අවස්ථා තිබෙනවා ද ?
  * වලාකුළුවල හැඩයක් තිබේ ද?, වර්ණයක් තිබේ ද? එකම වර්ණය ද නැතිනම් වෙනස් ද, වලාකුළු නිශ්චල ද, පාවෙනවා ද ?
  * දේදුන්නේ වර්ණයක් තිබේ ද,හැඩය කෙබඳු ද, දේදුන්න හිරු සමඟ සසඳන විට දකින්නට ඇත්තේ කුමන පැත්තකින් ද, කොපමණ වේලාවක් තිබුණා ද

  ඉහත තොරතුරු පිළිබඳ ව සිසු නිරීක්ෂණ ඇසුරින් කතාබහ කරන්න.
- සිසුන් නිරීක්ෂණය කළ දෑ චිත්‍ර මගින් නිර්මාණය කිරීමට ද අවස්ථාව ලබා දෙන්න. ඒවා අගය

කරන්න.

- නිවසේ දී රාත්‍රී අහස නිරීක්ෂණයට ද සිසුන් යොමු කරන්න. මේ සඳහා දින කිහිපයක කාලයක් ලබා දෙන්න. රාත්‍රී අහස නිරීක්ෂණයේ දී දුටු දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  *උදා :* * දිවා අහසේ දුටු දේවල්වලට වඩා රාත්‍රී අහසේ දී වෙනස් දේවල් දක්නට තිබුණා ද ?
    * චන්ද්‍රයා කෙබඳු ද, හිරු මෙන් තද රශ්මියක් තිබේ ද ?
    * චන්ද්‍රයා රාත්‍රිය තුළ තිබෙන්නේ එකම ස්ථානයක ද ? නැතිනම් වෙනස් වූවා ද?
    * තරු කෙබඳු ද ? ඒවා දිලිසෙනවා ද, තරු ගණන් කරන්න පුළුවන් ද බැරි ද?
    * රාත්‍රී අහසේ වලාකුළු තිබුණා ද, සඳ, තරු දක්නට නැති රාත්‍රී තිබුණා ද ආදී වශයෙන් සිසුන්ගෙන් විමසන්න.

**ක්‍රියාකාරකම 2**

- දිවා සහ රාත්‍රී අහසේ අපූර්වත්වය නිරීක්ෂණය ඇසුරින් කතාබහක යෙදෙන්න.
  *උදා :* * වලාකුළුවලින් දිස්වෙන විවිධ වර්ණයන්
    * රාත්‍රී අහසේ තරු බැබලීම හා තරු විසිරී ඇති ආකාරයේ සුන්දරත්වය
    * සඳ පෙනෙන ආකාර ආදි වශයෙන්
- සිසුන් හඳුනාගත් තොරතුරු පන්තියේ වාර්තා කිරීමට යොමු කරන්න. ඒවා පිළිබඳව සාකච්ඡා කරන්න.
- දිවා හා රාත්‍රී අහසේ අපූර්ව දෑ විවිධ මාධ්‍ය මගින් නිර්මාණයට ද සිසුන්ව යොමු කරන්න. මේ සඳහා කණ්ඩායම් ලෙස සිසුන් යොමු කළ හැකි ය. සිසු නිර්මාණ එකතු කරමින් ප්‍රදර්ශනයක් පවත්වන්න. සිසු නිර්මාණ අගය කරන්න.
- අහසේ අපූර්වත්වය පිළිබඳ ලියැවුණු කවි, ගීත සිසුන් සමඟ ගායනා කරන්න. රංගනයෙන් ද ඒවාට දායකත්වය ලබා දීමට යොමු කරන්න.
  *උදා :* * සමන් පිච්ච මල් ඉහිරුණු - නිල් තණකොළ පිට්ටනියක්
    වගෙයි අහස අන්න බලනු - කොච්චර ලස්සන ද රෑට (රචනය : එස්. මහින්ද හිමි)

**ක්‍රියාකාරකම 3**

- අහසේ පාකළ හැකි විවිධ දෑ පිළිබඳ අත්හදා බැලීම සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. ඒ i | y d wj YH oEI , ks ai Odk ï I r . k ka' *උදා :* සැහැල්ලු කඩදාසි කැබලි, ශාක පත්‍ර, පුළුන් වැනි දෑ
- එළිමහනට ගොස් ඒවා අහසේ පා කිරීමට ඉඩ හැර ඒ එක් එක් ද්‍රව්‍ය පාවෙන ආකාරයේ වෙනස්කම් පිළිබඳ විමසන්න.
- ඒවා අතරින් නූලක් ගැටගසා පා කළ හැකි දෑ මොනවා ද යන්න හඳුනා ගැනීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ද්‍රව්‍යවල නූලක් ගැටගසා අහසේ පා කර යැවීම සඳහා දිවයාමට සලස්වන්න.
- සිසුන් කණ්ඩායම් කර සරුංගල් සෑදීමට අවශ්‍ය ද්‍රව්‍ය සපයාගෙන එක් එක් කණ්ඩායමේ අදහස පරිදි සරුංගල සාදා ගැනීමට උදවු කරන්න.
- එම සරුංගල් අහසේ පා කිරීමට අවස්ථාව ලබා දෙන්න. අත්හදා බලන ලද විවිධ දෑ අහසේ පා කළ හැක්කේ කුමක් නිසාදැයි සිසුන්ගෙන් විමසන්න.
- ඉහත නිරීක්ෂණ ඇසුරින් විවිධ ද්‍රව්‍ය පාකර හැරීම සඳහා සුළඟ උපයෝගී කරගත හැකි බව පෙන්වා දෙන්න.
- සුළඟේ ස්වභාවය අනුව පාකිරීමේ හැකියාව වෙනස්වන බව ද හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

- අහසේ විවිධ දෑ පාකිරීම පිළිබඳ අත්දැකීම් පිළිබඳ චිත්‍ර ඇඳීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- මිනිසාට මෙන් ම ගස්වැල්වලට ද හිරු එළිය බලපාන ආකාරය සොයා බැලීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- සෑම සිසුවෙකුටම පොල්කටුව බැගින් ලබා දෙන්න.
- එළිමහනේ තණකොළ සහිත ස්ථානයකට ගොස් එම පොල්කටුවලින් තණකොළ වසා පොල්කටුව නොසෙලවෙන සේ එයට උඩින් බරක් තැබීමට උපදෙස් ලබා දෙන්න.
- පොල්කටුවෙන් ආවරණය වී ඇති තණකොළවලට කුමක් සිදු විය හැකි දැයි සිසුන්ගෙන් විමසන්න.
- දින කිහිපයකට පසු තණකොළවල වෙනස නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
  * ආවරණය වූ තණකොළවලට කුමන වෙනසක් වී තිබුණේ ද ?
  * ආවරණය කර තිබූ තණකොළ හා ආසන්නයේ තිබූ වෙනත් තණකොළ අතර වෙනස්කම් මොනවා ද ?
  * එසේ වූයේ ඇයි ?
- සිදු වී ඇති වෙනස්කම් ඉහත දැක්වෙන කරුණු ඔස්සේ සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 5**

- තිරස් හා සිරස් අවකාශ භාවිත කරමින් උඩ පැනීම්, දිවීම් ආශ්‍රිත ක්‍රීඩාවල නිරතවීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒ සඳහා සිසුන්ව ඉඩකඩ ඇති ස්ථානයකට රැගෙන යන්න. සිසුන්ට නිදහසේ දිව යාමට යොමු කර එම දිව යන අතර ගුරුතුමිය විසින් දෙන ලද සංඥාවකට හැකි තරම් ඉහළට පනින ලෙස උපදෙස් ලබා දෙන්න. මෙසේ කිහිප විටක් සංඥාව නිකුත් කරමින් ක්‍රියාකාරකම සිදු කරන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් හතරකට වෙන් කරන්න.
- එක් එක් කණ්ඩායම කැමති කුරුල්ලෙක් ගැන විමසන්න. අනතුරුව එම කුරුල්ලන් මෙන් හැසිරීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- අහසේ දැකිය හැකි සුන්දරත්වය මතුකර දැක්වෙන චිත්‍ර නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- එම නිර්මාණ ඇසුරින් පන්තියේ චිත්‍ර ප්‍රදර්ශනයක් පවත්වන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 7**

- හිරු එළියෙන් හිස ආවරණය කර ගැනීම සඳහා ශාක පත්‍ර ඇසුරෙන් තොප්පියක් නිර්මාණය කිරීමට සුදුසු ශාක පත්‍ර කිහිපයක් එකතු කර ගන්න. (*උදා* : කොස් කොළ, අඹ කොළ ආදිය)
- ඒවා කෙළවර ඉරටු කැබැලි වැනි දෙයක් යොදා ගනිමින් ශාක පත්‍ර එක එක යා කර ගනිමින් කැමැති හැඩයකට තොප්පියක් නිර්මාණය කිරීමට අවස්ථාව දෙන්න.
- මේ ආකාරයට කාඩ්බෝඩ්/බ්‍රිස්ටල් බෝඩ් ආදිය යොදා ගනිමින් ද හිරු එළියෙන් ආවරණය වීමට සුදුසු තොප්පියක් සකස් කර ගැනීමට කටයුතු කරන්න. ඒවා විසිතුරු වර්ණ කඩදාසි හෝ විවිධ දෑ යොදා ගනිමින් අලංකාර කර ගන්න.

# 7. තේමාව : අප කන බොන දේ

**නිපුණතා** :
- ආහාර වර්ගවල ඇති වැදගත්කම හඳුනාගනිමින් පරිභෝජනය කරයි.
- නිරෝගී පැවැත්ම සඳහා නිවැරදි සෞඛ්‍යය පුරුදු පවත්වා ගනියි.
- ආහාර අපිරිසිදුවන අයුරු හඳුනාගෙන ඒවායින් ආහාර ආරක්ෂා කර ගැනීමට කටයුතු කරයි.
- විවිධ මාධ්‍ය යොදා ගනිමින් ආහාර හා සම්බන්ධ නිර්මාණවල යෙදෙයි.
- ශක්ති වර්ධනයට උපකාරී වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- ආහාර ගැනීමේ දී පවත්වා ගත යුතු නිවැරදි පිළිවෙත් ප්‍රදර්ශනය වන නිර්මාණාත්මක රංගනවල යෙදෙයි.

**ඉගෙනුම් පල** :
- ආහාර වේලක අඩංගු දේ නම් කරයි.
- ආහාර පානවලින් අපේ ශරීරයට ලැබෙන ප්‍රයෝජන විස්තර කරයි.
- ආහාරපාන නියමිත වේලාවට නියමිත ප්‍රමාණයෙන් පරිභෝජනය කරයි.
- පරිභෝජනය සඳහා ස්වාභාවික ආහාර තෝරා ගනියි.
- නිරෝගී සිරුරක් පවත්වා ගැනීම සඳහා යෝග්‍ය සෞඛ්‍ය පුරුදු අනුගමනය කරයි.
- ආහාර අපිරිසිදු වන ක්‍රම ප්‍රකාශ කරයි.
- ආහාර පිරිසිදුව තබා ගැනීමට කටයුතු කරයි.
- ප්‍රියජනක ලෙස ආහාර පිළිගැන්වීම සඳහා සුදුසු නිර්මාණ කරයි.
- ශරීර ශක්තිය වර්ධනය සඳහා දළ චාලක හා සියුම් චාලක ක්‍රියාකාරකම් සිදුකරයි.
- යහපත් සෞඛ්‍යය පුරුදු සහිත පණිවුඩ රැගත් රංගන ඉදිරිපත් කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- තමා වඩාත් කැමති ආහාර වර්ග පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- උදේ, දවල්, රාත්‍රී ආහාර සඳහා කෑමට ප්‍රියකරන ආහාර මෙන් ම අතුරුපස වශයෙන් අප ගන්නා ආහාර පිළිබඳව ද සිසුන් සමඟ කතාබහ කරන්න.
- මේ අනුව එක් එක් සිසුන් පරිභෝජනයට ගැනීමට කැමති ආහාරපාන වර්ග විමසන්න. ඒවා එකිනෙකට අනුව වෙනස් වන බව පෙන්වා දෙන්න. ආහාර ගැනීමෙන් අප අපේක්ෂා කරන්නේ නිරෝගී සිරුරක් පවත්වා ගැනීම බව සිසුන්ට අවබෝධ වීම සඳහා සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිසුන් කැමති ආහාර පමණක් ම ආහාරයට ගන්නේ නම්, ඇතිවිය හැකි තත්ත්වයන් පිළිබඳ ව විමසිලිමත් ව සිතීමට සිසුන්ට අවස්ථා සලස්වන්න.

  *උදා* : දුර්වල වීම, රෝගී වීම, . . . වැනි
- ඒ අනුව අප එදිනෙදා ආහාර නිසි පරිදි ලබාගත් විට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන් සමඟ කතා බහ කරන්න.

  *උදා* : * ලෙඩ රෝගවලින් ආරක්ෂා වීම
  * ශක්තිය ලබා ගැනීම
  * ශරීරය මනා ලෙස වැඩීම . . . වැනි

**ක්‍රියාකාරකම 2 :**

- විවිධ ආහාර වර්ග දැක්වෙන රූප ගෙන එන ලෙස සිසුන්ට පවසන්න.
- සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කරන්න. සිසු කණ්ඩායම්වලට තම කණ්ඩායම සතු ආහාර ද්‍රව්‍යවල රූප කාණ්ඩ කිරීමට යොමු කරන්න.

  *උදා :* * සතුන්ගෙන් ලබා ගන්නා
  * ශාකවලින් ලබා ගන්නා

- ආහාර වර්ග කාණ්ඩ කිරීමෙන් අනතුරුව ඉහත වර්ග දෙකටම අයත් ආහාර අප එදිනෙදා පරිභෝජනයට ගන්නා ආහාරවල තිබේ ද යන්න සොයා බැලීමට සිසුන් යොමු කරන්න.
- ආහාරවේලක් පෝෂණ ගුණයෙන් වඩාත් පරිපූර්ණ වීමට එක් කරගත හැකි දේ විමසන්න. සිසු පිළිතුර ඇසුරෙන් පලා, එළවළු, මාළු ආදිය ආහාරයට ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- එවැනි ආහාර, ප්‍රධාන ආහාර වේලට එක්කර ගැනීමෙන් ඇතිවන වාසි පිළිබඳව ද සිසුන් දැනුවත් කරන්න.

  *උදා :* * හොඳින් ඇස් පෙනීම
  * රෝගවලින් ආරක්ෂා වීම . . . වැනි

- කෘත්‍රිම හා ක්ෂණික ආහාරපානවල අහිතකර බව ද, ස්වාභාවික ලෙස සකස් කරගන්නා ආහාර පානවල ඇති වැදගත්කම ද . . . ආදිය මතුවන සේ කෘත්‍රිම ආහාරවලට කැමති ළමයකු හා ස්වභාවික ආහාරවලට කැමති ළමයකු අතර චරිතාරෝපිත රංගන සැලසුම් කරන්න.
- එම කතාබහ ඔස්සේ ස්වාභාවික ආහාර පාන ගැනීමේ වැදගත්කම පිළිබඳ ව සිසුන් දැනුවත් කරන්න. සිසු දිවා ආහාරය දිනපතා නිරීක්ෂණය කරමින් ගුණාත්මක ආහාරවේලක් ගැනීමට සිසුන් යොමු කරන්න.
- ඉහත සඳහන් කරුණු අවධාරණය කෙරෙන පෝස්ටර්, බැනර් නිර්මාණය කර සිසු පෙරහැරක් පාසල තුළ සංවිධානය කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- නියමිත වේලාවට නියමිත ප්‍රමාණයෙන් පෝෂ්‍යදායී ආහාර නොගැනීම නිසා ඇතිවිය හැකි ගැටලු පිළිබඳ සිසුන්ගෙන් විමසන්න. එදිනෙදා ආහාරවේල් අවශ්‍ය ප්‍රමාණයට ගත යුතු බව හා එසේ නොවූ විට ඇති විය හැකි තත්ත්වයන් පැහැදිළි කරන්න.

  *උදා :* * ශක්තිය හීන වීම
  * ශරීර වර්ධනය අඩාල විම
  * අසනීප තත්ත්වයන් ඇති වීම
  * පන්ති කාමර ක්‍රියාකාරකම් නිසි පරිදි සිදුකිරීමට අපොහොසත් වීම . . . වැනි

- ඒ අනුව උදය ආහාරය ගැනීමේ වැදගත්කම පිළිබඳව ද සිසුන් සමඟ කතා බහ කරන්න.
- අප ප්‍රධාන ආහාරවේල් හා එම ආහාරවේල් වලදී ලබා ගන්නා ආහාර පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- ප්‍රධාන ආහාරවේල් යනු මොනවා දැයි විමසා, ඒවා අවධාරණය කරන්න.
- අප බීමට ගන්නා පාන වර්ග කීපයක් නම් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ආහාර මෙන් ම පාන වර්ග ද ශරීරයට අවශ්‍ය බව පෙන්වා දෙන්න.
- වෙළඳ පොළෙන් මිලදී ගන්නා පානවලට වඩා උණුකර නිවාගත් ජලය පානය කිරීමේ වැදගත්කම හා ඉන් ශරීරයට ලැබෙන ප්‍රයෝජන පිළිබඳ ව සිසුන්ට පැහැදිළි කරන්න.
- සිසුන් දිනපතා ජලය පානය කරන ප්‍රමාණය විමසා, පිරිසිදු පානීය ජලය දිනපතා ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමේ වැදගත්කම අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 4**

- මුඛයේ පිරිසිදු බව පවත්වා ගැනීමේ වැදගත්කම පිළිබඳව ද සිසුන් සමඟ කතාබහ කරන්න.
- මුඛයේ පිරිසිදු බව පවත්වාගත් හා පවත්වා නොගත් අවස්ථාවල දී ඇතිවන වාසි/අවාසි කතාබහ කරන්න. මේ සඳහා සුදුසු පින්තූර ආදිය යොදා ගන්න.
- සෑම සිසුවකු ලවාම දත් බුරුසුවක් පන්තියට ගෙන්වා ගෙන නිවැරදිව දත් මදින ආකාරයට දත් මැදීමට අවස්ථාව සලසන්න. ප්‍රධාන ආහාරවේල්වලින් පසු දවසට දෙවරක් වත් දත් මැදීමේ අවශ්‍යතාව මතුකර දක්වන්න.

**ක්‍රියාකාරකම 5 :**

- අත්, පා, නිය නිතරම පිරිසිදුව තබා ගැනීමේ අවශ්‍යතාව මතුකර සාකච්ඡා කරන්න.
- 'පිරිසිදු නියපොතු' ක්‍රියාකාරකම සඳහා නියපොතු කපා පිරිසිදු කරගෙන ඒමට සිසුන් දැනුවත් කරන්න. පසුදා එළිමහන් කවයක හිඳ පන්තියේ සියලුම සිසුන්ගේ නියපොතු පරීක්ෂා කර පි-රි-සි-දු නි-ය-පො-තු කියමින් තාලයට අත්පොළොසන් දීමට සිසුන් යොමු කරන්න.
- අපිරිසිදු නියපොතු සහිත දරුවන් වේ නම් වෙනත් අයෙකුගේ සහය ද සහිතව නියපොතු කපා පිරිසිදු කරවන්න. තේමාව සිදුකරන කාලයෙන් පසුව ද මෙම ක්‍රියාකාරකම විටින් විට සිදුකරන්න.
- වතුර බේසම් දෙකකට සමාන වතුර ප්‍රමාණය බැගින් යොදා එක් බේසමකින් පමණක් දැත් සෝදන ලෙස සිසුන්ට උපදෙස් දෙන්න.
- සිසුන් දැත් සෝදා අවසන් වූ පසු දැත් නොසේදූ භාජනයේ හා දැත් සේදූ භාජනයේ ඇති වතුරවල වෙනස නිරීක්ෂණය කරන ලෙස සිසුන්ට පවසන්න. මේ ඇසුරෙන් දැත් කොතරම් අපිරිසිදුව තිබේ දැයි සිතා බැලීමට යොමු කරන්න.
- දැත් හොඳින් පිරිසිදු වූ පසුව දැත්වල දක්නට ලැබෙන සුන්දරත්වය හා ඒ ආකාරයට පිරිසිදු බව පවත්වාගෙන යන දරුවන්ට සැවොම ඇලුම් කරන බව ද පහදා දෙන්න.
- අපිරිසිදු දැත් සහිතව ආහාර ගැනීම නිසා අපට නොයෙක් රෝග පීඩා ඇතිවිය හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න. දිනපතා සිසුන් ආහාර ගැනීමට පෙර මෙවැනි පුරුදු පවත්වාගෙන යන්නේ දැයි විමසිලිමත් වන්න.

  අත්ලේ ගෑවෙන සේ ආහාර මිශ්‍ර කිරීම, තළු ගසමින් කෑම ගැනීම, මුඛයේ ආහාර ඇති විට කතා කිරීම, අවට විසිරෙන ආකාරයට ආහාර ගැනීම, අත් දෙකම යොදා ගනිමින් ආහාර ගැනීම . . . වැනි දෑ කරන ළමයකු පිළිබඳ පුවතක් සිසුන්ට පවසා එම ළමයා පිළිබඳ සිසුන්ගේ අදහස් විමසන්න. මේ කතාබහ තුළින් එවැනි චර්යා අධෛර්ය කිරීමට යොමුවන්න.
- යහපත් පුරුදු පිළිබඳ ව කියැවෙන සරල කවි නිර්මාණය කර සිසුන් සමඟ ගායනා කරන්න.
- යහපත් සෞඛ්‍ය පුරුදු පිළිපැදීම පිළිබිඹු කරන භූමිකා රංගනවල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 6 :**


- ආහාරපාන අපිරිසිදු විය හැකි අවස්ථා පිළිබඳ පින්තූර ඉදිරිපත් කරමින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න. *උදා :*
  - * බිම වැටීම නිසා අපද්‍රව්‍ය තැවරීම,
  - * ආහාර විවෘතව තැබීම නිසා මැස්සන් ආදී සතුන්ගෙන් හානි වීම,
  - * කල් ඉකුත් වී තිබීම,
  - * සතුන් කා තිබීම,
  - * දුම්, දූවිලි ආදිය තැවරීම . . . වැනි
- මේ ආකාරයට ආහාරපාන අපිරිසිදු වීම වළක්වා ගැනීමට අපට කළ හැකි දේ යෝජනා කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. නිවසේ අත්දැකීම් ඉදිරිපත් කිරීමට දිරිමත් කරන්න.

**ක්‍රියාකාරකම 7**

- ආහාර පිළිගැන්වීමේ දී නිර්මාණශීලී ව පිළිගැන්වීම සඳහා යොදාගත හැකි නිර්මාණවල යෙදීමට සිසුන් යොමු කරන්න.

  *උදා :* *  මේස දරණු (Table mat) පිළියෙල කිරීම.

  - බ්‍රිස්ටල් බෝඩ් මත රූප සටහනේ පෙනෙන පරිදි හෝ වෙනත් රටාවකට සිදුරු විද ගන්න.




  - විවිධ වර්ණයේ කැරලි නූල් හෝ වූල් කිහිපයක් එකට ගෙන කිසියම් මෝස්තරයක් මතුවන සේ සිදුරු මත නූල් දුවවමින් මේස දරණුවක් නිර්මාණය කරන්න.

**ක්‍රියාකාරකම 8**

- ශක්තිය වර්ධනය සඳහා උපකාරී වන ක්‍රියාකාරකම් කිරීම සඳහා සිසුන් එළිමහන් ස්ථානයකට කැඳවා ගෙන යන්න.
- ගුරුතුමිය විසින් ලබා දෙන සංඥා අනුව වේගය අඩු වැඩි කරමින් පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.
  - * එකතැන දිවීම
  - * වේගය වැඩි කරමින් එකතැන දිවීම
  - * ඇවිදීම
  - * වේගය වැඩි කරමින් ඇවිදීම
- සීමාවක් සලකුණු කර, ඉහත ක්‍රියාකාරකම් සුහද තරගයක් ලෙස එම සීමාව තුළ සිදු කිරීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 9 :**

- පහත සඳහන් වින්දනාත්මක ක්‍රීඩාවල නිරතවීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- පන්තියේ සිසුන් පේළි දෙකකට සිටීමට සලස්වන්න. කණ්ඩායම් දෙක A හා B වශයෙන් නම් කරන්න. සිසුන් පේළි දෙකට මීටර් 2ක් හෝ 3ක් පමණ ඉදිරියෙන් මේසයක් තබන්න.




- සිසු සංඛ්‍යාවට ගැළපෙන පරිදි එක ආහාර වර්ගයක කාඩ්පත් දෙක බැගින් වන සේ මේසය මත විවිධ ආහාර වර්ගවල රූප සහිත කාඩ්පත් යම් ප්‍රමාණයක් තබන්න.

- ගුරුතුමිය විසින් දෙන සංඥාවකට අනුව පේළි දෙකේ මුලින් සිටින සිසුන් යුගලය ඉදිරියට පැමිණ කාඩ්පත් තෝරාගත යුතුය.  උදා : කාඩ්පත් අතරින් පලතුරු වර්ගයක රූපයක් සහිත කාඩ්පත් රැගෙන එන්න.
- ඒ අනුව මේසය මත අදාළ රූප අතරින් තනි තනිව ඉක්මණින් සිසුන් දෙදෙනා රූප තෝරාගෙන එය ගුරුතුමියට පෙන්වා ලබාගත් රූප නැවත මේසය මත තබා තම කණ්ඩායමට අදාළ පේළියේ පිටුපසින් දිවගොස් සිටගත යුතුය.
- ඉන්පසු පේළියේ ඊළඟ සිසුන් දෙදෙනා දුවගොස් ගුරුතුමිය පෙන්වන ආහාර වර්ගය කලින් පරිදිම තෝරාගෙන ක්‍රීඩාවේ යෙදිය යුතුය.
- මේ ආකාරයට තරගය දිගටම පවත්වන්න.
- නිවැරදි රූපය පෙන්වා ඉක්මණින් ම තම කණ්ඩායම වෙත පැමිණෙන සිසුන්ගේ කණ්ඩායමට ජය හිමි වේ.
- අප එදිනෙදා ලබාගන්නා ආහාර වේල් තුළ විවිධ වූ ආහාර වර්ග ඇති බව පිළිබඳ ව, ක්‍රියාකාරකම අවසානයේ සිසුන් දැනුවත් කරන්න.

**ක්‍රියාකාරකම 10**

- උදේ, දවල්, රාත්‍රී ආහාර සඳහා අප ගන්නා ආහාර වර්ගවලට අයත් රූප සහිත කාඩ්පත් කට්ටලයක් බැගින් සෑම සිසු කණ්ඩායමකට ම ලැබෙන සේ සකසා ගන්න.
- සිසුන් 5 - 6 අතර ප්‍රමාණයක් සහිතව පන්තියේ සිසුන් කණ්ඩායම් කරන්න.
- රූප කාඩ්පත් කට්ටල සෑම කණ්ඩායමකටම ලබා දෙන්න.
- රූප කාඩ්පත් ආශ්‍රයෙන් ගුරුවරයා ලබා දෙන උපදෙස්වලට අනුව ක්‍රියාකාරකම්හි නියැළිය යුතු බවට උපදෙස් ලබා දෙන්න.

  *උදාහරණ*

  1. රූප යොදාගෙන උදෑසන ආහාර සඳහා සුදුසු ආහාර වේලක් නිර්මාණය කරන්න.
  2. රූප යොදාගෙන දිවා ආහාරය සඳහා සුදුසු ආහාර වේලක් නිර්මාණය කරන්න.   . . . වැනි

- උදවු අවශ්‍ය කණ්ඩායම් සඳහා ප්‍රතිපෝෂණ ලබා දෙන්න.
- සිසු නිර්මාණවල අත්දැකීම් ප්‍රයෝජනයට ගනිමින් විවිධත්වයෙන් යුතු පෝෂ්‍යදායී ආහාරවේල් අපගේ එදිනෙදා ආහාරයට එක්කර ගත හැකි බව පහදා දෙන්න.

## 8. තේමාව : තොරතුරු ලැබෙන හැටි

**නිපුණතාව** :
- සන්නිවේදනයේ දී භාවිත කරන විවිධ මාධ්‍ය හඳුනා ගෙන ඒවා නිවැරදි ව හසුරුවයි.
- සන්නිවේදනය හා බැඳුණු තාක්‍ෂණික උපකරණ භාවිතය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- තොරතුරු සන්නිවේදනය හා සම්බන්ධ විවිධ නිර්මාණ කරයි.
- විවිධ සංඥාවලට ප්‍රතිචාර දක්වමින් චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- විවිධ සන්නිවේදන විධි යොදා ගනිමින් ප්‍රකාශනාත්මක චලන සහිත ක්‍රියාකාරකම්වල නිරත වෙයි.

**ඉගෙනුම් පල** :
- සන්නිවේදන මාධ්‍ය හා උපකරණ පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
- සන්නිවේදනයේ දී යොදා ගන්නා තාක්ෂණික මෙවලම් නිවැරදිව භාවිත කරයි.
- තොරතුරු සන්නිවේදනය හා සම්බන්ධ උපකරණවල ආකෘති නිර්මාණය කරයි.
- දෙන ලද සංඥාවකට අනුව දිවීම හා පැනීම මගින් ප්‍රතිචාර දක්වයි.
- සන්නිවේදනයේ දී හඬ හා ඉරියව් හසුරුවන විවිධ ආකාර ප්‍රදර්ශනය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1:**

- විවිධ මාධ්‍යයෙන් අපට තොරතුරු ලැබෙන උපකරණවල පින්තූර සිසුන් ලවා පන්තියට රැස්කර ගන්න.
- මෙම පින්තූර ඇසුරු කර ගනිමින් අපට තොරතුරු ලැබෙන ආකාර පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා :* * ගුවන්විදුලිය
  * රූපවාහිනිය
  * දුරකථනය
  * පුවත්පත්
- සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න. සෑම කණ්ඩායමකටම බ්‍රිස්ටල් බෝඩ් එක බැගින් ලබා දෙන්න.
- සිසුන් විසින් ගෙන ආ පින්තූර එම බ්‍රිස්ටල් බෝඩ් මත ඇලවීමට උපදෙස් දෙන්න.
- ඒ අනුව අපට තොරතුරු ලැබෙන විවිධ ආකාර ඇති බව තවදුරටත් සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- තොරතුරු ලැබෙන විවිධ මාධ්‍ය හඳුන්වා දීමට සැබෑ මාධ්‍ය උපකරණවලින් කිහිපයක් පන්ති කාමරයට රැස්කර ගන්න.
- එසේ නොමැති නම් පාසලේ එවැනි උපකරණ ඇති ස්ථාන සිසුන්ට සජීවීව නැරඹීමට හෝ අවස්ථාව ලබා දෙන්න.
- එම තාක්ෂණික උපකරණ වෙන් වෙන් ව ක්‍රියාත්මක කර, ඒවායින් නිකුත් වන හඬ, රූප ආදිය නැරඹීමට/සවන්දීමට යොමු කරන්න.
- අනතුරුව මෙම එක් එක් උපකරණ හසුරුවන ආකාරය පිළිබඳ හුරුවක් ලැබීමට සිසුන්ට අවස්ථාව සලසන්න.

  *උදා :* * ගුවන්විදුලි යන්ත්‍රයක් ක්‍රියාකරවීම/ක්‍රියා විරහිත කිරීම
  * රූපවාහිනියක් ක්‍රියාකරවීම/ක්‍රියා විරහිත කිරීම
  * වැඩසටහන් මාරු කිරීම
  * හඬ අඩු වැඩි කිරීම

- මෙවැනි උපකරණ භාවිතයේ දී ආරක්ෂාකාරීව හා වැඩිහිටියන්ගේ මගපෙන්වීම මත පරිහරණය කළ යුතු බවට සිසුන් දැනුවත් කරන්න.
- මෙම උපකරණවලින් අපට ලබා ගත හැකි තොරතුරු පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් මෙහෙයවන්න.
- මේ ආකාරයටම පත්තර, සඟරා, බැනර් ආදියෙන් තොරතුරු ලබාදෙන ආකාර පිළිබඳව ද සරල කතාබහක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 3**

- සිසුන්ට සෙල්ලම් දුරකතනයක් සෑදීම සඳහා සුදුසු ආකාරයේ ද්‍රව්‍ය රැගෙන එන ලෙස පවසන්න.
- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කර, නිවසින් ගෙනෙන ලද ද්‍රව්‍ය (*උදා* : ගිනිපෙට්ටි, යෝගට් කෝප්ප, නූල්, . . . වැනි) ඇසුරින් සෙල්ලම් දුරකථනයක් සකස් කිරීමට සිසුන්ට උපදෙස් දෙන්න.
- සකස් කරන ලද දුරකතනයෙන් සිසුන්ට පණිවුඩ හුවමාරු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- දෙදෙනා කරන කතාබහ පැහැදිලිව ඇසුනේ දැයි සිසුන්ගෙන් අසා දැනගන්න. සිසුන් කළ නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 4**

- මයික්‍රොෆෝනයක් හෝ එවැනි ආදේශ උපකරණයක් පන්තියට ලබා ගන්න.
- පන්ති කාමරයේ හෝ සුදුසු ස්ථානයක කුඩා වේදිකාවක් සකස් කර ගන්න.
- මයික්‍රොෆෝනය ගුරුවරිය විසින් නම් කරන සිසුවෙකුට ලබා දී තමා කැමති දෙයක් පිළිබඳව වැකි 2ක් හෝ 3ක් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  *උදා* : අපේ ගෙදර, මගේ ගුරුතුමී, . . . වැනි
- මේ ආකාරයට සෑම සිසුවෙකුටම ඉදිරිපත් වීමට අවස්ථාව ලබා දෙන්න.
- සිසුන් අගය කරන්න.

**ක්‍රියාකාරකම 5**

- හඬ පටිගත කරගත හැකි උපකරණයක් පන්තියට සපයා ගන්න. (ජංගම දුරකථනයක්, කැසට් යන්ත්‍රයක්, හඬ පටිගත කරන උපකරණ, . . . වැනි ඕනෑම උපකරණයක්) එය භාවිත කරමින් පන්තියේ සෑම සිසුවකුගේ ගායනයක්, කතාවක් හෝ යම් දෙබසක් පටිගත කරන්න.
- ඒවා සිසුනට නැවත සවන්දීමට සලස්වන්න.
- ඒ අනුව හඬක් පටිගත කර නැවත ඇසීමට හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 6**

- කාඩ්බෝඩ් පෙට්ටි, කතුරු, බයින්ඩර් ගම්, වාර්නිෂ් කොළ, යෝගට් කෝප්ප, . . . වැනි ද්‍රව්‍ය රැගෙන ඒමට සිසුන් යොමු කරන්න.
- එම ද්‍රව්‍ය ඇසුරෙන් තොරතුරු ලබාගත හැකි හා ලබා දිය හැකි මාධ්‍ය හා සම්බන්ධ කැමති උපකරණයක් සකස් කිරීමට කණ්ඩායම් වශයෙන් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
  (*උදා* : රූපවාහිනියක්, ගුවන්විදුලියක්)
- සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- ගුරුවරිය ලබාදෙනු ලබන සංඥාවකට අනුව දිවීම, පැනීම ආශ්‍රිත ක්‍රීඩාවල නිරතවීමට සිසුන් යොමු කරන්න.
- රූප සටහනේ පරිදි එළිමහන් ස්ථානයක රේඛා තුනක් සටහන් කරන්න.
- පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කර, ඉන් එක් කණ්ඩායමක සිසුන් පළමුවන රේඛාව මත පෙළගැසීමට සලස්වන්න.
- මෙම ක්‍රියාකාරකමට අදාළ සංඥා ලබාදීම සඳහා නළාවක් යොදා ගන්න.

- ඒ අනුව පහත සඳහන් සංඥාවලට අනුව ක්‍රියාකාරකම්වල යෙදීමට සිසුන් යොමු කරන්න.
    - * පළමු සංඥාව - තමා සිටින රේඛාව මත එකතැන දිවීම
    - * දෙවන සංඥාව - දෙවැනි රේඛාව වෙතට දිවයාම
    - * තුන් වන සංඥාව - දෙවන රේඛාව මත සිට උඩ පැනීම
    - * හතරවන සංඥාව - තුන් වන රේඛාව මතට දිව යාම




- මේ ආකාරයටම ආපසු හැරී පෙර පරිදි සංඥාවලට අනුව ක්‍රියාත්මක වෙමින් අංක 1 රේඛාව දක්වා නැවත පැමිණිය යුතු වේ.
- පන්තියේ සිසුන් සියලු දෙනාටම මෙම ක්‍රියාකාරකමෙහි යෙදීමට අවස්ථාව සලස්වන්න.

**ක්‍රියාකාරකම 8**

**පියවර 1**

- සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. ඉන් එක් යුගලයක සිසුන් මීටරයක පමණ දුරක් සිටින සේ සිටගැනීමට සලස්වන්න. පසුව පහත ආකාරයේ සරල දෙබස් ප්‍රකාශ කිරීමට එම සිසු යුගලයට අවස්ථාව ලබා දෙන්න.

  *උදා* : 1 සිසුවා - ඔහොම ඉන්නකෝ
  2 සිසුවා - ඇයි කථා කළේ ?

- මෙම දෙබස සිදු වූ ආකාරය පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න. මෙහි දී දෙබස හා සම්බන්ධ පහත සඳහන් කරුණු පැහැදිලි කරන්න.

  *උදා* : * දෙබස පැහැදිලිව ඇසීම
  * ඒ අනුව දෙන ලද ප්‍රතිචාර පැහැදිලි වීම
  * දෙදෙනාගේ ඉරියව් හොඳින් පෙනීම
  * එම ඉරියව් හොඳින් තේරුම් ගත හැකි බව, . . . වැනි

**පියවර 2**

- පසුව එම සිසුන් දෙදෙනා මීටර් 5ක් පමණ දුරකින් තබා එම දෙබසම නැවත ප්‍රකාශ කිරීමට යොමු කරන්න.
- ඒ අනුව පළමු දෙබසට වඩා දෙවන දෙබස සඳහා වැඩිපුර ආයාසයක් හා වැඩි හඬක් අවශ්‍ය බව සිසුන්ට අවධාරණය කරවන්න.
- පළමු හා දෙවන පියවර අතර වෙනස පැහැදිලි කරන්න. පහත සඳහන් කරුණු මෙහි දී මතු කරන්න.

  *උදා* : * පෙර දෙබස මෙන් පැහැදිලිව නො ඇසුණ බව
  * අදහස් ප්‍රකාශ කිරීමට වැඩි හඬක් (ආයාසයකින්) අවශ්‍ය වන බව
  * පළමු පියවරේ මෙන් මුහුණේ ඉරියව් පැහැදිලිව නොපෙනෙන බව
  * ආයාසයකින් ඇහුම්කන් දිය යුතු බව

- මේ ආදි වශයෙන් මීටර් 10 - 15 පමණ දුරකින් තබා මෙම ක්‍රියාකාරකම කිරීමට තවදුරටත් සිසුන් යොමු කරන්න.
- පියවර එක සහ දෙක මෙන් සිදු වූ වෙනස්කම් සාකච්ඡා කරන්න.

# 9. තේමාව : වටපිටාවේ සිදුවන වෙනස්කම්

**නිපුණතා** :
- පරිසරයේ සිදුවන වෙනස්කම් සහ ඒවාට සතුන් දක්වන ප්‍රතිචාර ගවේෂණය කර වාර්තා කරයි.
- ස්වාභාවික පරිසරයේ ඇතිවිය හැකි හදිසි තත්ත්වයන් පිළිබඳ විමසිලිමත් ව කටයුතු කරයි.
- වටපිටාවේ සිදුවන විවධ වෙනස්කම්වල දී භාවිත කළ හැකි නිර්මාණ කරයි.
- සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- අවකාශය භාවිත කරමින් වින්දනාත්මක ක්‍රියාකාරකම්වල යෙදෙයි.

**ඉගෙනුම් පල** :
- වැස්සට පෙර හා පසු සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් සංසන්දනය කරයි.
- අව්ව හා සුළඟ නිසා සමීප පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්‍ෂණය කර වාර්තා කරයි.
- වටපිටාවේ සිදුවන වෙනස්වීම්වලට සතුන් දක්වන ප්‍රතිචාර නිරීක්ෂණය කර වාර්තා කරයි.
- ස්වාභාවික පරිසයේ ඇති විය හැකි හදිසි තත්ත්වයන් නිසා සිදුවිය හැකි බලපෑම් වාර්තා කරයි.
- වටපිටාවේ සිදුවන වෙනස්කම් චිත්‍රයට නගයි.
- විවිධ ද්‍රව්‍ය යොදාගනිමින් වටපිටාවේ සිදුවන වෙනස්කම්වල දී භාවිත කළ හැකි දේ නිර්මාණය කරයි.
- වටපිටාවේ සිදුවන වෙනස්කම් ඇසුරින් චලන ගවේෂණ ක්‍රියාකාරකම්වල නියැළෙයි.
- ශ්වසන ක්‍රියාකාරකම් ඇසුරින් විවිධ දේ පා කර හරියි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- වැසිබර කාලගුණයක් සහිත දිනයක පහත දැක්වෙන දේ ඇසුරින් ප්‍රශ්න නගමින් වර්ෂාව පිළිබඳ සිසු අනුමාන සාකච්ඡා කරන්න.

  *උදා :* * අද වහිවී ද ?
  * ඇයි ඔබ එසේ කියන්නේ ?
  * අනෙක් දවස්වලට වඩා අද දවසේ ඇති වෙනස මොකක් ද ?
- පසුව වැස්සට පෙර හා පසු වටපිටාවේ නිරීක්‍ෂණය සඳහා සුදුසු අවස්ථාවක් තෝරාගන්න.
- වැස්සට පෙර පරිසරය නිරීක්‍ෂණයේ දී පහත සඳහන් කරුණු අවධාරණය කරමින් සිසුන් සමඟ සාකච්ඡාවක් මෙහෙයවන්න.
  * වැස්සට පෙර පරිසරයේ ආලෝකය වෙනස් වීම කෙසේ සිදුවී ද ?
  * ආලෝකය අඩුවූයේ නම් ඒ ඇයි ?
  * පරිසරයේ පැවති උණුසුමට කුමක් වී ද ?
  * සුළං හැමීම කෙසේ සිදුවන්නේ ද ?
  * වැස්සට පෙර පොළොවේ ස්වභාවය කෙබඳු ද ?

**ක්‍රියාකාරකම 2 :**

- වර්ෂාවෙන් පසු පරිසරය නිරීක්ෂණය සඳහා සිසුන් සමඟ චාරිකාවක යෙදීමට අවශ්‍ය කටයුතු සැලසුම් කරගන්න.
- මෙම චාරිකාවේ දී පරිසරයේ ඇති වී ඇති වෙනස්කම් හඳුනා ගන්න.
- වර්ෂාවෙන් පසු පරිසරයේ පවතින ස්වභාවය පිළිබඳ කතාබහ කරන්න.

  *උදා* : * උණුසුම කෙබඳු ද ?
  * ආලෝකය/එළිය කෙබඳු ද ?
  * සුළං තවමත් පවතින්නේ ද ? නොඑසේ නම් සුළඟේ වෙනසක් වී ඇත් ද ?
  * පොළොවේ කුමන වෙනස්කම් සිදුවී ඇත් ද ?
    - ජලය රැඳී තිබෙන ස්ථාන
    - ජලය ගලා ගොස් ඇති ස්ථාන
    - පස් තැන්පත් වී ඇති ස්ථාන
    - පස සෝදා ගොස් ඇති ස්ථාන . . . වැනි
- පොළොවේ මතුපිට පස තරමක් හාරා පස්වල ස්වභාවය පිළිබඳ සිසු අවධානය යොමු කරන්න.
- වැස්සට පෙර හා වැස්සට පසු පරිසරයේ ස්වභාවය වෙනස්වන අයුරු මෙම නිරීක්ෂණ ඇසුරින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- වැස්සට පෙර, වැස්සක් වසින විට, වැස්සෙන් පසු අවස්ථා චිත්‍රයට නැගීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- ඒවා පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. සිසු නිර්මාණ අගය කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- හොඳින් හිරු එළිය සහිත වියළි කාලගුණයක් ඇති දිනයක දවසේ අවස්ථා කිහිපයක දී පාසල් වත්තේ චාරිකාවල යෙදෙන්න.
- මේ සෑම අවස්ථාවකදී ම පරිසරයේ වෙනස්කම් නිරීක්ෂණය සඳහා සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එහි දී පහත සඳහන් දේ කෙසේ වෙනස් වී ඇත්දැයි යන්න සොයා බැලීමට සිසුන් උනන්දු කරන්න.
  * උදෑසන පරිසරයේ පිණි කැට, තණකොළවල තෙතමනය
  * පරිසරයේ ආලෝක තත්ත්වයේ වෙනස්කම් පවතී ද ?
  * උණුසුමේ වෙනස්කම් සිදුවී ඇත් ද ?
  * වැඩිපුර සිසිලසක් දැනෙන අවස්ථා මොනවා ද ?
- සිසු නිරීක්ෂණ වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ අනුව දවසේ විවිධ අවස්ථාවල දී පරිසරය විවිධ ස්වභාවයන්ගෙන් යුක්ත බව සාකච්ඡාවක් ඇසුරින් අවබෝධ වීමට සලස්වන්න.

**ක්‍රියාකාරකම 4 :**

- හොඳින් හිරු එළිය සහිත දිනයක ලී කැබැල්ලක්, කළුගල් කැබැල්ලක්, යකඩ කැබැල්ලක්, වැලි ආදිය මද වේලාවක් අව්වේ තබා ඒවාට සිදු වී ඇත්තේ කුමක් දැයි නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
- යකඩ වැනි දේ ඉක්මණින් හා වැඩියෙන් රත්වන බවත්, ලී වැනි ද්‍රව්‍ය අඩුවෙන් රත්වන බවත් නිරීක්ෂණය තුළින් හඳුනා ගැනීමට සලස්වන්න.
- ඒ ඒ ද්‍රව්‍ය අඩු වැඩි වශයෙන් උණුසුම් වී ඇති අයුරු සසඳමින් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සිසු අත්දැකීම් ඇසුරින් එදිනෙදා ජීවිතයේ අවශ්‍යතා සඳහා හිරු එළිය ප්‍රයෝජනවත් වන අයුරු සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- සුළං සහිත දිනයක පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය සඳහා සිසුන් යොමු කරන්න. (සිසු ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත්වන්න.)
- දෑස් වසාගෙන සුළඟට ගස් සෙලවෙන ශබ්දයට සවන් දීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- අවට පරිසරයේ කොළ අතු සෙලවෙන අයුරු නිරීක්ෂණය කරන්න.
- ඒවා සෙලවීමට හේතුව කුමක් විය හැකිදැයි විමසන්න.
- සුළං නිසා ඒවා සෙලවෙන බවත්, සුළඟේ වේගය අනුව ඒවා සෙලවීමේ වෙනස්කම් සිදුවන බව ද පැහැදිලි කරන්න.
- ගස්වල කොළ අතු සෙලවීම අනුව සුළං හමන්නේ කුමන පැත්තෙන් දැයි සිසුන්ගෙන් විමසන්න.
- සුළං හමන්නේ කුමන පැත්තෙන් දැයි තවදුරටත් හඳුනා ගැනීම සඳහා සිසුන් පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නිරත කරවන්න.
  * පුළුන්, පිහාටු හෝ වෙනත් සියුම් ද්‍රව්‍ය අහසට විසිකර ඒවා ගමන් කරන දිශාව සොයා බලන්න.
  * හඳුන් කූරක් දල්වා එහි දුම ගමන් කරන අයුරු නිරීක්ෂණයට යොමු කරන්න.
  * කඩදාසිවලින් කොඩි කිහිපයක් සකස් කර ඒවා ඉරටු හෝ වෙනයම් ආධාරකයක සවිකර ගන්න. භාජනවල වැලි පුරවා එම කොඩි සවිකර ස්ථාන කිහිපයක තැබීමට ද කටයුතු කරන්න. සෑම ස්ථානයකම කොඩි එකම පැත්තකට සෙලවෙනවා ද යන්න ඒ ඇසුරින් නිරීක්ෂණය කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- ඉහත නිරීක්ෂණ තුළින් ලබාගත් අත්දැකීම ඔස්සේ පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න.
- චලන ගවේෂණ ක්‍රියාකාරකම් ඇසුරින් චලන අනුකරණය කිරීමට සිසුන් යොමු කරන්න.

  උදා : * කාටද පුළුවන් සුළඟට සෙලවෙන ගස් මෙන් සෙලවෙන්න.
  * කාටද පුළුවන් වැස්සට කලින් කුරුල්ලන් පියඹා යන විධියට පියඹා යන්න.
  * කාටද පුළුවන් වළාකුලක් මෙන් පාවෙන්න.
- සුළං හමන විට සිරුරට දැනෙන වෙනස ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සුළං හමන අවස්ථාවක දී සුළං හමන දිශාවට හා විරුද්ධ දිශාවට දිවීමට සැලැස්වීමෙන් දැනෙන වෙනස සසඳමින් කතාබහක යෙදෙන්න.

**ක්‍රියාකාරකම 7 :**

- ස්වසන ක්‍රියාකාරීත්වය මනාව සිදුකිරීමට උපකාරී වන පහත දැක්වෙන ආකාරයේ අභ්‍යාසවල සිසුන් නිරත කරවන්න. ඒ සඳහා පුළුන්, පිහාටු, වරා මල් වැනි සුළඟේ පාකර හැරිය හැකි ද්‍රව්‍ය රැගෙන ඒමට සිසුන් දැනුවත් කරන්න.
- පිරිසිදු වාතාශ්‍රය ලැබෙන එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- නාසයෙන් හොඳින් හුස්ම ගනිමින් දෙඅත් ඉහළට ඔසවන ලෙසත්, හුස්ම කටින් පිට කරමින් දෙඅත් පහළට දමන ලෙසත් සිසුන්ට පවසන්න.
- මෙම අභ්‍යාසය කිහිප වතාවක් සිසුන් සමග සිදු කරන්න.
- ඉන්පසු සුළඟේ පා කිරීමට ගෙන්වා ගත් ද්‍රව්‍ය සිසුන්ට ලබා දී එම ද්‍රව්‍ය ඉහළ අහසට පිඹිමින් වැඩි කාලයක් අවකාශයේ රඳවා ගැනීමට උත්සහ ගන්නා ලෙස සිසුන්ට පවසන්න.
- ද්‍රව්‍ය පහළට නොවැටී වැඩි කාලයක් අවකාශයේ රඳවා ගන්නා දරුවන් අගයන්න.

**ක්‍රියාකාරකම 8 :**

- පහත අවස්ථාවන් අතුරෙන් දිවා කාලයේ නිරීක්ෂණය කළ හැකි දෑ පාසලේදීත්, පාන්දර සහ සවස් කාලයේ නිරීක්ෂණය කළ හැකි දෑ නිවසේ දීත් නිරීක්ෂණයට යොමු කරන්න.

  *උදා :* * උදෑසන කුරුල්ලන් කෑම සොයා යාම
  * උදෑසන කුකුළා හැඬලීම
  * සවස කුරුල්ලන් කැදලි කරා යාම
  * රාත්‍රියේ දී වවුලන්, බකමූණන් සැරිසැරීම


- උදෑසන කාලයේදීත්, සවස/රාත්‍රී කාලයේදීත් විශේෂයෙන් දක්නට ලැබෙන සතුන් සහ ඔවුන්ගේ හැසිරීම් පිළිබඳ සිසුන් සමඟ කතාබහ කරන්න.
- වටපිටාවේ සිදුවන වෙනස්කම්වලට සමහර සතුන් කල්තබා ප්‍රතිචාර දක්වන බව පෙන්වා දෙන්න. එවැනි සිද්ධි, පිළිගැනීම් වැඩිහිටියන්ගෙන් අසා දැනගෙන ඒමට සිසුන් යොමු කරන්න. මෙහිදී ප්‍රදේශයට අනුව සිසුන්ට ගැළපෙන පරිදි උදාහරණ ඇසුරෙන් සාකච්ඡාවක් ගොඩනගන්න.

**ක්‍රියාකාරකම 9 :**

- සුළං බලයෙන් ක්‍රියා කරවිය හැකි සුළං පෙත්තක් (රූං පෙත්තක්) නිර්මාණය කිරීමට සිසුන් යොමු කරන්න.

  *අවශ්‍ය ද්‍රව්‍ය* : * පොල් කොළ/දිගට ඉරන ලද ඩිමයි කඩදාසි තීරු
  * ඉරටුවක්

- සෙන්ටිමීටර් 30 පමණ දිග සෙන්ටිමීටර් 3ක් පළල තීරු පටි සාදා ගන්න.
- රූප සටහනේ පෙනෙන පරිදි සුළං පෙත්ත සාදා ඉරටුවක රඳවාගෙන සුළං බලයෙන් ක්‍රියාත්මක කිරීමට අවස්ථාව ලබා දෙන්න.




**ක්‍රියාකාරකම 10**

- අධික වැසි, තද සුළං සහිත කාලගුණික තත්ත්වයක් ඇති වුවහොත් සිදුවිය හැකි දේ පිළිබඳ සිසුන්ගෙන් විමසන්න.
- එවැනි අවස්ථා පිළිබඳ සිසු අත්දැකීම් තිබේ නම් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- අධික වැසි, දැඩි සුළං නිසා විපත් සිදුවී ඇති අවස්ථා දැක්වෙන පින්තූර, ඡායාරූප හෝ වීඩියෝ පට යොදා ගනිමින් හදිසි තත්ත්වයන්ගෙන් පරිසරයට සිදුවී ඇති හානි පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා :* * ගසක් ඉදිරී වැටී පාරවල් අවහිර වීම
  * ගෙයක වහළට සුළඟ නිසා හානි සිදුවීම
  * ජල ගැලීම් සිදු වී ඇති අවස්ථා
  * නායයාම් ඇති වූ අවස්ථා

- තම ප්‍රදේශයේ පසුගිය කාලය තුළ දී එවැනි හදිසි පාරිසරික තත්ත්වයන් ඇතිවී දැයි සිසුන්ගෙන් විමසන්න.
- එවැනි අවස්ථාවල දී ක්‍රියාකළ ආකාර පිළිබඳව ද ඔවුන්ගෙන් විමසන්න. ඒවා පන්තියට වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙවැනි අවස්ථාවලදී ගතයුතු ක්‍රියාමාර්ග පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.
- ස්වාභාවික විපත්වලට ගොදුරු වූවන් වෙතොත් ඔවුන්ට හැකි පමණින් උපකාර කළ යුතු බවත්, එසේ කළ හැකි ආකාර පිළිබඳවත් සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

## 10. තේමාව : අපේ යහ පැවැත්ම

**නිපුණතා** :
- යහගුණ අගය කරමින් එම ගුණාංග පවත්වාගෙන යාමට කටයුතු කරයි.
- වගකීම් ඉටු කරමින් පොදු කටයුතු සඳහා දායකත්වය ලබා දෙයි.
- නීතිරීති පිළිගනිමින් නීතිගරුකව හැසිරෙයි.
- යහපුරුදු පවත්වා ගැනීම සඳහා ඉවහල් වන නිර්මාණ කරයි.
- ශාරීරික සහ මානසික යෝග්‍යතාවය පවත්වා ගැනීමට ඉවහල්වන ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- වින්දනාත්මක ප්‍රවේශ භාවිත කරමින් යහපත් චර්යා පිළිබිඹු කරයි.

**ඉගෙනුම් පල** :
- පන්ති කාමරයේ දී අන් අය කෙරෙහි ගරුත්වයෙන් යුතු ව කටයුතු කරයි
- අන් අය අපහසුතාවට පත් නොවන අයුරින් පන්ති කාමර කටයුතු සිදුකරයි.
- තම පන්තියේ සිසුන්ගේ ගුණාංග අගය කරයි.
- අවශ්‍ය අවස්ථාවල නායකත්ව ලක්ෂණ ප්‍රදර්ශනය කරයි.
- එදිනෙදා කටයුතුවල දී නීතිගරුක ව හැසිරෙයි.
- යහපුරුදු ප්‍රදර්ශනය වන චිත්‍ර/පෝස්ටර් නිර්මාණය කරයි.
- යුගල වශයෙන් සහභාගි වී සාර්ථකත්වය ලබා ගත හැකි ක්‍රියාකාරකම්වල නිරත වෙයි.
- යහපුරුදු පිළිබඳ කියවෙන කවි, ගීත ගායනය සමඟ ප්‍රකාශනාත්මක රංගනය කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- අන් අය ආදරයෙන් හා ගරුත්වයෙන් යුතුව කතාබහ කරන විට අපට දැනෙන දේ පිළිබඳ ව තමා උදාහරණ ලෙස ගනිමින් සිසුන් සමඟ කතාබහ කරන්න.
- එහි දී පහත සඳහන් කරුණු මතු කර දක්වන්න.

  *උදා* : * එසේ කතා කරන අය කෙරෙහි ආදරයක්, ගරුත්වයක් සිතෙහි ඇතිවන බව
  * ඒ අය ලබාදෙන උපදෙස් පිළිපැදීමට කැමැත්තක් ඇති වන බව
  * ඒ අය පවරන යම් යම් කාර්යයන් කිරීමට කැමැත්තක් ඇති වන බව, . . . වැනි කරුණු
- මේ ආකාරයට තම දෙමාපියන්, සහෝදර සහෝදරියන්, ගුරුවරුන් ආදරයෙන් කතාබහ කිරීමේ දී තමාගේ සිතට දැනෙන දේ පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.
- අන් අයගෙන් ආදරය, ගරුත්වය ලැබීමට නම් අප විසින් ද ඒ අය කෙරෙහි ආදරය හා ගරුත්වයෙන් යුතු හැසිරීම් ප්‍රදර්ශනය කළ යුතු බව සිසුන්ට පැහැදිලි කරන්න.
- එසේ අන් අයට ආදරයෙන් හා ගරුත්වයෙන් යුතුව කටයුතු කළ හැකි අයුරු පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා* : * ප්‍රිය වචනයෙන් කතාබහ කිරීම
  * අවශ්‍ය අවස්ථාවල දී 'ස්තුතියි', 'කරුණාකර' වැනි වචන භාවිතය
  * අන් අය උසුළුවිසුළුවලට ලක් නොකිරීම
  * යමෙකුට කරදරයක්, අපහසුවක් වූ විට හැකි පමණින් උපකාර කිරීම
- මෙවැනි හැසිරීම් අප විසින් පුරුද්දක් වශයෙන් පවත්වා ගත යුතු බව ද, එවැනි හැසිරීම් සහිත දරුවන්ට සියලු දෙනා ඇළුම් කරන බව ද සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2**

- පාසලේ නිස්කලංක ස්ථානයකට සිසුන් කැඳවා ගෙන ගොස් පහසු ලෙස වාඩිවීමට යොමු කරන්න. ඉරියව් සන්සුන් ලෙස පවත්වා ගනිමින් පහසු ලෙස වාඩි වී දෑස් පියාගෙන සංසුන්ව සිටීමට සලස්වන්න.
- පැහැදිලිව හා මෘදු ලෙස සිසුන් අමතමින් ගුරුතුමිය සහ අනෙක් සිසුන් වෙත ගරුත්වය දක්වමින් හැසිරිය හැකි ආකාරය පිළිබඳ සිතා බැලීමට යොමු කරන්න.

  *උදා :* * දැන් ඔබේ ගුරුතුමිය ගැන සිතන්න.
  - * ගුරුතුමිය එක්ක ආදරයෙන් ඉන්න මොනවද කරන්න ඕනෑ. අනෙක් ළමයින් එක්ක ආදරයෙන් ඉන්න මොනවද කරන්න ඕනෑ. හිතන්න ඒ ගැන.
  - * ප්‍රමාණවත් කාලයක් නිහඬ අවස්ථා දෙමින් සිතීමට යොමු කරන්න.
  - * **මම ගුරුතුමියටත්, මටත් සතුටක් දැනෙන විදියට පන්තියේ ඉන්නවා. මට වගේම පන්තියේ අනෙක් ළමයින්ටත් සතුටක් දැනෙන විදියට ඉන්නවා.**
- මෙම ප්‍රකාශ දෙවරක් හෝ තෙවරක් නැවත ගුරුතුමිය විසින් කියමින් සිසුන් තුළ තහවුරු කරන්න.
- මෙසේ සිත් පහන් කිරීම අවසන් කරමින් සිසුන්ගේ දෑස් විවර කිරීමට උපදෙස් ලබා දෙන්න.
- අනතුරුව ගුරුතුමිය සහ අනෙක් සිසුන් සමඟ සතුටින් සමගියෙන් වැඩ කිරීමේ දී ඒ අය අපහසුතාවයට පත් නොවන, ඒ අයට ගරුත්වය දැක්විය හැකි හැසිරීම් ගැන කතාබහ කරන්න.

  *උදා :* * උදෑසන පන්තියට පැමිණීම
  - * බැහැරවීමට ගුරුතුමියගෙන් අවසර ගැනීම
  - * ආචාරශීලීව ආමන්ත්‍රණය කිරීම
  - * ප්‍රිය වචනයෙන් කතා කිරීම
  - * අන් අයට කරදර/හිරිහැර වන ආකාරයේ හැසිරීම්වලින් වැළකීම, . . . වැනි
- සිසුන් තුළ තහවුරු කළ හැකි ආකාරයේ හොඳ පුරුදු කිහිපයක් හඳුනා ගන්න.
- සෑම සිසුවෙක් ම ඇගයීමට ලක්කළ හැකි වන සේ එම පුරුදු සහ නම් සඳහන් ප්‍රදර්ශනාත්මක පත්‍රිකාවක් සකස් කර එය පන්තියේ ප්‍රදර්ශනය කරන්න.
- යම් සිසුවෙකු විසින් හොඳ පුරුද්දක් ප්‍රදර්ශනය කරන අවස්ථාවක දී එම සිසුවාට/සිසුවියට අදාළ හොඳ පුරුද්ද දැක්වෙන තීරුව ඉදිරියෙන් තරුවක් වැනි සිසුන් ප්‍රිය කරන සංකේතයක් ඇගයීමක් වශයෙන් ලබා දෙන්න.
- මෙය වර්ෂය පුරා පවත්වාගෙන යන්න.

**ක්‍රියාකාරකම 3**

- පාසල් වත්තේ චාරිකාවක් සැලසුම් කරන්න. එම චාරිකාවේ දී අපටත් අනුන්ටත් හිතකර ලෙස පවතින තැන් හා අහිතකර ලෙස පවතින තැන් හමුවිය හැකිවන පරිදි ගමන් මාර්ගය සැලසුම් කර ගන්න.

  *උදා:* * ගමන් කරන විට පාවල ගැටෙන බාධාකාරී තැන්, දුගඳ හමන තැන්, අප්‍රියජනක ලෙස බැහැර කළ කැළි කසළ ආදි
  - * මල් වවා ඇත ප්‍රියජනක තැන්
  - * සුන්දර ලෙස අතුගා පිරිසිදුව පවතින තැන්
  - * ප්‍රියජනක නිමාවක් ඇති ව සකස්කරන ලද ස්ථාන
- හිතකර ව පවතින තැන් සඳහා කහපාට කොඩි ද, අහිතකර ව පවතින තැන් සඳහා තද රතු පාට කොඩි ද සකස් කර ගන්න.
- සිසුන් කැටුව චාරිකාවේ යෙදී අදාළ පරිදි කොඩි සිටුවීමට සිසුන් යොමු කරන්න.
- චාරිකාවේ දී ආපසු එන අතර සිටුවන ලද කොඩි අසල මදක් නැවතී ඒවා එම තත්ත්වවලින් පැවතීමට හේතු විමසන්න.

- චාරිකාව අවසානයේ සිසුන් සමඟ කතාබහක යෙදී ඔවුන්ගේ අදහස් ද උපයෝගි කර ගනිමින්, පහත සඳහන් කරුණු සිසුන්ට **උචිත බස් වහරෙන්** අවධාරණය කරන්න.
  - * අපටත්, අනුන්ටත් හිතකර තැන් එසේ තිබෙන්නේ අනුන්ට හිතකර ලෙස හැසිරෙන අය නිසා ය.
  - * අපටත් අනුන්ටත් අහිතකර තැන් එසේ වන්නේ අනුන්ට අහිතකර ලෙස හැසිරෙන අය නිසා ය.
- අනතුරුව සිසුන්ට සිත් ගන්නා සුළු ස්වරයෙන් හා වචනයෙන් කතාකර, පහත සඳහන් ප්‍රශ්න ගැන සිතා බැලීමට යොමු කරන්න.
  - * පන්තියේ අනුන්ට හිරිහැරයක් වන දේවල් මම කරනවා ද ?
  - * ඒ මොනවාගේ දේවල් ද ?
  - * මට ඒවා නවත්වා ගන්න පුළුවන් නේ ද? . . . ආදිය
- පසුව ශබ්ද නගා කියවීම සඳහා පන්තියේ මෙවැනි පාඨයක් ප්‍රදර්ශනය කර තබන්න.
  *උදා* : **'මම අනෙක් අයට උදව් කරන ළමයෙක් වෙනවාම යි.'**
- සිතා බලන මොහොත නිශ්ශබ්දව ගත කළ පසු එම පාඨය සිසුන් සමඟ කියවන්න. එය තුන්වරක් කියවා එම අධිෂ්ඨානය සති දෙකක කාලයක් සෑම උදෑසනකම කියවන්න. පාඨය දිගටම පන්තියේ ප්‍රදර්ශනය කර තබන්න.
- මෙවැනි සුදුසු පාඨ තෝරා වර්ෂය පුරාම පන්ති කාමරය තුළ ප්‍රදර්ශනය කිරීමට සලස්වන්න.

**ක්‍රියාකාරකම 4**

- යහ පුරුදු පිළිබඳ කියවෙන තමා විසින් නිර්මාණය කරගත් කුඩා කවියක් පෙළින් පෙළ රංගන ද සහිතව සිසුන් සමඟ ගායනා කරන්න.

  *උදා* : * යහළුවන්ට උදවු කරන
  අනතුරක දී පිහිටට යන
  ගුරුවරුන්ට කීකරු වන
  සතුන්ට කරුණා දක්වන
  හොඳ ළමයෙක් මං
  හොඳ ළමයෙක් මං
- පොත්පත්වලින් සොයාගත් මෙවැනි වෙනත් කවි, ගී ද සිසුන් සමඟ ගායනා කරන්න.
  *උදා* : * සිරිත් මල්දමෙහි කවි
  * මගේ සිත තැන්පත් ය . . . ගීතය
- ඒ සඳහා උචිත අයුරින් රංගන ඉදිරිපත් කිරීමට ද සිසුන් යොමු කරන්න.
- කවි, ගී ගායනා කර ඒවායෙහි දැක්වෙන යහපත් පුරුදු පිළිබඳ සිසුන් සමඟ කතාබහ කරන්න.
- පන්ති පුරුද්දක් වශයෙන් සෑම දිනකම යම් සුදුසු අවස්ථාවක දී මෙවැනි කවියක් ගායනා කර එහි දැක්වෙන යහ පුරුදු පවත්වා ගැනීමට සිසුන්ගේ සිත් තුළ අධිෂ්ඨාන ඇති කරවන්න.

**ක්‍රියාකාරකම 5 :**

- යහ පුරුදු ප්‍රදර්ශනය වන චිත්‍ර සහ පෝස්ටර් නිර්මාණය සඳහා පහත දැක්වෙන ක්‍රියාකාරකම්වල නියැළීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- තමා හොඳ ළමයෙක් නම් අත් ඔසවන ලෙස සිසුන්ට පවසන්න.
- ඔවුන් හොඳ වූයේ ඇයි දැයි යන්නට හේතු එක් එක් සිසුවාගෙන් විමසන්න.
- ඔවුන් පවසන දේ අගයන්න.
- ඔවුන් විසින් ප්‍රකාශ කළ හොඳ පුරුදු චිත්‍රයට නැගීමට අවස්ථාව ලබා දෙන්න.
- යහපත්/හොඳ පුරුදු දැක්වෙන රූප, චිත්‍ර, පත්තර, සඟරාවලින් සොයාගෙන එන ලෙස සිසුන්ට පවසන්න.

*උදා :* * යහළුවන්ට උදවු කිරීම
* පාසල, පන්තිය, නිවස පිරිසිදුව හා අලංකාරව පවත්වා ගැනීම
* සතුන්ට ආදරය, කරුණාව දැක්වීම
* සහයෝගයෙන් කටයුතු කිරීම
* වැඩිහිටියන්ට සැලකීම
* උදෑසන අවදිවීම, . . . වැනි දේ දැක්වෙන රූප

- සිසුන් කණ්ඩායම් කරන්න.
- සෑම සිසු කණ්ඩායමකටම බ්‍රිස්ල් බෝඩ් එක බැගින් ලබා දී තම කණ්ඩායම සතු පින්තූර යොදා ගෙන 'හොඳ පුරුදු පුරුදු වෙමු' යන මැයෙන් පෝස්ටරයක් නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඒවායෙහි දැක්වෙන හොඳ පුරුදු පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.
- පෝස්ටර් පන්ති කාමරයේ ප්‍රදර්ශනය කරන්න. අගය කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- අවශ්‍ය අවස්ථාවල දී නායකත්වය ගෙන කටයුතු කිරීමේ වැදගත්කම මතුකර දැක්වීම සඳහා සිසුන්ට කතන්දර ඉදිරිපත් කරන්න.
  *උදා :* උගුලකට හසු වූ වටු කුරුල්ලන්ගේ කතාව
- යම් අයෙකු නායකයකු ලෙස පත්කර ගනු ලබන්නේ බුද්ධිමත් බව හා කණ්ඩායමට දක්වන ආදරය මත බව සිසුන්ට පහදා දෙන්න. සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ගුරුවරයා විසින් යම් සිසුවෙකු නායකයකු ලෙස පත් කරන්න.
- නායකයා අත වැනීම, උඩ පැනීම, ගී ගැයීම, තාරාවෙකු මෙන් යාම වැනි ක්‍රියාකාරකම්වල නිරත විය යුතු බවට උපදෙස් දෙන්න.
- නායකයා විසින් කරන දෙය අනෙක් සිසුන් විසින් අනුකරණය කළ යුතු ය. නම් කරන ලද නායකයා විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම් නැවැත්විය යුත්තේ ගුරුවරයා විසින් ලබා දෙන සංඥාවකට අනුව ය.
- මේ ආකාරයට අනෙක් සිසුන්ට ද නායකයා ලෙස හැසිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මෙය විනෝදාත්මක ක්‍රියාකාරකමක් ලෙස සිදු කිරීමට කටයුතු කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- පන්ති කාමරයේ හා පාසලේ එදිනෙදා කටයුතු පහසු කරලීම සඳහා පනවා ඇති නීතිරීති කිහිපයක් පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  *උදා :* * පාසලේ ප්‍රධාන සීනුවට අවශ්‍ය විට දී අවනත වීම
  * පන්තියෙන් පිටතට යාමේ දී අවසර සහිතව යාම
  * සිසුන් පන්තියෙන් පිටතට යාමේ දී පේළියට යාම
- නීතිරීති පිළිපැදීමෙන් සිසුන්ට සිදුවන පහසුව හා වාසිය පිළිබඳව කතා කරන්න.
- නීතිරීති නොපිළිපැදීමෙන් සිසුන්ට සිදුවන අපහසුතා පිළිබඳව කතා කරන්න.
- ඒ අනුව පාසලේ හා පන්තියේ නීතිරීතිවලට අවනතව කටයුතු කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කරන්න.


**ක්‍රියාකාරකම 8 :**

- තම මිතුරන්ගේ ගුණාංග අගය කිරීම සඳහා සිසුන් තුළ පුරුද්දක් ඇති කර ගන්න. ඒ සඳහා පහත සඳහන් ක්‍රියාකාරකමේ නිරත වීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සෑම සිසුවෙකුටම වර්ණවත් කඩදාසි රවුමක් බැගින් ලබා දෙන්න.

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- පන්තියේ කිසිවෙකුට කරදර නොකරන, තමා කැමතිම යහළුවෙකු සොයා තමා සතු රවුම එම සිසුවාට ලබා දෙන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
- පසුව එක් එක් සිසුවාට ලැබී ඇති රවුම් පිළිබඳ විමසා බලන්න.
- වැඩිම රවුම් ප්‍රමාණයක් ලද සිසුවා ඉදිරියට කැඳවන්න.
- එම සිසුවාට බොහෝ සිසුන් කැමති ඇයි දැයි සිසුන්ගෙන් විමසන්න.
- ඔහුගේ/ඇයගේ හොඳ ගුණ අගය කරන්න.
- සිසුන් විසින් පවසන ඔහුට/ඇයට කලින් සකස් කරගත් ඔටුන්නක් පළඳවන්න.  අනෙක් සිසුන් ලවා අත්පොළසන් දීමෙන් එම සිසුවා ඇගයීමට ලක් කරන්න.
- මේ ආකාරයට එදිනෙදා පන්ති කාමරයේ දී සිසුන් සිදුකරන හොඳ දේ අගය කර ඔවුන් ඇගයීමට ලක් කරමින් හොඳ වැඩ කිරීමට ඔවුන් දිරිමත් කරන්න.

**ක්‍රියාකාරකම 9 :**

- අපට තනිව කිරීමට අපහසු දේ ඉටු කර ගැනීමේ දී තවත් අයෙකුගේ සහය ලබා ගැනීමේ වැදගත්කම පිළිබඳව සිසුන් සමඟ කතා කරන්න.
- එහිදී පහත සඳහන් කරුණු අවධාරණය කරන්න.
  - * ඉක්මණින් කළ හැකි වීම
  - * වෙහෙස අඩු වීම
  - * තනිව කාර්යයන් කිරීමට වඩා අන් අය සමඟ කාර්යයන් කිරීමේ සතුටක් ඇතිවීම
- පන්තියේ සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න.
- සෑම යුගලයකම සිසුන් දෙදෙනා A හා B ලෙස නම් කරන්න.
- රූප සටහනේ දැක්වෙන ආකාරයට රේඛා තුනක් සලකුණු කරන්න.




- පළමු රේඛාව මත A හිමි සිසුන් සිටුවන්න.  දෙවන රේඛාව මත B හිමි සිසුන් සිටුවන්න.
- A හිමි  සෑම සිසුවෙකුටම 30$cm$ පමණ දිග ප්ලාස්ටික් බට කැබැල්ලක් හෝ වෙනත් සුදුසු දෙයක්ලබා දෙන්න. (ක්‍රීඩාව සිදුකිරීමේ දී සිසුන්ගේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වන්න.
- ගුරුතුමිය විසින් ලබාදෙන විධානයකට අනුව A හිමි සිසුන් දුවගොස් B කණ්ඩායමේ තම සාමාජිකයාට බට කැබැල්ල ලබාදිය යුතු ය.  ඉන්පසු B කණ්ඩායමේ සිසුන් අවසන් රේඛාව දක්වා දිව යා යුතු ය.
- මුලින් ම රේඛාව වෙත ළඟා වන සිසුන් හට ජය හිමි වේ.

## 11. තේමාව : අපට ඕනෑ දේ ලැබෙන හැටි

**නිපුණතාව** :
- අවශ්‍ය අවස්ථාවල දී අපට උදවු ලබාදෙන අය හඳුනාගෙන ඔවුන් කෙරෙහි යහපත් ආකල්පයකින් කටයුතු කරයි.
- වෙළඳපොළක ස්වභාවය හා ක්‍රියාකාරීත්වය හඳුනාගෙන වාර්තා කරයි.
- තමාට ලැබුණු දේ අන්‍යයන් සමඟ බෙදා හදා ගැනීමේ යහපුරුදු පවත්වා ගෙන යාමට ක්‍රියා කරයි.
- අපට අවශ්‍ය සමහර දෑ අපටම නිෂ්පාදනය කරගත හැකි බව අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.
- එදිනෙදා ද්‍රව්‍ය ඇසුරෙන් විවිධ නිර්මාණවල යෙදෙයි.
- ශාරීරික යෝග්‍යතා වර්ධනය සඳහා අවශ්‍ය ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- අපට ඕනෑ දේ ලැබෙන ස්ථානවලින් සිදු කරන කාර්යයන් වින්දනාත්මක ව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- දෙමාපියන්, වැඩිහිටියන්, ගුරුවරුන් සහ මිතුරන් අපට උදවු කරන ආකාර ප්‍රකාශ කරයි.
- අපගේ අවශ්‍යතා ඉටු කරන දෙමව්පියන්, වැඩිහිටියන්, ගුරුවරුන්ගෙන් සහ මිතුරන්ගෙන් ඉටුවන සේවය පිළිබඳ යහපත් ආකල්පයකින් ක්‍රියා කරයි.
- වෙළඳ පොළක ක්‍රියාකාරීත්වය පිළිබඳ සිය අත්දැකීම් විස්තර කරයි.
- තමාට ලැබෙන දේ අන්‍යයන් සමඟ බෙදාහදා ගනියි.
- තමාට ලැබෙන දේ අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කරයි.
- එදිනෙදා ආහාර සඳහා අපටම නිෂ්පාදනය කර ගැනීමට හැකි දේ ගෙවත්තේ වගා කිරීමට දායක වෙයි.
- ස්වාභාවික පරිසරයෙන් සපයා ගත හැකි ද්‍රව්‍ය යොදා ගෙන සකස් කරගත් වර්ණ භාවිත කරමින් නිර්මාණ කරයි.
- විවිධ ද්‍රව්‍ය යොදා ගනිමින් ශාරීරික නම්‍යතාව වර්ධනයට කටයුතු කරයි.
- එදිනෙදා අවශ්‍යතාවලට සම්බන්ධ ස්ථාන හා පුද්ගලයින් ආශ්‍රිත කවි, ගීත, රංගන ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- අපට උදවු කරන විවිධ පුද්ගලයින් හා ඔවුන් කරන උදවු පිළිබඳ පහත කරුණු මතු කරමින් සාකච්ඡා කරන්න.
  - * අපට උදවු කරන අය කවුරුන් දැයි සිසුන් සමඟ සාකච්ඡා කරන්න.(දෙමවුපියන්, ගුරුවරුන්, නෑදෑයින්, සහෝදර සහෝදරියන්, මිත්‍රයින්)
- තමන්ට උදවු ලබා දුන් කෙනෙකු ගැන හා ලබා දුන් උදවු පිළිබඳ අදහස් ප්‍රකාශ කිරීමට සෑම සිසුවෙකුටම අවස්ථාව ලබා දෙන්න.
- මෙම සාකච්ඡාව ඇසුරෙන් අප එදිනෙදා ජීවත්වීමේ දී අන් අයගේ උදවු අවශ්‍ය බවත්, තමන් ද අන් අයට හැකි පරිදි උදවු කළ යුතු බවත් අවධාරණය කරන්න.
- උදවු ලබා ගැනීමේ අයුරු හා එසේ ගැනීමේ වැදගත්කම සිසුන්ට පැහැදිලි කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- නිවසට වෙළඳපොළෙන් මිලදී ගෙන එන විවිධ භාණ්ඩවල ලේබල් සහ ඇසුරුම් කිහිපයක් සිසුන් ලවා පන්ති කාමරයට රැස්කරවා ගන්න.
- ඒවා ඇසුරින් අපට එදිනෙදා අවශ්‍ය දේවලින් සමහර දේ වෙළඳ පොළෙන් ලබා ගැනීමට සිදුවන බව සිසුන්ට සාකච්ඡාවක් ඇසුරෙන් පැහැදිලි කරන්න.

- අප එදිනෙදා පරිහරණය කරන ද්‍රව්‍ය හා භාණ්ඩවල පින්තූර (*උදා* : ආහාර පාන, කුළුබඩු, එළවළු, පලතුරු, දත් බෙහෙත්, සබන් වැනි . . .) කපා කාඩ්බෝඩ්වල අලවා කලින් සකස් කරගන්න.
- සිසුන් කණ්ඩායම් 2කට බෙදා රතු හා කොළ පාට දෙකකින් යුතු පෙට්ටි දෙකක් සූදානම් කර, කඩෙන් මිලදී ගන්න ද්‍රව්‍ය රතුපාට හා ගෙවත්තෙන් ලබා ගත හැකි ද්‍රව්‍ය කොළපාට වශයෙන් ද්‍රව්‍ය තෝරා දැමීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- ඉන්පසු බහාලූ පෙට්ටි දෙකේ ඇති ද්‍රව්‍ය දැමීම නිවැරදි දැයි සොයා බලන්න.
- මෙම ක්‍රියාකාරකම ඇසුරෙන් ගෙවත්තේ හා නිවසේ ම නිපදවා ගත හැකි දේ පිළිබඳ සිසුන් සමග සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 3**

- තම ගෙවත්තේ වගා කළ හැකි දේ සාදා ගැනීමට දෙමාපියන්ට උදවු කිරීමේ වැදගත්කම සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
- සෑම සිසුවකුටම කුඩා පෝච්චියක් හෝ සුදුසු බඳුනක හෝ පාසල් භූමියේ සකස් කරගත් ස්ථානයක (පොහොර/පස් සහිත) පැල රෝපණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. තමන්ගේ නම හා පන්තිය පෝච්චියේ/ස්ථානයේ සුදුසු පරිදි ලියා අලවන්න.
- මිරිස්, බටු, තක්කාලි, බණ්ඩක්කා වැනි ගෙවත්තේ වගා කළ හැකි එළවළු ඇට වර්ග හෝ ගොටුකොළ, මුකුණුවැන්න වැනි පැළ ගෙන්වා ගෙන සිසුන් ලවා පෝච්චිවල පැළ කරවන්න.
- දිනපතා ගස්වලට වතුර දමා, අවශ්‍ය පරිදි පොහොර දමා සාත්තු කිරීමට යොමු කරන්න.
- ගස් වැඩෙන ආකාරය සතියෙන් සතිය ඒවායේ වර්ධනය නිරීක්ෂණය කර වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- එදිනෙදා අවශ්‍ය දේ ගෙවත්තේ වගා කර ගැනීමෙන් අපට ලැබෙන වාසි පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (*උදා* : පිරිසිදු බව, මුදල් ඉතිරි වන බව, නැවුම් බව)
- මේ ඇසුරෙන් එදිනෙදා ආහාර සඳහා පිරිසිදු, නැවුම් දේ අපට නිවසේම වගා කිරීමට හැකි බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 4**

- ප්‍රදේශයේ පැවැත්වෙන වෙළඳපොළක සජීවී අත්දැකීම් ලබා ගැනීම සඳහා සිසුන් සමඟ චාරිකාවක යෙදෙන්න.
- එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි සිසු අවධානයට යොමු කරන්න.
  - * වෙළඳපොළෙහි විකිණීමට ඇති භාණ්ඩ
  - * ඒවා විකිණීම සඳහා තබා ඇති අයුරු
  - * භාණ්ඩ මිළදී ගන්නන් හැසිරෙන ආකාර
  - * වෙළඳපොළේ විවිධ ද්‍රව්‍ය අසුරා ඇති ආකාර . . . ආදී වශයෙන්
- සිසුන් ලබාගත් සජීවි අත්දැකීම් ඇසුරෙන් ඔවුන්ට දැණුනු, හැගුණු දේ පන්ති කාමරය තුළ වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පාසල් භූමිය තුළ ආදර්ශ පොළක් පවත්වා සිසුන් ලබාගත් අත්දැකීම් තවදුරටත් තහවුරු කිරීමට කටයුතු කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- සිසුන් පසුගිය කාලය තුළ භාවිත කර ඉවතලන දේ පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. (*උදා* : සෙල්ලම් බඩු, වතුර බෝතල්, පැන්සල් උල් කරන උපකරණ, . . . වැනි)
- එම ද්‍රව්‍ය ඉවතලීමට හේතු පිළිබඳව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා* : * සෙල්ලම් බඩු - කැඩී බිඳී යාම

  * වතුර බෝතල් - බිඳී යාම . . . වැනි
- මෙවැනි දේවලින් උපරිම ප්‍රයෝජනයක් නොගෙන ඉවතලීම නිසා අපට අත්වන අවාසි පිළිබඳව මෙම සාකච්ඡාවේ දී සිසුන් දැනුවත් කරන්න.

- එසේම පරිහරණය කරන දෑ නිවැරදිව හා ආරක්ෂාකාරීව, පරිහරණය කිරීමේ වැදගත්කම ද සිසුන්ට අවධාරණය කරන්න.

  *උදා* : - පැන්සල - අතින් ඇල්ලීමට හැකි උපරිමය දක්වා පාවිච්චි කිරීම

  - තමා සතු ව පොත්පත්, වතුර බෝතල්, පාසල් බෑග්, සපත්තු, මකන, කතුරු ආදිය නාස්තියෙන් තොරව උපරිම අයුරින් පරිහරණය කිරීම, . . . වැනි කරුණු
- අරපිරිමැස්මෙන් යුතුව කටයුතු කිරීමට පෙළඹීමක් ඇතිවන අයුරින් තම තමන් පරිහරණය කරන දෑ අරපිරිමැස්මෙන් යුතු ව පරිහරණය කරන සිසුන් ඇගයීමට ලක් කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- බෙදා හදා ගැනීමේ ගුණයේ (පරිත්‍යාගශීලීත්වය) වැදගත්කම හා ඉන් තමාට අත්වන සතුට පිළිබඳව සිසුන් සමග කතාබහ කරන්න.
- මෙම කතාබහේ දී තමාට අවශ්‍ය කරන දේවල් සමහර අවස්ථාවල දී අන් අයගෙන් ද ලබාගැනීමට සිදුවන බවත්, අන් අයගේ අවශ්‍යතාවල දී අප විසින් ද බෙදාහදා ගෙන උදවු කිරීමේ අවශ්‍යතාවත්, එහි වැදගත්කමත් සිසුන්ට අවධාරණය කරන්න.
- තමා සතු දේ තම මිතුරන් සමඟ බෙදාහදා ගනිමින් කටයුතු කළ හැකි අයුරු පිළිබඳව සිසුන් සමඟ සාකච්ඡා කරන්න. (*උදා:*පැන්සලක් නැති සිසුවෙකුට තමා සතුව ඇති පැන්සලක් ලබා දීම)
- අන් අයට දෙන සෑම දෙයක් ම සතුටින් දීමත්, හැකි සෑම විට ම අන් අයට උපකාර කිරීමත් අප විසින් පවත්වා ගත යුතු යහපත් ගුණාංග බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 7 :**

- ස්වාභාවික ව වර්ණ නිපදවා ගත හැකි දේ පිළිබඳ සිසුන් සමග සාකච්ඡාවක් කරන්න.

  *උදා* : * ගඩොල් කුඩු * අඟුරු * නිල් කටරොල් මල්,
  * වදමල් * බීට්රූට්
- ඒවායේ කුඩු හෝ ඉස්ම හෝ යොදා ගෙන වර්ණ සකස් කරගත හැකි ආකාර අත්හදා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම වර්ණ යොදා ගනිමින් හබරල, බණ්ඩක්කා, කෙසෙල් පිත්ත ආදිය ආශ්‍රයෙන් මෝස්තර නිර්මාණය කිරීමට සිසුන් යොමු කරවන්න. සිසු නිර්මාණ ඇගයීමට ලක්කරන්න.

**ක්‍රියාකාරකම 8 :**

- ශරීරයේ නම්‍යශීලීභාවය පවත්වා ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදාගත හැකි ද්‍රව්‍ය කිහිපයක් රැස්කර ගන්න.

  *උදා* : බෝල, වළලු, ඇටමලු, ටයර්, පැනීමට සුදුසු ලණුවක් , . . . වැනි දේ
- මේවා යොදා ගනිමින් සිදු කළ හැකි චාලක ක්‍රියා සැලසුම් කරන්න. *උදා* : බෝල/වළලු විසි කිරීම හා ඇල්ලීම, ලණු පැනීම, ටයර් ඇතුලෙන් රිංගා යාම, . . . වැනි

**ක්‍රියාකාරකම 9 :**

- වෙළඳ පොළක් හෝ අප භාණ්ඩ මිලදී ගන්නා ඕනෑම ස්ථානයක හෝ අත්දැකීම් ඇසුරෙන් චරිතාරෝපිත රංගනයක් (අනුකරණාත්මක) ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා* : වෙළෙන්දෙක්/භාණ්ඩ මිලදී ගන්නා අයෙක් . . . වැනි
- පහත දැක්වෙන ආකාරයේ ගීතවලට රංගන ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  - එළවළු අම්මා අපේ ගෙදරට එන්නා //<br>අපිට කන්න හොඳ හොඳ දේ අරගෙන එන්නා //<br>ගෝවා, බෝංචි වට්ටක්කා<br>බීට්රූට් බණ්ඩක්කා<br>රස ගුණ පිරි හොඳ එළවළු අරගෙන එන්නා
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් ඇගයීමට ලක්කරන්න.

## 12. තේමාව : ගමන් බිමන්

**නිපුණතාව** :
- ගමන්බිමන්වල දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- පොදු ගමනාගමන සේවා පිළිබඳ දැනුවත් වෙමින් ඒවා ආරක්ෂා කිරීමට කටයුතු කරයි.
- ගමන් බිමන් යාමේ දී විය හැකි බාධක හා අනතුරු පිළිබඳ විමසිලිමත් ව ඒවායින් ආරක්ෂා වීමට කටයුතු කරයි.
- ගමන් බිමන්වල දී අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.
- ගමනාගමන ක්‍රම විවිධ මාධ්‍ය මගින් නිර්මාණය කරයි.
- ගමන් කිරීම හා සම්බන්ධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- විවිධ ගමන් විලාස ඇසුරෙන් නිර්මාණාත්මක රංගන ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- ඇවිදීමේ දී නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- සිටගැනීම හා සම්බන්ධ නිවැරදි ඉරියව් පවත්වා ගනියි.
- වාඩිවීම හා සම්බන්ධ නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි.
- දිය, ගොඩ, අහසේ ගමන් කරන වාහන නම් කරයි.
- දිය, ගොඩ, අහසේ ගමන් කරන වාහනවල වෙනස්කම් ප්‍රකාශ කරයි.
- පයින් ගමන් කිරීමේ දී සිදුවන බාධක අනතුරු කෙරෙහි විමසිලිමත් ව තම ආරක්ෂාව සලසා ගනියි.
- ගමන් බිමන්වල දී අන්‍යයන්ට ලබාදිය හැකි උදවු හඳුනා ගනිමින්, අවශ්‍ය අයට උදවු කරයි.
- ගමන්බිමන්වල දී අන්‍යයන්ගෙන් තමාට ලැබෙන උදවුවලට යහපත් ප්‍රතිචාර දක්වයි.
- ගමනාගමනය සඳහා යොදාගන්නා ක්‍රම විදහා දැක්වෙන චිත්‍ර හා ආකෘති නිර්මාණය කරයි.
- සමබරතාවය රැක ගනිමින් නිවැරදි ව ඉරියව් පවත්වා ගනියි.
- විවිධ ගමන් විලාස අනුකරණය ඇසුරින් වින්දනයක් ලබයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- අප එදිනෙදා කටයුතු කිරීමේ දී ප්‍රදර්ශනය කරන විවිධ ඉරියව් පිළිබඳ සිසුන් සමග කතාබහ කරන්න. එවැනි ඉරියව් නිරීක්ෂණය සඳහා චාරිකාවක් සංවිධානය කරන්න.
- මෙම ඉරියව් නිරීක්ෂණය සඳහා සුදුසු ස්ථාන හඳුනා ගන්න.

  *උදා* : - අසල පන්ති කාමරයක්
  - මිනිසුන් එහා මෙහා ගමන් කරන මහා මාර්ගය
- එම චාරිකාවේ දී පහත සඳහන් ඉරියව් නිරීක්ෂණයට අවධානය යොමු කරන්න.

  *උදා* : - ඉඳගැනීමේ විවිධ ඉරියව්
  - සිටගැනීමේ විවිධ ඉරියව්
  - බරක් එසවීමේ දී හා බරක් රැගෙන යාමේ විවිධ ඉරියව්
- මෙම නිරීක්ෂණවල දී ඉඳගැනීමේ දී පෙන්වන විවිධ ඉරියව් නිරීක්ෂණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

  *උදා* : * පුටුවක, බංකුවක වාඩිවී සිටින අයුරු,
  * පොත් බෑගය පුටුව මත තබා පුටුවේ අඩක පමණක් වාඩි වී සිටින අයුරු ... වැනි ඉරියව්
- වාඩිවීම පිළිබඳ සමාජයේ පවතින සිරිත් විරිත් හඳුනාගෙන ඒ පිළිබඳ ව සිසුන් සමඟ කතා කරන්න.

  *උදා* : * සමහර අවස්ථාවල දී වැඩිහිටියන් සිටගෙන සිටින විට තමා වාඩි වී සිටීම නුසුදුසු බව
  * පූජකවරයෙකු, ගුරුවරයෙකු දුටු විට හුනස්නෙන් නැගිර ආචාර කිරීම, ඉඩ දීම කළ යුතු බව

- වාඩිවීමේ වැරදි ඉරියව් නිසා ඇතිවන ශාරීරික අපහසුතා, සිදුවිය හැකි ආබාධ පිළිබඳ ව කතාබහ කරන්න. ඒ අනුව නිවැරදි ඉරියව්වලින් වාඩිවීමේ වැදගත්කම අවධාරණය කරන්න.
- නිවැරදිව වාඩිවීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.

  *උදා :* * පුටුවේ පාද හතර මත නිවැරදිව වාඩි වීම
  * පුටුව මතට පාද නොගැනීම
  * ඉදිරි අසුනට පහ නොතැබීම
  * අන් අයට ආරක්ෂාකාරී ව වාඩිවීමට අවශ්‍ය උදව් ලබා දීම
- වාඩිවීමේ නිවැරදි ඉරියව් කෙසේ ද යන්න හඳුනා ගෙන ඒවා ආදර්ශනයට සිසුන් යොමු කරන්න.
- එසේම වාඩිවීමේ දී තම පාද, ඇඳුම් පැළඳුම් ද සකස් කර ගනිමින් විනීත ඉරියව් සහිතව වාඩිවිය යුතු බව ද සිසුන්ට පැහැදිලි කරන්න.
- මෙම නිරීක්‍ෂණ චාරිකාවේ දී සිටගැනීමේ ඉරියව් ද නිරීක්ෂණයට සිසුන්ව යොමු කරන්න. වැරදි හා නිවැරදි ව සිටගැනීමේ ඉරියව් සිසුන් ලවා ආදර්ශනය කරමින් නිවැරදිව සිටගැනීමේ ඉරියව් පවත්වා ගැනීමේ වැදගත්කම කතාබහ කරන්න.
- ඉහත සඳහන් වැරදි හා නිවැරදි ඉරියව් පිළිබඳ ව පෝස්ටර් චිත්‍ර නිර්මාණය කිරීමට සිසුන්ට අවස්ථාව දෙන්න.
- ඒවා අගය කරන්න.
- පන්ති කාමරයේ දී මෙම ඉරියව් නිතිපතා පවත්වාගෙන යෑම කෙරෙහි ද සිසුන් දිරිමත් කරන්න.


**ක්‍රියාකාරකම 2 :**

- ඇවිදීමේ ක්‍රියාකාරකම් හුරුව සඳහා සෙල්ලම් මිදුලට හෝ වෙනත් පහසුකම් සහිත ස්ථානයකට සිසුන්ව කැටුව යන්න. ඇවිදීම සම්බන්ධ පහත සඳහන් ක්‍රියාකාරකම්වල සිසුන්ව යොදවන්න.

  *උදා :* - නිදහසේ ඇවිදීම, (සෙමෙන්/වේගයෙන්)
  - රේඛාවක් දිගේ ඇවිදීම (වේගයෙන්/සෙමෙන්)
  - වමට/දකුණට හැරී ඇවිදීම (වේගයෙන්/සෙමෙන්)
  - පාද ළඟින් තබමින් ඇවිදීම
  - පාද ඈතින් තබමින් ඇවිදීම
  - එක් සිසුවකු පිටුපසින් තවත් සිසුවකු උරහිස්වලින් අල්ලාගෙන කෝච්චියක් සේ ඇවිදීම
  - දෑත් දෙපසට විහිදුවා ඇවිදීම
  - යම් බරක් (*උදා :* පොතක්) හිසමත තබාගෙන, අතින් එල්ලාගෙන, කරෙහි එල්ලාගෙන ඇවිදීම ආදී වශයෙන් විවිධ ඇවිදීම් අවස්ථාවල යෙදීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- පන්තියේ සිසුන් සමාන කණ්ඩායම් දෙකකට වෙන් කරන්න. එම කණ්ඩායම් දෙක A හා B වශයෙන් නම් කරන්න.
- අනතුරුව එළිමහනේ ඉඩ ඇති ස්ථානයක පහත රූප සටහනේ දැක්වෙන පරිදි රේඛා තුනක් ඇඳගන්න.




- "A" හිමි සියලු සිසුන් අංක 01 රේඛාව මත සිටුවන්න. 'B' හිමි සියලු සිසුන් අංක 02 රේඛාව මත පේළියට සිටුවන්න.
- අංක 1 පේළියේ සියලු සිසුන්ට පොතක්/බෝංචි මල්ලක් . . . වැනි දෙයක් බැගින් ලබා දෙන්න.
- ගුරුතුමිය දෙන සංඥාවකට අනුව ඔවුන් තම හිස මත පොත/බෝංචි මල්ල තබාගෙන (දෑතින් නොඅල්ලා) සමබරතාවය රැකගනිමින් අංක 2 රේඛාවේ තමාට සමාන්තර ව සිටින සිසුවා දක්වා ගොස් පොත/බෝංචි මල්ල ලබාදිය යුතු වේ.
- පසුව අංක 2 රේඛාවේ සිසුන් එම පොත හිස මත තබාගෙන තරගය අවසන් කරන රේඛාව දක්වා ගමන් කළ යුතු වේ.

- යම් සිසුවකුගේ පොත අතරමග දී බිම වැටුණහොත් නැවත ආරම්භක රේඛාවේ සිට තරගය ආරම්භ කළ යුතු ය.
- ඉක්මණින්, නිවැරදිව තරගය අවසන් කළ සිසු යුගලයන් අගය කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- සිසුන් සෙල්ලම් කිරීම සඳහා යොදා ගන්නා විවිධ වාහනවලට අදාළ සෙල්ලම් බඩු පන්තියට රැස්කර ගන්න.
- ඒවා යොදා ගනිමින් සෙල්ලම් කිරීමට සිසුන්ව යොමු කරන්න.
- එම සෙල්ලම් බඩු පිළිබඳ ව සාකච්ඡා කරමින් ඒවා උචිත අයුරින් වෙන් කිරීමට යොමු කරන්න.
  *උදා* : - ගොඩබිම ගමන් කරන වාහන
  - ජලයෙහි ගමන් කරන වාහන
  - අහසේ ගමන් කරන වාහන
- මෙම එක් එක් වාහනවල සුවිශේෂ වෙනස්කම් පිළිබඳ ව නිරීක්ෂණය කිරීමට සිසුන් යොමු කරන්න.
  *උදා* : - රෝද තිබේ ද ? තිබේ නම් ඒවා කීය ද ?
  - රෝදවල ප්‍රමාණය, රෝදවල හැඩය, රෝදවල හැඩය වෙනස් කළ විට ගමන් කිරීමට හැකි ද ?
  - වාහනවල හැඩවල වෙනස්කම් තිබේ ද ?
  - ගමන් කරන ස්ථාන අනුව හැඩයේ වෙනස්කම් පවතී ද ?
    (*උදා* : කුඹුරුවල, අහසේ, රේල්පීලිවල ගමන් කරන වාහන)
  - මෙම වාහනවල ගෙන යන දේවල් මොනවා ද ? ආදී වශයෙන් මේවා පිළිබඳ වෙනස්කම් සොයා බලන්න.
- සිසුන්ට එළිමහනේ ඉඩ ඇති ස්ථානයට ගෙන යන්න.
- ගොඩබිම, ජලයේ හා අහසේ ගමන් කරන වාහනයක් ලෙස එක් එක් සිසුවාට තමාට කැමති පරිදි හැසිරීමට ඉඩ දෙන්න. පන්තියේ සියලුම සිසුන්ට විවිධ වාහන පිළිබඳ අත්දැකීම් ලැබෙන පරිදි ගුරුතුමිය විසින් නම් කරන වාහන ආකාරයට ද ගමන් කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසුන් කැමති වාහන චිත්‍රවලට නැගීමට ද සිසුන්ට අවස්ථාව දෙන්න. ඒවා පන්තියේ ප්‍රදර්ශනය කරන්න. ඒවා අගය කරන්න.
- විවිධ වාහනවල ආකෘති නිර්මාණය කර ඒවා ඇසුරින් ක්‍රීඩා කිරීමට ද සිසුන්ට අවස්ථාව සලසන්න.

**ක්‍රියාකාරකම 5 :**

- වාහන මෙන් ගමන් කරමින් වින්දනාත්මක ක්‍රීඩාවල නිරත වීමට සිසුන්ට අවස්ථාව සලසන්න.
- ඒ සඳහා පන්තියේ සිසුන් කණ්ඩායම් දෙකකට බෙදන්න.
- යම් ඉඩ ඇති ස්ථානයක් තෝරාගෙන එහි ක්‍රීඩා කිරීමට ඉඩ ප්‍රමාණවත් පරිදි සිටින සේ සිව් දෙසින් සීමා රේඛා හතරක් ලකුණු කර, එක් කණ්ඩායමක් කෝච්චියක් ලෙස පෙළට සිටින්නට සලස්වන්න. අනෙක් සිසුන්ට තමන් කැමති ස්ථානයක සිටීමට ඉඩ දෙන්න.
- කෝච්චියේ ඉදිරි සිසුවා නිදහස් ව සිටින සිසුන් ඇල්ලීමට සැරසෙන අතර ඔවුන් ඉන් බේරීමට දිවයනු ඇත. ඇල්ලීම කළේ නම් අල්ලනු ලැබූ සිසුවා ද කෝච්චිය අගට එකතු වේ.
- මේ අයුරින් සිසුන් අවසන් වන තුරු ක්‍රීඩාව සිදු කළ හැකි ය.
- මෙය සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරමින් ද කෝච්චි සංඛ්‍යාව වැඩි කරමින් ද සිදු කළ හැකි ය.
- යම් කාලයක් තුළ දී වැඩි සිසුන් සංඛ්‍යාවක් අල්ලාගත් කෝච්චිය ජය ගනී.

**ක්‍රියාකාරකම 6 :**

- සිරුරේ සමබරතාව රැකගැනීමට උදවුවන ආකාරයේ ක්‍රියාකාරකම්වල සිසුන් නිරත කරවන්න. මේ සඳහා පාපැදිවලින් ඉවත් කරන ලද ටයර්/රිම් ආදිය කිහිපයක් සපයා ගන්න.

- පන්තියේ සිසුන් ඉඩ ඇති ස්ථානයකට ගෙන ගොස් කණ්ඩායමකට සිසුන් 5ක් පමණ වන සේ කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න. අනතුරුව එක් කණ්ඩායමක සෑම සිසුවෙකුටම රෝදය බැගින් ලබා දී එම රෝද අතින් තල්ලු කරමින් සමබරතාවය රකිමින් තනිව නිදහසේ පෙරලාගෙන යාමට යොමු කරන්න.
- පන්තියේ සිසුන් සියලු දෙනාට අවස්ථාව ලැබෙන අයුරින් මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- අපගේ එදිනෙදා විවිධ අවශ්‍යතා සඳහා පයින් ගමන් කිරීමට සිදුවන බව සිසුන් සමග සාකච්ඡා කරන්න.
- එසේ පයින් ගමන් කිරීමේ දී සමහර විට විය හැකි බාධක හා අනතුරු පිළිබඳව ද මෙම සාකච්ඡාවේ දී අවධානය යොමු කරන්න.

  *උදා* : - මාර්ගයේ සතුන් සිටීම නිසා විය හැකි අනතුරු

  - පාර මාරුවීමේ දී විය හැකි අනතුරු . . . වැනි
- මෙවැනි බාධක අනතුරුවලට මුහුණ දුන් සිසුන් කිහිප දෙනෙකු හඳුනාගෙන ඔවුන්ට තමා මුහුණදුන් අත්දැකීම් පන්තියට ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- පයින් ගමන් කිරීමේ දී විය හැකි අනතුරු පිළිබඳව දැනුවත් කිරීම සඳහා සිසුන් එළිමහන් ස්ථානකට කැටුව යන්න.
- එම ස්ථානය විවිධ බාධක මතින් ගමන් කිරීමට සිදුවන අයුරින් සකසා ගන්න.

  *උදා* : * ජලය පිරුණු වලක්, ඒදණ්ඩක් උඩින් පැන යාමට සුදුසු ආකාරයේ ගල්/වැලි පිරවූ උර කීපයක් . . . වැනි
- එම බාධක ජය ගනිමින් සිසුන් සමග සකස් කරගත් මාර්ගයේ ආරක්ෂිතව ගමන් කරන්න.
- මෙවැනි බාධක හා අනතුරු නිසා ඇති විය හැකි පීඩා පිළිබඳ සිසුන් සමඟ සාකච්ඡා කරන්න.

  *උදා* : - ගමන සාර්ථක ව අවසන් කිරීමට නොහැකි වීම

  - ගමන අවහිර වීම - තුවාල සිදුවීම - ප්‍රතිකාර ගැනීමට සිදුවීම
- මේ අනුව ඇතිවන බාධක හා අනතුරුවලින් ආරක්ෂා වෙමින් ගමන්බිමන්වල යෙදීමට සිසු අවධානය යොමු කරන්න.

**ක්‍රියාකාරකම 8 :**

- ගමන් බිමන් යාමේ දී අප හට අන් අයගේ උදවු උපකාර අවශ්‍ය වන අවස්ථා මෙන් ම අන් අයට උදවු උපකාර කළ යුතු අවස්ථා ද ඇති බව සාකච්ඡාවක් ඇසුරින් සිසුන්ට පැහැදිලි කරන්න. එසේ නොමැති වුවහොත් නොයෙකුත් අපහසුතා විඳීමට සිදු වන බව ද පෙන්වා දෙන්න.
- අන් අයගෙන් උදවු ලබා ගැනීමට වඩා අන් අයට උදවු කිරීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
- ගමන් බිමන් යෑමේ දී අන් අයට කරදරයක් නොවන ලෙස අප ගමන් කළ යුතු බව ද මෙහිදී තවදුරටත් අවධාරණය කරන්න.
- ගමන් බිමන් යාම හා සම්බන්ධ පහත සඳහන් අනුකරණ ක්‍රියාකාරකම්වල සිසුන්ව යොදවන්න. ගමන් බිමන් යෑමේ දී අන් අයට කරදර බාධක රහිත ව ගමන් කරන අයුරු

  *උදා* : * නිශ්ශබ්ද ව ගමන් කිරීම

  * අන් අයට අවහිර නොවන සේ හැසිරීම ආදී වශයෙනි.
- ගමන් බිමන් යෑමේ දී අන් අයට උදවු කරන අවස්ථා

  *උදා* : * අවශ්‍යතා ඇති අයෙක් දුටු විට තම අසුන ප්‍රදානය කිරීම

  * පොදු වාහනවල ගමන් කිරීමේ දී බෑග්, පාර්සල් සහිතව සිටගෙන ගමන් කරන අයගේ කැමැත්ත මත එම බෑග්, පාර්සල් තමා භාරගෙන ආරක්ෂිත ව ආපසු දීම වැනි අවස්ථා යොදා ගන්න.
- ගමන් බිමන් යෑමේ දී අන් අයට උදවු කරන අයුරු දැක්වෙන චිත්‍ර නිර්මාණ කිරීමට සිසුන්ව යොමු කරන්න. සිසු නිර්මාණ අගය කරන්න.
- මිනිසුන් ගමන් කරන විවිධ ඉරියව් ප්‍රදර්ශනය වන භූමිකා රංගන ඉදිරිපත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

## 13. තේමාව : එළිය සමඟ සෙල්ලම්

**නිපුණතා** :
- ආලෝක ප්‍රභවයන්, ආලෝකය හා ඇස අතර ඇති සබඳතාව අධ්‍යයනය කරයි.
- ඇසේ ආරක්ෂාව පිළිබඳ සැලකිලිමත් වෙමින් දෛනික කටයුතුවල යෙදෙයි.
- ස්වාභාවිකව එළිය වෙනස්වීම් අනුව පරිසරයේ ඇති වන වෙනස්කම් සහ එළිය වෙනස් කළ හැකි අයුරු විමර්ශනය කර වාර්තා කරයි.
- අලංකරණය සඳහා ආලෝකය උපයෝගී කර ගනිමින් විවිධ නිර්මාණ කරයි.
- ස්වාභාවික ආලෝකයෙන් වන බලපෑම් පිළිබඳ විමසිලිමත් ව ඵලදායී අයුරින් ක්‍රීඩාවල යෙදෙයි.
- එළිය සමඟ සිදු කළ හැකි අභිනය මුල් කරගත් වින්දනාත්මක ප්‍රකාශන ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- යමක් දැකීම සඳහා ආලෝකය හා ඇසේ පෙනීමේ හැකියාව පරීක්ෂා කර වාර්තා කරයි.
- ඇසේ ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් වෙමින් ක්‍රියාකරයි.
- එළිය විහිදීමේ, අඩු කිරීමේ හා වැඩි කිරීමේ උපක්‍රම අත්හදා බලයි.
- අලංකරණය සඳහා ආලෝකය යොදා ගත හැකි සැරසිලි නිර්මාණය කරයි.
- සෙවණැලි පෑගීම ආශ්‍රිත ක්‍රීඩාවල නිරත වෙයි.
- සෙවණැලි මගින් විවිධ ආංගික චලන ඇති කිරීම සඳහා වින්දනාත්මක ව සහභාගි වෙයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- යමක් දැකීම සඳහා ආලෝකය හා ඇසේ පෙනීමේ අවශ්‍යතාව වැදගත් වන බව පෙන්වා දීම සඳහා සිසුන් පහත සඳහන් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- ලොකු කාඩ්බෝඩ් පෙට්ටියක් තුළට යමක් දමා පෙට්ටිය තුළට එළිය ඇතුළු නොවන සේ හොඳින් වසන්න.
- පෙට්ටියේ පැත්තකින් කුඩා සිදුරක් සාදා ඒ තුළින් පෙට්ටිය ඇතුලේ ඇති ද්‍රව්‍ය හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- පෙට්ටියේ ඇති ද්‍රව්‍ය හඳුනාගත හැකිවූයේ දැයි සිසුන්ගෙන් විමසන්න.
- ආලෝකය පෙට්ටිය තුළට ලැබෙන සේ වෙනත් සිදුරක් සාදා නැවත ඇතුලේ ඇති ද්‍රව්‍ය හඳුනාගැනීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසු අදහස් විමසන්න.
- මේ ආකාරයට ආලෝකය ලැබෙන සිදුර ක්‍රමයෙන් විශාල කරමින් ද්‍රව්‍ය දැකීමට අවස්ථාව ලබා දෙන්න. මේ සඳහා ක්‍රමයෙන් සිදුර විශාල ලෙස සැකසූ පෙට්ටි කිහිපයක් වුව ද යොදාගත හැකි ය.
- ආලෝකය හොඳින් ලැබෙන විට යමක් දැකීමේ හැකියාව වඩාත් හොඳින් ඇති බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සුදුපාට ඩිමයි කඩදාසියක් ලැල්ලේ අලවන්න. එයට විදුලි පන්දමක ආලෝකය වැටීමට සලස්වා ඒ මතට යම් ද්‍රව්‍යයක සෙවණැල්ල වැටීමට සලස්වන්න.
- විදුලි පන්දමේ ආලෝකය නිවා දමන්න. මේ අනුව සෙවණැල්ලට සිදුවූ දේ සිසුන්ගෙන් විමසන්න.
- පසුව එළිමහනේ හිරු එළිය වැටී ඇති තැනකට ගොස් තම සෙවණැල්ල නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.
- නැවත හිරු එළිය වැටී නැති සෙවණකට ගොස් තම සෙවණැල්ල තිබේදැයි නිරීක්ෂණයට යොමු කරන්න.
- මේ අනුව සෙවණැල්ලක් ඇතිවීම සඳහා ආලෝකය අවශ්‍ය බව ද, ආලෝකය නැති විටෙක සෙවණැල්ලක් ඇති නොවන බව ද හඳුනා ගැනීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- හොඳින් හිරු එළිය වැටෙන තැනක කණුවක් සිටුවා දවසේ අවස්ථා කිහිපයක දී සෙවණැල්ලේ කෙළවරෙහි පිහිටීම නිරීක්ෂණයට අවස්ථාව ලබා දෙන්න.
- කෙළවරෙහි පිහිටීම සලකුණු කිරීම සඳහා වර්ණවත් කොඩි කිහිපයක් යොදා ගන්න.
- ඒ අනුව විවිධ අවස්ථාවල දී හිරුගේ පිහිටීම අනුව සෙවණැල්ලේ ප්‍රමාණය වෙනස්වන බව අවබෝධ වීමට සලස්වන්න.

**ක්‍රියාකාරකම 4 :**

- ආලෝකය විවිධ ස්ථානවලට යොමු කළ හැකි ආකාරය අත්හදා බැලීමට පහත සඳහන් ක්‍රියාකාරකමෙහි සිසුන් නිරත කරවන්න.
- මේ සඳහා පහත දැක්වෙන ද්‍රව්‍ය රැස්කර ගන්න.
  කැඩපත්, ජල බඳුනක්, ආලෝකය පරාවර්තනය වන හා එසේ නොවන ද්‍රව්‍ය කීපයක් (*උදා* : ලෝහ වර්ග, දැව, ප්ලාස්ටික්, . . . වැනි),
- සිසුන් හිරු එළිය සහිත එළිමහන් ස්ථානයකට කැඳවාගෙන ගොස් එක් එක් ද්‍රව්‍ය මතට හිරුඑළිය වැටීමට සලස්වා, එම ආලෝකය වෙනත් තැනකට හරවා යැවීමට හැකිදැයි අත්හදා බැලීමට යොමු කරන්න.
- එමගින් ආලෝකය වෙනත් තැනකට හරවා යැවිය හැකි ද්‍රව්‍ය හඳුනා ගන්න. ඒ අතරින් වඩාත් ප්‍රබල ද්‍රව්‍යයක් ලෙස කැඩපත හඳුන්වා දෙන්න.
- අනතුරුව සිසුන්ට කැඩපත් ලබාදී ඔබ විසින් පෙන්වන ලද නිශ්චිත ස්ථානයකට, ලෝහ භාණ්ඩවලට, බේසමක ඇති ජලයට කැඩපත් එළිය වැටීමට සලස්වා සිදුවන දේ නිරීක්ෂණය කර වාර්තා කිරීමට අවස්ථාව ලබා දෙන්න. (සිසු ආරක්ෂාව කෙරෙහි සැලකිලිමත් වෙමින් මෙම ක්‍රියාකාරකම සිදු කළයුතු වේ. කැඩපතින් පරාවර්තනය වන ආලෝකය අනෙක් සිසුන්ගේ මුහුණු වෙත යොමු කිරීමෙන් වළකින ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.)
- සියලුම සිසුන්ගේ දර්පනවලින් පරාවර්තනය වන ආලෝකය එක තැනකට යොමු කිරීමට සලස්වා සිදුවන දේ නිරීක්ෂණය කිරීමට අවස්ථාව ලබා දෙන්න. ඒ අනුව සිදු වූ දේ පිළිබඳ සාකච්ඡා කරන්න.
- මේ ආකාරයටම ඉටිපන්දම් ආලෝකය, පොල්තෙල් පහනක ආලෝකය, විදුලි පන්දමක ආලෝකය පරාවර්තනය කළ හැකි දැයි සොයා බැලීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. සිසු අදහස් ප්‍රකාශ කිරීමට ද අවස්ථා සපයන්න.

**ක්‍රියාකාරකම 5 :**

- ස්වාභාවික හා කෘත්‍රිම එළි වර්ග පිළිබඳ සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා* :

| <u>ස්වාභාවික එළි</u> | <u>කෘත්‍රිම එළි</u> |
|---|---|
| හිරු එළිය | විදුලි පන්දම් එළිය |
| සඳ එළිය | භූමිතෙල් ලාම්පු එළිය |
| | ඉටිපන්දම් එළිය |

- එළිය අඩු වැඩි කිරීමට අවශ්‍යවන අවස්ථාවන් පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
  *උදා* : හිරු එළිය තදින් වැටෙන අවස්ථාවල දී සෙවණ ලබා ගැනීමට
  අඳුරේ එළිය මඳ අවස්ථාවක ආලෝකය වැඩි කර ගැනීමට
- ස්වාභාවික එළිය අඩු කිරීමටත්, කෘත්‍රිම එළිය අඩු වැඩි කිරීමටත් හැකි ආකාර පිළිබඳව අත්හදා බැලීමට සිසුන් යොමු කරන්න.
- මේ සඳහා එළිය අඩු වැඩි කළ හැකි ආකාරයේ පොල්තෙල් පහනක් යොදාගන්න. එහි එළිය අඩු වැඩි කළ හැකි ආකාරය පෙන්වා දෙන්න.
- මේ අයුරින් වෙනත් කෘත්‍රිම එළි අඩු වැඩි කළ හැකි අයුරු පරීක්ෂා කරමින් සාකච්ඡා කරන්න.
  *උදා* : - ලාම්පු ආවරණ යෙදීම මගින් එළිය අඩු කර ගැනීම
  - දොර රෙදි යෙදීම මගින් ආලෝකය පාලනය කිරීම
- ස්වාභාවික එළිය අඩු කිරීමට යොදාගත හැකි උපක්‍රම පිළිබඳව ද සිසුන් සමඟ සාකච්ඡා කරන්න.
  *උදා* : - වහල යෙදීම මගින් එළිය පාලනය කිරීම
  - පැළලි මගින්,
  - කුඩ මගින්
  - භෝග වගාවේ දී භාවිත කරන විවිධ ආවරණ

**ක්‍රියාකාරකම 6 :**

- සෙවණැලි පැගීම ආශ්‍රිත වින්දනාත්මක ක්‍රීඩාවල යෙදීමට සිසුන් යොමු කරන්න.
- පිටියේ යම් සීමාවක් වෙන්කර සිසුන් යුගල වශයෙන් බෙදන්න.
- සීමාව තුළ එක් සිසුවකු දුවන අතර එම සිසුවාගේ සෙවණැල්ල අනෙක් සිසුවාට පැගීමට උපදෙස් ලබා දෙන්න.
- සෙවණැල්ල පැගූ විට දෙදෙනා මාරු වී නැවත ක්‍රීඩාව කරගෙන යාමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- හිරු එළිය ඇති උදෑසනක එළිමහනේ දී තමන්ගේ සෙවණැල්ල දෙස බලාගෙන ශරීරයේ විවිධ කොටස් චලනය කිරීමට යොමු කරන්න.
- අනතුරුව සිසුන් දෙදෙනා බැගින් කණ්ඩායම් කරන්න. පෙර පරිදිම යුගලයේ එක් සිසුවෙක් තම සිරුර රිද්මයානුකූලව චලනය කිරීමට යොමු කර එම සිසුවාගේ සෙවණැල්ල අනෙක් සිසුවාට අනුකරණය කිරීමට යොමු කරන්න.
- මෙම ක්‍රියාකාරකම සිසු යුගලය මාරු වෙමින් ද සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න.
- මේ ආකාරයටම සිසුන් කුඩා කණ්ඩායමක් ලෙස සකස් කර කණ්ඩායමේ එක් සිසුවෙක් ඉදිරියෙන් සිටීමට සලස්වන්න. එම සිසුවාගේ චලනය දෙස බලමින් එම සෙවණැල්ලේ රිද්මයට අන් සිසුන්ට චලන ඉදිරිපත් කිරීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 8**

- සූර්යයා මගින් ලැබෙන ආලෝකය අපට දැනෙන ආකාරය පිළිබඳ විවිධ අත්දැකීම් ලැබීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා හොඳින් හිරු එළිය වැටී ඇති දිනක සිසුන් සමඟ එළිමහනට යන්න.
- හිරු එළිය හොඳින් වැටී ඇති තැනක සිට හිරු එළිය වැටී ඇති අවට පරිසරය නිරීක්ෂණය කිරීමට සලස්වන්න.
- සෙවණ ඇති තැනකට ගොස් එතැන සිට හොඳින් හිරු එළිය වැටී ඇති පරිසරය නිරීක්ෂණය කිරීමටත් සලස්වන්න.
- මෙම අවස්ථා දෙකෙහි දී අත්විඳි තත්ත්වයන් පිළිබඳ අවධානය යොමු කරන්න.
- ඒ අනුව තදින් හිරු එළිය වැටෙන විට ශරීරයට ඇතිවන අපහසුතා, විශේෂයෙන් ඇසට ඇතිවන අපහසුතා පිළිබඳ සිසුන් සමග කතාබහ කරන්න.
- මෙහි දී තද ආලෝකයෙන් ඇස ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම පිළිබඳ ව තවදුරටත් අවධාරණය කරමින් සිසුන් සමඟ කතාබහ කරන්න.
- කලින් සපයා ගත් විනිවිද පෙනෙන වර්ණවත් කඩදාසි තුළින් අවට පරිසරය නිරීක්ෂණය කිරීමට අවස්ථාව දෙන්න.
- විනිවිද පෙනෙන විවිධ වර්ණයේ කඩදාසිවලින් අවට පරිසරය නිරීක්ෂණය කිරීමේ දී විඳින ආස්වාදය ප්‍රකාශ කිරීමට දිරි දෙන්න. මෙහි දී දැඩි අව් රශ්මිය දෙස බැලීමට යොමු කිරීමෙන් වළකින්න.

**ක්‍රියාකාරකම 9 :**

- විවිධ හැඩ සහිත පහන් කූඩු නිර්මාණය කර ඒවාට ආලෝකය සැපයීමෙන් වර්ණවත් කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මේ සඳහා පන්තියේ සිසුන් කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සිසු අදහස් අනුව විවිධ හැඩයේ පහන් කූඩු නිර්මාණයට සිසුන් දිරිගන්වන්න.
- නිර්මාණය කරගත් පහන් කූඩුවට ආලෝකය සපයා එළිය විහිදෙන ආකාර අත්විඳිමින් වින්දනයක් ලැබීමට අවස්ථාව සලසන්න.
- සිසු නිර්මාණ අගය කරන්න.

## 14. තේමාව : මිනිසුන් වැඩ කරන තැන්

**නිපුණතා** :
- ආසන්න පරිසරයේ පුද්ගලයන් ජීවිකාව සඳහා වැඩ කරන ස්ථාන සහ එම ස්ථානවල දී තම ආරක්ෂාව සලසා ගන්නා අයුරු විමර්ශනය කර වාර්තා කරයි.
- විවිධ කාර්ය සඳහා භාවිත කරන ඇඳුම් පැළඳුම් හා උපකරණ හඳුනාගෙන වාර්තා කරයි.
- මිනිසුන් වැඩ කරන ස්ථාන ආශ්‍රිත චලන අනුකරණය හා සමබරතාවය පවත්වා ගත යුතු චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- වැඩ කරන ස්ථාන, එම ස්ථානවල දී භාවිත කරනු ලබන භාණ්ඩ හා උපකරණ සම්බන්ධ නිර්මාණ කරයි.
- මිනිසුන් වැඩ කරන තැන් හා සම්බන්ධ තොරතුරු වින්දනාත්මක ව ප්‍රකාශ කරයි.

**ඉගෙනුම් පල** :
- ආසන්න පරිසරයේ පුද්ගලයන් වැඩ කරන ස්ථාන පිළිබඳ තොරතුරු වාර්තා කරයි.
- වැඩකරන ස්ථාන තුළ දී භාවිත කරන උපකරණ, මෙවලම්, ඇඳුම් පැළඳුම් පිළිබඳ තොරතුරු නිරීක්ෂණය කර වාර්තා කරයි.
- සමබරතාවය රැකගනිමින් විවිධ චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- වැඩ කරන විවිධ ස්ථාන හා සම්බන්ධ පෝස්ටර් හා චිත්‍ර නිර්මාණය කරයි.
- මිනිසුන් වැඩ කරන තැන් හා සම්බන්ධ ජනකවි හා ගීත ගායනා කරයි.
- වැඩ කරන ස්ථානවල මිනිසුන්ගේ විවිධ චලන රිද්මයානුකූල ව ඉදිරිපත් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- මිනිසුන් එදිනෙදා ජීවිකාව සඳහා විවිධ කාර්යයන් හා වෘත්තීන්වල නියැළෙන බව පැහැදිලි කරමින් සිසුන් සමඟ කතාබහක නියැළෙන්න.
- එම සාකච්ඡාව සඳහා සිතුවම්, පින්තූර, ඡායාරූප, වීඩියෝ පට වැනි සපයා ගත හැකි මාධ්‍යයන් යොදා ගන්න.
- සිසුන් සමඟ පහසුවෙන් ළඟාවිය හැකි කුඹුරක්/හේනක්/ගෙයක් සාදන තැනක්/ගඩොල් කපන තැනක්/කුඩා කම්හලක් (රෙදි, වඩුවැඩ) . . . වැනි වැඩබිම් අවම වශයෙන් දෙකක් තෝරාගන්න. වැඩබිම නැරඹීමට යාමට පෙර පහත සඳහන් කරුණු යටතේ සිදුකළ යුතු දේ පිළිබඳ සිසුන් දැනුවත් කරන්න.

  * වැඩ බිමේ දී කතාබහ කළ යුතු ආකාරය
  * වැඩබිමේ දී හැසිරිය යුතු ආකාරය
  * තම ආරක්ෂාව සලසා ගත යුතු ආකාරය
  * සහයෝගයෙන් කටයුතු කිරීමේ වැදගත්කම
  * නිරීක්ෂණය කළ යුතු දේ

    *උදා* * වැඩකරන අවස්ථාවල දී ආරක්ෂාව සඳහා අඳින ඇඳුම්, පැළඳුම්
    * වැඩබිම සකසා ඇති ආකාරය (*උදා* : ගොඩනැගිලි, බිම සැකසීම, . . . , වැනි)
    * භාවිත කරන ආවුද (*උදා* : අඬු මිටි, කියත්, උදලු, . . . වැනි)
    * භාවිත කරන යන්ත්‍ර (*උදා* : මයින හම, මහන මැෂින්, අත් යන්ත්‍ර, . . . . වැනි)
    * වැඩ බිමේ දී මිනිසුන් යෙදෙන විවිධ වැඩ

ආදී දේ පිළිබඳ ව විමසිලිමත් ව බැලීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- වැඩබිමේ දී දුටු දේ පිළිබඳව සිසුන් සමඟ කතාබහ කරන්න.
- මෙම කතාබහේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳව වෙන් වෙන් වශයෙන් අවධානය යොමු කරන්න.
  * වැඩබිමේ සිටි අය ඇඳ සිටි ඇඳුම් පැළඳුම්වල ස්වභාවය (වර්ණය, සපත්තුවල ස්වභාවය, ඇඳුම් පැළඳුම්වල ස්වභාවය, ඇඳුම් පැළඳුම් යොදාගැනීමට හේතු කුමක් විය හැකි ද, . . . වැනි)
  * වැඩබිම් සකස් කර තිබූ ආකාරය (ගොඩනැගිලිවල ස්වභාවය, බිම සකසා තිබූ අයුරු, වහලවල ස්වභාවය, . . . වැනි)
  * වැඩබිමේ දී මිනිසුන් සිදුකළ විවිධ කාර්යයන් හා ඔවුන්ගේ සහයෝගීතාවය
  * අප වෙනුවෙන් යමක් ලබා දීමට/නිෂ්පාදනයට ඔවුන් බොහෝ වෙහෙස මහන්සි වන බව
  * භාවිත කළ ආවුද හා මෙවලම් (ආවුදවල ස්වභාවය, ඒවා යොදාගත් කාර්යයන්, . . . වැනි)
- සිසුන් විසින් නිරීක්ෂණය කළ වැඩබිමේ සිත් ගත් අවස්ථාවක් චිත්‍රයට නැගීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- නිරීක්ෂණය කරන ලද වැඩබිමෙහි දී නිෂ්පාදනය කරනු ලබන දේවලින් අපට ලැබෙන ප්‍රයෝජන සිසුන් සමඟ කතාබහ කරන්න.
- එම ද්‍රව්‍ය නැති වුවහොත් අපට අත්වන දුෂ්කරතා ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබාදෙන්න.
- ඒ අනුව වැඩකරන මිනිසුන් අපට අවශ්‍ය පිරිසක් ය යන හැඟීම ඇති වන සේ සාකච්ඡාව මෙහෙයවන්න.
- එවැනි පිරිස් අගය කිරීමට, සැලකීමට, ගරු කිරීමට සුදුසු පුද්ගලයන්ය යන හැඟීම ඇතිවන සේ කතාබහට යොමු කරවන්න.
- මෙසේ වැඩ කිරීමේ දී සුහද බව, සාමූහික බව, නීතිගරුක බව හා කැපවීම වැනි ගුණාංගවල වැදගත්කම ඉස්මතු කරන්න.
- අභින ඇසුරින් නිදහසේ චලන ඉදිරිපත් කිරීමට ඉඩ දෙන්න.
- අම්මා, තාත්තා ඇතුළු පවුලේ අය, යම් වැඩක නිරත වන්නේ නම් තමන් ද ඒ සඳහා හැකි ලෙස උදවු කිරීමේ වැදගත්කම පෙන්වා දෙන්න.
- ඒ අය අප වෙනුවෙන් වෙහෙස මහන්සි වන බවත්, එහෙයින් දෙමාපියන් හා පවුලේ අනෙකුත් සාමාජිකයන් සමඟ යහපත් ආකල්පයකින් කටයුතු කළයුතු බවත් සාකච්ඡා කරන්න.

**ක්‍රියාකාරකම 4 :**


- වැඩ බිම්වල දී විය හැකි අනතුරු පිළිබඳ ව පණිවුඩ රැගත් පෝස්ටර් නිර්මාණය කිරීමට සිසුන් කණ්ඩායම් වශයෙන් යොමු කරන්න. මේ සඳහා පහසුවෙන් සපයා ගත හැකි පින්තූර හෝ අඳින ලද පින්තූර භාවිත කරන්න.
- එක් එක් වැඩබිමට අදාළ රූප සහිත කාඩ් පත් එම කණ්ඩායම්වලට ලබා දී පෝස්ටර් නිර්මාණයට සිසුන් යොමු කරන්න.
- වැඩබිම් නිරීක්ෂණයෙන් පසු ලැබූ අත්දැකීම් ආශ්‍රයෙන් සිසුන්ට නිර්මාණය කිරීමට හැකි ආකාරයේ උපකරණ කිහිපයක් හඳුනාගන්න.
  *උදා :* උදැල්ල, දැකැත්ත, සවල, රේක්කය, . . . වැනි
- අපතේ යන ද්‍රව්‍ය හා පරිසරයෙන් සපයාගත හැකි දේ යොදා ගනිමින් එම උපකරණ නිර්මාණයට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- අතීතයේ දී මිනිසුන් සිදුකරන ලද විවිධ කාර්යයන් අතරතුර වෙහෙස මහන්සිය දුරු කර ගැනීම සඳහා විවිධ කවි, ගී ගායනා කළ බව කතාබහක් ඇසුරින් සිසුන්ට පැහැදිලි කරන්න.
- එවැනි අවස්ථාවල දී ගායනා කළ සිසුන්ට ගායනා කළ හැකි සරල ජනකවි කීපයක් තෝරාගන්න. ඒවා සිසුන් සමඟ ගායනා කරන්න.
  *උදා* : * ඔන්න මලේ ඔය නාමල නෙලා වරෙන් . . . වැනි ජනකවි
- ගායනාවලට අනුව චලන හා අභිනය ඉදිරිපත් කිරීමට ද සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 6 :**

- පන්තියේ සිසුන් පස්දෙනා බැගින් වන සේ කණ්ඩායම් කරන්න.
- රූප සටහනේ දැක්වෙන ආකාරයට ප්‍රමාණවත් ඉඩක් යොදා ගනිමින් සීමාවන් සලකුණු කරන්න.




- එක් කණ්ඩායමක සිසුන් එහි දැක්වෙන ආකාරයට සිටුවන්න.
- රූප සටහනේ දැක්වෙන පරිදි පළමු සීමාව දැක්වෙන රේඛාව මත තරමක් දුරින් පොත් පහක් ද, දෙවන සීමාව දැක්වෙන රේඛාව තුළ ඇට මළු පහක් ද, තුන්වන සීමාව දැක්වෙන රේඛාව මත සමාන ප්‍රමාණයේ ජල භාජන පහක් ද තබන්න.
- ගුරුතුමිය විසින් ලබාදෙන සංඥාවකට අනුව ක්‍රීඩාව ආරම්භ කළ යුතු වේ. ඒ අනුව සිසුන් පළමුවන සීමාව දක්වා දිවගොස් එහි ඇති පොත ගෙන එය හිස මත තබා, දෑතින් නොඅල්ලා දෙවන සීමාව දක්වා ගමන් කළ යුතු ය.
- පසුව දෙවන සීමාව මත තමා ගෙන ආ පොත තබා එහි ඇති ඇට මල්ලක් ගෙන හිස මත තබා දෑතින් නොඅල්ලා තුන්වන සීමාව දක්වා ගමන් කළ යුතු ය.
- රැගෙන ආ ඇටමල්ල තුන්වන සීමාව මත තබා එහි ඇති වතුර භාජනයේ වතුර අපතේ නොයවා දෑතින් අල්ලාගෙන අවසන් රේඛාව දක්වා ගමන් කළ යුතු ය.
- යම් සිසුවෙකුගේ සමබරතාවය බිඳී ඇටමළු හෝ පොත් බිම වැටුණහොත් එම සිසුවා නැවත අදාළ සීමාවේ සිට ගමන් කළ යුතු ය.
  *උදා* : දෙවන සීමාවේ සිට තුන්වන සීමාව දක්වා ගමන් කිරීමේ දී ඇටමල්ලක් යම් සිසුවෙකු හිසින් වැටුණහොත් නැවත දෙවන සීමාව දැක්වෙන රේඛාවට පැමිණ ක්‍රීඩාව ආරම්භ කළ යුතු ය.
- ක්‍රීඩාවේ නීතිරීතිවලට අවනත වෙමින් ඉක්මණින් අවසන් රේඛාව දක්වා පැමිණෙන සිසුන් අගය කරන්න.
- නැවත මේ ආකාරයට සියලු සිසු කණ්ඩායම් සඳහා ක්‍රියාකාරකම සිදු කිරීමට අවස්ථාව ලබා දෙන්න. පවතින ඉඩකඩ ප්‍රමාණය අනුව කණ්ඩායමක සිටින සිසු සංඛ්‍යාව වෙනස් කර ගැනීමට ද අවකාශ ඇත.

## 15. තේමාව : වටපිටාවේ වෙනස් තැන්

**නිපුණතා** :
- පරිසරයේ විවිධත්වයට අනුව පැළ වැඩෙන ආකාරය හා ජීවීන්ගේ ක්‍රියාකාරීත්වය නිරීක්ෂණය කර වාර්තා කරයි.
- පරිසරයේ විවිධ ස්ථානවල මිනිසා විසින් සිදුකරන වෙනස්කම් හඳුනාගනිමින් එම ස්ථාන යහපත් ස්ථාන බවට පත්කර ගැනීමට කටයුතු කරයි.
- පරිසරයේ විවිධත්වයන්ට ගැළපෙන නිර්මාණ කරමින් පරිසරයේ සුන්දරත්වය රැකගනියි.
- පාසල් පරිසරයේ වෙනස් වූ තැන් අනුව මූලික ශාරීරික යෝග්‍යතා වර්ධනය වන චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- වටපිටාවේ වෙනස් තැන්වල ඇති විවිධත්වය පිළිබිඹු කරන රිද්මයානුකූල චලන වින්දනාත්මකව ඉදිරිපත් කරයි.

**ඉගෙනුම් පල** :
- අවට පරිසරයේ විවිධ ස්ථානවල ඇති වෙනස්කම් නිරීක්ෂණය කර වාර්තා කරයි.
- ආසන්න පරිසරයේ විවිධ ස්ථානවල ස්වභාවය අනුව පැළ වැඩෙන ආකාරයේ වෙනස්කම් ඉදිරිපත් කරයි.
- පරිසරයේ ගැවසෙන සතුන් පිළිබඳ තොරතුරු නිරීක්ෂණය කර වාර්තා කරයි.
- පරිසරයේ සුන්දරත්වය අගය කරමින් එය රැක ගැනීමට දායක වෙයි.
- අවට පරිසරයේ තෝරාගත් ස්ථාන, සුන්දර ස්ථාන බවට පත්කර ගැනීමට දායකවෙයි.
- අවට පරිසරයේ විවිධ ස්ථානවලින් සපයාගන්නා ද්‍රව්‍ය ඇසුරෙන් නිර්මාණ කරයි.
- නිර්මාණය කරගත් බාධක සහිත පරිසරයක අවකාශ භාවිතය හා සම්බන්ධ ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- පරිසරයේ ඇසෙන, දකින ශබ්ද නාද හා චලන රිද්‍යමානුකූල ව ප්‍රදර්ශනය කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- විවිධ ස්ථානවල පැළ වැඩෙන ආකාරයේ වෙනස්කම් හඳුනා ගැනීම සඳහා පාසල ආසන්න පරිසරයේ පිහිටි සුදුසු ස්ථානයක් නිරීක්ෂණය කිරීමට සිසුන් සමග චාරිකාවක යෙදෙන්න.
- එහිදී පහත සඳහන් කරුණු කෙරෙහි සිසු අවධානය යොමු කරන්න.
  - පැළ වැඩීමේ ස්වභාවය හඳුනා ගැනීම
    *උදා :* * පැළ හොඳින් වැඩී ඇති/වැඩී නැති බව
    * ශාක පත්‍රවල ඇති වෙනස්කම්
    * කඳෙහි හා මුල්වල ඇති වෙනස්කම්
    * නිරීක්ෂණය කළ ස්ථානවල ඇති පැළෑටි එකම වර්ගයකට අයත් ද/නැති ද යන වග
  - තෝරාගත් ස්ථානවල පසේ ස්වභාවය හඳුනාගැනීම
    *උදා :* * ගල් සහිත/ගල් රහිත බව
    * වැලි සහිත/රහිත බව
    * පසේ බුරුල් හෝ තද බව,
    * පසේ තෙත් හෝ වියළි බව
- ඉහත තොරතුරු ඇසුරෙන් එක් එක් ස්ථානවල වෙනස්කම් අනුව පැළ වැඩීමේ වෙනසක් ඇත් දැයි සිසුන් සමඟ කතාබහ කරන්න

**ක්‍රියාකාරකම 2**

- වටපිටාවේ විවිධ ස්ථානවල වෙනස්කම් අනුව ඒවායෙහි සුවිශේෂීව ගැවසෙන සතුන් හඳුනා ගැනීම, නිරීක්ෂණය සඳහා සුදුසු ස්ථාන කීපයක් හඳුනාගන්න.
- සිසුන් එම ස්ථානවලට කැඳවාගෙන යන්න.
- ඒවායෙහි වාසය කරන සතුන් පිළිබඳ පහත සඳහන් තොරතුරු නිරීක්ෂණයට සිසුන් යොමු කරන්න.

  *උදා :* * එම ස්ථානවල ගැවසෙන සතුන් කවුරුන් ද ?
  * ඔවුන්ගේ ශාරීරික ස්වභාවය (වර්ණය, හැඩය,. . . වැනි)
  * හැසිරෙන ආකාරය (තනි තනිව ද/රංචු වශයෙන් ද) . . . වැනි
- සිසුන් නිරීක්ෂණය කළ තොරතුරු පිළිබඳ ව කතාබහ කරන්න. ඒ ඇසුරින් ස්ථානය අනුව ගැවසෙන සතුන් වෙනස් වන බව සිසුන්ට පෙන්වා දෙන්න.

**ක්‍රියාකාරකම 3**

- තමාගේ පාසලේ වටාපිටාව නිරීක්ෂණය කිරීම සඳහා සිසුන් සමග චාරිකාවක යෙදෙන්න.

  *උදා :* - සෙවන සහිත ස්ථාන (වදුලු සහිත තැන්) - දැඩි අව්රශ්මිය සහිත ස්ථාන
  - කැසිකිළි වැසිකිළි සහිත ස්ථාන - සෙල්ලම් කිරීමට ඉඩකඩ සහිත ස්ථාන
  - වගා කර ඇති ස්ථාන
- සිසුන් නිරීක්ෂණය කළ ස්ථාන අතරින් වඩාත් ප්‍රියකරන හා ප්‍රිය නොකරන ස්ථාන මොනවා දැ යි යන්න පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න. එසේ එක් එක් ස්ථාන ප්‍රිය කිරීමටත්, ප්‍රිය නොකිරීමටත් හේතු විමසමින් සාකච්ඡාවක් මෙහෙයවන්න.
- සිසුන් විසින් ප්‍රකාශ කළ ඔවුන් ප්‍රිය කරන සුන්දර ස්ථාන රැක ගැනීම සඳහා අපට කළ හැකි දේ පිළිබඳ ව සිසුන් සමඟ කතාබහ කරන්න.

  *උදා :* * එම ස්ථානවලට කැළිකසළ දැමීමෙන් වැළකීම
  * එම ස්ථාන පිරිසිදුව තබා ගැනීමට උදවු වීම
- සිසුන් ප්‍රිය නොකරන ස්ථානයක් හඳුනාගෙන එම ස්ථානය ප්‍රියජනක ස්ථානයක් බවට පත් කිරීමට කළ හැකි දේ පිළිබඳව සිසුන්ගෙන් විමසන්න.

  *උදා :* * සෙල්ලම්පිටිය - තුත්තිරි ගලවා අයින් කිරීම
  * කුණු දමන ස්ථානය - කසල බඳුන් තැබීම
  * තණකොළ වැවී ඇති තැන් - තණකොළ ගලවා ඉවත් කිරීම
  * දිය සෙවල බැඳී ඇති තැන් - වැඩිහිටියන්ගේ උදවු සහිතව ඒවා අතුල්ලා ශුද්ධ පවිත්‍ර කිරීම
- සිසුන් විසින් කළ යෝජනා සුදුසු අයුරින් ක්‍රියාත්මක කිරීමට කටයුතු සැලසුම් කරන්න.

<u>**මදුරුවා හා ළමයා**</u>

- පහත සඳහන් දෙබස් සහිත චරිත නිරූපනයේ සිසුන් යොදවන්න

  *උදා :*

  මදුරුවා 1 : අද නම් මට බිත්තර ගොඩක් දාන්න තැනක් හම්බ වුණා.

  ළමයා 1 : මේ බලන්න අපේ ඉස්කෝලෙ තැන තැන කුණු එකතු වුණාම මදුරුවො ඉබේටම බෝවෙනවා


  මදුරුවා 2 : මේ කියන කොටම එන්නෙ. හොඳට බඩ පුරවගන්න පුළුවන්.

  ළමයා 2 : අපි එකතු වෙලා ඉක්මණට මේ ටින්, බෙලෙක්ක, ප්ලාස්ටික් කෝප්ප වතුර පිරෙන්නේ නැතිවෙන්න අයින් කරමු.

  මදුරුවා : අය්යෝ මට බිත්තර ගොඩක් දාන්න තිබුණ තැන නැති වුණා.
- සිසුන් වඩාත් කැමති ස්ථානයක් චිත්‍රයට නැගීමට උපදෙස් දෙන්න.
- සිසු ඉදිරිපත් කිරීම් අගය කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- පන්තියේ සිසුන් කණ්ඩායම් කීපයකට වෙන්කරන්න.
- ඉඩකඩ ඇති ස්ථානයකට හෝ සිසුන් කැඳවාගෙන ගොස් කණ්ඩායම් කිහිපයකට වෙන් වෙන්ව රවුමට සිටගැනීමට උපදෙස් දෙන්න.
- සෑම කණ්ඩායමකින්ම එක් සිසුවෙක් බැගින් රූප සටහනේ පරිදි රවුමේ මැදට කැඳවන්න.



- ඇට මල්ලක් හෝ බෝංචි මල්ලක් සෑම කණ්ඩායමකටම ලබා දෙන්න. (රවුමේ මැද සිටින සිසුවා හා රවුම වටා සිටින සිසුන් අතර දුර මීටර් 2ක් පමණ වීම සුදුසු ය.)
- රවුමේ මැද සිටින සිසුවාට බෝංචි මල්ල/ඇට මල්ල ලබා දෙන්න.
- එම සිසුවා වටා කුඩා රවුමක් ඇඳ ක්‍රියාකාරකම සිදුකරන අතර ඉන් පිටතට නොපැමිණිය යුතු බවට උපදෙස් ලබා දෙන්න.
- මැද සිටින සිසුවා විසින් රවුමේ සිටින අනෙක් සිසුවෙකු වෙත ඇට මල්ල වීසි කරන අතර එය අල්ලා ගනු ලබන සිසුවා නැවත ඇට මල්ල රවුම මැද සිටින සිසුවාට යොමු කළ යුතු ය.
- මේ ආකාරයට සියලු සිසුන්ට රවුම මැදට පැමිණීමට අවස්ථාව ලැබෙන තෙක් ක්‍රියාකාරකම සිදුකරන්න.
- රවුමේ මැද සිටින සිසුවා හා අනෙක් සිසුන් අතර දුර ප්‍රමාණය වෙනස් කරමින් ද මෙම ක්‍රියාකාරකම සිදුකරන්න.

**ක්‍රියාකාරකම 5**

- විවිධ ශබ්ද සහිත එළිමහන් ස්ථානයකට සිසුන් කැඳවාගෙන යන්න.
- මැද සිටින ස්ථානයේ අවට පරිසරය හොඳින් නිරීක්ෂණය කරන ලෙස සිසුන්ට පවසන්න.
- නිරීක්ෂණයේ දී ගස්වැල්, ගස්වල කොළ සෙලවෙන අයුරු, සතුන්ගේ හැසිරීම වැනි දේ කෙරෙහි සිසු අවධානය වඩාත් හොඳින් යොමු කරන්න.
- නිරීක්ෂණයේ දී දුටු චලන අනුකරණයට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- සියලුම සිසුන්ට දෑස් වසාගන්නා ලෙස උපදෙස් දෙන්න.
- අවට පරිසරයෙන් ඇසෙන ශබ්දවලට හොඳින් සවන්දෙන ලෙස පවසන්න.
  *උදා :* * වාහනවල ශබ්ද
  * සතුන්ගේ නාද, . . . වැනි
- සිසුන්ට දෑස් විවර කරන ලෙස පවසන්න.
- දෑස් වසාගත් විට තමාට ඇසුණු ශබ්ද මොනවා ද යන්න අනුමාන කර ප්‍රකාශ කිරීමට ඔවුන්ට අවස්ථාව ලබා දෙන්න.
- එම ශබ්ද අනුකරණය කිරීමට සිසුන් තනි තනිව හා කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6**

- අවට පරිසරයෙන් සපයා ගත හැකි විවිධ වර්ණ සහිත ශාක පත්‍ර පන්ති කාමරයට රැස්කර ගන්න.
- සිසුන් කණ්ඩායම් කරන්න.
- එක් කණ්ඩායමකට එක් බ්‍රිස්ල් බෝඩ්එක බැගින් ලබා දෙන්න.
- එහි තමන් වටපිටාවේ දී දුටු කැමති රූපයක් සටහන් කරන ලෙස සිසුන්ට උපදෙස් ලබා දෙන්න.
  *උදා :* * මල් පෝච්චියක්
  * ගසක කොළයක්
  * මලක්
  * පැපොල් ගෙඩියක්
- රැස්කර ගත් ශාක පත්‍ර යොදා ගනිමින් එම රූපය කොලාජ් නිර්මාණයක් සේ සකස් කිරීමට සිසුන් යොමු කරන්න.
- සිසු නිර්මාණ ප්‍රදර්ශනය කරන්න. අගය කරන්න.

## 16. තේමාව : අපේ උදවු ඕනෑ අය

**නිපුණතා** :
- සමාජයේ උදවු අවශ්‍ය අය හඳුනා ගෙන උදවු කිරීමට කටයුතු කරයි.
- සාර්ථකත්වය සඳහා සහයෝගයෙන් යුතුව කටයුතු කරයි.
- අන් අයට උපකාරී වන ආකාරයේ නිර්මාණ කරයි.
- අන්‍යෝන්‍ය සහයෝගය වර්ධනය සඳහා චාලක ක්‍රියාකාරකම්වල යෙදෙයි.
- සමාජයේ විවිධ අය පිළිබඳ සංවේදීතාව මතු කර දක්වන භූමිකා රංගනවල නිරත වෙයි.

**ඉගෙනුම් පල** :
- පාසලේ දී හා නිවසේ දී උදව් අවශ්‍ය අයට උදවු කරයි.
- විශේෂ අවශ්‍යතා සහිත පුද්ගලයන් කෙරෙහි සංවේදී ව කටයුතු කරයි.
- අන් අයගේ උදවු ලබා ගැනීමේ දී ආචාරශීලී ගති පැවතුම් ප්‍රදර්ශනය කරයි.
- අන්‍යෝන්‍ය සහයෝගයෙන් යුතුව තවත් කෙනෙකුට උපකාරී වන නිර්මාණ කරයි.
- සහයෝගයෙන් සිදුකළ යුතු කණ්ඩායම් ක්‍රීඩාවල නිරත වෙයි.
- අන් අය කෙරෙහි සංවේදී බවින් යුතු වීමේ වැදගත්කම තහවුරු කර ගනිමින් විවිධ භූමිකා රඟදක්වයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පාසලේ දී හා නිවසේ දී අන් අය වෙනුවෙන් කළ හැකි උදවු මොනවා දැයි යන්න පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමුවන ආකාරයට සාකච්ඡාවක් මෙහෙයවන්න.
- තමා විසින් අන් අය වෙනුවෙන් උදවු කළ අවස්ථා කිහිපයක් ප්‍රකාශ කිරීමට සිසුන්ට අවස්ථාව ලබා දෙන්න. මෙහි දී නිවසේ දී කළ උදවු හා පාසලේ දී කළ උදවු වෙන් වශයෙන් ප්‍රකාශ කිරීමට සිසුන්ව යොමු කරන්න.
- අන් අයට උදවු කිරීම මෙන්ම තමාට උදවු උපකාර කළ අයෙකුට ප්‍රතිඋපකාර දැක්වීම ද වැදගත් බව සාකච්ඡා කරන්න.
- එවැනි අවස්ථාවල දී භාවිත කළ යුතු යහපත් වචන හඳුන්වා දෙන්න.
  *උදා* : * කරුණාකර
  * ස්තුතියි වැනි ප්‍රකාශ පුරුද්දක් වශයෙන් භාවිතයට සිසුන් හුරු කරවන්න.
- මෙවැනි භාවිත සහිත නිරූපණ ඉදිරිපත් කිරීමට සිසුන්ව යොමු කරන්න.
- සිසුන්ගේ ඉදිරිපත් කිරීම් අගය කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- නිවසේ දී හා පාසලේ දී අන් අයගේ උදවු උපකාර අවශ්‍ය අය පිළිබඳ ව සිසුන්ගෙන් විමසන්න.
- එවැනි අය වෙනුවෙන් අපට කළ හැක්කේ කෙබඳු ආකාරයේ උදවු ද, එවැනි උදවු ලබාදිය හැක්කේ කෙසේ ද, කුමන අවස්ථාවලදී ද, ඒ සඳහා වැඩිහිටියන්ගෙන් සහයෝගය ලබාගත හැක්කේ කෙසේ ද වැනි කරුණු සිසුන් සමඟ කතා කරන්න.
- සිසුන් විසින් නිවසේ දී අන් අයට සිදු කරන උදවුවක් දැක්වෙන චිත්‍රයක් ඇඳීමට සිසුන්ට අවස්ථා සලසන්න.
- අපගේ උදවු අවශ්‍ය වන අය කෙරෙහි සංවේදී ව උදවු උපකාර කරන අයුරු විදහා දැක්වෙන භූමිකා රංගනවල සිසුන්ට නිරතවීමට අවස්ථා සලසන්න.

**ක්‍රියාකාරකම 3 :**

- ඇස් නොපෙනෙන, කන් නොඇසෙන, කතා කිරීමේ අපහසුතා සහිත, වෙනත් ශාරීරික ආබාධ සහිත, මහළු, . . . වැනි අයට උදවු කරන අවස්ථා සහිත පින්තූර සිසුන්ට ඉදිරිපත් කරන්න.
- සෑම අයෙකුම එක හා සමාන හැකියාවලින් යුතු අය නොවන බවත්, එසේ නොවන අයට අප උදවු කළයුතු බවත්, ඒ ආකාරයට අපට කළ හැකි උදවු කෙබඳු ඒවා ද යන්නත් පිළිබඳ ව සිසුන්ගේ අවධානය යොමුවන සේ කතාබහක් ගොඩනගන්න.
- ඉහත සඳහන් ආකාරයේ උදවු අවශ්‍ය අය සමච්චලයට ලක් නොකළ යුතු බවත්, ඔවුනට උදවු කිරීම අපගේ යුතුකමක් බවත්, එසේ උදවු කිරීමෙන් අත්වන සතුට, සොම්නස වඩා උතුම් බවත් පැහැදිළි කරන්න.
- අප විසින් යම් අයකුගේ උදවු ලබා ගැනීමේ දී හෝ උදවු ඉල්ලීමේ දී ආචාරශීලී වීමේ වැදගත්කම පිළිබඳවත්, එය යහපත් පුද්ගලයකුගේ චරිත ලක්ෂණයක් බවත්, එවැනි ගුණාංග කුඩා කල සිට ම වර්ධනය කරගත යුතු ඒවා බවත් පහදා දෙන්න.

**ක්‍රියාකාරකම 4 :**


- අපේ උදවු ලැබිය යුතු වැඩිහිටියකුට ලබාදිය හැකි ආකාරයේ සුභපැතුම් පතක් නිර්මාණයට සිසුන් යුගල වශයෙන්/කණ්ඩායම් වශයෙන් යොමු කරන්න.
  *උදා :* * නිරෝගී සුවය ප්‍රාර්ථනා කරමින්
  * දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරමින්
- ඒ සඳහා අවශ්‍ය ද්‍රව්‍ය සපයා ගන්න.
- මෙම නිර්මාණය සඳහා ඉවතලන කඩදාසි, වියළා ගත් මල්, කොළ ආදිය ද විසිතුරු ආකාරයට යොදා ගැනීමට සිසුන් යොමු කරන්න.
- සුදුසු අවස්ථාවල දී මෙවැනි නිර්මාණ කරමින් ඒවා අන් අයට ලබා දී ඔවුන් සතුටට පත් කිරීමේ වැදගත්කම සිසුන්ට පහදා දෙන්න.
- මෙවැනි නිර්මාණ තවදුරටත් කිරීම සඳහා සිසුන් දිරිමත් කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- අන් අයගේ සහයෝගය සහිතව සිදු කළ යුතු පහත දැක්වෙන ආකාරයේ ක්‍රියාකාරකම්හි යෙදීමට සිසුන් යොමු කරන්න.
  *උදා :* - යම් සරල දර්ශනයක්/පින්තූරයක් පිටපත් කිහිපයකින් සකස් කර ගන්න. එම පින්තූරයේ සෑම පිටපතක් ම විවිධ හැඩ සහිත කොටස් තුනකට වෙන් වෙන සේ කපා වෙන්කර ගන්න. කපාගත් එක් රූපයකට අදාළ කොටස් තුන එක් කවරයකට බැගින් වන සේ දමන්න.
  - සිසුන් කණ්ඩායම්වලට බෙදා සෑම සිසු කණ්ඩායමකටම රූප කොටස් සහිත කවරයක් බැගින් ලබා දෙන්න.
  - රූප කොටස් නිවැරදිව ගළපමින් අදාළ රූපය නිර්මාණය කිරීමට සිසු කණ්ඩායම් යොමු කරන්න. සිසු නිර්මාණ අගය කරන්න.
- මෙම ක්‍රියාකාරකමට සිසුන් පහසුවෙන් සහභාගි වූයේ නම් රූප කපන කොටස් ප්‍රමාණය වැඩි කරමින් ක්‍රියාකාරකම නැවත සිදුකරන්න.

**ක්‍රියාකාරකම 6 :**


- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම් කිහිපයකට වෙන් කරන්න.
- සෑම කණ්ඩායමක් ම පේළි වශයෙන් සිටුවා තරමක් විශාල ප්‍රමාණයේ බෝලය බැගින් පේළිවල ඉදිරියෙන් ම සිටින සිසුන්ට ලබා දෙන්න.



- ගුරුතුමිය විසින් ලබාදෙන සංඥාවකට අනුව එක් එක් පේළියේ ඉදිරියෙන්ම සිටින සිසුවා බෝලය තම දෙපා අතරින් දෙවන සිසුවා වෙත යොමු කළ යුතු ය.
- දෙවැනි සිසුවා ද ඒ ආකාරයට ම තෙවෙනි සිසුවා වෙත බෝලය යොමු කළ යුතු ය.
- මේ අයුරින් බෝලය පේළියේ අවසන් සිසුවා තෙක් යොමු කළයුතු අතර, ඉක්මණින්ම බෝලය පේළියේ අවසානය දක්වා යොමු කළ කණ්ඩායමට ජය හිමි වේ.
- එකිනෙකාට උදව් කරමින් සාමූහික ව එක් අරමුණකින් කටයුතු කිරීම නිසා ජය ලබා ගැනීමට පහසු වන බව පිළිබඳ ව ක්‍රීඩාව අවසානයේ දී තවදුරටත් ගුරුතුමිය විසින් අවධාරණය කරන්න.

**ක්‍රියාකාරකම 7 :**

- තොප්පි කිහිපයක් සපයා ගන්න.
- පන්තියේ සිසුන් සුදුසු පරිදි කණ්ඩායම්වලට බෙදන්න. වරකට කණ්ඩායම් 3ක් හෝ 4ක් ඉදිරියට කැඳවන්න.
- රූප සටහනේ දැක්වෙන පරිදි එම කණ්ඩායම් පේළියට සිටුවන්න. එක් එක් පේළියක සිටින සිසුන් දෙදෙනෙකු අතර දුර මීටර් හතරක් (04) පමණ වීම අවශ්‍ය ය. සෑම කණ්ඩායමකම සිටින පළමු සිසුවා අතට තොප්පිය බැගින් ලබා දෙන්න.




- ගුරුතුමිය විසින් ලබා දෙන සංඥාවකට අනුව සෑම කණ්ඩායමකම පළමු සිසුවා දිවගොස් තම කණ්ඩායමේ දෙවන සිසුවාගේ හිස මත තොප්පිය පැළඳවා එම දෙවන සිසුවාගේ ස්ථානයේ සිටගත යුතු ය.
- මේ අයුරින් කණ්ඩායමේ දෙවන සිසුවා, තෙවන සිසුවාගේ ද, තෙවන සිසුවා සිව්වන සිසුවාගේ ද ආදී වශයෙන් හිස මත තොප්පිය පැළඳවා එම ස්ථානවල සිටගත යුතු ය.
- මේ අයුරින් කණ්ඩායමේ අවසන් සිසුවා තෙක් මෙම ක්‍රියාව සිදු කරන්න. කණ්ඩායමේ අවසානයේ සිටගෙන සිටින සිසුවා තොප්පිය පැළඳ තරගය අවසන් කරනු ලබන රේඛාව දක්වා දිව යා යුතු ය.
- තරගය අවසන් කරන සීමාව දක්වා ඉක්මණින් පැමිණෙන කණ්ඩායමට ජය හිමි වේ.
- අවසානයේ දී කණ්ඩායමක් වශයෙන් එක් අරමුණකින් කටයුතු කිරීම නිසා ජය ලබා ගැනීමට පහසු වන බව පිළිබඳ ගුරුතුමිය විසින් අවධාරණය කරන්න.

# 3.0 ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි

## හැඳින්වීම

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යටතේ පළමුවන ශ්‍රේණියේ සිට ම සන්නිවේදනය හා අවබෝධය සඳහා ඉංග්‍රීසි භාවිත කිරීමට දිවයිනේ සියලු ම සිසුන්ට සම අවස්ථා ලබා දීම සඳහා කටයුතු සලසා ඇත. තුන්වන ශ්‍රේණියේ දී විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීම ආරම්භ කිරීමට ප්‍රථම හඳුන්වා දෙන මෙම අංගය "**ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි**" ලෙස හැඳින්වේ. මෙම නාමයෙන් පිළිබිඹු වන පරිදි ම මෙහිදී අවධානය යොමු වනුයේ සිසුන් ක්‍රියාකාරකම් හෝ සෙල්ලම්වල යෙදී සිටින අවස්ථාවලදී කතාබහ සඳහා ඉංග්‍රීසි භාවිතයයි. විශේෂඥ ගුරුවරයකු යොදා විධිමත් ආකාරයට ඉංග්‍රීසි ඉගැන්වීමක් මෙහි දී අපේක්ෂා නොකෙරේ.

මෙම විෂය නිර්දේශය ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මගින් විශේෂයෙන් ම පළමුවන ශ්‍රේණියේ උගන්වන ගුරුවරයා විසින් ඉගැන්විය හැකි ආකාරයෙන් පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය යන විෂයයන් උගන්වන අවස්ථාවලදී ඒ හා සමඟ කළ හැකි ආකාරයට සකස් කර ඇත. මෙම වැඩ සටහන මගින් ශ්‍රවණය හා කථනය සඳහා වැඩි අවධානයක් යොමු කර ඇත. මෙම නවාංගය පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයය සඳහා මෙන් ම ගණිත විෂයය තුළ ද භාවිත කිරීමට ඉඩ සලසා ඇත.

පහත සඳහන් ප්‍රධාන අරමුණු මෙම වැඩ සටහන තුළින් සාක්ෂාත් කර ගැනීමට අපේක්ෂා කෙරේ.

- එදිනෙදා ජීවිතයේ දී අවශ්‍ය වන සරල ඉංග්‍රීසි වචන කිහිපයක් නිතර නිතර අසන්නට හා කියන්නට සලස්වා කුඩා වයසේ සිට ම දරුවන් ඉංග්‍රීසි වචනවලට හුරු කිරීම.
- සන්නිවේදනය හා අවබෝධය සඳහා සරල ඉංග්‍රීසි භාවිත වන ඉගෙනුම් පරිසරයක් පන්ති කාමරය හා ඉන් පිටත ඇති කිරීම.
- ඉංග්‍රීසි භාවිතයට සිසුන් තුළ ඇති පසුබටතා මඟ හැරවීම.
- තුන්වන ශ්‍රේණියේ සිට විධිමත් ලෙස ඉංග්‍රීසි ඉගෙනීමට ආසාවක් සිසුන් තුළ ඇති වන පරිදි පසුබිම සකස් කිරීම.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

- සිසුන්ට කතා බහ සඳහා සරල ඉංග්‍රීසි භාවිතය හඳුන්වා දිය යුත්තේ පන්ති භාර ගුරුවරයා විසිනි.
- මේ සඳහා විශේෂ කාල පරිච්ඡේද වෙන් කිරීම ද අවශ්‍ය නොවේ.
- ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රිසි සඳහා අවස්ථා මතු කර ගත යුත්තේ සිසුන් "පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය" යන විෂයයන්ට සම්බන්ධ ක්‍රියාකාරකම හා විනෝදජනක වැඩවල යෙදී සිටින අවස්ථාවලදීය.
- ක්‍රියාකාරකම්වල යෙදෙමින්, තම මව්බසෙන් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු වන අවස්ථාවන්හිදී සිසුනට නිතර දක්නට ලැබෙන ද්‍රව්‍යවල නම් ඉංග්‍රීසි භාෂාවෙන් සහ සරල ඉංග්‍රීසි ක්‍රියා පද, විධාන යනාදිය හඳුන්වා දීමටත් හැකි අවස්ථා ආයාසයකින් තොරව මතු කර ගැනීමට උත්සාහ කළ යුතුය.
- සිසුන් සමඟ නිදහසේ හැසිරෙන විට දී ඔවුනට ඉංග්‍රීසි භාෂාවෙන් ආමන්ත්‍රණය කිරීම, සුබ පැතීම, ආශිර්වාද කිරීම වැනි දේ සිදු කිරීමට අවස්ථා ද මතු වේ. මෙවැනි අවස්ථා සරල වාචික ඉංග්‍රීසි හඳුන්වා දීම සඳහා උපයෝගී කර ගත හැකි ය.
- ගුරුවරයාගෙන් විශේෂයෙන් බලාපොරොත්තු වනුයේ, දරුවා ජීවත් වන වටාපිටාවේ සමීප නිතර දක්නට ලැබෙන ද්‍රව්‍ය, ක්‍රියා පද, ආමන්ත්‍රණ, විධාන, ආශීර්වාද යනාදිය ඇතුළත් සරල ඉංග්‍රීසි වාග්මාලාවක් තෝරා ගෙන එම වාග්මාලාව ගුරුවරයාටත් දරුවනටත් අමතර බරක් නොවන පරිදි ප්‍රියජනක ලෙස ඔවුනොවුන් අතර සන්නිවේදන අවස්ථා ගොඩ නැගීමට උචිත පරිදි යොදා ගැනීමයි.

- උදාහරණයක් වශයෙන් සැලකිය හැකි සරල ඉංග්‍රීසි වාග්මාලාවක් මෙහි අවසානයේ ඇතුළත් කර ඇත. එහි, එදිනෙදා ජීවිතයේ දී සිසුන්ට නිතර හමුවන ද්‍රව්‍යවල ඉංග්‍රීසි යෙදුම් ද විවිධ අවස්ථා සඳහා උචිත සරල ක්‍රියා පද, ආමන්ත්‍රණ, විධාන ආදිය ඇතුළත් වේ. සිසුන්ට සමීප පරිසරය අනුව මෙම වාග්මාලාව, වචන අලුතෙන් එකතු කිරීමෙන් හෝ අඩු කිරීමෙන්, සුදුසු පරිදි වෙනස් කර ගැනීමට ගුරුවරයාට නිදහස ඇත. මෙහි ඉදිරිපෙත් කර ඇති පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ ගණිතය විෂයයන්ට අදාළ හඳුන්වා දී ඇති වචන සියල්ල ම භාවිත කිරීම අනිවාර්ය නොවේ. එමෙන් ම පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයයේ තේමාවන්ට අදාළ ව ඉදිරිපත් කර ඇති ක්‍රියාකාරකම් මෙන් ම ඉංග්‍රීසි ගීත ද ගුරුවරයාගේ අභිමතය පරිදි වෙනස් කර ගැනීමට නිදහස ඇති බව කිව යුතු ය.
- මීට අමතර ව ගණිත විෂයයට අදාළ ව ක්‍රියාකාරකම් පාදන වාචික ඉංග්‍රීසි සඳහා වන වාග්මාලාවක්ද ඉදිරිපත් කර ඇත. පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂය මෙන් ම ගණිතය විෂය ඉගැන්වීමේ දී ද උචිත අවස්ථාවලදී ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි භාවිත කිරීමට අවස්ථාව සැලැස්වීම ගුරුවරයාගේ වගකීමයි.
- ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරකම් පාදක වාචික ඉංග්‍රීසි සඳහා විශේෂයෙන් සකස් කරන ලද මොඩියුලයක් ඇත. පරිසර ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයයේ තේමාවන්ට අනුව කාණ්ඩ කර ඇති වාග්මාලාවක් ද යෝජිත ක්‍රියාකාරකම් තවත් උපදෙස් හා උදව් ද එහි ඇතුළත් කර ඇත. ඉංග්‍රීසි භාෂාවෙන් සකසා ඇති මෙම මොඩියුල ගුරුවරයාගේ කාර්ය භාරය පහසු කර ලීමට සමත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.
- නිවැරදි උච්චාරණය සඳහා මග පෙන්වීමක් ලෙසත්, නිවැරදි රිද්මය හා ගායනා කිරීමේ උපකාරකයක් ලෙසත් ජාතික අධ්‍යාපන ආයතනයේ ඉංග්‍රීසි දෙපාර්තමේන්තුව මඟින් සකසා ඇති 1 වන හා 2 වන ශ්‍රේණි සඳහා වන සිංදු ඇතුළත් කැසට් පටයක් සකස් කර ඇති අතර එක් එක් තේමාව සඳහා ඇති සිංදු පන්තියේ දී ගායනා කිරීම සඳහා මෙම කැසට් පටය උපයෝගී කර ගැනීම ගුරුවරයාට පහසුවක් වනු ඇත.
- ගුරුවරයාට එදිනෙදා භාවිත කළ හැකි පන්ති කාමර යෙදුම් ද මෙහි ඇතුළත් කර ඇත.
- නිවැරදි ව ඉංග්‍රීසි වචන උච්චාරණය කිරීම පිළිබඳ ව සැලකිලිමත් වන්න. අවශ්‍ය වේ නම් මේ සඳහා පාසලේ ඉංග්‍රීසි උගන්වන ගුරුවරුන්ගේ සහ ඉංග්‍රීසි ගුරු උපදේශකවරුන්ගේ උපදෙස් ලබා ගත හැකි ය. එමෙන් ම, ප්‍රාදේශීය ඉංග්‍රීසි උපකාරක මධ්‍යස්ථාවල (Regional English Suppport Centres) සේවය ද ලබා ගෙන ගුරුවරයාගේ ඉංග්‍රීසි දැනුම වර්ධනයට ද මේ තුළින් අවස්ථා සලසා ගැනීමට අපේක්ෂා කෙරේ.

**විශේෂයෙන් සැලකිය යුතු කරුණු කිහිපයක්**

වාචික ඉංග්‍රීසි හඳුන්වා දීමේ ක්‍රියාවලිය යටතේ

* විධිමත් ඉංග්‍රීසි ඉගැන්වීමේ ක්‍රම භාවිතය අපේක්ෂා නොකෙරේ.
* ඉංග්‍රීසි හෝඩියේ අකුරු ඉගැන්වීමට, ඉංග්‍රීසි වචන ලිවීමට ඉගැන්වීම හෝ කියවීම අපේක්ෂා නොකෙරේ.
* විශේෂ පොත්පත් භාවිතය අවශ්‍ය නොවේ.

<table>
<tr><th>Theme</th><th>Objectives</th><th>Content</th></tr>
<tr><td>01. We and the School</td><td>The student will be able to<br>- Use the vocabulary relevant to the theme<br><br>- Greet someone<br><br>- Ask questions<br><br>- E.g. What’s your name?</td><td>Vocabulary :<br>Principal/Vice Principal/Office/Class RoomTeacher/Children/Friend /Bell/Tap/ CanteenWell / Vase / Toilet / Library / Play groundMain hall / Computer / Desk / Chair / DustbinDuster<br>Structures :<br>Good Morning!Good Morning teacher!<br>Good morning children!<br>What’s your name?I’m…………………..<br>Activities :<br><u>Song</u> 1.<br>1. Good Morning to you//<br>Good morning dear children<br>Good Morning to you<br>Good Morning to you//<br>Good morning dear teacher<br>Good Morning to you<br>2. Bits of Paper //<br>Lying on the ground<br>Make the place untidy//<br>Pick them up//<br><u>Activity 09</u><br>Pass the Ball</td></tr>
<tr><td>02. Our Home</td><td>Use the vocabulary relevant to the theme</td><td>Vocabulary :<br>Mother / Father / Sister / Brother / Grand Father/Grand Mother / Uncle /Aunt /Son / Daughter / Friends / Cat / Dog / Fish / Parrot / Rabbit / Clean / Rice / Knife<br>Structures :<br>Thank you.<br>You’re welcome<br>Good Morning<br>Good Afternoon<br>Good Evening<br>Good Night<br>Good bye</td></tr>
</table>

<table>
<tr><th>Theme</th><th>Objectives</th><th>Content</th></tr>
<tr><td></td><td></td><td>Activities:<br><u>Song</u><br>Good Morning dear father, dear father,<br>dear father<br>Good Morning dear father<br>Good morning to you<br>Good morning////<br>Good Morning dear father<br>Good morning to you<br>Good Morning dear mother……….<br>Good Morning dear brother………..<br>Good Morning dear sister……………..</td></tr>
<tr><td>03. Animals that come into the garden</td><td>Identify vocabulary items related to the theme</td><td>Vocabulary :<br>Garden / Dog / Cat / Birds / Cow / Crow / Cock / Hen/Butterfly / Parrot / Pigeon /Squirrel / Hand / Leg/Tail / Beak / Red / Blue /Green / Yellow / White / Black/Brown<br>Structures :<br>Do you have a pet?<br>Yes/ No<br>Activities:<br><u>Song</u><br>In my garden I see a cow<br>Moo-moo-moo-moo<br>Good morning cow<br><br>In my garden I see a hen<br>Cluck- cluck-cluck-cluck<br>This is my hen<br><br>In my garden I see a bird<br>Cheep- cheep- cheep-cheep<br>A beautiful bird<br><u>Activity - 06</u><br>Move like that animal<br>(rabbit, monkey, parrot)</td></tr>
</table>

| Theme | Objectives | Content |
|---|---|---|
| **04. Play with water** | Identify vocabulary items related to the theme<br><br>Use given verbs to express meaning | **Vocabulary :**<br>Water/Drink/Cook/Bathe/Wash/Dance / Soap/Basin / Flower /Red / Blue / Sugar / Salt<br>**Structures :**<br>I wash……………..<br><br>I eat……………<br><br>I drink………………<br>**Activities :**<br>**Song**<br>Swim, swim, swim together//<br>All in the water<br><br>Wash, wash, wash together//<br>All in the water<br><br>Bathe, bathe, bathe together//<br>All in the water<br><br>Play, play, play together//<br>All in the water<br><br>**Activity - 03**<br>Pass the water |
| **05. Sinhala & Tamil New Year Season** | Use relevant vocabulary items to the theme<br><br>Express what they like | **Vocabulary :**<br>Paint / Polish / Wash / Clean / Curtain / Milk Rice / Sweets / Banana (Plantain) /Cake / Shirt / Sarong /Saree/ Frock /T-Shirt/ Short<br>**Structures:**<br>Mother has………..<br>I like……………..<br>**Activities:**<br>**Song**<br>Happy New Year to you<br>Happy New Year to you<br>Happy New Year dear children<br>Happy New Year to you<br><br>Happy New Year to you<br>Happy New Year to you<br>Happy New Year dear teacher<br>Happy New Year to you<br><br>**Activity - 03**<br>New year games |

| Theme | Objectives | Content |
|---|---|---|
| **06. The Sky we see** | Identify vocabulary items related to the theme.<br><br>Ask question using "What" | **Vocabulary:**<br>Day time / Sky /Blue / White / Clouds / Clear / Sun / Orange /Red / Aero plane / Birds / Kite / Fly /Night time / Moon / Stars / Dark / Owl / Bat / Rain / Thunder / Dark<br>**Structures:**<br>What Colour is the………………….<br>**Activities:**<br>**Song**<br>I see the moon, the moon sees me<br>I see the stars, one, two, three<br><br>I see the sun, the sun sees me<br>I see the clouds, one, two, three<br><br>Birds fly in the sky sha la la la la<br>Planes fly in the sky sha la la la la<br>Kites fly in the sky sha la la la la<br>They all fly in the sky<br>**Activity 02**<br>Jump. Let's catch the clouds<br>**Activity 03**<br>Let's fly the parachute |
| **07. Things we eat and drink** | Identify vocabulary items relevant to the theme<br><br>Express likes | **Vocabulary :**<br>Milk / Rice / Fruits / Fruit salad / Mango / Orange/Bananas (Plantain)/Apple/Pineapple/ watermelon /Papaw/Vegetables/Carrot / Beans/Beet root/ leeks/Bread /Hoppers / String hoppers/Curry/Fish/Meat /Ice cream / Breakfast / Lunch / Dinner<br>**Structures :**<br>I like……………and …………………<br>I eat/ drink …………….in the morning<br>**Activities:**<br>**Song**<br>I drink milk in the morning<br>I drink milk in the morning<br>I drink milk in the morning<br>And then I go to school<br><br>I drink tea in the morning<br>I drink tea in the morning<br>I drink tea in the morning<br>And then I go to school<br>**Activity 09**<br>Select the card |

| Theme | Objectives | Content |
|---|---|---|
| **08. How information is received** | Identify vocabulary items relevant to the theme.<br>Use polite forms of language | **Vocabulary:**<br>Good Morning/Please/Thank you /Excuse me/ Hello! / Bye! / Eyes / Ears/ Television / Radio/ News Paper / Telephone / Home work<br>**Structures:**<br>I'm …………….<br>Hold on please<br>**Activities:**<br>**<u>Song</u>**<br>Tring Tring Tring //<br>Hello…. Hello….<br>I'm Shehan//<br>Heshan please//<br>Hold on Shehan//<br>Hold on please<br>Tring….//<br>**<u>Activity -07</u>**<br>Listen & Do |
| **08. Changes in the environment** | Use vocabulary related to the environment.<br>Identify the changes in the environment. | **Vocabulary:**<br>Clean / Wind / Cold / Hot / Beautiful / Sweep / Neat / Broom / Elk broom /Dust Bin / Rain / Umbrella / Class room / Bits of paper / Bits of foods / litter<br>**Structures:**<br>It's ……………<br>A/An<br>**Activities:**<br>**<u>Song</u>**<br>"I hear thunder//"<br>**<u>Activity 06</u>**<br>Who can do? |

| Theme | Objectives | Content |
|---|---|---|
| **10. Our well-being** | Identify vocabulary items related to the theme | **Vocabulary:**<br>Help / Kind / Love / Happy/ Clean / Fresh<br>**Structures:**<br>**Activities:**<br>**Song**<br>This is the way we brush our teeth<br>brush our teeth//<br>This is the way we brush our teeth<br>Early in the morning<br>**Activity 01**<br>Close your eyes<br>Breath in & Breath out |
| **11. How we get our needs** | Name some vocabulary related to the theme.<br>Learn requests for things politely. | **Vocabulary:**<br>Shirt / water bottle / Book / pencil /school bag/ Lunch box/ rice/ jam/ fish / dhal / potato /carrot/ Ginger /curry leaves /chilies / boutique / seller / Super market / fair / Vegetables / fruits / pocket<br>**Structures:**<br>Please give me………<br>Can I have …………<br>Here you are<br>Thank you.<br>**Activities:**<br>**Song**<br>Can I have a bottle please, a bottle please,<br>a bottle please? //<br>Can I have a bottle please?<br>Yes, here you are //<br>Can I have a bag please, a bag please,<br>a bag please? //<br>Can I have a bag please?<br>Yes, here you are //<br>Can I have a doll please, a doll please,<br>a doll please? //<br>Can I have a doll please?<br>Yes, here you are //<br>**Activity - 09**<br>Role play |

| Theme | Objectives | Content |
|---|---|---|
| **12. Transport** | Identify names of vehicles. | **Vocabulary:**<br>Car / Bus / Van / Lorry / Truck / Jeep / Bicycle / Motor Cycle / Tractor / Bowser / Train / Helicopter / Aeroplane / Jet / Ship / Boat / Canoe /Traffic lights Stop / Get Ready / Go / Red / Orange / Green /Yellow / Zebra crossing / Pavement / Left / Right / Police officer<br>**Structures:**<br>I see…………………<br>This is a ……………….<br>I come by……………<br>I walk to school<br>**Activities:**<br>**Song**<br>I see a car<br>You see a car<br>Beep, Beep, Beep<br>We see a car.<br><br>I see a bus<br>You see a bus<br>Broom, Broom, Broom<br>We see a bus.<br><br>I see a train<br>You see a train<br>Puff, Puff, Puff<br>We see a train.<br>**Game**<br>Move like the vehicle |

| Theme | Objectives | Content |
|---|---|---|
| **13. Play with light** | Identify some vocabulary items relevant to the theme<br>Use the question form. | **Vocabulary:**<br>Sun / Star / Moon / Tree / Shadow / Light / Dark /Torch / Lamp / Bulb / Hot / Cold / Bird / Eyes / day time /night / bright<br>**Structures:**<br>It's………………<br>Is it ……….………….?<br>**Activities:**<br>**<u>Song</u>**<br>I like red light//<br>I like green<br>I like you and //<br>You like me// |
| **14. Places where people work** | Identify vocabulary items related to the theme<br>Name the places of work | **Vocabulary:**<br>Uniform / School / Principal / Teacher / Hospital /Doctor / Nurse / Post Office / Postman / Paddy field / Farmer / Mammoty / Paddy /Seed / Building site / Building / Tractor / Driver / Workers / Factory / Hats / Gloves<br>**Structures:**<br>He is …………….<br>She is ………………<br>What is she/he?<br>**Activities:**<br>**<u>Song</u>**<br>The farmer saws the seeds<br>The farmer saws the seeds//<br>Hey ho the dairy O'<br>The farmer saws the seeds<br>The farmer cuts the grain//<br>Hey ho the dairy O'<br>The farmer cuts the grain<br>**Activity 05**<br>Fix the picture/ Show the picture<br>**Activity 07**<br>Select & Win |

| Theme | Objectives | Content |
|---|---|---|
| **15. Different Places in the environment** | Identify some vocabulary items relevant to the theme | **Vocabulary:**<br>Sand / Garden / Tree / Leaf / Stone / Fruit / Field / Colours / Mango / Jack / Orange / Coconut / Soil / Plant / Flowers / Hill / River / Stream / Swamp /Fence<br>**Structures:**<br>There's……………<br>There are……………<br>**Activities:**<br>**Song**<br>Red & yellow//<br>Green, blue and white//<br>Colours of the flowers//<br>We like them//<br>**Activity**<br>Pass the seeds bag |
| **16. People who need our help** | Identify vocabulary items related to the theme<br>Use simple commands.<br>Use polite requests. | **Vocabulary:**<br>Very Good / Well done / My Grand Mother / My grand Father / Help / Blind /Deaf / Cripple /Wheel Chair / Walking stick / Crutches /White cane<br>**Structures:**<br>I can't………………<br>Can You help me?<br>Thank you very much<br>Let's go home<br>**Activities:**<br>**Song** :<br>I can't see //<br>Can you help me<br>I can't see<br>I can help you//<br>Take the cane//<br>Thank you very much//<br>Let's go home//<br>**Activity - 09**<br>Hat game |

# Classroom Language

**Greeting & Wises**

Good morning!
Good afternoon!
Good evening!
Good Bye!
Good Luck!
All the best!
Happy Birthday!
Happy New Year!
Merry Christmas!
Happy Christmas!

**Requests**

May I come in?
May I go out?
Silence please
Listen to me please
Hurry up please
Be quiet
Be careful

**Polite forms**

Thank you
Please, excuse me
I'm sorry

**Praising**

Good
Very good
That's right
Well done
I like it

**Simple commands**

Hands up
Hands down
Run
Jump
Start
Clap your hands
Look at me
Form a line
Form a circle
Don't go out
Get ready

**Simple question forms**

Who is shouting?
What's this?
What's that?
What is it?
Is it a ............?
Is that a ............?
Are you ready?

**ගණිතය විෂය සඳහා හඳුන්වා දෙන වචන මාලාව**

| | | | | |
|---|---|---|---|---|
| Add | Finish | Three | One | Seven |
| Big | Front | Tall | Order | Short |
| Balance | Game | Weight | Red | Size |
| Count | Little | Length | Rectangle | Small |
| Eight | Two | Mathematics | Second | High |
| Four | Ten | Money | Six | Patterns |
| Five | | | | |

# 4.0 දෙවන ජාතික භාෂාව (දෙමළ)

### හැඳින්වීම

ශ්‍රී ලාංකිකයකු වශයෙන්, තමා සමග ජීවත් වන සහෝදර ජනතාවගේ භාෂාව ඉගෙනීම තුළින් එකිනෙකා කෙරෙහි අවබෝධයෙන් ක්‍රියා කිරීමේ හැකියාවන් සිසුන් තුළ වර්ධනය කිරීම මෙමඟින් බලාපොරොත්තු වේ.

මෙම අරමුණ ඇති ව දෙවන ජාතික භාෂාවක් ඉගැන්වීම තුළින් භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් බලාපොරොත්තු නොවන අතර, යම් ප්‍රමාණයක සන්නිවේදන හැකියාවක් වර්ධනය කර ගැනීමටත්, එකිනෙකා කෙරෙහි සංවේදී බවක් ඇති කර ගැනීමටත් අපේක්ෂා කෙරේ.

ක්‍රියාශීලී ජාතික ඒකාබද්ධතාවක් ඇති කර ගැනීමට මෙන් ම ජාතික සමගිය ඇති කිරීමේ මූලික අඩිතාලමක් දැමීමට ද දෙවන ජාතික භාෂාවක් ඉගෙනීම රුකුලක් වෙතැයි අපේක්ෂා කරනු ලැබේ.

ඒ අනුව පළමුවන ප්‍රධාන අවධියේ දී දෙවන ජාතික භාෂාව යටතේ පහත සඳහන් නිපුණතා ඉටු කර ගැනීමට මෙම ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය සකසා ඇත.

මෙහි දී සවන් දීම හා කතා කිරීම යන භාෂා ක්ෂේත්‍ර සම්බන්ධ ක්‍රියාකාරකම් පමණක් ඇතුළත් කර ඇත. ඒ අනුව මෙම නිපුණතා සකසා ඇත්තේ සිසුන්ගේ වයස, පරිණතිය හා ඔවුන්ගේ අත්දැකීම් සැලකිල්ලට ගනිමින් ය.

### ප්‍රාථමික අධ්‍යාපන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා අවශ්‍යතා සපුරා ගැනීමේ දී අදාළ වචන හා වගන්ති යොදා කතා කරයි.
- භාෂාවකට සවන් දී අර්ථාන්විත ව ප්‍රතිචාර දක්වයි.
- භාෂාවක් හැසිරවීමේ යහ පුරුදු ප්‍රදර්ශනය කරයි.
- අන් අය ඉදිරියේ තම අදහස් ද ප්‍රකාශ කිරීමට ඉදිරිපත් වෙයි.
- කියවීමේ හැකියා ප්‍රදර්ශනය කරමින් එය අර්ථාන්විත ව භාවිත කරයි.
- කවි, ගී අසමින් ගයමින් රස විඳියි.
- තවත් භාෂාවක් හැසිරවීම තුළින් වින්දනයක් ලබයි.
- තවත් භාෂාවක් හැසිරවීමට ඇති හැකියා අගයයි.

### පළමුවන ප්‍රධාන අවධිය සඳහා නිපුණතා

- එදිනෙදා ජීවිතයේ විවිධ අවස්ථාවන්හි දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.
- තමා පිළිබඳ තොරතුරු පැහැදිලි ව නිවැරදිව හා සුහදශීලී ව ප්‍රකාශ කරයි.
- පාසලේ දී තම අවශ්‍යතා ඉටුකර ගැනීම සඳහා සුහදව හා ආචාරශීලී ව ඉල්ලීම් කරයි.
- පාසලේ දී ලැබෙන විධානවලට අවනතව කටයුතු කරයි.
- තමාට සමීපතමයන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- අංක හඳුනාගෙන පැහැදිලි ව හා නිවැරදි උච්චාරණය සහිත ව කියයි.
- පාට හඳුනාගෙන නිවැරදි උච්චාරණයෙන් යුතු ව නම් කරයි.
- සරල කවි, ගී අංග චලන සහිත ව ගායනා කරයි.

**පළමුවන ශ්‍රේණිය සඳහා නිපුණතා**

- යමෙකු හමුවීමේ දී හා වෙන් වීමේ දී ආචාරශීලීව හා සුහද ව සුබ පතයි.
- තමාගේ නම නිවැරදි ව හා සුහද ව ප්‍රකාශ කරයි.
- ආචාරශීලී ව හා සුහද ව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි.
- පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.
- තම සමීප යහළුවන්ගේ තොරතුරු සුහද ව විමසයි.
- 1 සිට 5 තෙක් අංක දෙමළ භාෂාවෙන් කියයි.
- පාට පහක් නිවැරදි ව ප්‍රකාශ කරයි.
- සරල කවි, ගී අංග චලනය සහිත ව ගායනා කරයි.

**ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය**

සැලසුම් සහගත ක්‍රියාකාරකම් ඇසුරින් දෙවන ජාතික භාෂාවට අදාළ ව අපේක්ෂිත නිපුණතා ළඟා කර ගැනීම සඳහා ක්‍රියා කිරීම අවශ්‍ය ය. සිසුන් අදාළ නිපුණතා කරා ළඟා කර ගැනීමේලා යෝජිත ක්‍රියාකාරකම් යොදා ගැනීමට මෙන්ම අවස්ථාවෝචිත ව ක්‍රියාකාරකම් සැලසුම් කර ගැනීමට ද ඔබට නිදහස ඇත.

## දෙවන ජාතික භාෂාව (දෙමළ)

### විෂය නිර්දේශය

2007 වසරේ සිට හඳුන්වා දුන් අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලට අනුව සිංහල සිසුන් සඳහා දෙමළ භාෂාවත්, දෙමළ සිසුන් සඳහා සිංහල භාෂාවත් දෙවන ජාතික භාෂාව වශයෙන් පළමුවන ශ්‍රේණියේ සිට ඉගැන්වීමට සැලසුම් කරන ලදී. ඒ අනුව 2016 වසරේ දී හඳුන්වා දෙනු ලබන අධ්‍යාපන ප්‍රතිසංස්කරණ මගින් එම ගුරු මාර්ගෝපදේශය තවදුරටත් සංවර්ධනය කර ඉදිරිපත් කරනු ලැබේ. මෙය ක්‍රියාත්මක කළ යුතු ආකාරය සවිස්තරාත්මක ව ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ දෙවන ජාතික භාෂා කොටසට ඇතුළත් කර ඇත.

**නිපුණතාව**

යමෙකු හමුවීමේ දී හා වෙන් වීමේ දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.

| | | |
|---|---|---|
| **வணக்கம்** | වණක්කම් | (ආයුබෝවන්) |

**නිපුණතාව**

තමාගේ නම නිවැරදිව හා සුහදව ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| **நான் ..........** | නාන් ................ | (මම ...............) |
| **எனது பெயர் ...........** | එනදු පෙයර් ............. | (මගේ නම .............) |

**නිපුණතාව**

ආචාරශීලී ව හා සුහද ව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි.

| | | |
|---|---|---|
| **எடுங்கள்** | එඩුංගළ් | (ගන්න) |
| **தாருங்கள்** | තාරුංගළ් | (දෙන්න) |
| **போங்கள்** | පෝංගළ් | (යන්න) |
| **வாருங்கள்** | වාරුංගළ් | (එන්න) |
| **சொல்லுங்கள்** | සොල්ලුංගළ් | (කියන්න) |
| **பாடுங்கள்** | පාඩුංගළ් | (ගයන්න) |
| **பாருங்கள்** | පාරුංගළ් | (බලන්න) |
| **எழுதுங்கள்** | එලුදුංගළ් | (ලියන්න) |
| **சிரியுங்கள்** | සිරියුංගළ් | (හිනාවෙන්න) |

**නිපුණතාව**

පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

| | | |
|---|---|---|
| **எழும்புங்கள்** | එලුම්බුංගළ් | (නැගිටින්න) |
| **இருங்கள்** | ඉරුංගළ් | (වාඩිවෙන්න) |
| **கை தட்டுங்கள்** | කෛතට්ටුංගළ් | (අත්පුඩි ගසන්න) |
| **ஓடுங்கள்** | ඕඩුංගළ් | (දුවන්න) |
| **நில்லுங்கள்** | නිල්ලුංගළ් | (නවතින්න) |
| **துள்ளுங்கள்** | තුළ්ළුංගළ් | (උඩපනින්න) |

**නිපුණතාව**

තම සමීප යහළුවන්ගේ තොරතුරු සුහද ව විමසයි.

| | | |
|---|---|---|
| **உங்கள் பெயர் என்ன?** | උංගළ් පෙයර් එන්න ? | (ඔබේ නම මොකක් ද ?) |
| **உங்கள் ஊர் எது ?** | උංගල් ඌර් එදු ? | (ඔබේ ගම කොහේ ද ?) |
| **எனது ஊர் ............** | එනදු ඌර් ................ | (මගේ ගම ..................) |

**නිපුණතාව**

1 - 5 තෙක් අංක දෙමළ භාෂාවෙන් කියයි.

| | | |
|---|---|---|
| **ஒன்று** | ඔන්රු | (එක) |
| **இரண்டு** | ඉරණ්ඩු | (දෙක) |
| **மூன்று** | මූන්රු | (තුන) |
| **நான்கு** | නාන්ගු | (හතර) |
| **ஐந்து** | ඓන්දු | (පහ) |

**නිපුණතාව**

පාට පහක් නිවැරදි ව ප්‍රකාශ කරයි.

| | | |
|---|---|---|
| **நீல நிறம்** | නීල නිරම් | (නිල් පාට) |
| **பச்சை நிறம்** | පච්චෙ නිරම් | (කොළ පාට) |
| **மஞ்சள் நிறம்** | මඤ්ජල් නිරම් | (කහ පාට) |
| **வெள்ளை நிறம்** | වෙල්ලෙ නිරම් | (සුදු පාට) |
| **கறுப்பு நிறம்** | කරුප්පු නිරම් | (කළු පාට) |

**නිපුණතාව**

සරල කවි, ගී තාලානුකූලව ගායනා කරයි.

## නිපුණතාව : යමකු හමුවීමේ දී හා වෙන්වීමේ දී ආචාරශීලී ව හා සුහද ව සුබ පතයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**
- ගුරුවරයා සිසුන් ඉදිරියේ "ආයුබෝවන්" යනුවෙන් පවසා ඉන්පසු ; **"வணக்கம"** (වණක්කම් -ආයුබෝවන්) ලෙසින් ද දෑත් එකතු කර ආචාර කරන්න.
- නැවත **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) යනුවෙන් සිසුන් ලවා ද ගුරුවරයාට ආචාර කිරිමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**
- ප්‍රථමයෙන් සිසුන් දෙදෙනෙකු ඉදිරියට කැඳවා දෑත් එකතුකොට එකිනෙකාට **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) යැයි කියා සුහපැතීමට සළස්වන්න.
- මේ ආකාරයට යුගල බැගින් සිසුන් ඉදිරියට කැඳවා එකිනෙකාට **"வணக்கம்"** (වණක්කම්- ආයුබෝවන්) යැයි කියා සුබ පැතීමට යොමු කරන්න.
- නැවත එක් සිසු කණ්ඩායමක් සිටගැනීමට සලස්වා අනෙක් කණ්ඩායම වෙත **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) යැයි පවසා සුබ පැතීමට යොමු කරන්න.
- මේ ආකාරයට සුබ පැතීමට සෑම සිසු කණ්ඩායමකටම අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**
- වෙනත් පන්තියක ගුරුභවතකු පන්තියට කැඳවා සිසුන් ලවා **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) ලෙස ආචාර කරවන්න.
- ගුරුවරයා විසින් උදෑසන පන්ති ආරම්භයේ දී සිංහල බසින් මෙන් ම දෙමළ බසින් ද සිසුන්ට ආචාර කිරීම පුරුද්දක් වශයෙන් පවත්වාගෙන යන්න.
- පන්තියට වෙනත් ගුරුවරයකු පැමිණෙන සෑම අවස්ථාවකදී ම මේ ආකාරයට භාෂා දෙකෙන් ම සුබ පැතීමට සිසුන් යොමු කරන්න.

## නිපුණතාව : තමාගේ නම නිවැරදිව හා සුහදව ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුවරයා තමාව පෙන්වා, "நான் குமாரி" (නාන් කුමාරි - මම කුමාරි) ලෙස කිහිප වතාවක් පවසන්න.
- ඉන්පසු සිසුවෙක් ඉදිරියට කැඳවා ඔහුගේ නම ද ඒ ආකාරයෙන් ම පැවසීමට යොමු කරන්න.
  *උදා :* "நான் சமன்" (නාන් සමන් -මම සමන්)
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකුට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- පළමුවෙන් ම ගුරවරයා රවුමේ මැදට ගොස් බෝලයක් අතට ගෙන තමා හඳුන්වා දෙන්න.
  "வணக்கம்" (වණක්කම් - ආයුබෝවන්)
  "நான் குமாரி" (නාන් කුමාරි - මම කුමාරි)
- අනතුරුව රවුමේ සිටින සිසුවෙකු වෙත බෝලය විසිකරන්න. බෝලය ලැබුණු සිසුවා රවුම මැදට පැමිණ එම ආකාරයට ම තමාව හඳුන්වා දිය යුතු බව පවසන්න.
  *උදා :* "வணக்கம்" (වණක්කම් - ආයුබෝවන්)
  "நான் சமன்" (නාන් සමන් - මම සමන්)
- බෝලය අතැති සිසුවා වෙනත් සිසුවෙකු වෙත බෝලය යොමු කළ යුතු ය. බෝලය ලබා ගත් සිසුවා ද ඉහත ආකාරයට තමා හඳුන්වා දිය යුතු ය.
- මේ ලෙස රවුමේ සිටින සෑම සිසුවෙකුට ම තමා හඳුන්වා දීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 3 :**

- නැවතත් ගුරුවරයා තමා ව පහත ආකාරයට හඳුන්වා දෙන්න.
  "எனது பெயர் குமாரி" (එනදු පෙයර් කුමාරි - මගේ නම කුමාරි) -
- මෙසේ කියමින් ක්‍රියාකාරකම් අංක 02 හි මෙන් සිසුන් ක්‍රියාකාරකමෙහි යොදවන්න.

**ක්‍රියාකාරකම 4 :**

- පන්තියේ සියලු සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න. ගුරුවරයා ද රවුමේ ඇතුළත සිටගන්න. ගුරුවරයා විසින් තමන් ඉදිරියේ සිටින සිසුවකුට "வணக்கம ! நான் குமாரி. எனது பெயர குமாரி" (වණක්කම්! නාන් කුමාරි. එනදු පෙයර් කුමාරි-ආයුබෝවන්. මම කුමාරි. මගේ නම කුමාරි) ලෙස පවසන්න.
- රවුමේ සිටින එක් සිසුවකු හට වලස් පැංචෙක්/බෝනික්කෙක් ලබා දෙන්න.
- සිසුන් විසින් වලස් පැංචා/බෝනික්කා රවුම වටේට අතින් අත මාරුකරමින් යැවිය යුතු අතර ගුරුවරයා විසින් ලබා දෙන සංඥාවකට අනුව එම ක්‍රියාව නතර කළ යුතු වේ.
- ගුරුවරයාගේ සංඥාව නිකුත් වන අවස්ථාවේ දී වලස් පැංචා/බෝනික්කා අත රැඳි සිසුවා විසින් ඉහත ආකාරයට තම නම ප්‍රකාශ කළ යුතු ය.
- සෑම සිසුවකුටම තම නම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලැබෙන තෙක් මෙම ක්‍රියාකාරකම සිදුකරන්න.

## නිපුණතාව : ආචාරශීලී ව හා සුහදව තම පන්තියේ මිතුරන්ගෙන් ඉල්ලීම් කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම** 1 :

- ගුරුවරයා බෝලයක්/ඇටමල්ලක් සිසුවකු වෙත දිගු කර "ගන්න" යැයි පවසන්න.
- සිසුවා බෝලය/ඇටමල්ල ගත් පසු නැවතත් "දෙන්න" යනුවෙන් පවසා එය ඉල්ලා ගන්න.
- නැවත සිසුවාට බෝලය දෙන අතර **"எடுங்கள்"** (එඩුංගළ් - ගන්න) යනුවෙන් පවසන්න.
- **"தாருங்கள்"**(තාරුංගළ් - දෙන්න) ලෙස පවසමින් බෝලය නැවත ලබා ගන්න.
- මේ ආකාරයට ගුරුවරයා සිසුන් කිහිප දෙනෙකු සමග ක්‍රියාකාරකමෙහි නිරත වන්න. පන්තියේ සිසුන් යුගල වශයෙන් වෙන්කර යම් ද්‍රව්‍යයක් (*උදා* : පැන්සලක්, පොතක්, මලක්) සෑම යුගලයකටම ලබා දී ක්‍රියාකාරකමෙහි යොදවන්න.
- ගුරුවරයා විසින් පන්ති කාමරයේ දී යමක් ගන්නා විටත්, ලබා දෙන විටත් මෙම වචන නිතර භාවිත කරමින් සිසුන් ද ඒ සඳහා පොළඹවන්න.

**ක්‍රියාකාරකම** 2 :

- පන්තියේ සිසුන් කණ්ඩායම් තුනකට හෝ හතරකට වෙන් කරන්න. සෑම කණ්ඩායමක් ම වෙන් වෙන් වශයෙන් වාඩිකරවන්න.
- එක් එක් කණ්ඩායම සෙල්ලම් කඩයක් ලෙස සලකා ඒ සෑම කණ්ඩායමකටම පොත්, පැන්සල්, සෙල්ලම් බඩු, බෝතල් වැනි දේ ලබා දෙන්න. කණ්ඩායමේ එක් සිසුවෙක් වෙළඳසැලේ සේවකයකු ලෙස නම් කරන්න. ගුරුතුමිය විසින් ද්‍රව්‍ය හෝ උපකරණ පෙන්වා ඒවා ඉල්ලා සිටින ආකාරය නිරූපණය කරන්න.

  *උදා* : පැන්සල පෙන්වා, **"தாருங்கள்"** (තාරුංගළ් - දෙන්න), **"எடுங்கள்"** (එඩුංගළ් - ගන්න) ලෙස පවසා එය නැවත වෙළඳසැලේ සිටින සිසුවාට ලබා දෙන්න.
- මෙය කිහිප වාරයක් ආදර්ශනය කරන්න.
- ගුරුවරයා නිරූපණය කළ ආකාරයට සෑම කණ්ඩායමකම සිටින සිසුන්ට ඉහත වචන භාවිත කරමින් ක්‍රියාකාරකමෙහි නිරත වීමට අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම** 3 :

- ගුරුතුමිය සිසුන් ඉදිරියට පැමිණ අංග චලනය සමඟ "එන්න" යනුවෙන් සිසුවෙකුට පවසන්න. නැවතත් අතින් සංඥා කරමින් 'යන්න' යයි පවසන්න. එම සිසුවාටම පෙර පරිදි අතින් සංඥා කරමින්, **"வாருங்கள்"** (වාරුංගළ් - එන්න) ලෙස පවසන්න.
- නැවත සංඥා කරමින් , **"போங்கள்"** (පෝංගළ් - යන්න) ලෙස පවසන්න.
- මේ ආකාරයට සිසුන් කිහිප දෙනෙකුට විධාන ලබා දෙමින් ඉහත වචන සිසුන්ට හොඳින් හුරු වනතුරු ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

**ක්‍රියාකාරකම** 4 :

- නිල්, කහ, රතු, සුදු වර්ණවලින් යුතු මල් සිසුන්ට ප්‍රමාණවත් පරිදි සකස් කරගන්න. සිසුන් එළිමහනක කැඳවා රවුමක් ආකාරයට සිටුවන්න. ඉන්පසු සිසුන්ට **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) යැයි සුභ පතන්න. අතින් සංඥා කරමින් එක් සිසුවකුට "එන්න" යැයි කියන්න. ආපසු අතින් සංඥා කරමින් "යන්න" ලෙස පවසන්න.
- එම සිසුවාට ඉහත ආකාරයට ම සංඥා කරමින්, **"வாருங்கள்"** (වාරුංගළ් - එන්න) ලෙස සංඥා කරමින් **"போங்கள்"** (පෝංගළ් - යන්න) ලෙසත් පවසන්න.
- ඉහත විධාන දෙක හොඳින් අවබෝධ කරගත් පසු ඒ අතරට, **"துள்ளுங்கள்"** (තුළ්ළුංගළ් - උඩපනින්න) යන වචනය යොදා ගනිමින් තවදුරටත් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.

- සකස් කරගත් මල් රවුම පුරා විසුරුවන්න ඉහත ආකාරයට සිසුවකු, **"வாருங்கள்"** (වාරුංගල් - එන්න) යනුවෙන් පවසමින් කැඳවන්න.
- **"எடுங்கள்"** (එඩුංගල් - ගන්න) යනුවෙන් පවසමින් අතින් සංඥා කර මලක් ගැනීමට සිසුවා යොමු කරන්න.
- **"தாருங்கள்"** (තාරුංගල් - දෙන්න) යනුවෙන් පවසා මලක් තමාට ලබා දෙන ලෙස සංඥා කරන්න. නැවත ගුරුවරයා, **"எடுங்கள்"** (එඩුංගල් - ගන්න) යැයි පවසා මල නැවත සිසුවාට ලබා දෙන්න.
- **"போங்கள்"** (පෝංගල් - යන්න) යනුවෙන් පවසා සිසුවා ආපසු යවන්න.
- මෙය කිහිප වාරයක් ආදර්ශනය කරන්න.
- ගුරුවරයා නිරූපණය කළ ආකාරයට වරකට සිසුන් දෙදෙනෙකු බැගින් කැඳවා ඉහත වචන භාවිතා කරමින් ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.
- **சிரியுங்கள்** සිරියුංගල්(හිනාවෙන්න) යන වචනයෙහි තේරුම සිසුන්ට පහදන්න. විෂයමාලාවේ ක්‍රියාකාරකම් සිදුකරන අතර සුදුසු අවස්ථාවල දී එය භාවිත කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- විෂය නිර්දේශයේ සඳහන් ඕනෑම සිංහල හෝ දමිල ගීතයක් සිසුන් සමඟ ගයන්න.
- ගීතය ආරම්භ කරන සෑම අවසථාවකම **"பாடுங்கள்"** (පාඩුංගල් - ගයන්න) ලෙස පවසා සිසුන් සමඟ ගීත ගායනා කරන්න.
- **"பாடுங்கள்"** (පාඩුංගල් - ගයන්න) යන වචනය සිසුන්ට හුරුවන තෙක් මේ ආකාරයට භාවිත කරන්න.
- **"பாடுங்கள்"** (පාඩුංගල් - ගයන්න) ලෙස ගුරුවරයා විධාන කළ විට සිසුන් කණ්ඩායමින් කණ්ඩායමට ගීතය ගායනා කරවීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 6 :**

- 1 සිට 5 දක්වා සංඛ්‍යා සහිත විශාල ප්‍රමාණයේ කාඩ්පත් පහක් සකස් කරගන්න.
- සිසුන්ට දැස් වසා ගැනීමට උපදෙස් දෙන්න
- ගුරුවරයා **"பாருங்கள்"** (පාරුංගල් - බලන්න) ලෙස කියූ විට දැස් හැර කාඩ්පත දෙස බැලිය යුතු බව පවසන්න.
- සිසුන්ට කාඩ්පත් දෙස බලා එහි සඳහන් සංඛ්‍යාව පවසන ලෙස උපදෙස් දෙන්න.
- මේ ආකාරයට රූප කාඩ්පත් පෙන්වමින් **"பாருங்கள்"** (පාරුංගල් - බලන්න) යන වචනය සිසුන්ට හුරුවන තෙක් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.
- මේ ආකාරයට සෑම කණ්ඩායමකටම ක්‍රියාකාරකමෙහි නිරතවීමට අවස්ථාව ලබා දෙන්න.

## නිපුණතාව : පන්ති කාමරයේ දී ගුරුවරයාගෙන් ලැබෙන විධානවලට අවනත ව ක්‍රියා කරයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- පන්තියේ සිසුන් සියලු දෙනාම වාඩි වී සිටීමට සලස්වා අතින් සංඥා කරමින් **"எழும்புங்கள்"** (එලුම්බුංගළ් - නැගිටින්න) යනුවෙන් පවසමින් සිසුන් නැගිට්ටවන්න. නැවත අතින් සංඥා කරමින්, **"இருங்கள்"** (ඉරුංගළ් - වාඩිවෙන්න) යනුවෙන් පවසමින් සිසුන් වාඩි කරවන්න. මේ අයුරින් කිහිප වතාවක් ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- දිනය තුළ හොඳ වැඩක් කළ සිසුවෙකු පන්තියේ ඉදිරියට ගෙන ගුරුතුමී විසින් සිසුවාට ප්‍රශංසා කර, අනෙක් සිසුන්ට එම සිසුවා වෙනුවෙන් අත්පුඩි ගසන ලෙස පවසන්න.
- ගුරුතුමිය ද අත්පුඩි ගසමින් පන්තියේ සිසුන්ට, **"கை தட்டுங்கள்"** (කෛතට්ටුංගළ් - අත්පුඩි ගසන්න) ලෙස පවසා ඔවුන් ද අත්පුඩි ගැසීමට යොමු කරන්න.
- මේ ආකාරයට හොඳ වැඩ කළ තවත් සිසුන් ඉදිරියට කැඳවා **"கை தட்டுங்கள்"** (කෛතට්ටුංගළ්- අත්පුඩි ගසන්න) යන වචනය අවධාරණය කරමින් ඉහත ක්‍රියාකාරකම වර්ෂය පුරා ම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 3 :**

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- මෙතෙක් උගත් විධාන යොදා ගනිමින් පහත දැක්වෙන ක්‍රීඩාවේ සිසුන් නිරත කරවන්න.

  සයිමන් කීවා **"கை தட்டுங்கள்"** (කෛතට්ටුංගළ් - අත්පුඩි ගසන්න)
- මෙසේ කියන විට සිසුන් ප්‍රතිචාර දැක්විය යුතු ය. "සයිමන්" යන නම හැර වෙනත් නම් යොදා ගනිමින් දෙන විධාන සඳහා සිසුන් ප්‍රතිචාර නොදැක්විය යුතු ය.
- වැරදි ප්‍රතිචාර දක්වන සිසුන් රවුමෙන් ඉවත් විය යුතු අතර, ඔවුන් අනෙකුත් සිසුන් නිවැරදි ව ක්‍රියාකාරකමෙහි නිරත වන්නේ දැයි නිරීක්ෂණය කළයුතු වේ.

**ක්‍රියාකාරකම 4 :**

- සිසුන් රවුමක ආකාරයට සිටුවන්න.
- ගුරුවරයා රවුමේ මැද සිට පහත විධාන සිංහල භාෂාවෙන් ලබා දෙන්න.
- රවුම වටේ දුවන්න. නවතින්න.
- අනතුරුව, "දුවන්න" වෙනුවට **"ஓடுங்கள்"** (ඕඩුංගළ් - දුවන්න) ද,
  "නවතින්න" වෙනුවට **"நில்லுங்கள்"** (නිල්ලුංගළ් - නවතින්න) යන දෙමළ වචන භාවිත කරමින් ළමුන් නැවත ක්‍රියාකාරකමෙහි නිරත කරවන්න.

## නිපුණතාව : තම සමීප යහළුවන් ගේ තොරතුරු සුහදව විමසයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- ගුරුතුමිය ප්‍රථමයෙන් ම **"வணக்கம்"** (වණක්කම් - ආයුබෝවන්) යනුවෙන් ආචාර කර, මම ........... (කුමාරි) යනුවෙන් පවසන්න.
- මෙසේ ගුරුතුමිය තමාගේ නම පවසා වෙනත් සිසුවෙකුගෙන් "ඔබේ නම කුමක්දැ"යි අසන්න.

  සිසුවා - මගේ නම . . . . (සමන්)
- මේ ආකාරයෙන් සිසුන් කිහිපදෙනෙකුගෙන් විමසන්න.
- නැවත "நான் குமாரி" (නාන් කුමාරි - මම කුමාරි) **"உங்கள் பெயர் என்ன?"** (උංගල් පෙයර් එන්න ? - ඔබේ නම මොකක් ද ?) ලෙස විමසන්න.
- ඒ අයුරින් ම සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසා පිළිතුර ලබාගන්න.
- ඔබේ නම කුමක් දැයි යන්න දෙමළ බසෙහි දී **"உங்கள் பெயர் என்ன?"** (උංගල් පෙයර් එන්න? - ඔබේ නම මොකක් ද ?) ලෙස යෙදෙන බව මෙම ක්‍රියාකාරකම ආශ්‍රයෙන් සිසුන්ට අවබෝධ වීමට සලස්වන්න.
- සිසුන් දෙදෙනා බැගින් ඉහත සඳහන් දෙබස පුහුණුවීමට යොමු කරන්න.
- පසුව කණ්ඩායමේ සිටින අනෙක් සෑම සිසුවෙකු සමඟ ද එම ක්‍රියාකාරකමෙහිම නිරත වෙමින් කෙනෙකුගේ නම කුමක් ද යන්න දෙමළ බසින් ඇසීමටත්, තම නම ප්‍රකාශ කිරීමටත් තවදුරටත් අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සිසුන් රවුමක් ආකාරයට සිටුවන්න.
- ගුරුවරයා බෝලයක් රැගෙන එම රවුමට එකතුවන්න.
- ගුරුවරයා තමාගේ නම "நான் குமாரி" (නාන් කුමාරි - මම කුමාරි) යැයි පවසා **"உங்கள் பெயர் என்ன?"** (උංගල් පෙයර් එන්න ? - ඔබේ නම මොකක් ද ?) ලෙස විමසමින් බෝලය එක් සිසුවකුට පිරිනමන්න.
- බෝලය අල්ලා ගත් සිසුවා තමාගේ නම **"நான் சமன்"** (නාන් සමන් - මම සමන්), **"உங்கள் பெயர் என்ன?"** (උංගල් පෙයර් එන්න ? - ඔබේ නම මොකක් ද ?) ලෙස විමසමින් බෝලය තවත් සිසුවෙකු වෙත යොමු කළ යුතු ය.
- බෝලය ලබාගත් සිසුවා ද තම නම **"நான் மாலா"** (නාන් මාලා - මම මාලා), යැයි ප්‍රකාශ කොට රවුමේ සිටින වෙනත් යහළුවෙකුට බෝලය යොමු කරමින් **"உங்கள் பெயர் என்ன?"** (උංගල් පෙයර් එන්න ? - ඔබේ නම මොකක් ද ?) ලෙස විමසිය යුතු ය.
- මෙලෙස සියලුම සිසුන් වෙත බෝලය යොමු කරමින් ක්‍රියාකාරකමෙහි නිරතවන්න.

**ක්‍රියාකාරකම 3 :**

- ගුරුවරයා තමාගේ ගම සිංහලෙන් පවසන්න. *උදා* : මගේ ගම බලංගොඩ
- මෙලෙස සිසුන් කිහිප දෙනෙකු ගෙන් ද ඔවුන්ගේ ගම හා නම් විමසා පිළිතුරු ලබා ගන්න.
- අනතුරුව ගුරුවරයා, **"எனது ஊர் பழங்கொட"** (එනදු ඌර් බලංගොඩ - මගේ ගම බලංගොඩ) ලෙස පවසන්න.
- මේ අයුරින් සෑම සිසුවෙකුට ම තමාගේ ගමේ නම ප්‍රකාශ කිරීමට අවස්ථාව ලබා දෙන්න.

- නැවත ගුරුවරයා, **"எனது ஊர் பழங்கொட"** (එනදු ඌර් බලංගොඩ - මගේ ගම බලංගොඩ) **"உங்கள் ஊர் எது?"** (උංගළ් ඌර් එදු ? - ඔබේ ගම කොහේ ද ?) යනුවෙන් සිසුන් කිහිප දෙනෙකුගෙන් විමසන්න.
- ගුරුවරයා මේ අයුරින් සෑම සිසුවෙකුගෙන් ම විමසිය යුතු ය. පසුව තම කණ්ඩායමේ අනෙක් සිසුන්ගෙන්, **"உங்கள் ஊர் எது ?"** (උංගළ් ඌර් එදු ? - ඔබේ ගම කොහේ ද ?) යන්න යොදා ගනිමින් ඔවුන්ගේ ගම විමසීමට සිසුන් යොමු කරන්න.

**ක්‍රියාකාරකම 4**


- වරකට එක් සිසුවෙක් බැගින් පන්තියේ ඉදිරියට කැඳවන්න. සිසුවා අතට මයික්‍රොෆෝනයක්/මයික්‍රොෆෝනයක ආකෘතියක් ලබා දී **"நான் சமன்"** (නාන් සමන් - මම සමන්), **"எனது ஊர் கொழும்பு"** (එනදු ඌර් කොළඹ - මගේ ගම කොළඹ) ලෙස පවසා වෙනත් සිසුවකු වෙත මයික්‍රොෆෝනය ලබා දිය යුතු වේ.
- මයික්‍රොෆෝනය ලබාගත් සිසුවා ද එම ආකාරයටම තමා පිළිබඳ ව හඳුන්වා දිය යුතු ය.
- මේ ලෙස සෑම සිසුවකුටම අවස්ථාව ලැබෙන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.

## නිපුණතාව : 1 - 5 තෙක් අංක දෙමළ භාෂාවෙන් කියයි.

### ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- 1 - 5 තෙක් ඉලක්කම් සහිත පුවරු පහක් සකස් කරගන්න.




- සිසුන් සියලු දෙනා සමඟ මෙම ගීතය ගායනා කරන්න.

  ඔන්රු ඔන්රු ලල්ල ලල්ල ලා
  ඉරණ්ඩු ඉරණ්ඩු ලල්ල ලල්ල ලා
  මූණ්රු මූණ්රු ලල්ල ලල්ල ලා
  නාන්ගු ඓන්දු ලල්ල ලල්ල ලා

- එකේ ඉලක්කම සහිත පුවරුව සිසුන්ට ඉදිරිපත් කොට එය, "**ஒன்று**" (ඔන්රු - එක) ලෙස හඳුන්වා දෙන්න. සිසුන් ලවා "ඔන්රු" යන්න කිහිප වතාවක් කියවන්න.
- ඒ සමඟ "ඔන්රු ඔන්රු" ගීතය ගායනා කරවන්න. මේ අයුරින් 2, 3, 4, 5 යන ඉලක්කම් සඳහා සකසා ගත් පුවරු යොදා ගනිමින් සිසුන්ට එම ඉලක්කම්වලට යොදන දෙමළ වචනය හුරු කරවන්න.

| | | |
|---|---|---|
| **ஒன்று** | ඔන්රු | 1 |
| **இரண்டு** | ඉරණ්ඩු | 2 |
| **மூன்று** | මූන්රු | 3 |
| **நான்கு** | නාන්ගු | 4 |
| **ஐந்து** | ඓන්දු | 5 |

- විටින් විට ඉහත ගීතය ද ගායනා කරන්න. ගීතය ගායනා කරන අතර අතැඟිලි යොදා ගනිමින් එම අදාළ සංඛ්‍යා පෙන්වීමට ද යොමු කරන්න

**ක්‍රියාකාරකම 2 :**

- 1 - 5 තෙක් සංඛ්‍යා සඳහන් කාඩ්පත් සහිත පෙට්ටි සිසු කණ්ඩායම්වලට ගැලපෙන ප්‍රමාණයක් සකස් කර ගන්න. එයින් එක් පෙට්ටියක් ගුරුතුමිය විසින් ගෙන ඉන් එක කාඩ්පතක් ඉවතට ගන්න. එය පන්තියට පෙන්වා එහි ඇති ඉලක්කම කුමක් දැයි දෙමළ බසින් හඳුන්වන ලෙස සිසුන්ට පවසන්න.
- මේ ආකාරයට සියලුම සංඛ්‍යා කාඩ්පත් පෙන්වා සිසුන්ගෙන් පිළිතුරු ලබා ගන්න.
- කාඩ්පත්වල සඳහන් සංඛ්‍යා නාම සිසුන් හොඳින් අවබෝධ කරගත් පසු සෑම කණ්ඩායමකටම කාඩ්පත් සහිත පෙට්ටිය බැගින් ලබා දෙන්න.
- කණ්ඩායමේ එක් සිසුවෙකු පෙට්ටියෙන් කාඩ්පත් වරකට එක බැගින් පිටතට ගෙන එහි සඳහන් සංඛ්‍යාව දෙමළ බසින් ප්‍රකාශ කළ යුතු වේ. මේ ආකාරයට සියලු සංඛ්‍යා කාඩ්පත් එම සිසුවා විසින් ප්‍රකාශ කළ පසු නැවත ඒවා පෙට්ටියට දමා කණ්ඩායමේ වෙනත් සිසුවෙකු පෙර සිසුවා සිදුකළ ආකාරයටම සංඛ්‍යා නාම ශබ්දනගා ප්‍රකාශ කළ යුතුය.
- මේ ආකාරයට සෑම කණ්ඩායමකම සෑම සිසුවෙකුටම ඉහත ක්‍රියාකාරකමෙහි නිරතවීමට අවස්ථාව සලසන්න.

**ක්‍රියාකාරකම 3 :**

- 1 - 5 තෙක් ලකුණු කළ බෝල 5ක් මල්ලකට දමන්න. ගුරුවරයා සිසුවෙකුට නම කියා කතා කළ යුතු ය. **"சமன் வாருங்கள்"** (සමන් වාරුංගල් - සමන් එන්න)
- ඉන්පසු මල්ල පෙන්වා, **"எடுங்கள்"** (එඩුංගල් - ගන්න) යනුවෙන් පවසන්න.
- එවිට සිසුවා මල්ල තුළ ඇති බෝලයක් ලබාගත යුතු ය.
- ගුරුවරයා **"சொல்லுங்கள்"** (සොල්ලුංගළ් - කියන්න) යැයි කී විට සිසුවා,
- **"ஒன்று"** (ඔන්රු - 1) ආදී වශයෙන් බෝලයේ සඳහන් සංඛ්‍යාව දෙමළ බසින් පැවසිය යුතු ය.
- මේ ආකාරයට සංඛ්‍යා නාම පැවසීමට හැකි තරම් සිසුන්ට අවස්ථාව ලබා දෙන්න.
- මීළඟ අවස්ථාවේ දී ගුරුතුමා දෙමළ බසින් ම සිසුවෙකුට අඬගසා, **"சமன் வாருங்கள்"** (සමන් වාරුංගල් - සමන් එන්න) **"எடுங்கள்"** (එඩුංගල් - ගන්න)
- සිසුවා බෝලය ගත් විට ගුරුවරයා, **"சொல்லுங்கள்"** (සොල්ලුංගළ් - කියන්න) ලෙස පැවසිය යුතු ය.
- එවිට සිසුවා විසින් එහි සඳහන් සංඛ්‍යාව පැවසිය යුතු වේ. මේ ආකාරයට ක්‍රියාකාරකම සියලු සිසුන්ට අවස්ථාව ලැබෙන තෙක් සිදු කරන්න.

**ක්‍රියාකාරකම 4 :**

- කණ්ඩායමකට එක බැගින් වන සේ දාදු කැට සකසා ගන්න.
- ඒවායේ 1 - 5 තෙක් ඉලක්කම් සඳහන් කරන්න.
- හයවන මුහුණතෙහි 1 - 5 තෙක් දක්වා සංඛ්‍යා අතරින් ඕනෑම සංඛ්‍යාවක් සඳහන් කරන්න.
- කණ්ඩායමේ සෑම සිසුවෙකුට ම දාදු කැටය උඩ දැමීමට අවස්ථාව ලබා දී ලැබෙන සංඛ්‍යාව දෙමළ බසින් කීමට යොමු කරන්න.

**ක්‍රියාකාරකම 5**


- සිසුන් එළිමහනට රැගෙන යන්න.
- ඔවුන්ට නිදහසේ ඇවිදින ලෙස පවසන්න.
- ගුරුවරයා විසින් **"ஒன்று"** (ඔන්රු - 1) කී විට එක් සිසුවෙකු ලෙසත් **"இரண்டு"** (ඉරණ්ඩු - 2) කී විට සිසුන් දෙදෙනෙකු ලෙසත් ආදි වශයෙන් ගුරුවරයා පවසන සංඛ්‍යාව අනුව සිසුන් එකතු වී අත් අල්ලා ගත යුතු බවට උපදෙස් ලබා දෙන්න. (1 - 5 දක්වා සංඛ්‍යා පමණක් මේ සඳහා යොදා ගන්න.)
- මුලින් සංඛ්‍යා අනුපිළිවෙළට පවසා සිසුන්ට සංඛ්‍යා හොඳින් අවබෝධ වූ පසු සංඛ්‍යා මාරු කරමින් විනෝදාත්මක ආකාරයෙන් ක්‍රියාකාරකම මෙහෙයවන්න.

## නිපුණතාව : පාට පහක් නිවැරදි ව ප්‍රකාශ කරයි.

## ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රමෝපාය

**ක්‍රියාකාරකම 1 :**

- නිල්, කොළ කහ, සුදු, කලු යන වර්ණයෙන් වර්ණ කළ පුවරු තුනක් ඉදිරිපත් කර සිසුන්ට වර්ණ හඳුන්වා දෙන්න.



| | | | | |
|---|---|---|---|---|
| நீல நிறம் | பச்சை நிறம் | மஞ்சள் நிறம் | வெள்ளை நிறம் | கறுப்பு நிறம் |
| නීල නිරම් | පච්චෛ නිරම් | මඤ්ජල් නිරම් | වෙල්ලෛ නිරම් | කරුප්පු නිරම් |
| (නිල් පාට) | (කොළ පාට) | (කහ පාට) | (සුදු පාට) | (කළු පාට) |

- සිසුන් පස්දෙනෙකුට වර්ණ පුවරුව බැගින් ලබා දෙන්න. ඉන්පසු ගුරුවරයා යම්කිසි වර්ණයක් නම් කළ විට එම වර්ණය අයත් පුවරුව හිමි සිසුවාට ඉදිරියට පැමිණ වර්ණය දෙමළ බසින් ප්‍රකාශ කිරීමට අවස්ථාව දෙන්න.

  *උදා :* ගුරුවරයා "**நீல நிறம்**" (නීල නිරම් - නිල් පාට) කී විට අදාළ සිසුවා පැමිණ "**நீல நிறம்**" (නීල නිරම් - නිල් පාට) ලෙස කිව යුතුය.


- ඉන්පසු සිසුන් සියලු දෙනාම අදාළ වචනය ප්‍රකාශ කළ යුතු ය. සෑම සිසුවෙකුටම අවස්ථාව ලැබෙන පරිදි මෙම ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 2 :**

- සිසුන් එළිමහනකට කැඳවා ගෙන යන්න. ක්‍රියාකාරකම 01 සඳහා යොදාගත් වර්ණ පුවරු සුදුසු තැන්වල සිටුවන්න.
- ගුරුවරයා වර්ණයක් කී විට සිසුන් අදාළ වර්ණය අසළට දිවීම කළ යුතු ය. වැරදි වර්ණය අසළට ගිය සිසුන් නිවැරදි ස්ථානය වෙත යොමු කළ යුතු ය. මෙම වර්ණවලට අයත් නම් සිසුන්ට හොඳින් අවබෝධ කරගන්නා තුරු ම සිසුන් මෙම ක්‍රියාකාරකම කරවන්න.

**ක්‍රියාකාරකම 3 :**

- විවිධ වර්ණ සහිත බෝල කිහිපයක් පෙට්ටියකට දමා මැදින් තබන්න. සිසුන් කණ්ඩායම් හතරක් ලෙස වෙන්කර පෙට්ටියේ සිව්කොනට වන සේ මදක් ඈතින් සිටුවන්න.




- ගුරුවරයා, “வாருங்கள், நீல நிறம் பந்தை எடுங்கள” (වාරුංගළ්, නීල නිරම් පන්දෛ එඩුංගළ් - එන්න, නිල්පාට බෝලය ගන්න) ලෙස කිව යුතු ය.
- පෙළෙහි පළමු සිසුවා නිවැරදි වර්ණය ලබාගෙන, “நீல நிறம்” (නීල නිරම් - නිල් පාට) ලෙස ගුරුවරිය වෙත ප්‍රකාශ කළ යුතු ය. මේ ආකාරයට කණ්ඩායම් හතරේ සිසුන්ට වරින්වර අවස්ථාව ලබා දෙන්න.

**ක්‍රියාකාරකම 4 :**

- නිල්, කහ, කොළ, සුදු, කලු යන වර්ණ සහිත වාර්නිෂ් හෝ වෙනත් කඩදාසි වර්ගයක් බ්‍රිස්ටල් බෝඩ් මත අලවා ගන්න. පසුව එම වර්ණ පහෙන් එකම හැඩයක් සහිත මල්, එක් වර්ණයකින් සිසු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් වන සේ කපා ගන්න.
- සිසුන් එළිමහනට රැගෙන යන්න. එම ස්ථායේ මීටර් 20ක පමණ ප්‍රදේශයක් ආවරණය වන සේ සෑම වර්ණයකටම අදාළ මල් පෙති විසුරුවන්න.
- සිසුන් කණ්ඩායම් හතරකට බෙදන්න. එක් කණ්ඩායමක් ඉදිරියට කැඳවා ගුරුවරයා විසින් දෙමළ බසින් ප්‍රකාශ කර වර්ණය සහිත මල් රැගෙන ආ යුතු බව පවසන්න.
- මේ ආකාරයට කණ්ඩායම් මාරු කරමින් සිසුන්ට වර්ණ පිළිබඳ අවබෝධය හොඳින් තහවුරු වන තෙක් ක්‍රියාකාරකම සිදු කරන්න.

**ක්‍රියාකාරකම 5 :**

- 


  වර්ණ යොදා ගනිමින් "වාසනා චක්‍රය" ක්‍රීඩාවෙහි සිසුන් සමඟ නිරත වන්න. චක්‍රය කරකැවූ පසු කුමන පැහැය ඊතලය ළඟ නවතී දැයි අනුමාන කරන මෙන් සිසුන්ට පවසන්න. ඉන්පසු රෝදය කරකවා ඊතලය ළඟ නවතින වර්ණය හඬනගා දෙමළ බසින් පැවසීමට උපදෙස් දෙන්න. සිසුන්ට වර්ණවලට අදාළ නම් හොඳින් හුරුවන තෙක් ක්‍රියාකාරකමේ යොදවන්න.

- මෙම ක්‍රියාකාරකම ලකුණු ප්‍රදානය කරමින් තරගයක් ලෙස ද පැවැත්විය හැකිය.

**නිපුණතාව :**

**සරල කවි, ගී තාලානුකූලව ගායනා කරයි.**

| | | | |
|---|---|---|---|
| i. | නිලා නිලා වා වා | நிலா நிலா வா வா | හඳහාමි නතර නොවී |
| | නිල්ලාමල් ඕඩි වා | நில்லாமல் ஒடி வா | කන්ද උඩින් පිච්ච මලක් |
| | මලෛ මේල් ඒරි වා | மலை மேல் ஏறி வா | රැගෙන එන්න |
| | මලිලිහෛ පූකොණ්ඩු වා | மல்லிகைப் பூக்கொண்டு வா | |
| | නිලා නිලා වා වා | நிலா நிலா வா வா | |
| | නිල්ලාමල් ඕඩි වා | நில்லாமல் ஒடி வா | |
| ii. | පච්චයික් කිලියේ වාවා | பச்சைக் கிளியே வா வா | කොළ පාට ගිරවෝ එන්න |
| | පාලුම් සෝරුම් උණ්ණ වා | பாலும் சோறும உண்ண் வா | කිරියි බතුයි කන්න එන්න |
| | කෙච්චි මඤ්ජල් පූස වා | கொச்சி மஞ்சள் பூச வா | කහ ගාන්න එන්න හුරතල් |
| | කොඤ්චි විළෛයාඩ වා | கொஞ்சி விளையாட வா | කරමින් සෙල්ලම් කරන්න එන්න |
| iii. | අප්පම් අප්පම් අප්පම් | அப்பம் அப்பம் அப்பம் | අම්මා හදපු ලස්සන රවුම් |
| | අම්මා සුට්ට අප්පම් | அம்மா சுட்ட அப்பம் | ආප්ප |
| | වට්ට වට්ට අප්පම් | வட்ட வட்ட அப்பம | |
| | වඩිවාන අප්ම් | வடிவான் அப்பம் | |
| iv. | පන්දඩිපෝම් පන්දඩිපෝම් | பந்தடிப்போம் பந்தடிப்போம் | පාලා, බෝල සෙල්ලම් |
| | පාල ඕඩි වා | பாலா ஒடி வா | කරන්න එන්න |
| | පාඩිප්පාඩි පන්දඩිපෝම් | பாடிப்பாடிப் பந்தடிப்போம | |
| | පාලා ඕඩි වා | பாலா ஒடி வா | |

# 5.0 සෙල්ලම් මිදුල

පළමුවන ශ්‍රේණියට පිවිසෙන දරුවන්ගේ සමබර වර්ධනයක් සඳහා බුද්ධිමය මෙන් ම ශාරීරික, චිත්තවේගී හා සාමාජික වර්ධනය ද අත්‍යවශ්‍යයි. ඒ සඳහා පන්ති කාමරයෙන් බැහැර වින්දනාත්මක සැලසුම් ගත පරිසරයක ක්‍රියාශීලී ලෙස හැසිරීමට අවස්ථා දරුවනට තිබිය යුතු ය. පන්තියේ සියලු ම දරුවන්ට වින්දනාත්මක ක්‍රියාශීලී අවස්ථා ලබා දෙන තැනක් ලෙස සෙල්ලම් මිදුල හඳුන්වා දිය හැකි ය.

"සෙල්ලම් මිදුලේ" බොහෝ ප්‍රයෝජන තිබේ. බුද්ධි වර්ධනයෙන් ඉදිරියෙන් සිටින සමහර දරුවෝ පන්ති කාමරයේ වැඩ ඉක්මනින් නිම කරති. එයින් පසු ඔවුන්ගේ හැසිරීම් අන් දරුවන්ට කරදර සහිත යයි බොහෝ විට මැසිවිලි නැගේ. එවැනි දරුවන් ද ගුරුවරයාට පෙනෙන තෙක් මානයේ තිබෙන ආරක්ෂාකාරී ව සැකසුණු සෙලල්ම් මිදුල වෙත යොමු කළ හැකි ය. දරුවන්ගේ ඕනෑ එපාකම්, කැමති අකමැතිකම්, හැකි නොහැකිකම් අනුව සෙල්ලම් තෝරා ගැනීමට මෙහි සීමිත අංගෝපාංග පමණක් ප්‍රමාණවත් නැත. මෙවැනි සෙල්ලම් මිදුලකට

- රිංගීමට
- පැද්දීමට
- නැගීමට
- එල්ලීමට අවස්ථා තිබීම යෝග්‍ය ය.

**මේ අනුව සෙල්ලම් මිදුලේ දී සිසුන් නිරත වන ක්‍රියාකාරකම් තුළින්**

- රිංගීම, පෙරළීම, දිවීම, පැනීම, එල්ලීම වැනි මූලික චලන හැකියා දියුණු කෙරේ.
- සමායෝජනය, සමබරතාවය, රිද්මය, නම්‍යතාවය හා නිවැරදි ඉරියව් පවත්වා ගැනීම දියුණු කළ හැකි ය.
- සිසුන්ගේ හසුරු කුසලතා දියුණුවට මඟ පෑදේ.
- සහයෝගය, සාමූහික ව කටයුතු කිරීම, බෙදා හදා ගැනීම, ඉවසීම, එකිනෙකාට උපකාර කිරීම වැනි යහපත් ගුණාංගවලට මඟ පෑදේ.
- මානසික තෘප්තිය අත්වන ආකාරයට නිදහසේ ක්‍රියාකාරකම්වල නියැලීමට මෙය සුදුසු ම ස්ථානයකි.
- භාෂා සංකල්ප (ශ්‍රවණ විභේදනය, දෘෂ්ටි විභේදනය, පෙර ලිවීමේ කුසලතා, මනෝචාලක කුසලතා වැනි පූර්ව භාෂා සංකල්ප)
- ගණිත සංකල්ප සංවර්ධනය සඳහා මෙය ඉතා වැදගත් ස්ථානයකි.

  *උදා :* * නැඟුම් රාමුවේ නැගීමට සැලැස්වීම ඔවුන්ට නිදහසේ අභිමත පරිදි නැගීමට යොමු කිරීම.

  * උඩින්ම සිටින්නේ කවුද? ඊට පහළින් සිටින්නේ කවුද? පහළින් ම සිටින්නේ කවුද? වැනි ප්‍රශ්න අසමින් සංකල්ප වර්ධනය කළ හැකි ය.

  * සීසෝව භාවිතයෙන් සිසුන්ගේ බර පිළිබඳ සංකල්පය (උඩ යට, දුර ළඟ, ඉහළ පහළ, සෙමෙන් වේගයෙන්, ලොකු කුඩා වැනි සංකල්ප ... ) සාධනය කළ හැකි ය.

  * පටිපාටිගත කිරීම පිළිබඳ ගණිත පාඩමට පෙර ටයර් මං පෙතෙහි සිසුන් ක්‍රියාකාරීව යෙද විය හැකි ය.


සෙල්ලම් මිදුල ප්‍රාථමික අධ්‍යාපන විෂය ක්ෂේත්‍රවල සංකල්ප වර්ධනය සඳහා ඉවහල් වන ආකාරයට භාවිත කිරීම වැදගත් ය. ඒ සඳහා සෙල්ලම් මිදුලේ උපකරණ භාවිත කරන විට ගුරුවරයාගේ මැදිහත් වීම අත්‍යවශ්‍ය වෙයි. විශාල මාංශ පේශී වර්ධනය, ස්නායු පේශී සමායෝජනය ආදී ශාරීරික වර්ධනයට යොමු වන ක්‍රියාකාරකම්වල යෙදෙන අතර ම සංකල්ප වර්ධනය කළ හැකි ය.

ඒ සඳහා දරුවන්ගේ වර්ධනය තුඩු දෙන තවත් අංගෝපාංග එකතු කරමින් සෙල්ලම් මිදුල සංවර්ධනය කිරීම නිර්මාණශීලී ගුරුවරයාට පැවරෙන අභියෝගයකි.

පහත දැක්වෙන උදාහරණ ඇසුරෙන් සෙල්ලම් මිදුල ඵලදායී ආකාරයෙන් යොදාගත හැක්කේ කෙසේ ද යන්න පිළිබඳ ව විමසා බලමු.

*නිද : පළමුවන ශ්‍රේණිය*

මව්බස විෂයයෙහි දී අතෙහි සියුම් මාංශ පේශී හසුරුවමින් රූල් ද අතර අකුරු ලිවීමට සිදු වේ. මෙම හැකියාව වර්ධනය සඳහා අක්ෂර ලිවීමට පෙර හා එයට සමගාමී ව විශාල පේශී හසුරුවමින් වැඩි ඉඩකඩක් තුළ සිය ශරීරය මැනවින් හැසිරවීමට සිසුන්ට හුරුවීම අවශ්‍ය ය.




**ගුරුවරයාට මැදිහත් විය හැකි ආකාරය**
කාටද පුළුවන් උමග තුළින් උමගේ නොගෑවී යන්න.
කාටද පුළුවන් ටයර්වල නොගෑවී රිංගන්න.


*නිද : මව්බස - පිල්ලම් භාවිතය*

පිල්ලම් අකුරේ උඩ යට හා පැත්තෙන් ලිවීමට සිදුවේ. එබැවින් රවුමේ දරුවන් සිටින තැන් පිළිබඳව ගුරුවරයා මැදිහත් ව හුරු කිරීමෙන් සංකල්ප වර්ධනය යොමු වේ.

සමන් ඉන්නේ නිමාලිට ඉහළින් ද පහළින් ද?
දෙවනුව සමන්ට ඉහළට නැගීමට සලස්වන්න.
දැන් මෙසේ ඇසිය හැකි ය.
සමන් දැන් ඉන්නේ නිමාලිට ඉහළින් ද පහළින් ද?




**ගණිත සංකල්ප - පටිපාටිගත කිරීම**
පිටුපසින් තිබෙන ටයරය ලොකුම එක ද? පොඩිම එක ද?




2 වන ශ්‍රේණියේ දී මෙම තත්ත්වය තව දුරටත් දියුණු කළ යුතු වේ. එක් එක් උපකරණය භාවිත කිරීමට යොදා ගන්නා සේ සකස් කර ගත හැකි ය.

නිද : සිසුවා තබන පියවරට අනුව, අනෙක් සිසුන් වාරයක් බැගින් අත් පොලසන් දෙන අතර එකම අනුරූපතාවය ඇති කිරීම




**ගණිත සංකල්ප අභිමත ඒකකවලින් දිග මැනීම**
නිද : අනෙක් කෙළවරට තව පියවර කීය ද?



**ගණිත සංකල්ප - සාපේක්ෂ පිහිටීම**

*නිද : පළවෙනි පොල් කට්ටට වඩා තුන්වෙනි පොල් කට්ටට නැග්ග විට කොපමණ උසක් නැග ඇත් ද?*



## ගෙදර වැඩ පැවරීම

පාසල් කාලය වෙන් කිරීම පවා සිදු කරන්නේ සිසුන්ගේ පරිණතිය පිළිබඳ මනෝවිද්‍යාත්මක හා අධ්‍යාපනික මූලධර්ම පදනම් කර ගනිමිනි. පළමුවන ප්‍රධාන අවධියේ සීමිත පැය ගණනකට පාසල් කාලය සීමා වන්නේ ඒ අනුවය.

ගෙදර වැඩ පැවරීමේ දී මේ පිළිබඳ දැඩි වගකීමකින් කටයුතු කළ යුතු ය. මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් හා ආගම යන විෂයයන් හතරක ගෙදර වැඩ එකවර පැවරූ විට, මේ සියල්ලට ම බඳුන් වන එකම සිසුවකු හා සිසුවියක දැඩි පීඩාවකට පත් වේ. එබැවින් ගෙදර වැඩ පවරන විට ශිෂ්‍යයාගේ පරිණතියට ඔරොත්තු දෙන අත්‍යවශ්‍යම වැඩ සුළු ප්‍රමාණයක් පමණක් පැවරීමේ වගකීම ගුරුවරයාට පැවරෙයි. දිනපතා සිය දරුවන්ගේ ගෙදර වැඩ සඳහා කාලයක් වෙන් කළ හැක්කේ ඉතාමත් සීමිත දෙමාපිය පිරිසකට පමණකි.

සීමිත කාලයක් තුළ පාසල් පරිසරයෙන් පමණක් ලබා දිය නොහැකි ඉගෙනුම් අත්දැකීම් සඳහා අවශ්‍යම අවස්ථාවල දී ගෙදර වැඩ පැවරීම කළ හැකි ය. එහෙත් ඒවා පැහැදිලි ව හා නිවැරදි ව යොමු කිරීම ද ඒ සඳහා ප්‍රමාණවත් කාලයක් ලබා දීම කෙරෙහි ද අවධානය යොමු විය යුතු ය.

# 6.0 සිසු ප්‍රගතිය තක්සේරු කිරීම

## 1.0 හැඳින්වීම

ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් සඳහා ඵලදායී වූ ඉගෙනුම් අත්දැකීම් සංවිධානය කිරීමේ දී ගුරු මහත්ම මහත්මීන්ට සිසුන් ඉගෙනීමේ දී පෙන්නුම් කරන දුෂ්කරතාවයන් හා දක්‍ෂතා පිළිබඳ ව සුවිශේෂී අවබෝධයක් තිබීම අත්‍යවශ්‍ය ය. ඒ අනුව පන්තියේ සිටින සියලු ම සිසුන්ට ගැළපෙන ආකාරයට ඉගෙනුම් ක්‍රම සංවිධානය කළ හැකි ය. මේ පුළුල් අරමුණෙන් පන්ති කාමරය තුළ සිසුන්ගේ ප්‍රගතිය පිළිබඳ ව නිරන්තයෙන් තොරතුරු රැස් කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම වශයෙන් හඳුන්වා දිය හැකි ය. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් තක්සේරු කිරීමේ, විවිධ අරමුණු තිබේ. ස්ථාපන කාර්යයන්, අනාවරණ කාර්යයන්, උපදේශන කාර්යයන්, සහතික පත් ප්‍රදානය කිරීම හා පර්යේෂණ කාර්යයන් මෙහි දී ප්‍රධාන වේ. එහෙත් ප්‍රාථමික ශ්‍රේණිවල දී තක්සේරු කිරීම ප්‍රධාන වශයෙන් ම අනාවරණය හා උපදේශනය යන කරුණු මුල් කරගෙන ක්‍රියාත්මක වේ. ප්‍රාථමික ශ්‍රේණිවල ඉගෙන ගන්නා සිසුන් ඉගෙනීමේ දි බොහෝ ගැටලු පෙන්නුම් කරයි. ගුරු මහත්ම මහත්මීන් උගන්වන අතරතුර ඒවා හොඳින් හඳුනාගෙන ඒවාට විසඳුම් ලබාදීම අවශ්‍ය ය. තම පන්තියේ සිටින එක් එක් ශිෂ්‍යයා සුවිශේෂී ලෙස මුහුණපාන ගැටලු හඳුනාගෙන ඒ එක් එක් ශිෂ්‍යයාට ගැළපෙන ආකාරයට ඉගෙනුම් කටයුතු සංවිධානය කිරීම අවශ්‍ය ය. ඒ මගින් සෑම සිසුවකු ම විෂයමාලාවෙන් අපේක්ෂිත නිපුණතා කරා කැටුව යාමට ගුරුවරුනට පුළුවන. සිසුන් පළමුවැනියා දෙවැනියා වශයෙන් තරා කිරීම හෝ දක්‍ෂ සිසුන් හා දුර්වල සිසුන් වශයෙන් වර්ග කිරීම හෝ වැනි කරුණු ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ අරමුණු නොවේ.

## 2.0 සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපායයන්

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රමෝපායයන් ප්‍රධාන කරුණු දෙකක් යටතේ හඳුන්වා දිය හැකි ය.

### 2.1 සිසු ප්‍රගතිය විධිමත් ලෙස තක්සේරු කිරීම

ඉගැන්වීමේ ක්‍රියාවලිය තාවකාලික ව නතර කොට පූර්ව සූදානමකින් හා සැලසුමකින් යුතු ව මුළු අවධානය ම ඒ කෙරෙහි යොමු කොට කරනු ලබන තක්සේරු කිරීම විධිමත් තක්සේරු කිරීම වශයෙන් හැඳින්විය හැකි ය. ඒ යටතේ විධිමත් පරීක්ෂණ හා ක්‍රියාකාරකම් භාවිත කෙරේ.

### 2.2 සිසු ප්‍රගතිය අවිධිමත් ක්‍රමෝපායයන් භාවිත කර තක්සේරු කිරීම

සිසුන් ඉගෙනීමේ යෙදී සිටින අතරතුර ම ඊට බාධා නොවන ආකාරයෙන් තොරතුරු රැස්කිරීම මෙහි දී සිදු කෙරේ. මේ සඳහා ප්‍රධාන වශයෙන් ප්‍රශ්න කිරීම, සිසුන් සමග තනි තනිව හෝ කාණ්ඩ වශයෙන් හෝ සාකච්ඡා කිරීම, සිසුන් වැඩවල නිරත ව සිටින අතරතුර ඔවුන්ගේ වැඩ නිරීක්‍ෂණ කර තොරතුරු ලබා ගැනීම, සිසුන්ගේ ගෙදර වැඩ ඇගයීමට ලක් කිරීම වැනි ක්‍රමෝපායයන් භාවිත කරනු ලැබේ. මෙහි දී ගුරුවරයාගේ වෘත්තියභාවය අතිශයෙන් වැදගත් වේ. ගුරුවරයා ගනු ලබන විනිශ්චයන් වඩාත් නිවැරදි ව ගැනීම සඳහා සැලකිල්ලෙන් යුතු ව කටයුතු කිරීම අවශ්‍ය ය. අවිධිමත් ක්‍රමෝපායයන් මඟින් සිසුන් පිළිබඳ ව විස්තරාත්මක වූත් ගුණාත්මක වූත් තොරතුරු ලැබෙන හෙයින් ඒවා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සඳහා වඩාත් ඵලදායී වනු ඇත. සිසුන් පිළිබඳ ව ගුරුවරුන් අවිධිමත් ලෙස ගන්නා තීරණවල වලංගුතාවය ද ඉතා ඉහළ බව බොහෝ පර්යේෂණ මඟින් අනාවරණය වී ඇත.

## 3.0 තක්සේරු කිරීමේ විවිධ ස්වරූපයන්

ප්‍රාථමික ශ්‍රේණිවල ක්‍රියාත්මක වනුයේ නිර්ණායක මූලික තක්සේරු කිරීම වේ. මෙහි දී ගුරුවරයා මුල් කරගත් අවිධිමත් ක්‍රමවේදයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

තක්සේරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ විවිධ අවස්ථාවල දී සිදු කළ හැකි ය. ඒ අනුව තක්සේරු කිරීමේ ක්‍රියාවලිය සම්භවන තක්සේරු කිරීම හා සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් වර්ග කළ හැකි ය.

**සම්භවන තක්සේරු කිරීම**

යම් ඉගෙනුම් අදියරක් අතරතුර දී නිරන්තරයෙන් සිසු ඉගෙනුම් දක්ෂතා හා දුබලතා පිළිබඳ ව සොයා බැලීම සම්භවන තක්සේරු කිරීමයි. අඛණ්ඩ තක්සේරු කිරීම යනුවෙන් ද මෙය හඳුන්වනු ලබයි. ප්‍රාථමික ශ්‍රේණිවල සිසුන් ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලුවලට ඉතාමත් ප්‍රායෝගික විසඳුම් ලබාදීම අත්‍යවශ්‍ය ය. එසේ නැතහොත් සිසුන් ලබන අසාර්ථකත්වයන් ඔවුන් තව දුරටත් පසුබට සිසුන් බවට පත් කිරීමට හේතු වේ. එහෙයින් සිසුන් පිළිබඳ නිරන්තරයෙන් සොයා බැලීම ප්‍රාථමික ශ්‍රේණිවල තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වශයෙන් සැලකිය යුතු ය.

**සම්පිණ්ඩිත තක්සේරු කිරීම**

ඉගෙනුම් අදියරක් අවසානයේ යම් ඉගෙනුම් කොටසක් කොතෙක් දුරට සාධනය කරගෙන ඇත් ද යන්න පරීක්ෂා කිරීම සම්පිණ්ඩිත තක්සේරු කිරීම යනුවෙන් අදහස් කෙරේ. ඒ අනුව වාරයක් අවසානයේ හෝ අවුරුද්දක් අවසානයේ එම අවුරුද්ද තුළ උගන්වන ලද විෂය කරුණු අලලා සකස් කළ ප්‍රශ්න පත්‍රයක් මඟින් සිසුන් ලබාගත් ප්‍රගතිය තක්සේරු කළ හැකි ය. නමුත් මෙවැනි තක්සේරු කිරීමක් ප්‍රාථමික ශ්‍රේණි සඳහා වඩාත් යෝග්‍ය යැයි නිර්දේශ කිරීම අපහසු ය.

**නිර්ණායක මූලික තක්සේරු කිරීම**

විෂයමාලාවේ අන්තර්ගතය හා නිපුණතා අනුව සකස් කරගත් ඉගෙනුම් ඵල කරා සිසුන් ළඟා වී තිබේ ද යන්න පරීක්ෂා කිරීම නිර්ණායක මූලික තක්සේරු කිරීමයි. ප්‍රාථමික ශ්‍රේණි සඳහා පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සහ පොදු තක්සේරු කිරීමේ පත්‍රිකා ඉදිරිපත් කර ඇති අතර එක් එක් පත්‍රිකාවක් සඳහා සකස් කළ තක්සේරු කිරීමේ දී අවධානය යොමු කළ යුතු ඉගෙනුම් ඵල ඉදිරිපත් කර ඇත.

පහත දක්වා ඇත්තේ ගණිතය, මව්බස, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් විෂයයන් සහ පොදු තක්සේරු කිරීම සඳහා සකස් කළ තක්සේරු කිරීමේ නිර්ණායක කිහිපයකි.

**ගණිතය** - *උදා* : තරමින් වෙනස් වූ ද්‍රව්‍ය හෝ රූප හෝ තුනක් පටිපාටියට තබයි.

**මව්බස** - *උදා* : සරල වැකි ශබ්ද නඟා කියවයි.

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්** - *උදා* : යහපැවැත්ම සඳහා සෞඛ්‍ය පුරුදු ප්‍රදර්ශනය කරයි.

**පොදු තක්සේරුව** - *උදා* : අන්‍යයන්ට උදව් කිරීමට කැමැත්තක් දක්වයි.

## 4.0 කාර්ය සාධන ගොනුව

සිසුන් තක්සේරු කිරීම සඳහා භාවිත කළ හැකි ඉතාම ඵලදායී ක්‍රමයක් ලෙස කාර්ය සාධන ගොනු සලකනු ලැබේ. සිසුන් ඉගෙනීමේ දී මුහුණ දෙන ගැටලු, ඔවුන් තුළ තිබෙන දක්ෂතා අඛණ්ඩව ඇගයීමේ ක්‍රමයක් වශයෙන් මෙය වැදගත් වේ. ප්‍රාථමික ශ්‍රේණිවල බොහෝ ගුරුවරුන් එක් එක් සිසුන්ගේ වැඩ වෙන වෙන ම ගොනුවල එකතු කිරීම පුරුද්දක් වශයෙන් කරනු ලැබේ. නමුත් කාර්ය සාධන ගොනුව මෙයට වඩා දිරියට ගිය ක්‍රියාවලියක් සේ සලකනු ලැබේ. ඒ අනුව කාර්ය සාධන ගොනුව සිසුන්ගේ දක්ෂතා මෙන් ම ඔහු ඉගෙනීමේ මුහුණපාන ගැටලු නිරූපණය වන ආකාරයට ඉතා අර්ථාන්විත ලෙස සකස් කළ සිසුන්ගේ වැඩ එකතුවක් ලෙස සලකනු ලැබේ. එය සිසුවා පිළිබඳ ව පැහැදිලි අදහසක් දක්වන සුළු දෙයක් විය යුතු ය. කාර්ය සාධන ගොනු පිළියෙල කිරීම ගුරුවරයාගෙන් ගුරුවරයාට වෙනස් විය හැකි ය. නිශ්චිත ක්‍රමයක්

දැක්වීම අසීරුය.  නිර්මාණාත්මක ගුරුවරයකුට තමාගේම ක්‍රමයක් අනුගමනය කරමින් ඉතා උසස් මට්ටමේ කාර්ය සාධන ගොනුවක් සකස් කළ හැකි ය. කාර්ය සාධන ගොනුවකට ඇතුළත් කළ හැකි දේ මොනවාද? බොහෝ දුරට ඒවා සිසුන්ගේ වැඩවල නියැදි, ලියු ලේඛන, සාදන ලද ගණන්, අඳින ලද චිත්‍ර, කරන ලද නිර්මාණ විය හැකි ය. එසේ ම ගුරුවරයා විසින් ලියන ලද කෙටි සටහන් ද එයට ඇතුළත් කළ හැකි ය.

## 5.0 කෙටි සටහන් ලිවීම හා පිරික්සුම් පත් භාවිත කිරීම

සිසුන්ගේ ප්‍රගතිය හා ඉගෙනීමේ ගැටලු හඳුනා ගැනීමේ දී එක් එක් ශිෂ්‍යයා පිළිබඳ ව ගුරුවරයාට ප්‍රයෝජනවත් වන තොරතුරු කෙටි සටහන් වශයෙන් තබා ගැනීම ද බොහෝ ප්‍රයෝජනවත් වේ. පන්තියේ උගන්වන අතරතුර දී සිසුන් පිළිබඳ ව තොරතුරු සමුදායක් ගුරුවරුන්ට ලැබේ. නමුත් මෙම තොරතුරු අර්ථාන්විත ලෙස ප්‍රයෝජනයට ගැනීමත් බොහෝ විට සිදු නොකෙරේ. එම නිසා සිසුන් පිළිබඳ ව අනාවරණය කරගන්නා තොරතුරු පොතක කෙටි සටහන් වශයෙන් තබාගෙන ඒවා අවශ්‍ය පරිදි ප්‍රයෝජනයට ගත හැකි ය.

පිරික්සුම් ලැයිස්තු ද එසේ ම ප්‍රයෝජනවත් වන තවත් ක්‍රමයකි. ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය අවසානයේ ඉදිරිපත් කර ඇති නිර්ණායක කරා සිසුන් ළඟා වී තිබේ දැයි තීරණය කිරීම සඳහා ඒ පිරික්සුම් ලැයිස්තු උපයෝගී කර ගත හැකි ය.

## 6.0 තක්සේරු කිරීමේ පත්‍රිකා හා ඒවා ප්‍රයෝජනයට ගැනීම

රැස් කරනු ලබන තොරතුරු සටහන් කර වාර්තා කිරීම සඳහා යොදා ගත හැකි පත්‍රිකාවල ආකෘති හතරක් ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයේ ඇතුළත් කර ඇත. ඒවා මව්බස, ගණිතය, පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් සහ පොදු තක්සේරු පත්‍රිකා ලෙස නම් කර ඇත.

ඒවායේ එක් එක් සිසුවාගේ නම ඉදිරියෙන් එක් එක් ඉගෙනුම් ඵලය සඳහා එක් කොටුව බැගින් වෙන් කර ඇත. සිසුන් ඒ ඒ ඉගෙනුම් ඵලය කරා ළඟා වී තිබේ ද නැති ද යන්න, පරීක්ෂා කිරීමෙන් අනතුරු ව සටහන් කළ යුතු ය. පොදු තක්සේරු පත්‍රිකාවේ තක්සේරු කිරීමට භාජනය කළ යුතු බොහෝ "ඉගෙනුම් පල" වසර පුරාම සොයා බැලිය යුතු අයුරින් විහිදී ඇත. මෙහි දී එක් වාරයකට එක් සිසුවකුට එක් කොටුවක් බැගින් යොදා ගැනීමට හැකි වන පරිදි ඉගෙනුම ඵලයකට කොටු තුන බැගින් වෙන් කර තිබේ.

එක් එක් සිසුවා සම්බන්ධයෙන් එක් එක් ඉගෙනුම් ඵලය යටතේ ඔබ රැස් කළ තොරතුරු ඇසුරෙන් පහත සඳහන් ආකාරයට සංකේත යෙදීමෙන් වාර්තා කළ හැකි ය.

| **තීරණය** | **සංකේතය** |
|---|---|
| සාර්ථක ව කරයි | √ |
| දුෂ්කරතා පෙන්නුම් කරයි/ තව දුරටත් උදව් අවශ්‍යයි | • |

යම් ඉගෙනුම් ඵලයක් සම්බන්ධයෙන් ශිෂ්‍යයෙක් සාර්ථකත්වය පෙන්නුම් කරන්නේ ද යන්න ගුරුවරයකු විසින් තීරණය කරනු ලැබීම සඳහා අදාළ ඉගෙනුම් ඵලයට ගැළපෙන පරිදි තමා ම සකස් කර ගත් නිර්ණායක උපයෝගී කර ගැනීමට හැකි ය.

පන්තියේ සියලු ම සිසුන්ගේ සාධන මට්ටම පිළිබඳ ව ගනු ලබන තීරණ එක ම නිර්ණායක කට්ටලයක් මත පදනම් කර ගනු ලැබූ විට ඒවායේ ඒකාකාර බවක් ඇති වන හෙයින් අපේක්ෂිත ප්‍රතිඵල කරා ළඟා වීමට අපහසු විය හැකි ය.

## 7.0 අනාවරණය හා ප්‍රතිකාර්ය

අවිධිමත් - සම්භවන තක්සේරු කිරීමේ ප්‍රධාන අරමුණක් වන්නේ අනාවරණයයි.

යම් සිසුවකු සඳහා තක්සේරු පත්‍රියේ "●" සලකුණ යොදා ඇති සෑම අවස්ථාවක් කෙරෙහි ම ගුරුවරයාගේ විශේෂ අවධානය යොමු විය යුතු ය. සිසුවා මුහුණ දෙන දුෂ්කරතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදා නැවත තක්සේරු කිරීමට භාජන කළ යුතු ය. එම "●" සංකේතය, අනතුරු ව "√" සංකේතයක් බවට වෙනස් කිරීමට හැකි වන තෙක් මෙම ක්‍රියාවලිය දිගට ම සිදු කිරීම ගුරුවරුන්ගේ වගකීමයි.

හඳුනා ගනු ලබන ඉගෙනුම් දුෂ්කරතා මග හැර වීම පිණිස එක් එක් අවස්ථාවට ගැළපෙන පරිදි සුවිශේෂ ප්‍රතිකාර්ය ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රම සම්පාදනය කිරීම ද වැදගත් ය. මේවා එක් එක් සිසුවා පෙන්නුම් කරන ඉගෙනුම් දුෂ්කරතා අනුව තීරණය විය හැකි ය.

එමෙන් ම යම් ඉගෙනුම් අභිමතාර්ථයක් කෙරෙහි පන්තියේ සිසුන් වැඩි දෙනකු "●" සංකේත ලබා ඇත්නම් එසේ වීමට බලපෑ හේතු රාශියක් තිබිය හැකි ය. ඒවා හඳුනාගෙන සුදුසු ක්‍රියා මාර්ග ගෙන සිසුන් අවශ්‍ය ඉගෙනුම් ඵල කරා ගෙන ඒම ගුරුවරයාගේ වගකීමකි.

## 8.0 වෙනත් කරුණු

- එක් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය තවත් සිසුවකුගේ ඉගෙනුම් ප්‍රගතිය සමඟ සැසඳීමෙන් අධ්‍යාපනික වශයෙන් වැදගත් වූ තීරණ ලබා ගැනීම අසීරුය. එම නිසා සිසු-සිසු සාධන සැසඳීමෙන් වලකින්න.
- එක් සිසුවකුගේ වර්තමාන සාධන මට්ටම එම සිසුවාගේ ම පූර්ව සාධන මට්ටම් සමඟ සැසඳීමෙන් සිසු ප්‍රගතිය පිළිබඳ තොරතුරු ලබා ගත හැකි හෙයින් ඒ පිළිබඳ ව අවධානය යොමු කළ යුතු ය. එසේ ම විෂයමාලාවේ අපේක්ෂණ කරා කොතරම් ළඟා වී ඇත්දැයි සොයා බැලිය යුතු ය.
- තමාගේ පන්තියේ සිටින සිසුන්ට ගැළපෙන ආකාරයට තක්සේරුකරණ සකස් කිරීමට පන්තිය භාර ගුරුවරයා ම සමත් විය යුතු ය.

## මව්බස තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

තක්සේරු කිරීමේ පරිමාණය
- සාර්ථක ව කරයි
- දුෂ්කරතා පෙන්නුම් කරයි
- තවදුරටත් උදවු අවශ්‍යයි •

| | | | | සිසුන්ගේ නම් | |
|---|---|---|---|---|---|
| | | | | 1. විවිධ ශබ්ද අතරින් භාෂාමය ශබ්ද හඳුනාගෙන ප්‍රකාශ කරයි. | පූර්ව කුසලතා |
| | | | | 2. සාකච්ඡාවකට සවන්දී එහි පිරිස් හඳුනාගෙන නම් කරයි. | |
| | | | | 3. ළමා ගීතවලට වින්දනාත්මකව සවන් දී තාල තබයි. | |
| | | | | 4. කතන්දරවලට සවන්දී එහි සිටි අය නම් කරයි. | |
| | | | | 5. විධානවලට සවන්දී ප්‍රතිචාර දක්වයි. | |
| | | | | 6. අක්ෂරවල වෙනස උච්චාරණ රටාව අනුව හඳුනා ගනියි. | |
| | | | | 7. රූප කිහිපයකින් වෙනස් රූපය හඳුනාගෙන පෙන්වයි. | |
| | | | | 8. පින්තූර දෙකකින් අවම වශයෙන් වෙනස්කම් තුනක් හඳුනාගෙන ලකුණු කරයි. | |
| | | | | 9. සමාන අකුරු කිහිපයක් අතර ඇති වෙනස් අකුර පෙන්වයි. | |
| | | | | 10. විශාල මාංශපේශි සංවර්ධනය සඳහා අභ්‍යාස කරයි. | |
| | | | | 11. සියුම් මාංශපේශි සංවර්ධනය සඳහා අභ්‍යාස කරයි. | |
| | | | | 12. වමේ සිට දකුණට ඇස ගෙන යමින් පින්තූර කියවයි. | |
| | | | | 13. ඇස් සහ අත් සමායෝජනය සඳහා අභ්‍යාස කරයි. | |
| | | | | 14. පින්තූරවල ඇති දේ නම් කරයි. | |
| | | | | 15. අකුරේ සමාන හැඩය හඳුනාගෙන යා කරයි. | |
| | | | | 16. එකම අකුරෙන් ආරම්භවන පින්තූර නම් කරයි. | |
| | | | | 17. පින්තූරය නම්කර එහි පළමු අකුර කියවයි. | |
| | | | | 18. සීමාවක් තුළ පාට කරයි. | |
| | | | | 19. රේඛා භාවිත කර අභ්‍යාස කරයි. | |
| | | | | 20. තිත් ඉරි/කඩ ඉරි යා කර රූප අඳියි. | |
| | | | | 21. අකුරුවලට අයත් හැඩ රටා අඳියි. | |
| | | | | 22. අකුරු මත ඇඳීමේ අභ්‍යාසවල යෙදෙයි. | |
| | | | | 23. පවසන දෙය අවබෝධ කරගෙන ප්‍රතිචාර දක්වයි. | සවන්දීම |
| | | | | 24. අකුරුවල වෙනස හඳුනාගැනීම සඳහා සවන්දෙයි. | |
| | | | | 25. ළමා නිර්මාණවලට කැමැත්තෙන් හා රසවිඳිමින් සවන්දෙයි. | |

| | | | | සිසුන්ගේ නම<br>තක්සේරු කිරීමේ පරිමාණය<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>තවදුරටත් උදවු අවශ්‍යයි • | |
|---|---|---|---|---|---|
| | | | | 26. ළමා කවි/ගීත ගායනා කරයි. | කතා කිරීම |
| | | | | 27. කණ්ඩායමක් ඉදිරියේ කතන්දර කියයි. | |
| | | | | 28. තමාගේ නම, වයස, ගම ප්‍රකාශ කරයි. | |
| | | | | 29. අන් අය සමග සුහදව කතා කරයි. | |
| | | | | 30. තොරතුරු දැනගැනීම සඳහා ප්‍රශ්න අසයි. | |
| | | | | 31. කියවීමේ නිවැරදි ඉරියව් අනුගමනය කරමින් කියවයි. | කියවීම |
| | | | | 32. නිවැරදි උච්චාරණයෙන් යුතුව අකුරු කියවයි. | |
| | | | | 33. නිවැරදි උච්චාරණයෙන් යුතුව ශබ්දනගා වචන කියවයි. | |
| | | | | 34. නිවැරදි උච්චාරණයෙන් යුතුව වචන වෙන්කොට සරල වාක්‍යාංශ කියවයි. | |
| | | | | 35. නිවැරදි උච්චාරණයෙන් යුතුව වචන වෙන්කොට සරල වැකි කියවයි. | |
| | | | | 36. නැවතීමේ ලකුණට අනුගතව සරල වැකි කියවයි. | |
| | | | | 37. ලිවීමේ නිවැරදි ඉරියව් අනුගමනය කරමින් ලියයි. | ලිවීම |
| | | | | 38. හැඩය, දිශාව, ප්‍රමාණය, අංග සම්පූර්ණ බව අනුව අකුරු නිවැරදිව ලියයි. | |
| | | | | 39. වචන වෙන්කොට සරල වැකි ලියයි. | |
| | | | | 40. නැවතීමේ ලකුණට අනුගතව සරල වචන තුනකින් යුතු වැකි ලියයි. | |
| | | | | 41. තමාගේ නම, වයස, ගම නිවැරදිව ලියයි. | |

## පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

| | | | | සිසුන්ගේ නම<br>තක්සේරු කිරීමේ පරිමාණය<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>• තවදුරටත් උදවු අවශ්‍යයි |
|---|---|---|---|---|
| | | | | 1. පාසලේ පොදු විධානවලට අවනත ව ක්‍රියා කරයි. |
| | | | | 2. අන් අය කෙරෙහි සංවේදී වෙමින් සෙල්ලම් මිදුල භාවිත කරයි. |
| | | | | 3. පවුලේ සාමාජිකයන්ගෙන් පවුලට ඉටුවන කාර්යයක් බැගින් ප්‍රකාශ කරයි. |
| | | | | 4. සතුන්ගෙන් ආරක්ෂාකාරී වීමට ගත හැකි ක්‍රියා මාර්ග දෙකක් ප්‍රකාශ කරයි. |
| | | | | 5. සතුන් නිරීක්ෂණයෙන් හඳුනාගත් ලක්ෂණ දෙකක් ප්‍රකාශ කරයි. |
| | | | | 6. ජලය අරපිරිමැස්මෙන් යුතුව පරිහරණය කරයි. |
| | | | | 7. ජලය ප්‍රමාණවත් ව පානය කිරීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. |
| | | | | 8. අවුරුදු කාලයේ ඉටුකරන චාරිත්‍ර දෙකක් නම් කරයි. |
| | | | | 9. අවුරුදු කාලයේ දී පරිසරයේ සිදුවන වෙනස්කම් නිරීක්ෂණය කර උචිත අයුරින් වාර්තා කරයි. |
| | | | | 10. යහපැවැත්ම සඳහා සෞඛ්‍ය පුරුදු ප්‍රදර්ශනය කරයි. |
| | | | | 11. තොරතුරු හුවමාරුවේ දී ආචාරශීලී ව ප්‍රතිචාර දක්වයි. |
| | | | | 12. අපට අවශ්‍ය දෑ ගෙවත්තෙන් ම නිපදවා ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. |
| | | | | 13. ගමන් බිමන්වල දී සිය ආරක්ෂාව පිළිබඳ ව සැලකිලිමත් බවක් ප්‍රදර්ශනය කරයි. |
| | | | | 14. ආහාර පානවලින් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ප්‍රකාශ කරයි. |
| | | | | 15 ආහාර අපිරිසිදුවන ක්‍රමයක් ප්‍රකාශ කරයි. |
| | | | | 16. වැඩ කිරීමේ දී ඊට ගැලපෙන උපකරණ භාවිත කළයුතු බව ප්‍රකාශ කරයි. |
| | | | | 17. ඇස් ආරක්ෂා කර ගැනීමේ වැදගත්කම ප්‍රකාශ කරයි. |
| | | | | 18. ස්වභාවික ව සිදුවන හදිසි අවස්ථාවල දී ක්‍රියා කළයුතු ආකාරය සම්බන්ධයෙන් තම අදහස් ප්‍රකාශ කරයි. |
| | | | | 19. හිරු එළියේ බලපෑම නිසා මිනිසාට සිදුවන යහපතක් හා අයහපතක් ප්‍රකාශ කරයි. |
| | | | | 20. පරිසර සුන්දරත්වය ප්‍රකාශවන වගන්තියක්/කවියක්/ගීතයක් ඉදිරිපත් කරයි. |
| | | | | 21. අවස්ථාවට උචිත නිවැරදි ඉරියව් ප්‍රදර්ශනය කරයි. |
| | | | | 22. උදවු අවශ්‍ය අවස්ථාවල දී උදවු කිරීමට ඉදිරිපත් වෙයි. |
| | | | | 23. විශේෂිත පුද්ගලයන් කෙරෙහි සංවේදී ව ක්‍රියා කරයි. |
| | | | | 24. දුටු සිද්ධියක්/අත්දැකීමක්/අංග චලනයෙන් යුතුව ප්‍රකාශ කරයි. |
| | | | | 25. තමන් ඉගෙන ගත් කවියක්/ගීයක් ගායනය කරයි. |
| | | | | 26. තමා දුටු සිද්ධියක් චිත්‍රයට නගයි. |
| | | | | 27. තම අවට පරිසරයේ ඇති ද්‍රව්‍ය යොදා ගෙන නිර්මාණ කරයි. |
| | | | | 28. අවට පරිසරය පිළිබඳ ව විමසිලිමත් ව බලයි. |
| | | | | 29. රැස් කරන තොරතුරු විවිධ ආකාරයෙන් වාර්තා කරයි. |
| | | | | 30. සරල අත්හදා බැලීම් කරයි. |

## පොදු තක්සේරු කිරීම - තොරතුරු වාර්තා කිරීමේ පත්‍රිකාව

| | | | | |
|---|---|---|---|---|
| | | | | සිසුන්ගේ නම්<br>තක්සේරු කිරීමේ පරිමාණය<br>සාර්ථක ව කරයි<br>දුෂ්කරතා පෙන්නුම් කරයි<br>තවදුරටත් උදවු අවශ්‍යයි • |
| | | | | 1. පන්තියේ දී අන් අය කෙරෙහි ගරුත්වයෙන් යුතුව ක්‍රියා කරයි. |
| | | | | 2. බෙදා හදාගෙන කටයුතු කිරීමේ අගය ප්‍රකාශ කරයි. |
| | | | | 3. පෞද්ගලික පිරිසිදුකම ගැන සැලකිලිමත් ව කටයුතු කරයි. |
| | | | | 4. තමා අවට පරිසරය පිරිසිදු කර ගැනීමට දායක වෙයි. |
| | | | | 5. අන්‍යයන්ට උදවු කිරීමට කැමැත්තක් දක්වයි. |
| | | | | 6. අන්‍යයන් සමග සුහද ව කතා බහ කරයි. |
| | | | | 7. සුහද ලෙස අන්‍යයන්ගෙන් උදවු ලබා ගනියි. |
| | | | | 8. පරිසරයට ආදරය කරයි. |
| | | | | 9. නිමාවක් දකින තුරු අවධානයෙන් වැඩ කරයි. |
| | | | | 10. උපකරණ නිවැරදි ව භාවිත කරයි. |
| | | | | 11. පාවිච්චියෙන් පසු උපකරණ නිසි තැන තබයි. |
| | | | | 12. වැඩක් අවසානයේ උපකරණ හා ස්ථානය පිරිසිදු කරයි. |
| | | | | 13. ආරක්ෂාව ගැන සැලකිලිමත් ව කටයුතු කරයි. |
| | | | | 14. ස්වයං ඉගෙනුමට කැමැත්තක් දක්වයි. |
| | | | | 15. උචිත අවස්ථාවන්හි දී සරල දෙමළ වචන භාවිත කරයි. |
| | | | | 16. අවස්ථානුකූල ව දෙමළ බසින් සුබ පැතුම් වදන් භාවිත කරයි. |

# 7.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා

## 1.0 හැඳින්වීම

නිපුණතාවක් යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ දැනුම, කුසලතා, ආකල්ප හා හරවල සංකීර්ණ සංකලනයකට ය. විවිධ ආකාරයේ නිපුණතා තිබිය හැකි ය. සමහර නිපුණතා කුසලතා වැඩියෙන් බර වූ ඒවා වන අතර තවත් සමහරක් දැනුම හෝ ආකල්ප දිශාවන්ට වැඩියෙන් බර වූ ඒවා වීමට ඉඩ ඇත.

1 වන ප්‍රධාන අවධිය අවසන් කරනු ලබන සිසුන් **අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවල ප්‍රවීණත්වය ලබා ගෙන ඇතැයි තහවුරු කිරීමක්** කළ යුතු බව නව ප්‍රාථමික අධ්‍යාපන විෂයමාලා සැලැස්මෙහි සඳහන් කර ඇත. පැහැදිලි ව අවබෝධ කර ගත යුතු කරුණු කිහිපයක් මෙම ප්‍රකාශයේ ඇතුළත් ව ඇත.

එනම්

- අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?
- 1 වන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?
- ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?
- නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

මේ එක එකක් පිළිබඳ ව විස්තර වශයෙන් විමසා බලමු.

## 2.0 අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා යනු කවරේ ද?

විෂයමාලාවක් සංවර්ධනය කිරීමේ දී එහි අන්තර්ගතය තේරීමට වැදගත් ස්ථානයක් හිමි වේ. විවිධ හැකියා මට්ටම්වල සිටින සිසුන්ට ගැළපෙන පරිදි සරල මෙන් ම සංකීර්ණ නිපුණතා, විෂයමාලාවක් තුළ සාමාන්‍යයෙන් ඇතුළත් කරනු ලැබේ.

1 වන ප්‍රධාන අවධිය අවසන් කිරීමට ප්‍රථම 2 වන ශ්‍රේණියේ සෑම සිසුවකු ම පාහේ අනිවාර්යයෙන් ම ඉහළ මට්ටමක දක්ෂතා ප්‍රදර්ශනය කළ යුතු නිපුණතා සමූහයක් විෂයමාලා අන්තර්ගත තුළ අඩංගුව ඇත. සෑම සිසුවකුම විසින් ප්‍රගුණ කළ යුතු යැයි අපේක්ෂා කරන මෙම නිපුණතා අප අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ලෙස හඳුන්වනු ලැබේ.

මේ අනුව අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ගණයට අයත් වනුයේ

- ඉගෙනුම තව දුරටත් ගොඩ නැගීමට හා පවත්වාගෙන යෑමටත්,
- යහපත් පුරවැසියකු ලෙස සාර්ථක ව ජීවත් වීමටත් අනිවාර්යයෙන් ම අවශ්‍ය නිපුණතා වේ.

සැමට අධ්‍යාපනය ලබා දීමේ සම්මුතිය යටතේ සියලු ම සිසුන් තුළ අඩුම වශයෙන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා වර්ධනය කරවීමට අප බැඳී ඇත.

පන්තියේ සියලු ම සිසුන් ගෙන ආ යුතු ඉහළ තම ප්‍රාප්ති මට්ටම ලෙස අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා කිසි විටෙකත් සැකලිය යුතු නොවේ. වඩා දක්ෂ සිසුන් විසින් වර්ධනය කරනු ඇතැයි අපේක්ෂා කරන එහෙත්, සියලු ම සිසුන් සඳහා අත්‍යවශ්‍ය යැයි නොසැලකෙන ඉහළ මට්ටමේ නිපුණතා සමූහයක් ද විෂයමාලා අන්තර්ගතයන් තුළ ඇත. ඒවා අභිමත ඉගෙනුම් නිපුණතා ලෙස හැඳින්වේ.

ගුරුවරයාගේ අරමුණ විය යුත්තේ පන්තියේ සෑම සිසුවකු තුළ ම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා ඉහළ මට්ටමකට වර්ධනය කරන අතර, සිසුන් වැඩිදෙනකු තුළ අභිමත ඉගෙනුම් නිපුණතා වර්ධනය කිරීමට පියවර ගැනීම ය.

## 3.0 පළමුවන ප්‍රධාන අවධිය සඳහා අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා මොනවා ද?

පළමුවන ප්‍රධාන අවධිය අවසන් කරන සිසුන් විසින් ඉහළ මට්ටමක හැකියාවන් ප්‍රදර්ශනය කළ යුතු යැයි අපේක්ෂා කරන අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහයක් හඳුනාගෙන ඇත. මේ හඳුනා ගැනීමේ දී 1 වන හා 2 වන ශ්‍රේණියේ විෂය නිර්දේශ සම අනිකුත් විෂයමාලා ද්‍රව්‍ය ගැඹුරින් අධ්‍යයනය කරන ලද අතර, ගුරුවරුන්, ගුරු උපදේශකවරුන්, කථිකාචාර්යවරුන්, විෂයමාලා සංවර්ධනයන් සහ ප්‍රවීණ අධ්‍යාපනඥයින් රැසකගේ අදහස් සැලකිල්ලට භාජන කරන ලදී. එමෙන් ම වෙනත් රටවල ප්‍රකාශයට පත් කර ඇති මෙවැනි අත්‍යවශ්‍ය ප්‍රාප්ති මට්ටම් ද අධ්‍යයනය කරන ලදී.

හඳුනාගෙන ඇති අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සමූහය විෂයයන් වශයෙන් වෙන් වෙන් ව නොව, පොදු ලැයිස්තුවක් වශයෙන් සකස් කර ඇත. එම ලැයිස්තුව තුළ සන්නිවේදනයට, පෞරුෂත්වයට, පරිසරයට, වැඩ ලෝකයට සූදානම්වීමට, ආචාරධර්ම හා ආගමට, ක්‍රීඩා විවේකයට සහ ඉගෙනුමට ඉගෙනීමට අදාළ නිපුණතා අන්තර්ගතය.

## 4.0 ප්‍රවීණත්වය යනුවෙන් අදහස් කරන්නේ කුමක් ද?

යම් නිපුණතාවකට අදාළ දැනුම, කුසලතා හා ආකල්ප පිළිබඳ ව උසස් මට්ටමේ හැකියාවන් ප්‍රදර්ශනය කරනු ලබන සිසුවකු එම නිපුණතාවයේ ප්‍රවීණයකු ලෙස මෙහි දී පිළිගැනෙනු ඇත. උසස් මට්ටමක හැකියාවක් ලබා තිබේ දැයි තීරණය කිරීමට තක්සේරු කිරීම් තුළින් රැස් කළ විවිධ ආකාරයේ තොරතුරු සහ අදාළ නිර්ණායක එක් එක් නිපුණතාවට අදාළ ව සලකා බැලීමට සිදු වෙනු ඇත.

යම් නිපුණතාවක් සම්බන්ධව ප්‍රවීණ මට්ටමට පැමිණි සිසුවකු තුළ දක්නට ලැබිය හැකි ප්‍රධාන ලක්ෂණ කිහිපයක් පහත දැක්වේ.

- එම නිපුණතාවට අදාළ ඊළඟ ඉහළ මට්ටමට යොමු වීමට සූදානම් බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව තව දුරටත් ඉගෙනීමට පෙළඹීමක් ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව තමා තුළ ආත්ම විශ්වාසයකු ඇති බව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට සම්බන්ධ දැනුම හෝ කුසලතා හෝ තවත් අයකුට පැහැදිලි කර දීමට හෝ ඉගැන්වීමට හැකියාවක් පෙන්නුම් කරයි.
- එම නිපුණතාව පිළිබඳ ව විශේෂ උනන්දුවක් හෝ ආශාවක් දක්වන බව පෙන්නුම් කරයි.
- එම නිපුණතාව සම්බන්ධ ගැටලුවකට මුහුණ පෑ විට එය ස්වාධීන ව විසදා ගැනීමේ හැකියාව ප්‍රදර්ශනය කරයි.
- එම නිපුණතාවට අදාළ කාර්යයන් බොහෝ දුරට නිවැරදි ව කරයි.
- ආකල්පවලට අදාළ නිපුණතාවක් සම්බන්ධ චර්යා නිරන්තරයෙන් ප්‍රදර්ශනය කරයි.

## 5.0 නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කරන්නේ කෙසේ ද?

නිපුණතාවක ප්‍රවීණත්වය තහවුරු කිරීම ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදීම සිදු කළ යුත්තකි. ඒ සඳහා යොදා ගත හැකි ප්‍රධාන ක්‍රම දෙකක් හඳුනාගෙන ඇත.

(අ) අවිධිමත් තක්සේරු ක්‍රම මගින් අඛණ්ඩව රැස් කර වාර්තා කර ඇති තොරතුරු පමණක් ඇසුරෙන් තීරණයක් ගැනීම. (සම්භවන තක්සේරු තොරතුරු පමණි)

(ආ) ඉහත (අ) හි සඳහන් තොරතුරුවලට අමතර ව සම්පිණ්ඩිත තක්සේරු කිරීමක් හෝ වැඩි ගණනක් හෝ ඇසුරෙන් තීරණයන් ගැනීම.

ඉහත සඳහන් ක්‍රම භාවිත කර සිසුන් අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතාවලට ළඟා වී තිබේ ද යන්න පිළිබඳ තීරණ ගැනීමට අවශ්‍ය මග පෙන්වීම අත්‍යවශ්‍ය ඉගෙනුම් නිපුණතා සම්බන්ධයෙන් පිළියෙල කර ඇති ගුරු මාර්ගෝපදේශ සංග්‍රහයෙහි අන්තර්ගතව ඇත.